

# ධම්මපද පුරාණ සන්නය.

# චතුර්ථ සංස්කරණය.

මෙහි තෘතීය සංස්කරණය ද විද්‍යෝදය පරිවෙණාධ්‍යක්‍ෂ ධුරන්ධරව වැඩසිටි ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය්‍ය හෙයියන්තුඩුවේ ශ්‍රී දේවමිත්‍රාභිධාන නායකමාහිමියානන්වහන්සේ විසින්ම ප්‍රසිද්ධ කරණලද්ද එය මුද්‍රණයකරවූ විමඩ ද සිල්වා මහානාම පණ්ඩිතරත්න වික්‍රමසිංහ මුදලිඳු විසින් එහි ශෝධ්‍යපත්‍ර යථෝක්ත නායක මාහිමියන්වහන්සේ වෙත නිසිලෙස නොපමුණුවා ඉක්මන්කොට මුද්‍රණයකරවූ හෙයින් ඒ සංස්කරණය ප්‍රථම-ද්විතීය සංස්කරණයන් තරම් නිර්මල නොවීය. එහෙයින්ම ඒ ග්‍රන්ථය පරිශීලනය කරණ රිවිදින පාඨශාලාවල ශිෂ්‍යාදීන්ට එය ගැහැටක්ව පැවැත්තේය. ඒ බැව් වැටහීමෙන් අපි මෙය යළිත් මුද්‍රණය කරවන්ට අදහස්කොට සංස්කරණය කරදෙනලෙස යථෝක්ත නායක මාහිමියන්වහන්සේගේ ශිෂ්‍යවරයන් වහන්සේලාට සැලකෙළෙමු. නමුත් එය මුද්‍රණය කරවූ මුදලිතුමන් කෙරෙහි උන්වහන්සේලාතුළ පැවති මහත්වූ කරුණාව නිසාම ඒ තෘතීය සංස්කරණයේ පොත් අවසන්වන්ට පෙර එසේ කිරීමට උන්වහන්සේලා අකමැතිවූහ.

එසේ පවත්නා අතර අන්කෙනෙකුන් විසින් එය මුද්‍රණය කරවනලද්දේය. ඒ අන්‍යයන් විසින් කළ සංස්කරණයෙහි කර තිබෙන නොමනා වෙනස්කම් නිසා ග්‍රන්ථයාගේ භාෂාස්වරූපය සාකල්‍යයෙන්ම මෙන් වැනසීතිබේ. එහි පුස්කොළ පොත්වල නොමැති "ඈ" කාරයක් බොහෝසෙයින් යොදාතිබේ. මෙය කොතරමට කරතිබේදැයි බලනු රිසියෙන් ඒ පොතක් ගෙණ පෙරළුවිට පෙරළුනපිටේ එක් ගාථාවක සන්නයේ පමණක් එනම්-දහහත්වන වගීයේ පළමුවන ගාථාවේ සන්නයේ පමණක්-අට තැනක එය යොදා තිබෙන බැව් දිටිමු. මේ ගාථාවේ සන්නයට ඇත්තේ පේලි නවයක් පමණකි. පේළිනවයේ අටතැනක මේ අමුතු යෙදීම කරතිබේ නම් මුලුපොතේ කෙතරම් වියහැකිදැයි සිතා බලත්වා.

පැරණි පොත්පත් ගුඩියට පමුණුවන්නවුන් විසින් තම තමන්ගේ යම් යම් ආධානග්‍රාහයන් නිසා ඒ පොත්පත්වල පුරාණයෙහි පැවති භාෂාස්වරූපය වෙනස්වනසේ ක්‍රියා කිරීම සිංහල භාෂාවට කරණ මහත් හානියකි.

# ආ ශා ෂා.

## සන්න සහිත ධම්මපදය.

යස්සව නිම්මලතරාය වචොපභාය
සජ්ජන්තු පඞ්කජවනානි පබොධිතානි,
සම්බොධිසිද්ධගුණමණ්ඩලමණ්ඩිතස්ස
වන්දම තං තිභවසෙට්ඨතං සුමාලිං.

සබ්බාවගම්ම වරධම්මපදං මුනින්දො
ධම්මප්පදං පරමසන්තිපදං අභාසි,
යං සීහලාය පුරිමම්හි පවත්තිතං තං
කාලන්තරෙන ඛලිතං විකලිං කරොම.

සතරාමරලොකස්වාමිවූ අප බුදුරජාණන්වහන්සේ මිට සාරාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයකට පූර්‍වයෙහි කුළුණුනුවණැති සුමෙධ නම් මහා තාපසව දීපඞ්කර සර්‍වඥයන්වහන්සේගේ සම්මුඛයෙහි හස්තප්‍රාප්ත නිර්‍වාණපදය සසරදුකමෙන් හැර සකලසත්ත්වයන් කෙරෙහි පතළ මහාකරුණාවෙන් එව දිවකුරු බුදුන්ගෙන් විවරණ පතුල් ලැබ සසරට වැදී ඉන් මෑත ලොව පහළවූ තෙවිසි සර්‍වඥවරයන්ගෙන් ද ලබනලද විවරණ ඇතිසේක් සමතිංශත් පාරමිධර්‍මයන් පුරා වෙස්සන්තර රජව මහදන් දී සත්සලක් මහපොළෝ ගුගුරුවා. ැමකල දිවකලුන් ගත් වල්විදුනායෙන් දිලිසෙන සියලු දෙව්සිරින් සර තුසීපුර ඉපිද දිව්සැප විළඳනුවෝ දසදහසක් ලෝකධාතුවාසී දිව්‍යබ්‍රහ්මයන්ගේ ආයාචනයෙන් ශාක්‍යවංශයට මුදුන්මල්කඩක්වන් සුදෙවුන් මහරජු නිසා මහාමායා බිසෝ කුස පිළිසිඳ දසළුකඩමස කින් බිහිව ක්‍රමයෙන් වැඩී පැමිණි සක්විතිරජසැප හැර මහබිනික්මන්කොට මහාවීර්‍ය්‍ය කොට බොධිපර්‍ය්‍යඞ්කාරූඪව මාරපරාජය කොට සර්‍වඥ පදප්‍රාප්තව සත්සති යවා මහාබ්‍රහ්මයාගේ අයදුමෙන් බරණැස ඉසිපතනාරාමයෙහි දම්සක් පවත්වා ධර්‍මදෙශනා කරමින් විනෙයජනයන් නිවන් දක්වනුවෝ උපනුපන් කරුණු අරමුණු කොට මේ උතුම් ධර්‍මපදයත් දෙශනා කළසේක. ඒ සියලු ම බුද්ධවචන උන්වහන්සේගේ පිරිනිවීමට ඉක්බිති මහාකාශ්‍යප ස්ථවිරපමුඛ සිවුපිළිසිඹියාපත් පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් රජගහනුවරදී සඞ්ගායනා කරණලදහ.

පඤ්චසතිකය, සත්තසතිකය, සාහස්සිකය යි සඞ්ගායනා තුණකි. එයින් සර්‍වඥයන්වහන්සේගේ පිරිනිවීමෙන් සතරවෙනි මාසයෙහි රජගහනුවර වෙභාරපර්‍වතපාර්‍ශ්වයෙහි සප්තපර්‍ණීගුහාද්වාරයෙහි අජාසත් මහරජහුවිසින් කරණලද විසිතුරු ධර්‍මමණ්ඩපයෙහි වැඩහිඳ සද්ධර්‍මයාගේ චිරස්ථිතිය ප්‍රාර්‍ථනා කරන්නාවූ මහාකාශ්‍යප

ස්ථවිරයන්වහන්සේ ප්‍රධාන කොට ඇති මහානුභාවසම්පන්න පන් සියයක් මහරහතන්වහන්සේලා විසින් සත්මසකින් පළමුවෙනි මහාධර්මසඞ්ගායනාව කොට නිමවන ලද්දීය. පන්සියයක් විසින් සඞ්ගායනාකළහෙයින් මේ **පඤ්චසතිකා** නම් විය.

සම්බුද්ධයන්වහන්සේ පිරිනිවී සියක් හවුරුදු වූ කල විසාලාමහ නුවර දසදහසක් පමණ පාපභික්ෂූන් විසින් උපදවනලද සියලුම ශාසනමල ශෝධනය කොට යශස්ථවිරයන්වහන්සේ ප්‍රධානවූ සත් සියයක් මහරහතන් විසින් කාලාශෝකරජ්ජුරුවන්ගේ ආරක්ෂාවෙන් විසාලාමහනුවර වාලුකාරාමයෙහි වැඩහිඳ අටමසකින් දෙවෙනි සංගීතිය කොට නිමවනලදී. මේ **සත්තසතිකා** නම් විය.

සම්බුද්ධයන්වහන්සේ පිරිනිවී දෙසිය විසිහවෙනි වර්ෂයෙහි සියලු දඹදිව එකසත්කොට රජයට පැමිණි මහානුභාවසම්පන්න ධර්මාශෝක මහරජානන් විසින් දවසක් පාසා පන්ලක්ෂයක් ධන වියදම් කොට බුද්ධශාසනයෙහි පැවිදිවූ සැටදහසක් තීර්ථකයන් විසින් මේ ධර්මය මේ විනය යි තම තමන්ගේ දෘෂ්ටීන් ප්‍රකාශ කරමින් උපද වනලද සියලුම ශාසන මලශෝධනය කොට මොග්ගලිපුත්තතිස්ස නම් ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන දහසක් පමණ මහරහතන් විසින් පැළලුප්නුවර අශෝකාරාමයෙහි වැඩහිඳ ධර්මාශෝක නරෙන්ද්‍ර යන්ගේ ආරක්ෂාවෙන් නවමසකින් තුන්වෙනි සංගීතිය කොට නිමවනලදී. මේ **සාහස්සිකා** නම් විය.

සියලුම බුද්ධ වචන මේ සඞ්ගායනා තුනට අන්තර්ගතයි. මේ ධම්මපදය ඒ පළමුවෙනි ධර්මසඞ්ගීතියෙහිදී සඞ්ගායනා කොට ඛුද්දක නිකායෙහි ඇතුළත් කරණලදී.

**ධම්මපද** නම් කිමයත්? සත්තිස්බෝධිපාක්ෂිකනම් වූ ධර්ම කොට්ඨාස යි. ඒ ධර්ම කොට්ඨාසය සම්බුද්ධයන්වහන්සේ විසින් සමාස ව්‍යාස-සාකල්‍යාදිවශයෙනුත්, එකත්ව නය-නානාත්ව නයාදිනයවශයෙනුත් යථාස්වභාවයෙන් දේශනාකරණලදී. මේ ප්‍රකරණයෙහි සමාස වශයෙනැයි දතයුතු. එබැවින් සියලු ම බුද්ධධර්මය සංක්ෂෙපයෙන් මෙහි අන්තර්ගත ව පෙණේ. මේ ධම්මපදය ගාථා සාරසිය විසිතුණ කින් හා සව්සිවර්ගයකින් යුක්තයි. මෙය සම්පූර්ණයෙන් උගතෙකුට බුද්ධධර්මයෙහි උතුම් වියත්බවක් ලැබේ.

පළමුවෙනි ධර්මසඞ්ගීතිය කළ මහාස්ථවිරයන් වහන්සේලා විසින් මීට ද අර්ථකථා කරණලදී. ඒ අර්ථකථාව මහාමහෙන්ද්‍රස්ථවිර යන් වහන්සේ විසින් ලක්දිවට ගෙණවුත් ලක්දිව්වැස්සන්ගේ ප්‍රයෝජන සඳහා සිංහලභාෂාවෙන් තබනලද්දීය. ඉන් පසු කුමාර කාශ්‍යප නම් ස්ථවිරකෙනෙකුන් විසින් සිංහල අර්ථකථා ව සිංහල ද්වීපවාසීන් හැර අවශේෂදේශවාසීන්ට ප්‍රයොජනනැතැයි මීට මාගධී අර්ථකථාවක් වුවමැනවැයි ආයාචනය කරණලදින් සිසියම් ආචාර්ය කෙනෙකුන් විසින් මාගධීභාෂාවෙන් මීට අටුවාව කළබව එහි කතෘහු විසින් සුපදර්ශිත වාක්‍යයෙන් පෙණේ.

සිංහල අට්ඨකථාහි කියමන් ඉතා විස්තෘතව තිබුනු බවත් ගාථාවර්ණනා නොතිබුනු බවත් මාගධීඅට්ඨකථාහි කියනලදී. ඒ අතිවිස්තර වචන ක්‍රමය හැර ගාථාවර්ණනාත් ප්‍රකාශ කොට මාගධීභාෂාවෙන් අට්ඨකථාව කළබව එම ග්‍රන්ථයෙහි ප්‍රකාශිතයි. ඒ අට්ඨකථාව වස්තු 299 යකින් හා බණවර දෙසැත්තෑවකින් යුක්තයයි කියනලදී.

එහි යමකවර්ගයෙහි වස්තු 14 යි, අප්‍රමාදවර්ගයෙහි 9 යි, චිත්තවර්ගයෙහි 9 යි, පුෂ්පවර්ගයෙහි 11 යි, බාලවර්ගයෙහි 14 යි, පණ්ඩිතවර්ගයෙහි 11 යි, අර්හත්වර්ගයෙහි 10 යි, සහස්‍රවර්ගයෙහි 14 යි, පාපවර්ගයෙහි 12 යි, දණ්ඩවර්ගයෙහි 11 යි, ජරාවර්ගයෙහි 9 යි, ආත්මවර්ගයෙහි 10 යි, ලෝකවර්ගයෙහි 11 යි, බුද්ධවර්ගයෙහි 9 යි, සුඛවර්ගයෙහි 8 යි, ප්‍රියවර්ගයෙහි 9 යි, ක්‍රෝධවර්ගයෙහි 8 යි, මලවර්ගයෙහි 12 යි, ධර්මස්ථවර්ගයෙහි 10 යි මාර්ගවර්ගයෙහි 12 යි, ප්‍රකීර්ණවර්ගයෙහි 10 යි, නිරයවර්ගයෙහි 9 යි, නාගවර්ගයෙහි 9 යි, තෘෂ්ණාවර්ගයෙහි 12 යි, භික්ෂුවර්ගයෙහි 12 යි, බ්‍රාහ්මණවර්ගයෙහි 39 යි. මෙසේ අට්ඨකථාවෙහි වස්තු 299 යක් ප්‍රකාශයි.

ඒ මේ අට්ඨකථාවත් ආචාර්ය්‍ය බුද්ධඝෝෂ මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් කරණලදයි අට්ඨකථා අවසානයෙහි සඳහන්කරණලද්දේය. එය පසුව කිසිවෙකු විසින් යොදනලද පාඨයෙක්යයි හැඟේ. ගන්ධසංග්‍රහයෙහිදු ඒ කීම ආශ්‍රයකොට බුද්ධඝෝෂාචාර්ය්‍යයන් කළබව කියනලදී. ප්‍රකාශනය කළ පරිදි ප්‍රකාශිත ගාථාවලින් එසේ නොහැඟෙන බැවින් ඒ එසේමය යි පිළිගැන්මට හෙතු නොපෙණේ. දම්පියා අටුවා සන්නයෙහිත් ඒ බව නොකියනලද්දේය. අප විසින් පළමුවෙනි වර මුද්‍රණයකිරීමට පාඨශෝධනය කොට දෙනලද පොතෙහි බුද්ධඝෝෂාචාර්ය්‍යයන් වහන්සේ විසින් මේ අට්ඨකථාව කළබව කී තැනින් නැවත කරුණු සොයාබැලීමෙන් මේ අට්ඨකථාව බුද්ධඝෝෂාචාර්ය්‍යයන් විසින් නොකළබවට හෙතු ලැබුනේය.

මේ අට්ඨකථාව කෙළේ අස්වලාය යි නිශ්චය කළ නොහැක්කේය. සිරිකූඩ නම් රජහු විසින් කාරවනලද පන්සෙහි වැඩවිසූ ස්ථවිර[illegible]තැකුන් විසින් කළබව අට්ඨකථාහි කියනලදී. ඒ මෙසේයි:-

"පත්තං ධම්මපදං නාම ධම්මරාජේනනුත්තරං,
ගාථා ධම්මපදෙ තේන භාසිතා යා මහෙසිනා.

සතෙවීසා චතුසතා චතුසච්චවිභාවිනා,
සතත්තයඤ්හි වත්ථූනං එකනූන සමුට්ඨිතා.

විහාරෙ අධිරාජේන කාරිතම්හි කතඤ්ඤුනා,
පාසාදෙ සිරිකූඩස්ස රඤ්ඤො විහරතා මයා;

අජ්ඣෙසිතො නසමත්තානං අත්ථාය ච හිතාය ච,
ලොකස්ස ලොකනාථස්ස සද්ධම්මට්ඨිතිකාමතා;

තාසං අට්ඨකථං එතං කරොන්තෙන සුනිම්මලං,
වාසත්තති පමාණාය භාණවාරෙහි පාළියා;

යං පත්තං කුසලං තෙන කුසලා සබ්බපාණිනං,
සබ්බෙ ඉජ්ඣන්තු සඞ්කප්පා ලභන්තු මධුරං ඵලං ති."

මේ ග්‍රන්ථය අසවල් කාලයෙහි අසවලකු විසින් කෙළේය යි සඳහන් නොකෙළෙත් කාලය හා කර්තෘ නියමකිරීම දුෂ්කරයි. එතකුදු වුවත් බුද්ධාගම හා නානාශාස්ත්‍ර දැනීමෙහි අතිසමර්ථ පණ්ඩිත කෙනෙකුන් විසින් කළබව හැඟේ.

කවුරුනමුත් මේ ව්‍යාඛ්‍යාන කර්තෘ විසින් සාමාන්‍ය ලෝකයාගේ ප්‍රයෝජනය සලකා ව්‍යඤ්ජනයෙහි ආදර නොකොට අටුවානුසාරයෙන් අභිප්‍රාය හැඟෙන පරිද්දෙන් අර්ථවර්ණනා කළබව පෙණේ. ඒ එසේමය:—

"අත්ථං හි නාථෝ සරණං අවෝච න බ්‍යඤ්ජනං ලොකහිතො මහෙසි,
තස්මා අකත්වා රතිමක්ඛරෙසු අත්ථෙ නිවෙසෙය්‍ය මතිං මුතිමා."

මෙසේහෙයින් එසේකිරීම විරුද්ධ නොවේ.

පළමුවෙනි වර ශුද්ධකළ පොතේ අපට නිශ්චය වශයෙන් නොහැඟීමෙන් අශුද්ධව යෙදීතිබුන පාඨ මේවර (දෙවෙනිවර) ශුද්ධකොට යොදනලදී. තවද පරම්පරාගත සම්හර පාඨ අපට අශුද්ධයයි හැඟුන නමුත් වෙනස් නොකෙළෙමු. එබදු ඇතැම් තැනුත් පොත්වල වෙනස්ව දක්නාලද නානාපාඨත් අධෝලිපිකොට ඇති. ඒ පණ්ඩිතයන් විසින් විනිශ්චය කරණු ලැබේවා.

උද්දානයෙහි පෙනෙන ගණන්වලට වෙනස්ව, සම්හර වර්ගවල ගාථාසංඛ්‍යා අඩුවැඩි වී තිබේ. එබදුතැන් වෙන්වෙන් වශයෙන් සඳහන් කිරීමෙන් වැඩිප්‍රයෝජනයක් නොපෙනෙන බැවින්, ප්‍රථම වාරයෙහි මෙන් ඒ ඒ තැන්හි සඳහන් නොකෙළෙමු.

මේ ව්‍යාඛ්‍යානය බුද්ධාගම හා සව්‍යාකරණමාගධ සිංහලභාෂා ඉගෙණගන්නා සියල්ලන්ට ම අත්‍යන්තොපකාරී මාහැඟි ප්‍රකරණයෙකි.

මේ උතුම් ප්‍රකරණය අප විසින් යථාශක්තියෙන් නොයෙක් දේශයන් පොත් සපයා බලා අටුවා ගැටපද හා සංසන්දනය කොට අප ආචාර්යවරයන්ගේ උපකාරත් ඇතුව ශුද්ධකරණලදී.

මේ පොත ශුද්ධකිරීමේ ප්‍රයාසය මෙහි තතු දන්නන්ට සුවසේ වැටහෙයි. එබැවින් ඒ හගවනු පිණිස දීර්ඝවාක්‍ය නොලියමු. අති දීර්ඝකාලයක් ලියමනෙන් වැරදී තිබෙන මේ පොත අපේ ශක්ති [illegible]ණින් ශුද්ධ කළ නමුත් තව දෙස් නැතැයි නොසිතමු. ඒ ප්‍ර[illegible]න්තයන් විසින් ලොකාභිවෘද්ධිය සඳහා ශුද්ධ කරණු ලැබේවා!

හෙයියන්තුඩුවේ දේවමිත්‍ර නායකස්ථවිර.

ශ්‍රී බුද්ධ වර්ෂ 2455 නිකිණි මැදි,
පෝහෝයලත් ගුරුදින
විද්‍යෝදය පිරිවෙණෙහිදීය,

1911-9-7

# පටුන.

පිටුව.


1......යමකවර්ගය.
11......අප්‍රමාදවර්ගය.
17......චිත්තවර්ගය.
22......පුෂ්පවර්ගය.
27......බාලවර්ගය.
34......පණ්ඩිතවර්ගය.
39......අර්හද්වර්ගය.
44......සහස්‍රවර්ගය.
49......පාපවර්ගය.
55......දණ්ඩවර්ගය.
61......ජරාවර්ගය.
65......ආත්මවර්ගය.
69......ලෝකවර්ගය.
73......බුද්ධවර්ගය.
80......සුඛවර්ගය.
84......ප්‍රියවර්ගය.
88......ක්‍රෝධවර්ගය.
92......මලවර්ගය.
99......ධර්මස්ථවර්ගය.
104......මාර්ගවර්ගය.
111......ප්‍රකීර්ණවර්ගය.
116......නිරයවර්ගය.
121......නාගවර්ගය.
127......තෘෂ්ණාවර්ගය.
138......භික්ෂුවර්ගය.
146......බ්‍රාහ්මණවර්ගය.
130......උදානගාථා.

ධම්පියා අකාරාදිය


අ... ...යං. 155
අකතං දුක්කතං. 119
අක්කොච්ඡි මං. 3
අක්කොධනං. 132
අක්කොධෙන. 89
අක්කොසං. 152 (අකාකොසං. 155)
අචරිත්වා. 85
අචරිත්වා. 65
අචිරං වත. 21
අ[illegible]හි. 33
අට්ඨීනං නගරං. 63
අත්තදත්ථං. 69
අත්තනා චොදය. 145
අත්තනාව. 67 158
අත්තනාව කතං. 67
අත්තානමෙව. 66 68
අත්තනා චෙ. 66
අත්තානං චෙ. 65
අත්තා හවෙ. 45
අත්තා හි අත්තනො. 145
අත්තා හි අත්තනො. 67
අත්ථම්හි ජාතම්හි. 126
අථ වස්ස. 84
අථ පාපානි. 57
අනවට්ඨිත. 19
අනවස්සුත. 20
අනික්කසාවො. 6
අනුපුබ්බෙන. 94
අනුපවාදො. 76
අනෙකජාති. 64
අන්ධභූතො. 72
අපි දිබ්බෙසු. 77
අපුඤ්ඤලාභො ච. 118
අප්පකා තෙ. 37
අප්පමත්තො අයං. 36
අප්පමත්තො. 13
අප්පමාදරතො. 124
අප්පමාදරතො. 16
අප්පමාදරතො 16
අප්පමාදෙන. 16
අප්පමාදො. 11
අප්පම්පි චෙ. 10
අප්පලාභොපි. 140
අප්පස්සුතායං. 63
අභයෙ ච. 120
අභිත්ථරෙථ. 49
අභිවාදන. 47
අභූතවාදී. 116
අයසාව මලං. 94
අයොගෙ. 84
අලඞ්කතො. [illegible]
අලජ්ජිතායෙ. 120
අහං නාගොව. 121
අහිංසකායෙ. 90
අවජ්ජෙ. 121
අවිරුද්ධං. 134
අසතං භාවන. 32
අසජ්ඣායමලා. 94
අසංසට්ඨං. 154
අසාරෙ. 7
අසාහසෙන. 100
අසුභානුපස්සිං. 5
අස්සද්ධො. 48
අසෙචනා යො. 60
ආකාසෙ. 99
ආරොග්‍ය පරමා. 82
ආසාය සස්ස. 156

ඉ.
ඉදං පුරෙ. 124
ඉධ තප්පති. 19
ඉධ නන්දති. 09
ඉධ මොදති. 04
ඉධ වස්සං. 109
ඉධ සොචති. 8

උ.
උච්ඡින්ද. 109
උට්ඨානකාලම්හි. 101
උට්ඨානවතො. 13
උට්ඨානෙන. 14
උත්තිට්ඨෙ. 70
උදකං හි. 35, 61
උපනීතවයො. 93
උය්‍යුඤ්ජන්ති. 40
උසභං පවරං. 157

එ.
එකං ධම්මං. 72
එකස්ස චරිතං. 125
එකාසනං. 116
එතමත්ථවසං. 110
එතං ඛො සරණං. 78
එතං දළ්හං. 131
එතං විසෙසතො. 12
එතම්හි තුම්හෙ. 105
එථ පස්සථිමං. 71
එවමෙතං. 97
එවං සඞ්කාර. 27
එසොව මග්ගො. 105

ඔ.
ඔවදෙය්‍යානුසාසෙය්‍ය. 34

ක.
කණ්හං ධම්මං. 38
කයිරා චෙ. 119
කාමතො ජායති. 86
කායප්පකොපං. 94
කායෙන. 92
කායෙන සංවරො. 131
කාසාවකණ්ඨා. 117
කිච්ඡො. 75

| | | | | | |
|---|---|---|---|---|---|
| කිං ඝො ප්‍රමාති | | ත. | | | |
| කිං කො ප්‍රමාති. | 150 | තඤ්ච කම්මං. | 30 | න අන්තලික්ඛෙ. | 51 |
| කුම්භූපමං. | 20 | තණ්හාය. | 86 | න කහාපණ. | 78 |
| කුසොයථා. | 118 | තතො මලා මලතරං. | 95 | නගරං යථා. | 120 |
| කො ඉමං | 22 | තත්‍රාභිරතිං. | 38 | න චාහං බ්‍රාහ්මණං. | 151 |
| කොධං ජහෙ. | 88 | තත්‍රායමාදි. | 143 | න චාහු න ච. | 91 |
| කොනු හාසො. | 61 | තං පුත්ත පසු. | 109 | න ජටාහි. | 150 |
| ඛ. | | තං වො වදාමි. | 128 | න තං දළ්හං. | 131 |
| ඛන්තී පරමං. | 75 | තථෙව. | 88 | න තාවතා. | 100 |
| ග. | | තසිණාය. | 130 | න තෙන භික්ඛු | 102 |
| ගතද්ධිනො. | 39 | තස්මා පියං. | 85 | න තෙන අරියො | 103 |
| ගබ්භමෙකෙ. | 54 | තස්මාහි. | 83 | න තෙන ථෙරො. | 101 |
| ගම්භීරපඤ්ඤං. | 152 | තිණදොසානි. | 136 | න තෙන පණ්ඩිතො | 100 |
| ගහකාරක. | 64 | තිණදොසානි. | 137 | න තෙන හොති | 99 |
| ගාමෙ වා. | 43 | තුම්හෙහි කිච්චං | 105 | ~~[illegible]~~ | |
| ඡ. | | තෙ ඣායිනො. | 13 | න තං කම්මං. | 30 |
| චක්ඛුනා | 138 | තෙ තාදිසෙ. | 79 | න තං මාතා. | 21 |
| චත්තාරි ඨානානි | 117 | තෙසං සම්පන්න. | 26 | නත්ථි ඣානං. | 142 |
| චන්දනං තගරං. | 26 | ද. | | නත්ථි රාගසමො. | 98 |
| චන්දංව විමලං. | 156 | දදන්ති වෙ. | 97 | නත්ථි රාගසමො. | 81 |
| චරඤ්චෙ. | 28 | දන්තං නයන්ති. | 122 | න නග්ගචරියා. | 59 |
| ~~චරඤ්චෙ.~~ | – | දිවා තපති. | 148 | න පරෙසං. | 24 |
| චරන්ති බාලා. | 29 | දිසො දිසං. | 21 | න පුප්ඵගන්ධො | 26 |
| චිරප්පවාසිං. | 87 | දීඝා ජාගරතො | 27 | න බ්‍රාහ්මණස්ස. [illegible] 149 | 149 |
| චුතිං යො වෙදි. | 158 | දුක්ඛං දුක්ඛ. | 78 | න භජෙ. | 35 |
| ඡ. | | දුන්නිග්ගහස්ස. | 18 | න මුණ්ඩකෙන | 102 |
| ඡන්දජාතො. | 87 | දුප්පබ්බජ්ජං. | 114 | න මොනෙන. | 103 |
| ඡින්ද සොතං. | 146 | දුල්ලභො. | 78 | න වාක්කරණ. | 101 |
| ඡෙත්වා නද්ධිං. | 152 | දූරඞ්ගමං. | 19 | න වෙ කදරියා. | 73 |
| ජ. | | දූරෙ සන්තො. | 115 | න සන්ති. | 110 |
| ජයං වෙරං. | 81 | ධ. | | න සීලබ්බත. | 104 |
| ජිඝච්ඡා පරමා. | 82 | ධනපාලකො. | 123 | න හි එතෙහි. | 122 |
| ජීරන්ති වෙ. | 63 | ධම්මපීති. | 35 | න හි පාපං. | 31 |
| ඣ. | | ධම්මාරාමො. | 140 | න හි වෙරෙන. | 3 |
| ඣාය භික්ඛු. | 142 | ධම්මං චරෙ. | 70 | නිධීනංව. | 133 |
| ඣායිං විරජං | 147 | න. | | නිධාය දණ්ඩං | 152 |
| | | න අත්තහෙතු | 37 | නෙව දෙවො. | 34 |

නෙත කම්මං. 91
නෙතං ඛො. 77
නෙව දෙවො. 46
නො චෙ ලභෙථ. 125

ප.

පඤ්ච ඡින්දෙ. 142
පටිසන්ථාර. 144
පඨවිසමො. 42
පණ්ඩුපලාසොව. 92
පථව්‍යා. 73
පමාදං අප්පමාදෙන. 15
පමාදමනුයුඤ්ජන්ති. 14
පරදුක්ඛූප. 111
පරවජ්ජානු. 98
පරිජිණ්ණමිදං. 62
පරෙ ච න විජානන්ති. 4
පවිවෙකරසං. 82
පස්ස චිත්තකතං. 62
පංසුකූලධරං. 151
පාප මිත්තෙ. 53
පාපං චෙ. 50
පාපානි. 103
පාපොපි පස්සති. 51
පාමොජ්ජ. 146
පියතො ජායති. 85
පුඤ්ඤං චෙ. 50
පුත්තා මත්ථි. 28
පුප්ඵානි හෙව. 23
පුබ්බෙනිවාසං. 159
පූජාරහෙ. 79
පෙමතො. 85
පොරාණමෙතං. 90

ඵ.

ඵන්දනං චපලං. 17
ඵුසාමි නෙක්ඛම්ම. 104
ඵෙණූපමං. 23

බ.

බහුං වෙ. 77
බහුම්පි චෙ. 10
බාලසඞ්ඝාතචාරී. 83
බාහිත පාපොති. 148

භ.

භද්‍රොපි පස්සති. 61

ම.

මග්ගානට්ඨඞ්ගිකො. 104
මලිත්ථියා. 95
මත්තාසුඛ. 111
මධුවා මඤ්ඤති. 80
මනුජස්ස. 127
මනොපකොපං. 92
මනොපුබ්බඞ්ගමා. 1
මමෙව. 33
මාතරං පිතරං. 112
මාතරං පිතරං. 113
මා පමාදමනු. 14
මාප්පමඤ්ඤෙථ. 52
මාප්පමඤ්ඤෙථ. [illegible]
මා පියෙහි. 84
මාවොච ඵරුසං. 56
මාසෙ මාසෙ. 314
මිද්ධී යදා හොති. 123
මුඤ්ච පුරෙ. 132
මුහුත්තමපි චෙ. 29
මෙත්තාවිහාරී. 141

ය.

යං චෙ විඤ්ඤූ. 91
යතො යතො. 143
යථාගාරං දුච්ඡන්නං. 8
යථාගාරං සුච්ඡන්නං. [illegible]
යථා දණ්ඩෙන. 57
යථාපි පුප්ඵරාසිම්හා. 25
යථාපි භමරො. 24
යථාපි මූලෙ. 128
යථාපි රහදො. 3
යථාපි රුචිරං. 2
යථා බුබ්බුලකං. 70
යථා සඞ්කාර. 27
යදා ද්වයෙසු. 147
යම්හා ධම්මං. 150
යම්හි සච්චඤ්ච. 101
යස්ස අච්චන්ත. 67
යස්ස කායෙන. 14
යස්ස ගතිං. 15
යස්ස [illegible]වෙතං. 101
යස්ස චෙතං. 97
යස්ස ජිතං නාව. 129
යස්ස ජාලිනී. 74
යස්ස ජිතං. 73
යස්ස පාපං. 71
යස්ස පාරං. 147
යස්ස පුරෙ ච. 159
යස්ස රාගො ච. 155
යස්සාලයා. 156
යස්සාසවා. 41
යස්සින්ද්‍රියානි. 41
යං එසා සහතී. 127
යං කිච්චං. 47
යං හි කිච්චං. 118
යාහි කිච්චං. 111
යානිමානි. 62
යාවජීවම්පි චෙ. 29
යාව දෙව. 32
යාවං හි වනථො. 108
යෙ ච ඛො. 38
යෙ ඣානපසුතා.
යෙ රාගරත්තා. 132
යෙසං ච. 112
යෙසං සන්නිචයො. 4
යෙසං සම්බොධි. [illegible]

යො අප්පදුට්ඨස්ස. 53
යො ඉමං පලිපථං. 157
යො ගාථෙ. 108
යො ච පුබ්බෙ. 71
යො ච බුද්ධඤ්ච 77
යො ච සමෙති. 108
යො ච වන්ත. 7
යො වෙ තං සහති. 127
යො ච ගාථා. 45
යො ච වස්සසතං 46
යො ච වස්සසතං 48
යො ච වස්සසතං. „
යො දණ්ඩෙන. 57
යො දුක්ඛස්ස. 153
යොධ කාමෙ. 157
යොධ තණ්හං. „
යොධ පුඤ්ඤඤ්ච. 102
යොධ දීඝං. 155
යොධ පුඤ්ඤඤ්ච. 156
යො නිබ්බනථො, 130
යො පාණං. 96
යො බාලො 28
යො මුඛසඤ්ඤතො 139
යො වෙ උප්පතිතං. 89
යො සහස්සං. 45
යො සාසනං 68
යො හවෙ. 146

ර.

රතියා. 86
රමණීයානි. 43
රාජතො වා. 58

ව.

වචීපකොපං. 92
වනං ඡින්දථ. 108
වජ්ජඤ්ච. 121
වරමස්ස. 122
වස්සිකා විය: 144
වාචානුරක්ඛී. 107
වාණිජොව. 53
වාරිජොව. 18
වාරිපොක්ඛරෙ. 153
විතක්කම, 132
විතක්කූපසමෙ 133
වීතතණ්හො. 134
වෙදනං ඵරුසං 58

ස.

සචෙ නෙරෙසි. 57
සචෙ ලභෙථ. 124
සච්චං භණෙ. 89
සදා ජාගර. 90
සද්ධො සීලෙන. 115
~~[illegible]~~ 144
සන්තං තස්ස මනං 42
සබ්බත්ථ වෙ. 36
සබ්බදානං. 135
සබ්බපාපස්ස. 75
සබ්බසො 141
සබ්බසංයොජනං. 152
සබ්බාභිභූ. 134
සබ්බෙ ධම්මා. 106
සබ්බෙ තසන්ති, 55
සබ්බෙ සංඛාරා. 106
සබ්බෙ සංඛාරා. „
සරිතානි. 129
සලාභං. 140
සවන්ති සබ්බධී 129
සහස්සමපි චෙ. 44
සහස්සමපි චෙ. „
සාරඤ්ච සාරතො. 7
සාහු දස්සනං. 83
සිඤ්ච භික්ඛු. 141
සීලදස්සනං. 87
සුකරානි. 68
සුඛකාමානි. 56
සුඛා මත්තෙය්‍යතා 126
සුඛො බුද්ධානං. 79
සුඛං යාව ජරා. 126
සුජීවං අහිරිකෙන. 95
සුඤ්ඤාගාරං. 143
සුදස්සං වජ්ජං. 98
සුදුද්දසං. 19
සුප්පබුද්ධං. 113
සුප්පබුද්ධං. 114
සුභානුපස්සිං. 4
සුසුඛං වත. 81
සුසුඛං වත. 80
සුරාමෙරය. 96
සෙඛො පථවිං. 22
සෙය්‍යො අයො. 117
සෙලො යථා. 36
සො කරොති. 93
සො කරොති. „

හ.

හත්ථසඤ්ඤතො. 139
[illegible] 131
හංසාදිච්චපථෙ 72
හිත්වා මානුසකං 158
හිත්වා රතිඤ්ච. 158
හිරීනිසෙධො. 60
හිරිමතා ච. 96
හීනං ධම්මං. 69

# ධම්මපදං.

## පඨමො යමකවග්ගො.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

**1.** මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා,
තතො නං දුක්ඛමන්වෙති චක්කං'ව වහතො පදං.

---

1. ධම්මා, වෙදනාදිස්කන්ධත්‍රයසඞ්ඛ්‍යාත අරූපධර්මයෝ; මනො-
පුබ්බඞ්ගමා, කාමාවචරාදිභෙදයෙන් චාතුර්භූමිකවූ චිත්තය පූර්වඞ්ගම
කොට ඇත්තාහ; (නිස්සත්වනිර්ජීවාර්ථයෙන් ධර්ම නම් වූ වෙදනාදි
ස්කන්ධත්‍රයසඞ්ගෘහීත සියලු චෛතසිකයෝ චිත්තය හා ඒකොත්පාද-
ඒකනිරොධ-ඒකාලම්බන-ඒකවස්තුකවූවාහු ද චිත්තය නො උපන
හොත් චෛතසිකයන්ගේ උත්පත්තියෙක් නම් නැත්තුයි චෛත-
සිකයන්ගේ උත්පත්තියට චිත්තය ප්‍රධානකාරණ හෙයින් මනස
පූර්වඞ්ගමකොට ඇත්තාහයි සේයි) මනොසෙට්ඨා, (සහජාතාධිපති වස-
යෙන් චිත්තය ශ්‍රෙෂ්ඨ වන බැවින්) මනස උතුම් කොට ඇත්තාහ;
මනොමයා, (දරුආදියෙන් නිපන් ඒ ඒ භාණ්ඩ දරුමයාදි නම්
වන්නා සේ මනසින් නිපදනා හෙයින්) මනොමයහ, (=සිත්මුවාහ);
(එහෙයින්); චෙ, ඉදින්; පදුට්ඨෙන මනසා, (ආගන්තුකවූ අභිධ්‍යා-
දෞර්මනස්‍යාදිදොෂයෙකින්) දූසිතවූ (=කැලඹුනාවූ) සිතින් යුක්තව;
භාසතිවා, (මෘෂාවාද-පිශුනවචන-පරුෂවචන-සම්ප්‍රලාපයයි කියන
ලද චතුර්විධ වාග්දුශ්චරිතය) බෙණේ නම් හෝ; කරොති වා, (ප්‍රාණ-
වධ-අදත්තාදාන-කාමමිථ්‍යාචාර යයි කියනලද) ත්‍රිවිධ කායදුශ්චරි-
තය කෙරේ නම් හෝ, (කායවාග්දුශ්චරිතයන් නැතිවත් අභිධ්‍යා-
ව්‍යාපාද-මිථ්‍යාදෘෂ්ටියයි කියනලද ත්‍රිවිධ මනොදුශ්චරිතය පුරා නම්
හෝ); තතො, ඒ (ත්‍රිවිධ දුශ්චරිත) හෙතුවෙන්; දුක්ඛං, (සතරඅපා-
යෙහි ද මනුෂ්‍යලොකයෙහි ද) කායිකවූ ද චෛතසිකවූ ද විපාක-
දුඃඛය; නං, ඒ (දුශ්චරිතසමඞ්ගී) පුද්ගලයා; අන්වෙති, අනුව යන්-
නේය; කුමක් මෙන් ද යත්? වහතො, ගැල (යොදනලදුව) උසු-
ලන්නාවූ හෙවත් ගැල ඇදගෙණ යන්නාවූ ගොනුගේ; පදං, පිය
අනුව යන්නාවූ; චක්කං ඉව, ගැල්සක මෙන්— ගැල ඇද ගෙණ
යන ගොනුගේ පිය අනුව ඔහුපසුපස්සෙහි යන්නාවූ ගැල්සක මෙන්

2. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා,
තතො නං සුඛමන්වෙති ඡායා'ව අනපායිනී.

3. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති

---

ආපායිකවූ ද මානුෂිකවූ ද කායිකචෛතසිකවිපාකදුඃඛය දුශ්චරිත-සම්බන්ධී පුද්ගලයා නොහැර භවයෙන් භවයට අනුව යන්නේයයි සේයි.

2. ධම්මා, වේදනාදිස්කන්ධත්‍රයසඞ්ඛ්‍යාත අරූපධර්මයෝ; මනොපුබ්බඞ්ගමා, කාමාවචරාදිභෙදයෙන් චාතුර්භූමිකවූ චිත්තය පූර්වඞ්ගමකොට ඇත්තාහ; (නිස්සත්ත්වනිර්ජීවාර්ථයෙන් ධර්මනම්වූ වේදනාදිස්කන්ධත්‍රයසඞ්ගෘහීත සියලු චෛතසිකයෝ චිත්තය හා එකොත්පාද-එකනිරොධ-එකාලම්බන-එකවස්තුකවූවාහු ද චිත්තය නො උපන්හොත් චෛතසිකයන්ගේ උත්පත්තියෙක් නම් නැත්තුයි චෛතසිකයන්ගේ ඉපදීමට චිත්තය ප්‍රධානකාරණ හෙයින් මනය පූර්වඞ්ගමකොට ඇත්තාහයි සේයි) මනොසෙට්ඨා, (සහජාතාධිපති-වශයෙන් චිත්තය ශ්‍රේෂ්ඨ වන බැවින්) මනස උතුම් කොට ඇත්තාහ; මනොමයා, (ස්වර්ණාදියෙන් නිපන් ඒ ඒ භාණ්ඩ ස්වර්ණමයාදි නම් වන්නා සේ මනසින් නිපදනා හෙයින්) මනොමයහ, (=සිත්මුවාහ); එහෙයින්; (=මනසින් නිපදනා හෙයින්); චෙ, ඉදින්; පසන්නෙන මනසා, (අනභිධ්‍යාදිගුණයොගයෙන්) ප්‍රසන්නවූ (=නිර්මලවූ) සිතින් යුක්තව; භාසති වා, (චතුර්විධවාක්සුචරිතය) බෙණේ නම් හෝ; කරොති වා, ත්‍රිවිධකායසුචරිතය කෙරේ නම් හෝ; (කායවාක්-සුචරිතයන් නැතිවත් ත්‍රිවිධ මනස්සුචරිතය පුරා නම් හෝ); තතො, ඒ ත්‍රිවිධසුචරිතහෙතුවෙන්; සුඛං, කායිකවූ ද චෛතසිකවූ ද විපාකසුඛය; තං, ඒ (ත්‍රිවිධසුචරිතසම්බන්ධී) පුද්ගලයා; අන්වෙති, අනුව යන්නේය:(කුමක් මෙන් ද යත්?)අනපායිනී, ශරීරයෙන් පහ නො වන්නාවූ; ඡායා ඉව, සේ මෙනි—ත්‍රිවිධසුචරිතසම්බන්ධී පුද්ග-ලයා සුගතියෙහි උපන්නහු ද දුගතියෙහි දූ සුව අනුභවකරන්ට නිසි තන්හි උපන්නහු ද කායික චෛතසික විපාකසුඛය ශරීරප්‍රති-බද්ධ හෙයින් ශරීරයෙන් පහනොවන්නාවූ ඡායාව මෙන් ගිය ගිය තන්හි නොහැර අනුව යන්නේයයි සේයි.

3. මං, මට: අක්කොච්ඡි. ආක්‍රොශ කෙළේ යයි ද, හෙවත් ජාත්‍යා-දීන් ගටා බිණීයයි ද; මං, මට; අවධි, (අතින් පයින් දණ්ඩෙන් සැතින්) පහළේ යයි ද; මං, මා; අජිනි. (කූටදෙස් කියවීම් ආදි විසින්) දිනීයයි ද; මෙ, මාගේ උපභොගපරිභොගවස්තු; අහාසි, පැහැර ගත්තේයයි ද; යෙ, යම් ගෘහස්ථප්‍රව්‍රජිත කෙනෙක්; තං, ඒ (ආක්‍රො-

4. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති.

5. න හි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො.

ශාදිය කරණකොට උපන්) ක්‍රොධය (1); උපනය්හන්ති, (තණ-පිදුරු ආදියෙන් කුණුමස් වසා වෙළන්නවුන් මෙන්) නැවත නැවත සිත බඳිත්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං, (එක වරකද උපන්) ඒ වෛරය; න සම්මති, නො සන්සිඳෙන්නේය; (නැවත නැවත වැඩෙන්නේයි).

4. මං, මට, අක්කොච්ඡි, ආක්‍රොශ කෙළේයයි ද, හෙවත් ජාත්‍යාදියෙන් ගටා බිණීයයි ද; මං, මට, අවධි, (අතින් පයින් දණ්ඩෙන් සැතින්) පහළේයයි ද; මං, මා; අජිනි, (කූළුදෙස් කියවීම් ආදි විසින්) දිනීයයි ද; මෙ, මාගේ උපභොග-පරිභොග වස්තු; අහාසි, පැහැර ගත්තේයයි ද; යෙ, යම් ගෘහස්ථප්‍රව්‍රජිත කෙනෙක්; තං, ඒ (ආක්‍රොශාදිය කරණකොට උපන්) ක්‍රොධය; න උපනය්හන්ති, (අමනස්කාර වශයෙන් හෝ පෙර මා අනුන්ට කී දෙය කළ දෙය දූත් මා පිළුවන්නේයයි කර්මප්‍රත්‍යවෙක්ෂාවශයෙන් හෝ) (2) සිත නො බඳිත්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං, (ප්‍රමාදදොෂයෙකින් ඉපද ගියාවූ ද) ඒ වෛරය; උපසම්මති, (නිරින්ධනවහ්නියක් මෙන්) සන්සිඳෙන්නේය.

5. ඉධ, මේ සත්වලොකයෙහි; වෙරානි, (අනත්ථං මෙ අචරි යනාදිනව ආඝාතවස්තූන් කරණකොට උපන්) වෛරයෝ; වෙරෙන, වෛරයෙන්; කුදාචනං, කිසිකලෙක්හි දු, න සම්මන්ති, නො සන්සිඳෙන්නාහ, (කෙළ-මුකුණු-මළ-මූත්‍රාදි අශුචි වැකිතැන් එම කෙළ-මුකුණු-මළ-මූත්‍රාදි අශුචියෙන් සෝදව පිරිසිදු නොකට හැක්කාසේ බිණුවහුට බැණ ඇන්නහුට ඇණ බැත්දහු බැඳ වෛරයෙන් වෛරයෝ සන්සිඳුවිය නොහැක්කාහ); අවෙරෙන ච, අවෛරයෙන් ම; සම්මන්ති, සන්සිඳෙන්නාහ; (කෙළ-මුකුණු-මළ-මූත්‍රාදි අශුචි වැකිතැන් පිරිසිදු පැනින් සෝදව පිරිසිදු කරන්නාසේ අවෛරයෙන් ක්ෂාන්ති-මෛත්‍රී යොනිසොමනස්කාරයෙන් වෛරයෝ සන්සිඳෙන්නාහ); එසො, මේ (අවෛරයෙන් වෛර සන්සිඳවීම) තෙම; සනන්තනො ධම්මො, පුරාතනවූ (බුදු-පසේබුදු-මහරහතුන්

(1) මේ පෙළ අට්ඨුවාහයයි, මේ සන්නයෙහි—'වෛරය.'

(2) "අසතිඅමනසිකාරවසෙන වා කම්මපච්චවෙක්ඛණවසෙන වා" යනු පෙළ අට්ඨුවායි—සිහි නො එළවීම් මෙනෙහි නොකිරීම් වසයෙන් හෝ කම පසක්කිරීම් වසයෙන් හෝ යනු භාවයි. මේ සන්නයෙහි 'අමති' යන්නෙහි භාවය 'හෝ' යන නිපාතයෙන් හැඟේ හයි.

**6. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,**
**යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.**

**7. සුභානුපස්සිං (1) විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං,**
**භොජනම්හි ච අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං,**
**තං වෙ පසහති මාරො වාතො රුක්ඛංව දුබ්බලං.**

විසින් පුරුදුකොට ආ) ගුණ ධර්මයෙකි; නොහොත්; එසො; සනන්තනො ධම්මො, (අවෛරයෙන් වෛර සන්සිඳවීමයයි කියන ලද) මේ පුරාතනධර්මය තෙම බුදු-පසේබුදු-මහරහතන් විසින් ගියාවූ මඟෙකි.

6. එහි, මේ සඟමැද කොලාහල කරන්නාවූ; පරෙ, පණ්ඩිත-ජනයන් කෙරෙන් අන්‍යවූ කලහකාරකජනයෝ; මයං; අපි; යමා-මසෙ, නසුම්හයි,(=සතතයෙන් හැමවේලෙහි ම මරුමුඛයට යම්හයි; න විජානන්ති, නො දන්නාහ, හෙවත් නො සලකන්නාහ; තත්ථ, ඒ කලහකාරකජනයන් අතුරෙහි; යෙ ච, යම් පණ්ඩිතජනකෙනෙක් වනාහි; විජානන්ති, අපි සතතයෙන් හැම්වේලෙහි ම මරුමුඛයට යම්හයි දනිද්ද, (දැන කලහ සන්සිඳවීමට යත්න කෙරෙද්ද); තතො, ඒ (ඔවුන්ගේ) සම්‍යක්ප්‍රතිපත්තිය හෙතුකොටගෙණ; මෙධගා, කල-හයෝ; සම්මන්ති, සන්සිඳෙන්නාහුයි. නොහොත්; පරෙ, ("මහණෙනි කලහ-විග්‍රහ-විවාද නො කරව සමගිවව" යනාදීන් මා විසින් අවවාද කරණලදුව ද මාගේ අවවාද නොපිළිගත් බැවින්)අමාමකවූ; (=මාගේ නො වන්නාවූ) කලහකාරක භික්ෂූහු; මයං, අපි; එත්ථ, මේ සඟමැද; යමාමසෙ, (ඡන්දාදිවසයෙන් මිථ්‍යාග්‍රහණය කොට) කලහ-විග්‍රහවෘද්ධියට යත්න කරම්හයි; න විජානන්ති, නොදන්නාහ; තත්ථ, ඒ කලහකාරකවූ තොප හැමදෙනා අතුරෙහි; යෙ ච, යම් පණ්ඩිතපුරුෂකෙනෙක් වනාහි; විජානන්ති, පෙර අපි ඡන්දාදි-වසයෙන් මිථ්‍යාග්‍රහණයකොට කලහ-විග්‍රහවෘද්ධියට ව්‍යායාම කරන්-නෙමෝ නොනුවණින් පිළිපදුම්හයි දැන් දනිද්ද; තතො, ඒ පණ්ඩිත-පුරුෂයන් හෙතුකොටගෙණ හෙවත් ඒ නුවනැත්තන් නිසා; මෙධගා, නොනුවණින් උපන් කලහයෝ; සම්මන්ති, සන්සිඳෙන්-නාහුයි.

7. සුභානුපස්සිං විහරන්තං, (ඉෂ්ටාලම්බනයෙහි චිත්ත විහිදූ රූව යහපත, අත්ල-පත්ල යහපත,තන-බඩ තුරු යහපත,මුහුණ යහපත, දත් යහපත, මූව යහපත, ඇස් යහපත, කණ් යහපත යනාදීන් නිමිත්තානුව්‍යඤ්ජනග්‍රහණය කොට) විසභාග අරමුණු ග්‍රහවශයෙන් අනුවබලමින් වසන්නාවූ; ඉන්ද්‍රියෙසු අසංවුතං, එහෙයින් ම (චක්ඛුන්ද්‍රිය-සොතින්ද්‍රිය-ඝාණින්ද්‍රිය-ජිව්හින්ද්‍රිය- කායින්ද්‍රිය- මනින්ද්‍රියයි

(1) සුභානුපස්සී.

8. අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං,
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං,
තං වෙ නප්පසහති මාරො වාතො සෙලං'ව පබ්බතං:

---

කියනලද) සසිඳුරන් කෙරෙහි සංවරයක් නැත්තාවූ,(=සම්වෘතකවාටයෙන් අපිහිතවූ ද්වාරයන් ඇතිබැවින් චක්ෂුරාදි සඳොර නොරක්නාවූ); භොජනම්හි ච අමත්තඤ්ඤුං, ආහාරයෙහි ද මාත්‍රාඥ නොවූ, (=ආහාර පිරියෙස්නෙහි ද පිළිගැන්මෙහි ද වැළඳීමෙහි ද පරහට දීමෙහි ද පමණ නොදන්නාවූ) නොහොත් (භොජන මුඛයෙන් වදුරණලද සතර පසය නො දස්විකා වලඳකරණ හෙයින් ද කුලන් සඟන්නට දීමෙන් කුලදූසනයට පමුණුවන හෙයින් ද සිල්වත්නට දුන් නො එසේවූවානට දීමෙන් අට්ඨානනියොජනයට පමුණුවන හෙයින්ද) භොජනයෙහි පමණ නොදන්නාවූ, නොහොත් (මේ භොජනය එක්විසි අනෙස්නෙන් උපදවනලද හෙයින් ධාර්මික නොවෙයි, මේ භොජනය පිණ්ඩපාතචර්‍ය්‍යාදියෙන් දැහැමින් සෙමින් උපදවනලද හෙයින් ධාර්මිකයයි) භොජනයාගේ කප්පියාකප්පිය භාවය නොදැන වළඳන හෙයින් භොජනයෙහි පමණ නොදන්නාවූ; කුසීතං, (කාමවිතර්ක-ව්‍යාපාදවිතර්ක-විහිංසාවිතර්කයන්ගේ වසන හෙයින්) කුසීතවූ, හෙවත් ග්‍රන්ථධුරයෙහි ද විදර්ශනාධුරයෙහි ද (1) වත්පිළිවෙත් පිරීමෙහි ද මැලිවූ; හීනවීරියං, සතරඉරියව්වෙහි ම වීර්‍ය්‍යහීනවූ (=වත්පිළිවෙත් පුරණ ආජීව පිරිසිදු කරණ කායිකවීර්‍ය්‍යයෙන් ද කෙලෙසුන් තවන කුසල්දම් වඩන චෛතසික්වීර්‍ය්‍යයෙන් ද යුක්තනොවූ); තං, ඒ මෙබඳු පුද්ගලයා; මාරො, ඔහු සන්තානයෙහි බලවත්ව උපන් කෙලශමාර තෙම; වෙ, ඒකාන්තයෙන්; පසහති, මැඩපවත්වන්නේයි, (=අභිභවනයකොට නොබෝ කලකින් ඔහු සස්නෙන් පිරිහෙළා පියන්නේයි); කුමක් මෙන් ද යත්? වාතො, ප්‍රචණ්ඩවාතය තෙම; දුබ්බලං රුක්ඛං ඉව, ප්‍රපාතයෙක්හි සිටි දුර්වල රුකක් (මුලින් උපුටා හෙළන්නාක්) මෙනි.

8. අසුභානුපස්සිං විහරන්තං,(උද්ධුමාතකාදි දසඅසුභයන් අතුරෙන් එක්තරා) අසුභයක් අනුව බලමින් වසන්නාවූ, නොහොත් කෙස්-ලොම්-නිය-දත් ආදිවූ දෙතිස්කුණුකොටසුන් (වර්ණ-සණ්ඨාන-දිසොකාස-පරිච්ඡෙද වශයෙන්) පිළිකුල් සේ මෙනෙහි කෙරෙමින් වසන්නාවූ; ඉන්ද්‍රියෙසු සුසංවුතං,(එහෙයින් ම චක්ඛුන්ද්‍රිය-සොතින්ද්‍රිය-ඝාණින්ද්‍රිය-ජිව්හින්ද්‍රිය-කායින්ද්‍රිය-මනින්ද්‍රිය යි කියනලද) සසිඳුරන්

---

(1) ඇතැම් පොත්හි 'වාසධුරයෙහිද' ඇතැම් පොතක 'වනවාසධුරයෙහිද'

## 9. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති, අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

කෙරෙහි සුසංවෘතවූ,(=ඉෂ්ටාලම්බනසමායොගයක් ඇති කල්හි "එසා සුභා ප්‍රාසාදිකා" යනාදි විසින් නිමිත්තග්‍රහණයක් ද 'එතිස්සා හත්ථා සොභනා, පාදා සොභනා, මුඛං සොභනං" යනාදි විසින් අනුව්‍යඤ්ජනග්‍රහණයක්ද නොකොට සමාධිකවාටයෙන් සුපිහිතවූ ද්වාරයන්ඇති බැවින් චක්ෂුරාදි සදොර සකස්කොට රක්නාවූ); භොජනම්හි ච මත්තඤ්ඤුං, ආහාරයෙහි ද මාත්‍රඥවූ, (=ආහාර පිරියෙස්මෙහි ද පිළිගැන්මෙහි ද වැළඳීමෙහි ද පරහට දීමෙහි ද පමණ දන්නාවූ), නොහොත් භොජනමුඛයෙන් දක්වනලද සතරපසය ඒ ඒ පසයට නුදුන් වඳුල පස්විකිණෙන් පස්විසා වැළඳීමෙන් ද, කුලදූසනාදි—ප්‍රත්‍යාගතියොජනයට නොපැමිණවීමෙන් ද භොජනයෙහි පමණ දන්නාවූ; නොහොත් (මේ භොජනය එක්විසිඅනෙසනයෙන් උපදවනලදහෙයින් ධාර්මික නොවෙයි මේ භොජනය පිණ්ඩපාතචර්යාදියෙන් දැහැමින් සෙමින් උපදවනලද හෙයින් ධාර්මිකයයි) භොජනයාගේ කප්පියාකප්පියභාවය දැන අකැප බොජුන් දුරු කොට කැප බොජුන් වැළඳීමෙන් ද ආහාරයෙහි පමණ දන්නාවූ; සද්ධං, කර්මය ද කර්මඵලය ද හැදිනීම ලක්‍ෂණකොට ඇති ලෞකික-ශ්‍රද්ධාවෙන් ද, රත්නත්‍රයෙහි අචලප්‍රසාදයයි කියනලද ලොකොත්තර-ශ්‍රද්ධාවෙන් ද යුක්තවූ; ආරද්ධවීරියං, සතර ඊර්යාපථයෙහි වඩනලද වීර්ය ඇති,(=වත්පිළිවෙත් පුරණ ආජීව පිරිසිදු කරණ කායික වීර්ය-යෙන් ද කෙලෙසුන් තවන කුසල්දම් වඩන චෛතසිකවීර්යයෙන් ද යුක්තවූ); තං, ඒ මෙබඳු පුද්ගලයා; මාරො, (ඔහු සන්තානයෙහි උප-දනාවූ ද දුර්වලවූ) ක්ලේශමාර තෙම; වෙ, ඒකාන්තයෙන්; නප්පස-හති, මැඩ නොපවත්වන්නේයි, (ඔහු අලලන්නට කම්පාකරන්නට සමර්ථ නොවන්නේයි); කුමක් මෙන් ද යත්? සෙලං පබ්බතං, ඝන-ශෛලපර්වතයක් (කම්පාකරන්නට අසමර්ථවූ); වාතො ඉව, (මඳමඳව ගමන්නාවූ දුර්වල) පවනක් මෙනි.

9. යො, යම් පුද්ගලයෙක් තෙම; අනික්කසාවො, නිෂ්කාෂාය නොවූයේ, (=රාගාදිකෂාය සහිතවූයේ); දමසච්චෙන, ඉන්ද්‍රියදමනයෙන් ද පරමාර්ථසත්‍යපාක්ෂිකවූ වාක්සත්‍යයෙන් ද; අපෙතො, පහවූයේ; කාසාවං වත්ථං, කාෂායවස්ත්‍රය; පරිදහෙස්සති, හඳින් පොරෝණේ වේද; සො, මෙබඳුවූ ඒ පුද්ගල තෙම; කාසාවං, (බුද්ධ-ප්‍රත්‍යෙකබුද්ධ-මහරහතන්ගේ ධ්වජවූ) කාෂායවස්ත්‍රධාරණයට; න අරහති, සුදුසු නොවන්නේයි.

**10. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,**
**උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති.**

**11. අසාරෙ සාරමතිනො සාරෙ චාසාරදස්සිනො,**
**තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසඞ්කප්පගොචරා.**

**12. සාරඤ්ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො,**
**තෙ සාරං අධිගච්ඡන්ති සම්මාසඞ්කප්පගොචරා.**

---

10 යො ච, යම් ආර්‍ය්‍යපුද්ගලයෙක් වනාහි; වන්තකසාවස්ස, ආර්‍ය්‍යමාර්ගඥානාම්බුවයෙන් නගාපියනලද රාගාදිකෂායය ඇත්තේ වේ ද, හෙවත් චතුර්විධමාර්ගයෙන් ප්‍රහීණවූ රාගාදිසකලක්ලේශයන් ඇත්තේ වේ ද; සීලෙසු, චතුපාරිසුද්ධිසීලයෙහි; සුසමාහිතො, මනාව පිහිටියේ වේ ද; දමසච්චෙන, ඉන්ද්‍රියදමනයෙන් ද දුඃඛ-සමුදය-නිරොධ-මාර්ගයයි කියනලද චතුරාර්‍ය්‍යසත්‍යයෙන් ද; උපෙතො, යුක්ත ද; සො, මෙබඳු ඒ පුද්ගල තෙම, වෙ, එකාන්තයෙන්; කාසාවං, කාෂායවස්ත්‍රධාරණයට; අරහති, සුදුසුයි.

11. අසාරෙ, (චීවරාදිචතුර්විධප්‍රත්‍යය, මිච්ඡාදිට්ඨි-මිච්ඡාසඞ්කප්පාදි අට හා මිච්ඡාඤාණ-මිච්ඡාවිමුත්තියයි කියනලද දශවස්තුක (1) මිථ්‍යාදෘෂ්ටිය, තදුපනිශ්‍රයවූ ධර්මදෙශනාය යන මේ) අසාරයෙහි, සාරමතිනො, මේ සාරය යන දෘෂ්ටි ඇත්තාවූ; සාරෙ ච, (සම්මාදිට්ඨි-සම්මාසඞ්කප්පාදි අටහා සම්මාඤාණ-සම්මාවිමුත්තියයි කියනලද දශවස්තුකසම්‍යග්දෘෂ්ටිය, තදුපනිශ්‍රයවූ ධර්මදෙශනාය යන මේ) සාරයෙහි ද; අසාරදස්සිනො, මේ අසාරය යන දෘෂ්ටි ඇත්තාවූ; මිච්ඡාසඞ්කප්පගොචරා, (කාමවිතර්ක-ව්‍යාපාදවිතර්ක-විහිංසාවිතර්ක වශයෙන්) මිථ්‍යාසඞ්කල්පය ම ගොචර කොට ඇත්තාවූ; තෙ, ඒ අඥානජනයෝ; සාරං, (ශීලසාර-සමාධිසාර-ප්‍රඥාසාර-විමුක්තිසාර-විමුක්තිඥානදර්ශනසාර-නිර්වාණසාර යන මේ) ලෞකිකලොකොත්තරධර්මසාරයට; නාධිගච්ඡන්ති, නොපැමිණෙන්නාහුයි.

12. සාරඤ්ච, (දශවස්තුකසම්‍යග්දෘෂ්ටිය, තදුපනිශ්‍රයවූ ධර්මදෙශනාය, ශීලසාරාදි පඤ්චවිධධර්මසාරය, නිර්වාණසාරය යන මේ සියලු) සාරය ද; සාරතො ඤත්වා, (මේ සාරයයි) සාරහෙයින් දැන; අසාරඤ්ච, (චතුර්විධප්‍රත්‍යය, දශවස්තුකමිථ්‍යාදෘෂ්ටිය, තදුපනිශ්‍රයවූ ධර්මදෙශනාය යන මේ) අසාරය ද; අසාරතො, ඤත්වා, (මේ අසාරයයි) අසාර හෙයින්

---

(1) දම්පියා අටුවා සන්නයෙහි "නත්ථි දින්නං නත්ථි යිට්ඨං"යනාදීන් දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය ද "අත්ථි දින්නං අත්ථි යිට්ඨං"යනාදීන් දශවස්තුක සම්‍යග්දෘෂ්ටියද දක්වනලදී.

**13. යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති,**
**එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.**

**14. යථාගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති,**
**එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති.**

**15. ඉධ සොචති පෙච්ච සොචති පාපකාරී උභයත්ථ සොචති,**
**සො සොචති සො විහඤ්ඤති දිස්වා කම්මකිලිට්ඨමත්තනො.**

---

දූත වසන්නාවූ; සම්මාසඞ්කප්පගොචරා, (නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය, අව්‍යාපාදසඞ්කල්පය, අවිහිංසාසඞ්කල්පය යන ත්‍රිවිධ) සම්‍යක්-සඞ්කල්පය ම ගොචරකොට ඇත්තාවූ; තෙ, ඒ ප්‍රාඥයෝ; සාරං, ශිලසාර-සමාධිසාර-ප්‍රඥාසාර-විමුක්තිසාර-විමුක්තිඥානදර්ශනසාරයව ද පරමාර්ථසාරයයි කියනලද නිර්වාණසාරයව ද; අධිගච්ඡන්ති, පැමිණෙත්තාහුයි.

13. දුච්ඡන්නං, නො සකස්කොට සොයනලද්දාවූ, හෙවත් කුඩු-මහත් සිදුරු පෙණෙන සේ විරලකොට සොයනලද්දාවූ; අගාරං, තෘණකුටි ආදි යම් කිසි ගෙයක්; වුට්ඨී, වැසි ධාරා තොම; යථා, යම්සේ; සමතිවිජ්ඣති, විශෙෂයෙන් ම විනිවිදිනී වේද; එවං, එපරිද්දෙන් ම; අභාවිතං චිත්තං, (සමථ-විදර්ශනාභාවනාවෙන්) අභාවිතවූ සිත; රාගො, (සුභ අරමුණෙහි අයොනිශොමනසිකාරබල-යෙන් උපදනාවූ) කාමරාගය තෙම; සමතිවිජ්ඣති, වෙසෙසින් (=ඉතාම) විනිවිද පවත්නේයි.

14. සුච්ඡන්නං, සකස්කොට සොයනලද්දාවූ, (=වල ගොඩ නො කොට සම්සේ ඝනකොට සොයනලද්දාවූ); අගාරං, තෘණකුටි ආදි යම් කිසි ගෙයක්; වුට්ඨී, වැසි ධාරා තොම; යථා, යම්සේ; න සමති-විජ්ඣති; වෙසෙසින් (=ඉතාම) විනිවිදිනී නොවේ ද; එවං, එපරිද්-දෙන් ම, සුභාවිතං චිත්තං, (සමථ-විදර්ශනාභාවනාවෙන්) මනාකොට භාවිතවූ සිත; රාගො, (රූපාදි අරමුණු විෂය කොට උපදනාවූ) කාම-රාගය තෙම; න සමතිවිජ්ඣති, අතිශයින් විනිවිද නොපවත්නේයි.

15. පාපකාරී, (ප්‍රාණවධාදි නොයෙක්) පව්කම් කරණ සුලුවූ පුද්ගල-තෙම; ඉධ සොචති, (සෙසුදවස් ශොක නොකළ නමුත් මරණ කාල-යෙහි ගතිනිමිත්තවශයෙන් එළඹ සිටි නරකවහ්න්‍යාදිය දැක මා විසින් කුසල් නොකොට ගන්නාලද, පව් ම කරණ ලදැයි මෙසේ කර්මානුස්මරණවශයෙන්) මෙලොව ම එකාන්තයෙන් ශොක කරන්-නේය; පෙච්ච සොචති, පරලොව (අපාදුක්විඳිමින් විපාකානුභවන-වශයෙන්) ශොක කරන්නේය; උභයත්ථ සොචති, (මෙසේ පාපකාරී-පුද්ගල තෙම) දෙලොව ම ශොක කරන්නේය; සො, ඒ පාපකාරී-පුද්ගල තෙම; අත්තනො, තමාගේ, හෙවත් තමා විසින් කරණලද්දාවූ;

16. ඉධ මොදති පෙච්ච මොදති කතපුඤ්ඤො උභයත්ථ මොදති,
සො මොදති සො පමොදති දිස්වා කම්මවිසුද්ධිමත්තනො.

17. ඉධ තප්පති පෙච්ච තප්පති පාපකාරී උභයත්ථ තප්පති;
පාපං මෙ කතන්ති තප්පති භිය්‍යො තප්පති දුග්ගතිං ගතො.

18. ඉධ නන්දති පෙච්ච නන්දති කතපුඤ්ඤො උභයත්ථ නන්දති,
පුඤ්ඤං මෙ කතන්ති නන්දති භිය්‍යො නන්දති සුග්ගතිං ගතො.

---

කිලිට්ඨං කම්මං දිස්වා, කිලුටුවූ තමාගේ කර්මය දැක; සොචති, (මෙලොව ම) ශොක කරන්නේය; සො, හෙතෙම; විහඤ්ඤති, (පරලොව අපාදුක් විඳිමින්) වෙසෙසින් පෙළෙන්නේයි.

16. කතපුඤ්ඤො, (දානසීලාදිවශයෙන්) කරණලද (නොයෙක්) පින්කම් ඇති පුද්ගල තෙම; ඉධ, මෙලොවිහි ම; මොදති, (මා විසින් පව් නොකරණලද පින්කම් කරණලදැයි කුශලකර්මානුස්මරණයෙන්) සතුටුවන්නේය; පෙච්ච, පරලොවිහි ද; මොදති, (දිව්‍යමනුෂ්‍යසම්පත් අනුභව කරන්නේ විපාකානුභවයෙන්) සතුටුවන්නේය; උභයත්ථ මොදති, (කුශලකාරීවූ පුද්ගලතෙම මෙසේ දෙලොවිහි ම) සතුටුවන්නේය; සො, ඒ (කළ පින්කම් ඇති) සත්පුරුෂ තෙම; අත්තනො, තමාගේ හෙවත් තමා විසින් කරණලද; කම්මවිසුද්ධිං දිස්වා, පුණ්‍යකර්මවිශුද්ධිය දැක; මොදති, (මෙලොවත්) සතුටු වන්නේය; සො, හෙතෙම; පමොදති, (පරලොවත් ස්වර්ගසම්පත් විඳිමින්) වෙසෙසින් සතුටුවන්නේයි.

17. පාපකාරී, (ප්‍රාණවධාදි නොයෙක්) පව්කම් කරණ සුලුවූ පුද්ගල තෙම; ඉධ, මේ ලොවිහි ම; තප්පති, (කර්මසන්තාපයෙන්) තැවෙන්නේය; පෙච්ච, පරලොවිහි ද; තප්පති, (විපාකසන්තාපයෙන්) තැවෙන්නේය; උභයත්ථ, මෙලෝ පරලෝ දෙක්හි ම, තප්පති, (උක්තප්‍රකාරවූ කර්මසන්තාප විපාකසන්තාපයෙන්) තැවෙන්නේය; මෙ, මා විසින්, පාපං කතං ඉති, පව්කරණලදැයි; තප්පති, (මෙලොව) තැවෙන්නේය; දුග්ගතිං ගතො, (පරලොව) දුගතියට ගියේ; භිය්‍යො තප්පති, (නරකාදි සතරඅපායෙහි අතිතීක්ෂ්ණවූ අනිෂ්ටවිපාකසන්තාපයෙන්) බොහෝ කොට තැවෙන්නේයි.

18 කතපුඤ්ඤො, (දානසීලාදිවශයෙන්) කරණලද පින්කම් ඇති පුද්ගල තෙම; ඉධ, මෙලොව ම; නන්දති, (කර්මනන්දනයෙන්) සතුටුවන්නේය; පෙච්ච, පරලොව ද; නන්දති, (විපාකනන්දනයෙන්) සතුටුවන්නේය; උභයත්ථ, මෙලෝ පරලෝ දෙක්හි; නන්දති, (කර්මනන්දනයෙන් ද විපාකනන්දනයෙන් ද සතුටුවන්නේය; මෙ, මා විසින්; පුඤ්ඤං කතං ඉති, පින්කරණලදැයි; නන්දති, මෙලොව සතුටුවන්නේය; සුග්ගතිං ගතො, සුගතියට ගියේ (=සප්තකාම-

19. බහුම්පි චෙ සහිතම්භාසමානො
න තක්කරො හොති නරො පමත්තො,
ගොපොව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති.

20. අප්පම්පි චෙ සහිතම්භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී,
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්තචිත්තො,
අනුපාදියානො ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොතීති.

යමකවග්ගො පඨමො.

---

ස්වර්ගයෙහි උපන්නේ); භිය්‍යො නන්දති, (අපරිමිතවිපාකසංඛ්‍යාතාශ්චර්යයන්) බොහෝකොට ම සතුටුවන්නේයි.

19. පමත්තො නරො, (සිල්වත්ව සිටත් කුකුළෙකු පියා පහරණ පමණ කලකුදු අනිත්‍යාදිවශයෙන් යොනිසොමනසිකාරයෙහි යුක්තප්‍රයුක්තව නො වසනහෙයින්) ප්‍රමත්ත පුද්ගල තෙම; සහිතං, ත්‍රිපිටක බුද්ධවචනය; බහුම්පි භාසමානො, බොහෝ කොට කියන්නේ ද; නොහොත් බහුම්පි, බොහෝවූ ද; සහිතං, ත්‍රිපිටක බුද්ධවචනය උගෙණ; භාසමානො, (උද්දෙස-පරිපුච්ඡාදිවශයෙන් ද උපනිසින්නකකථා-භුත්තානුමොදනාවශයෙන් ද සර්වරාත්‍රිකධර්මදෙශනාවශයෙන් ද අනුන්ට) කියන්නේ වී නමුත්; චෙ, ඉදින්; තක්කරො න හොති, ඒ නොකරන්නේ වී නම්;(ධර්මය අසා කාරකපුද්ගලයා විසින් යම් භාවනානුයොගයෙක් කටයුතු ද ඒ නො කරන්නේ වී නම්); පරෙසං ගාවො ගණයං ගොපො ඉව, අනුන්ගේ ගෙරින් රක්නාවූ ගොපල්ලා මෙන්; (හෙවත් දවස්බැල ගිවිස අනුන්ගේ ගෙරින් පාවාගෙණ දවස මුළුල්ලෙහි රැකබලා හවා ගෙණවුත් සවස හිමියන්ට ගැණ පාවාදීලා තමා විසින් ලැබියයුතු දවස් බැල පමණක් ම ලබන්නාවූ පස්ගෝරසයට ද ගවයන්ට ද හිමිනොවන්නාවූ ගොපල්ලා මෙන්); සාමඤ්ඤස්ස භාගවා න හොති, (හුදෙක් අනවැස්සන් කෙරෙන් වත්පිළිවෙත් පමණකට හිමි වත් මුත්) සතරමග සතරපලයයි කියනලද ශ්‍රාමණ්‍යයට හිමි නොවන්නේයි.

20. අප්පම්පි, ස්වල්පවූ ද; සහිතං, බුද්ධවචනය; භාසමානො කියන්නාවූ; හෙවත් ත්‍රිපිටක බුද්ධවචනයෙන් මදදෙයකු ද උගෙණ (එකුදුනිය සප්විරයන් මෙන්)එක ගාථාවකු දු ධර්මදේශනාවශයෙන් අනුන්ට) කියන්නාවූ පුද්ගල තෙම; චෙ, ඉදින්; ධම්මස්ස අනුධම්ම-

21. අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං,
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.

චාරී හොති, (සතරමග සතරපල නිවණැයි කියනලද නවලො-
කොත්තරධර්මයට අනුරූපවූ චතුපාරිශුද්ධිශීල-ත්‍රයොදශධුතාඞ්ග-
දශශුභකර්මස්ථානාදි ප්‍රභෙද ඇති පූර්වභාග ප්‍රතිපත්තිසංඛ්‍යාත) අනු-
ධර්මයෙහි පවත්නා සුලුවී නම්; රාගස්ස, (කාමරාග-රූපරාග-
අරූපරාගවශයෙන් ත්‍රිවිධවූ) රාගය ද; දොසස්ස, (මේ ශත්‍රු-
නාසිත්වයි යනාදීන් සත්වයන් විෂයකොට හෝ යම්කිසි පරිච්ඡෙද-
කින් යම්කිසි අරමුණක් විෂය කොට හෝ ගැටෙමින් උපදනා)
ද්වෙෂය ද; මොහස්ස, (දුක්ඛයෙහි සුඛයයි මෙසේ සංඥාවිපර්‍යාස-
චිත්තවිපර්‍යාස වශයෙන් ප්‍රවෘත්තවූ) සම්මොහය ද; පහාය, (ශ්‍රොතා-
පත්ති මාර්ගාදීන්ට අනුරූපපරිද්දෙන් චතුර්විධමාර්ගයෙන්) ප්‍රහා-
ණය කොට; සම්මප්පජානො, පිරිසිඳදතයුතුවූ ධර්මයන් මනා-
කොට දන්නාවූ; (හෙවත් කාමරූපාරූපභූමිවශයෙන් ත්‍රෛභූමිකවූ
උපාදානස්කන්ධසංඛ්‍යාතවෘත්තය කුත්සිතාර්ථයෙන් දුඃඛසත්‍ය නම්
වෙයි, කාමතෘෂ්ණාදිවශයෙන් අෂ්ටොත්තරශතප්‍රභෙදවූ තෘෂ්ණා-
තොම දුඃඛොත්පත්තියට කාරණ හෙයින් සමුදය සත්‍ය නම් වෙයි,
මාර්ගඵලයන්ට ආලම්බනවූ ශාන්තිලක්ෂණවූ නිර්වාණය දුක්ඛනිරොධ-
යට නිමිත්ත හෙයින් නිරොධසත්‍ය නම් වෙයි, උපාදානස්කන්ධ-
සංඛ්‍යාතලොකසමතික්‍රමණය කරණ හෙයින් ලොකොත්තරවූ
අෂ්ටාඞ්ගිකාර්යමාර්ගය ක්ලෙශමාරණය කෙරෙමින් යනං හෙයිනුදු
නිර්වාණාර්ථීන් විසින් මාර්ගණය කටයුතු බැවිනුදු මාර්ගසත්‍ය නම්
වෙති, දුඃඛසත්‍යය පරිඥෙයය, සමුදයසත්‍යය ප්‍රහාතව්‍යය, නිරොධ-
සත්‍යය සාක්ෂාත්කර්තව්‍යය, මාර්ගසත්‍යය භාවිතව්‍යයයි මනාකොට
දන්නාවූ); සුවිමුත්තචිත්තො, (තදඞ්ගවිමුක්ති-විෂ්කම්භනවිමුක්ති-
සමුච්ඡෙදවිමුක්ති-පටිප්පස්සද්ධිවිමුක්ති-නිස්සරණවිමුක්තියයි කියන-
ලද පඤ්චවිමුක්තීන්ගේ වශයෙන් සකලක්ලෙශයන් කෙරෙන්)
මනාව මිදුනු සිත් ඇත්තාවූ; ඉධවා, මෙලොව පවත්නාවූ ද; හුරං
වා; පරලොව (වන්නාවූ ද ආධ්‍යාත්මික බාහ්‍යවූ ස්කන්ධධාත්වායතන
යන්); අනුපාදියානො, කාමූපාදානාදිචතුරුපාදානයන් හෙතුකොට
ගෙණ නිත්‍ය-සුඛ-ශුභ-ආත්ම වශයෙන් නොගන්නාවූ; සො, ඒ
(මහාක්ෂීණාශ්‍රවවූ සකලලොකෛක පුණ්‍යක්ෂෙත්‍රවූ) චතුර්ථාර්‍ය-
පුද්ගල තෙම; සාමඤ්ඤස්ස භාගවා හොති, සතරමග-සතරපලය;
ශීලාදි පඤ්චවිධ අශෛක්ෂ ධර්මස්කන්ධයයි කියනලද ශ්‍රාමණ්‍යගුණ-
යට හිමි වන්නේයි.

යමකවග්ගො පඨමො.

---

1. අප්පමාදො, (සුචරිතධර්මවිෂයෙහි ස්මෘති අවිප්‍රවාසයයි කියන-
ලද සියලු කුශලධර්මයන්ට ද ඓහලෞකික පාරලෞකික ආත්මාර්-

**22. එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා,
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා.**

---

පරාජයට ද මූලකාරණවූ) ප්‍රමාදයෙහි නොපමා බව; අමතපදං, (තමා ජරාමරණ රහිත [illegible] ද අධිගතවූ ආර්‍ය්‍යයන්ගේ ජරාමරණ නසන හෙයින් ද) [illegible]සි කියනලද නිර්වාණයාගේ අධිගමයට කාරණය; පමාදො, (සුචරිතධර්මයෙහි සමෘතිවිප්‍රවාසයයි කියනලද ප්‍රමාදභාවය; මච්චුනො පදං, (ප්‍රමත්තයා ජාතිය නොඉක්මවන බැවින් ජාතයාහට ජරාමරණ ඒකාන්ත බැවින් සත්වනිර්වෙදසඞ්ඛ්‍යාත) මරණයට කාරණය; අප්පමත්තා, (කල්‍යාණධර්මයෙහි) අප්‍රමත්තසත්වයෝ; න මීයන්ති, නොමියන්නාහ; (මෙසේ කීහෙයින් අප්‍රමත්තසත්වයෝ අජරාමරයහයි සැලකියයුතු නොවෙයි, අජරාමර සත්වයෙක් නම් නැත, ප්‍රමත්තයාහට සංසාරවෘත්තය අපරිච්ඡින්නය, අප්‍රමත්තයාහට පරිච්ඡින්නය, එහෙයින් ප්‍රමත්තසත්වයෝ ජාති ආදියෙන් අපරිමුක්ත බැවින් ජීවත් වන්නාහු ද මළාහු නම් වෙති, අප්‍රමත්තසත්වයෝ වනාහි අප්‍රමාද ලක්ෂණය වඩා වහාම මාර්ගඵලාධිගමය කොට දෙවන තුන්වන අත්බැව නොඋපදනාහ, එහෙයින් ඔහු නොමළාහු ද මළාහු ද ජීවත්වන්නාහු නම් වෙති); යෙ, යම් සත්වකෙනෙක් වනාහි; පමත්තා, කල්‍යාණධර්මයෙහි ප්‍රමත්තයෝද; තෙ, ඔහු; යථා මතා, (ප්‍රමාද මරණයෙන් මළ හෙයින්) මළවුන් බඳුවූවෝයි; (යම්සේ මළාහු ජීවිතෙන්ද්‍රිය රහිත හෙයින් දරදණ්ඩක් මෙන් අචේතනයෝ ද එසේම දන් දෙම්හ, සිල් රකුම්හ, පෙහෙවස් වසම්හ, බණ අසම්හයි යන එක ද සිතක් නොඋපදවන්නාවූ ගෘහස්ථයෝ ද ආචාර්‍ය්‍ය උපාධ්‍යාය වත් ආදිය් පුරම්හ, ධුතාඞ්ගසමාදන්වම්හ, භාවනා කරම්හයි යන එක ද සිතක් නොඋපදවන ප්‍රව්‍රජිතයෝ ද අචේතනත්වයෙන් මළවුන් හා නිර්විශෙෂ හෙයින් මළවුන් හා සමයෝයි සේයි).

2. එතං, මේ (නොමියන මියන) කාරණය, නොහොත් ප්‍රමත්තයාහට සසරින් මිදීම නැත අප්‍රමත්තයාහට ඇත යන මේකාරණය; විසෙසතො ඤත්වා, විශෙෂයෙන් දැන; අප්පමාදම්හි, නොපමා බව පිහිටියාවූ; පණ්ඩිතා, නුවණැත්තාහු; අප්පමාදෙ, තමන්ගේ අප්‍රමාදගුණයෙහි; පමොදන්ති, සතුටු වෙති; අරියානං, (බුද්ධ-ප්‍රත්‍යෙකබුද්ධ-ශ්‍රාවක-සඞ්ඛ්‍යාත) ආර්‍ය්‍යයන්ගේ; ගොචරෙ, (චතුසතිපට්ඨානාදි භෙද ඇති සත්තිස් බොධිපාක්ෂිකධර්මය නවලොකොත්තරධර්මය යන) ගොචරයෙහි; රතා (හොන්ති), ඇලුනාහු වෙත්.

**23. තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා,**
**ඵුසන්ති ධීරා නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.**

**24. උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො,**
**සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසොභිවඩ්ඪති.**

---

3. ඣායිනො, (රූපාරූප සමාපත්ති සඞ්ඛ්‍යාත ආලම්බනොපනිධ්‍යානය-විදර්ශනා-මාර්ගඵල සඞ්ඛ්‍යාත ලක්ෂණොපනිධ්‍යානය යන ද්විප්‍රකාරධ්‍යානයෙන්) ධ්‍යායිවූ, හෙවත් සමාපත්තිවිදර්ශනාභාවනාවෙහි යුක්තවූ ප්‍රයුක්තවූ; සාතතිකා, (අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත්මාර්ගප්‍රතිලාභය දක්වා) සතතයෙන් ප්‍රවෘත්තවූ කායිකචෛතසිකවීර්‍ය්‍ය ඇති; නිච්චං, සතතයෙන්; දළ්හපරක්කමා, (පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් යම් නිර්වාණයක් පැමිණියයුතු ද ඒ නිර්වාණය නොපැමිණ අතරෙහි නොනවතිමියි මෙසේ පැවැත්තාවූ) දෘඪවීර්‍ය්‍යයෙන් සමන්විතවූ; තෙ ධීරා, ඒ ප්‍රාඥයෝ; යොගක්ඛෙමං, කාමයොගාදි සතර යොගයෙන් කෙසේත් නිර්භයවූ; අනුත්තරං, (තමහට අධිකතරවූ ලෞකිකලොකොත්තරධර්මයක් නැතිහෙයින්) අනුත්තරවූ; නිබ්බානං, (අත්‍යන්තශාන්ත වූ නිත්‍ය වූ ධ්‍රැව වූ) අමෘතමහානිර්වාණය; ඵුසන්ති, (සතරමඟ සතරඵලයයි කියනලද ඥානස්පර්ශනා-විපාකස්පර්ශනාවන් අතුරෙන් ආර්‍ය්‍යඵලසඞ්ඛ්‍යාත විපාක-ස්පර්ශනාවෙන්) ස්පර්ශනයකරත්නාහුයි-ආලම්බන කරණවශයෙන් නිවණට පැමිණෙත්නාහුයි සේයි.

4. උට්ඨානවතො, උට්ඨානසඞ්ඛ්‍යාත වීර්‍ය්‍යයෙන් යුක්තවූ; සතිමතො, ස්මෘතිසම්පන්නවූ, හෙවත් කුදුමහත් කටයුත්තෙහි එළඹ සිටිනා සිහි ඇති; සුචිකම්මස්ස, සුචිවූ (=නිර්දොෂවූ) කායකර්මාදිය ඇති; නිසම්මකාරිනො, (මෙය කළකල මෙවැනි වැඩෙක් අවැඩෙක් වෙයි කියා මෙසේ නිදන් බලා පිළිසම්හිරිවන් සේ සියලු කටයුතු) පරීක්ෂාකොට කරණ සුලුවූ; සඤ්ඤතස්ස ච, කායාදියෙන් සඤ්ඤතවූ, හෙවත් සංයතවූ කායවාක්කර්ම ඇති; ධම්මජීවිනො, ප්‍රාණවධාදියෙන් ද තුලාකූට-මානකූටාදියෙන් ද දුරුව කෘෂිවාණිජ්‍යකර්මාන්තාදි ධාර්මික ජීවිකාවෙන් (1) ජීවත්වන්නාවූ; අප්පමත්තස්ස, (කෘෂිවාණිජ්‍යකර්මාන්ත-රාජසෙවාදියෙහි) අප්‍රමත්තවූ පුරුෂයාගේ; යසො, ඓශ්වර්‍ය්‍ය-භොග-පරිවාර-සම්මානසඞ්ඛ්‍යාතවූ ද කීර්ත්තිවර්ණ-සඞ්ඛ්‍යාතවූ ද යසස; අභිවඩ්ඪති, ඔදවැඩි ඕගුද මෙන් විශෙෂයෙන් වඩනේයි.

---

(1) මේ අගාරිකයාහටයි, වෙදකම් දූතකම් ආදිය දුරුකොට දූතැමින් පැමිණ පිණ්ඩපාතචර්‍ය්‍යාවෙන් දිවිපැවැත්වීමවූ අනගාරිකයාගේ ධාර්මික ජීවිකාවද මෙහි පෙල අටුවාහි කියනලදී.

25. උට්ඨානෙනප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච,
දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරති.

26. පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මේධිනො ජනා,
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨංව රක්ඛති.

27. මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං.

---

5. උට්ඨානෙන, කායිකචෛතසිකවීර්‍යසඞ්ඛ්‍යාත උට්ඨානයෙන් ද; අප්පමාදෙන, සුචරිතධර්මවිෂයෙහි සමෘතිසම්පන්නත් බවයයි කියනලද අප්‍රමාදයෙන් ද; සඤ්ඤමෙන, චතුඃපාරිශුද්ධිශීලසඞ්ඛ්‍යාත කායවාක්සංයමයෙන් ද; දමෙන ච, (චක්ෂුරාදි සදොරට හමුවූ රූපාදි සඅරමුණෙහි ලොභද්වේෂමොහ නොඋපදවා යොනිසො අවජ්ජන් පැවැත්වීමයයි කියනලද) ඉන්ද්‍රියදමනයෙන් ද, හෙවත් මෙකියනලද සතරධර්මයන් කාරණකොටගෙණ; මෙධාවී, (ධර්මෝජස්ප්‍රඥයයි කියනලද විදර්ශනාඥානයෙන් සමන්විතවූ) ප්‍රාඥතම; යං, යම් ප්‍රතිෂ්ඨාවක්; ඔඝො, කාමොඝාදිවසයෙන් චතුර්විධවූ කෙලෙස් මහවතුර; න අභිකිරති, නො නසාද (නසාපිය නොහේද); තං දීපං, (අර්හත්ඵලසඞ්ඛ්‍යාතවූ) ඒ ප්‍රතිෂ්ඨාව; කයිරාථ, කරන්නේයි— (මෙකියනලද සතරගුණයෙන් යුක්තවූ ප්‍රාඥතම අගාධ අපාරවූ සංසාරසාගරයෙහි කෙලෙස් මහවතුරෙන් නසාපිය නොහැකිවූ රහත්ඵලයයි කියනලද ප්‍රතිෂ්ඨාව තමහට කොටගන්නට පොහොසත්වන්නේය යනු භාවයි.

6. බාලා, මෙලෝ පරලෝ වැඩ නොදන්නාවූ; දුම්මේධිනො ජනා, එහෙයින්ම නුවනැති සත්වයෝ; පමාදං අනුයුඤ්ජන්ති, ප්‍රමාදයෙහි ආදීනව නො දක්නාහු ප්‍රමාදයෙහි යෙදී පවත්නාහ, හෙවත් ප්‍රමාදයෙන් දවස් යවන්නාහ; මෙධාවී, (ධර්මෝජසප්‍රඥාවෙන් යුක්තවූ ප්‍රාඥතම වනාහි; අප්පමාදං, අප්‍රමාද බව; සෙට්ඨං ධනං ඉව, (කුලවංශාගතවූ) උත්තමරත්නයක් මෙන්; රක්ඛති, රක්නේය— යම්සේ ලෝවැස්සෝ මුතු මැණික් ආදි උතුම් ධන නිසා යහෙන් ජීවත්වම්හ, අඹු දරුවන් සුවසේ රකුම්හ, දන් පින් කරම්හයි මෙසේ ධනයෙහි අනුසස් දක්නාහු ධන රක්‍ෂා කෙරෙද්ද එසේම නුවනැති පුරුෂ ද නොපමා තැනැත්තෙත් ප්‍රථමධ්‍යානාදීන් පිළිලබයි සතර මග සතර පලයට ත්‍රිවිද්‍යාෂඩභිඥාවට සිව් පිළිසිඹියාවට පැමිණෙන්නේයයි අප්‍රමාදයෙහි අනුසස් දක්නේ උතුම් ධනයක් මෙන් නොපමා බව රක්නේයි යේයි.

7. පමාදං පමාබව, මා අනුයුඤ්ජෙථ, නගමක් පුරුදු කරන්නේය, හෙවත් පමාබැව්හි යෙදී නොඑයන්නේය; කාමරතිසන්ථවං, වස්තු-

28. පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො,
පඤ්ඤාපාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං,
පබ්බතට්ඨොව භුම්මට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති.

29. අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහුජාගරො,
අබලස්සංව සීඝස්සො හිත්වා යාති සුමෙධසො.

---

කාම කෙලශ කාම ශ්‍රීදක්ගි රතියයි කියනලද තෘෂ්ණාසංස්තවයෙහි; මා අනුයුඤ්ජථ, නහමක් යෙදෙන්නේය; අප්පමත්තො, එළඹ සිටි සිහි ඇති බැවින් නොපමාව; ඣායන්තො හි, (ආලම්බනොපනිජ්ඣාන ලක්ෂණොපනිජ්ඣානසඞ්ඛ්‍යාත) ශමථවිදර්ශනා භාවනා කරන්නාවූ පුද්ගල තෙම වනාහි; විපුලං සුඛං, මහත්වූ නිවන්සුවයට; පප්පොති, පැමිණෙන්නේයි.

8. පණ්ඩිතො, ප්‍රාඥවූ ආර්‍යශ්‍රාවක තෙම; යදා, යම්කලෙක්හි; අප්පමාදෙන, කුශලධර්මයෙහි සමෘතිසම්පන්නභාවයයි කියනලද අප්‍රමාද භාවයෙන්; පමාදං, සමෘතිවිප්‍රවාසසඞ්ඛ්‍යාත ප්‍රමාදය; නුදති, දුරුකෙරේද, (පුරාණජලයට අවකාශ නොදී ඒ යතා ගෙණ වදනාවූ නවදියවතුරක් මෙන් ප්‍රමාදයට අවකාශ නොදී ප්‍රමාදය මැඩගෙණ පවත්නේ වේ ද එකල්හි); පඤ්ඤාපාසාදං, දිවඇසැයි කියනලද අභිඥචිත්තසම්ප්‍රයුක්තවූ ප්‍රඥ නැමැති ප්‍රාසාදයට; ආරුය්හ, නැගී, හෙවත් දිව ඇස් ලැබීමට සුදුසු පිළිවෙත් පිරීමෙන් හිණෙකින් පහයකට නැගෙන්නාක්හු මෙන් නැගී; අසොකො, (අනාගාමි මාර්ගයෙන් ම උදුරා හරණලද ශොකශල්‍ය ඇති බැවින්) ශොකරහිතවූ; ධීරො, ප්‍රාඥවූ ඒ මහාක්ෂීණාශ්‍රව තෙම; සොකිනිං පජං, අනුද්ධෘතවූ ශොකශල්‍ය ඇති බැවින් ශොකීවූ ප්‍රජාව, හෙවත් චුතවන්නාවූ ද උපදනාවූ ද ශොක සහිතවූ සත්ත්වසමූහයා; අවෙක්ඛති, බලන්නේයි; කුමක්මෙන්ද යත්? භුම්මට්ඨෙ, බිම සිටියවුන් (සුවසේ බලන්නාවූ); පබ්බතට්ඨො ඉව, පර්වත මුදුනෙක්හි සිටි එකක්හු මෙන්; බාලෙ, (අසමුච්ඡින්නවූ වට්ටබීජ [8] ඇති හෙයින් චවමානවූ ද උත්පද්‍යමානවූ ද) බාලජනයන්; අවෙක්ඛති, දිව ඇසින් සුවසේ දක්නේයි.

9. පමත්තෙසු, (කල්‍යාණධර්මවිෂයෙහි සමෘතිවිප්‍රවාසය හෙතුකොටගෙණ) ප්‍රමත්තසත්ත්වයන් අතුරෙහි; අප්පමත්තො, සමෘතිවෛපුල්‍යයට පැමිණි බැවින් අප්‍රමත්තවූ; සුත්තෙසු, සමෘතිජාගර්‍යාභාවයෙන් සතර ඉරියව්වෙහි ම කෙලශනිද්‍රාවෙන්) නිදන්නාවූ සත්ත්වයන් අතුරෙහි; බහුජාගරො, මහත්වූ සමෘතිවෛපුල්‍යජාගර්‍යා–

---

(8) 'වර්ත්මබීජ' ඇතම්.

30. අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො,
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා.

31. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා,
සංයොජනං අණුං ථූලං ඩහං අග්ගීව ගච්ඡති.

32. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ.

අප්පමාද වග්ගො දුතියො.

---

වෙති සිටියාවූ, හෙවත් කෙලශනිද්‍රාවෙන් නොනිදන හෙයින් බහුල ජාගරියා ඇති: සුමෙධසො, සුන්දරවූ ප්‍රඥ ඇති මහාක්ෂීණශ්‍රව තෙම; අබලස්සං, කොරපා ඇති ජවහීනවූ දුබල අශ්වයකු හැරපියා යන්නාව; සීඝස්සො ඉව, ශීඝ්‍රවූ ජව ඇති සෛන්ධව අශ්වයකු මෙන්; හිත්වා, පමත්තපුද්ගලයන් සසරවටව හැර පියා, (අගමියෙන්ද අධිගමයෙන්ද ඔවුන් පසුකොට පියා); යාති, (සසරින් නික්ම) නිවන්පුරයට (වහාම) යන්නේයි.

10. මඝවා, ශක්‍රදෙවේන්ද්‍රතෙම (4); අප්පමාදෙන, (මඝමාණවකල මචලග්‍රාමයෙහි භූමිශොධනයෙහි පටන් කාරණයෙද) අප්‍රමාදභාවය හෙතුකොටගෙණ; දෙවානං, දෙදෙව්ලොව දෙවනාවන්ට; සෙට්ඨතං ගතො, උතුම් බවම පැමිණියේය, (රජබවට පැමිණියේ යයි සේයි); (එහෙයින්) අප්පමාදං, නොපමාබව; පසංසන්ති, (සියලු ලෞකික ලොකොත්තර ගුණවිශෙෂයන්ගේ ප්‍රතිලාභයට කාරණහෙයින් බුද්ධාදි පණ්ඩිතවරයෝ) ප්‍රශංසා කෙරෙති; පමාදො, පමාබව වනාහි; සදා, හැමකල්හි ම; ගරහිතො, (සියලු විපත්තියට කාරණ) හෙයින් බුද්ධාදී ආර්යයන් විසින් ගර්හිතයි (=නින්ද කරණලදී).

11 අප්පමාදරතො, නොපමාබව ඇලුනාවූ; පමාදෙ භයදස්සි වා, (නරකොත්පත්තිය ආදිකොට) ප්‍රමාදයෙහි භය දක්නාවූ; නොහොත් නරකොත්පත්‍යාදියට කාරණ හෙයින් ප්‍රමාදය භය විසින් දක්නාවූ; භික්ඛු, මහණ තෙම; අණුං, (උද්ධම්භාගියවශයෙන්) අණුවූ ද, (=කුඩාවූ ද): ථූලං, (ඔරම්භාගිය වශයෙන්) ස්ථූලවූ ද; සංයොජනං, රූපරාගසංයොජනාදි දසවිධ සංයොජනයන්; අග්ගී ඉව, (කුදමහත් උපාදානයන් දවමින් යන) ලැව් ගින්නක් මෙන්; ඩහං, අභිනම්‍යාගීඥාන වහ්නියෙන් දවමින් (පුනරුත්පත්තියට් අයොග්‍යකෙරෙමින්); ගච්ඡති, නිවන්පුරයට යන්නේයි.

12. අප්පමාදරතො, අප්‍රමාදබව ඇලුනාවූ, හෙවත් නොපමාව වසන්නාවූ; පමාදෙ භයදස්සි වා, (නරකොත්පත්තිය ආදිකොට)

---

(4) 'ඉදානි මඝවාති පදස්සත්ථො මඝමාණවො' අටුවා.

**1. ඵන්දනං චපලං චිත්තං දූරක්ඛං දුන්නිවාරයං;**
**උජුං කරොති මෙධාවී උසුකාරො'ව තෙජනං.**

---

ප්‍රමාදයෙහි භය දක්නාවූ, හෙවත් නරකොත්පත්‍යාදියට කාරණ හෙයින් ප්‍රමාදය භයවිසින් දක්නාවූ; භික්ඛු, මහණතෙම; පරිහාණාය, (ශමථවිදර්ශනාධර්මයන් වත් මාර්ගඵලාධිගමයන් වත්) පිරිහීමට; අභබ්බො, අයොග්‍යය; නිබ්බාණස්ස, ක්ලේශනිර්වාණයට ද අනුපාදපරිනිර්වාණයට ද; සන්තිකෙ එව, සමීපයෙහි ම වන්නේයි.

## අප්පමාදවග්ගො දුතියො.

---

1. ඵන්දනං, රූපාදි නානාලම්බනයෙහි චලිතව පවත්නා වූ; චපලං, (එක ඉරියව්වෙක නොපිහිටන ග්‍රාමදාරකයෙකු මෙන් එක අරමුණෙක්හි නොපිහිටන හෙයින්) චපලවූ, (=අනවස්ථිතවූ); දූරක්ඛං, (සත්ප්‍රායවූ එක අරමුණෙක්හි ම පිහිටුවන්නට නොපිළිවන් හෙයින් [illegible] තැනින් වැද ගොයම් කන කුළුගොණකු මෙන්) (නොරැක්කහැක්කාවූ;) දුන්නිවාරයං, (විසභාගාලම්බනයට දිවනහෙයින්) තුන්දුසිරින් නොවලැක්විය හැක්කාවූ; චිත්තං, භූමි-වත්ථාලම්බනක්‍රියාදි වශයෙන් චිත්‍ර හෙයින් චිත්ත නම්වූ විඥානය; මෙධාවී, ප්‍රාඥවූ පුරුෂ තෙම; උජුං කරොති, ඍජු කරන්නේයි, කුමක්මෙන්ද යත්? තෙජනං, හීදණ්ඩක් හැද මැඩ ඉදිකරන්නාවූ; උසුකාරො ඉව, හීවඩුමෙනි— යම්සේ උසුකාර නැමැති හීවඩු (1) තෙම හී දණ්ඩනට නිසිදණ්ඩක් වලින් කපා ගෙනවුත් පිටපොත්ත හැර තෙල්කාඩියෙන් තෙමා අඟුරුකබලෙහි තවා හීඅළුවෙහි ලා හැද මැඩ ඉදිකොට වාලවෙධයට යොග්‍යකොට රාජරාජමහාමාත්‍යයන්ට ශිල්ප දක්වා මහත්සත්කාර සම්මාන ලබා ද එසේම නුවණැති පුරුෂ තෙම ස්පන්දනාදි ස්වභාවවූ ද මේ සිත ධුතාංගාරණ්‍යවාසයෙන් හීදණ්ඩහි පිටපොත්තවැනිවූ ඖදාරිකක්ලේශයන් තදඞ්ගාදි වශයෙන් පහ කොට ඉක්බිති ශ්‍රද්ධාස්නේහයෙන් තෙමා කායික-චෛතසිකවීර්‍ය්‍ය නැමති ගිනිඅඟුරෙහි තවා ශමථවිදර්ශනාභාවනා නැමැති අළුවෙහි ලා හැද මැඩ ඉදි කොට ත්‍රෛභූමිකසංස්කාරයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කොට අවිද්‍යාස්කන්ධප්‍රදලනය කොට ත්‍රිවිද්‍යා ෂඩභිඥා නවලොකොත්තරධර්මය යන මේ ගුණවිශෙෂ අත්පත් කොට ගෙණ අග්‍රදක්ෂිණෙය බව ලබන්නේනයි සේයි.

---

(1) සියලුම පොත්හි 'උසුකාර යන නාමාන්තරයක් ඇති ධනුර්ධර තෙම යනුයි. මේ විමසිය යුතුයි.

34 2. වාරිජෝ'ව ථලෙ ඛිත්තො ඔකමොකත උබ්භතො,
ඵන්දතිදං චිත්තං මාරධෙය්‍යං පහාතවෙ.

35 3. දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො,
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං.

---

2. ඔකමොකතො, උදකාලයෙන් හෙවත් උදකසඞ්ඛ්‍යාතවාසස්ථානයෙන්; උබ්භතො, නගනලද්දාවූ; ථලෙ ඛිත්තො, (අතින් හෝ පයින් හෝ දැල්ආදි එක්තරා දෙයකින් හෝ) ගොඩදමනලද්දාවූ; වාරිජො ඉව, දිය නොලදින් සැලෙන මසකු මෙන්; ඉදං චිත්තං, (පඤ්චකාමගුණාලයෙහි අභිරතවූ බාලපෘථග්ජනයන්ගේ) මේ අභාවිතවූ සිත (පඤ්චකාමගුණාලයෙන් නගා); මාරධෙය්‍යං, මාරායත්තහෙයින් මාරධෙය්‍යයයි කියනලද ත්‍රෛභූමිකවෘත්තය; පහාතවෙ, පහකරන්ට (ප්‍රයොගකරණකල්හි හෙවත් විදර්ශනාකර්මස්ථානයෙහි බහා කායිකචෛතසිකවීර්‍ය්‍යයෙන් තවනලබනකල්හි); පරිඵන්දති, හැමපරිද්දෙන් සැලෙන්නේය; (එකාලම්බනයෙහි නොපිහිටවන්නේය, එතකුදුවූවත් ධුරනික්ෂෙප නොකොට ප්‍රාඥවූ පුද්ගලතෙම උක්තක්‍රමයෙන් සිත ඍජුකරන්නේයයි සේයි) නොහොත්, ඉදං චිත්තං, (මාරධෙය්‍යයයි කියනලද ක්ලෙශවෘත්තිය නොහැරසිටියාවූ බාලපෘථග්ජනයන්ගේ අභාවිතවූ) මේ චිත්තය; ඔකමොකතො, උදකසඞ්ඛ්‍යාතවූ ආලයෙන්; උබ්භතො, නගනලද්දාවූ; ථලෙ ඛිත්තො, ගොඩදමනලද්දාවූ; වාරිජොව, මත්ස්‍යයෙකු මෙන්; පරිඵන්දති, (නානාලම්බනයෙහි පරිභ්‍රමණය කිරීම් වසයෙන්) සැලෙන්නේය; (එහෙයින්ම) මාරධෙය්‍යං, යම්ක්ලෙශවෘත්තසඞ්ඛ්‍යාතමාරධෙය්‍යයක් නිසා චිත්තය චලිත වේ ද ඒ මාරධෙය්‍යය; පහාතවෙ (=පහාතබ්බං), පහකටයුතුයි—මාර්ගඵල නිර්වාණ ප්‍රත්‍යක්ෂකිරීමෙන් ක්ලෙශවෘත්තසඞ්ඛ්‍යාතමාරධෙය්‍යය ප්‍රහීණ කටයුතුයයි සේයි.

3. දුන්නිග්ගහස්ස, දුකින් නිගතහැකිවූ, හෙවත් නිග්‍රහකරන්නට නොපිළිවන්වූ; ලහුනො, ලඝුවූ, හෙවත් ලඝුව ඉපද ලඝුව නිරුද්ධවන්නාවූ; යත්ථ කාමනිපාතිනො, (ජාතියවත් ගොත්‍රයවත් වයසවත් නොබලා ලැබෙන්නාවූ ද නොලැබෙන්නාවූ ද යුක්තවූ ද අයුක්තවූ ද) යම් කැමැති අරමුණෙක හෙනසුලුවූ; චිත්තස්ස, (කුළුඅසෙකු මෙන් දුර්විනීතවා) චිත්තයාගේ; දමථො, (නානාලම්බනග්‍රහණය නොකොට ඒකාලම්බනයෙහි පිහිටුවා චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන්) දැමීම (=නිෂ්පාපි කිරීම); සාධු, මැනවි; කාරණ කිම් ද යත්? චිත්තං, මේ සිත; දන්තං, දමනලද්දේ, (=නිෂ්පාපිකරණලද්දේ); සුඛාවහං, මාර්ගඵල සුව ද නිවන්සුව ද එළවන්නේයි.

36
4. සුදුද්දසං සුනිපුණං යත්ථ කාමනිපාතිනං,
චිත්තං රක්ඛෙථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහං.

37
5. දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං,
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා.

38
6. අනවට්ඨිතචිත්තස්ස සද්ධම්මං අවිජානතො,
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති.

---

4. සුදුද්දසං, ඉතා ම දක්නට නොපිළිවන්වූ; සුනිපුණං, ඉතා සියුම්වූ; යත්ථ කාමනිපාතිනං, (ජාත්‍යාදිය නොබලා ලැබෙන්නාවූ ද නොලැබෙන්නාවූ ද යුක්තවූ ද අයුක්තවූ ද) යම් කැමති අරමුණෙක්හි හෙනසුලුවූ; චිත්තං, සිත; මෙධාවී, ප්‍රාඥපුද්ගල තෙම; රක්ඛෙථ, රක්නේයි, (චිත්තාවශිකව අනයව්‍යසනයට පැමිණෙන අඥනයකු මෙන් නොව ප්‍රාඥපුද්ගල තෙම සිත රක්නේයි); චිත්තං, ඒ චිත්තය; ගුත්තං, (නානාලම්බනයෙහි විසිර පැවැත්තනොදී එකත්වාලම්බනයෙහි පිහිටුවා) රක්නාලද්දේ, සුඛාවහං, ලොවිලොවුතුරාසුව එලවන්නෙයි.

5. දූරඞ්ගමං, (මකුළුහුයක් පමණතැනු දු පූර්විදිග්ආදියට චිත්තයාගේ සඞ්ක්‍රමණයෙක් නැත ද යොදුන් දහසකින් දුරවූ ද අරමුණුගන්නා බැවින්) දුරට යන්නා ම වූ; එකචරං, (සටත්පිරිසෙසින් දසිතකු දු එකවට නොඉපද එක්සිතක් ඉපද නිරුද්ධවූ කල්හු ම අනික් එක ම සිතක් උපදනා හෙයින්) එකචරවූ (=හුදකලාව ම පවත්නාවූ); අසරීරං, (තමා අරූපධර්මබැවින් වර්ණසංස්ථානයෙක් නැත්නුයි) ශරීරයක් නැත්තාවූ; ගුහාසයං, (සතරමහාභූතයන් නිසා පවත්නා මේ) ශරීරනැමැති ගුහාවෙහි පවත්නාවූ හෙවත් හෘදයරූපය නිසා පවත්නාවූ; චිත්තං, සිත; යෙ, යම් ස්ත්‍රී පුරුෂ කෙනෙක් හෝ ගෘහස්ථප්‍රව්‍රජිත කෙනෙක් හෝ; සඤ්ඤමෙස්සන්ති, (නොඋපන් කෙලෙසුන් නොසිපැද්දදී ප්‍රමාදදෝෂයෙකින් උපන් කෙලෙසුන් දුරුකෙරෙමින්) සංවරයෙහි පිහිටුවද්ද; තෙ, ඔහු; මාරබන්ධනා, මාරබන්ධනයයි කියනලද ත්‍රෛභූමිකවෘත්තයෙන්; මොක්ඛන්ති, මිදෙනනාහුයි.

6. අනවට්ඨිතචිත්තස්ස, (අසුපිට තුබූ කොමඩුපලයක් මෙන් ද දසවෙයි රෑහිඳුවූ කණුවක් මෙන් ද මට්ටත්තලයා හිස තුබූ කොලොම්මලක් මෙන් ද එකෙක නොපිහිටා කිසිකලෙක සෙවකව කිසිකලෙක ආජීවකව කිසිකලෙක නිගණ්ඨව කිසිකලෙක තාපසව කිසිකලෙක ගිහිව කිසිකලෙක පැවිදිව වසනහෙයින්) අනවස්ථිතවූ සිත් ඇති; සද්ධම්මං අවිජානතො, බුද්ධාදි සත්පුරුෂයන් විසින් ප්‍රශස්තවූ සත්තිස් බොධිපාක්ෂික ධර්මය නොදන්නාවූ; පරිප්ලවපසාදස්ස, (අල්පප්‍රසාදයෙන් පොපට්හිපි හෙයින් හෝ ශ්‍රද්ධාව

39
7. අනවස්සුත චිත්තස්ස අනන්වාහත චෙතසො,
පුඤ්ඤපාප පහීණස්ස නත්ථි ජාගරතො භයං.
40
8. කුම්භූපමං කායමිමං විදිත්වා නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
යොධෙථ මාරං පඤ්ඤායුධෙන ජිතඤ්ච රක්ඛෙ අනිවෙස-
නො සියා.

---

මදහෙයින් හෝ) ඉපිලෙන නැඳුහැ ඇත්තාහට; පඤ්ඤා, කාමාවචරාදිප්‍රභෙද ඇති ප්‍රඥා තොම; න පරිපූරති, නොපිරෙත්නීයි; (කාමාවචර ප්‍රඥාව පවා නොපිරෙණ කල රූපාවචර අරූපාවචර ලොකොත්තරප්‍රඥා කැලම නොපිරෙත්නීමැයි).

7. අනවස්සුතචිත්තස්ස, රාගයෙන් තෙත් නොවූ සිත් ඇති; අනන්වාහතචෙතසො, ද්වේෂයෙන් නොපහරණලද සිත් ඇති; පුඤ්ඤපාපපහීණස්ස, අර්හත්මාර්ගයෙන් ප්‍රහීණකළ කුශලාකුශල ඇති; ජාගරතො, (ශ්‍රද්ධාදිපඤ්චවිධජාගරධර්මයෙන් සමන්විත බැවින් කායග්ලානත්‍යාදිවශයෙන් නිද්‍රොපගතවුව ද ක්ලෙශනිද්‍රාවෙන් නොනිදන හෙයින්) නොනිදන්නා නම්වූ ක්ෂීණාශ්‍රවයාහට; භයං නත්ථි, (ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණවූ ක්ලෙශයන්ගේ අපුනරාවර්තනය හෙතුකොට ගෙණ) කෙලෙසුන්කෙරෙන් භයෙක් නැති.

8. ඉමං කායං, (කෙශාදිසමූහයයි කියනලද) මේ ශරීරය; කුම්භූපමං, (අබලදුබල බැවින් ද නොතගවුරු බැවින් ද තව්කාලි බැවින් ද) කුලාලභාජනයක් බඳුවූයේ, හෙවත් මැටිබඳුනක් වැනි කොට, විදිත්වා, දැන; ඉදං චිත්තං, (ප්‍රාඥවූ කුලපුත්‍ර තෙම තමාගේ) මේ විදර්ශනාචිත්තය; නගරූපමං ඨපෙත්වා, (ගැඹුරුවූ කටුඅගල-දිය අගල ඇති තරවූ පවුරු-පදනම් හා දොරටු-අටලු ඇති පසමිතුරන් විසින් අයොධ්‍යවූ සුරක්ෂිත) නුවරක් මෙන් කෙලෙස්සතුරන් විසින් පැරදවිය නොහැකිකොට තබා; පඤ්ඤායුධෙන, විදර්ශනාමයවූ ද ආර්යමාර්ගමයවූ ද ප්‍රඥා නැමති ආයුධයෙන්, (තත් තත් මාර්ගයෙන් වධ්‍යවූ ක්ලෙශයන් තාක් ප්‍රතිබාහනය කෙරෙමින්); මාරං, ක්ලෙශමාරයා; යොධෙථ, පහරණ්ණ; ජිතඤ්ච, දිනනලද්දාවූ, හෙවත් උපදවනලද්දාවූ තරුණ විදර්ශනාව ද; රක්ඛෙ, (ආවාසසප්‍රාය-ඍතුසප්‍රාය-භොජනසප්‍රාය-පුද්ගලසප්‍රාය-ධර්මශ්‍රවණසප්‍රායාදිය සෙවනය කෙරෙමින් අතරතුරෙහි සමාපත්තියට සමවැද එයින් නැගී ශුද්ධචිත්තයෙන් සංස්කාරයන් අනිත්‍යාදිවශයෙන් සන්මර්ශනය කෙරෙමින්) රක්නේය; අනිවෙසනො සියා, අනාලය වන්නේය, (=සමාපත්තිය ආස්වාද කෙරෙමින් සමාපත්තිය ගේ කොට නොපයන්නේය) — සමාපත්තිය ම ආස්වාද කෙරෙමින් ශුද්ධචිත්තයෙන් සංස්කාරසන්මර්ශනය නොකෙරේ නම් මාර්ගඵලප්‍රතිවෙධය කරන්නට නොපොහොසත, එහෙයින් සමාපත්තියෙහි ආලය නොකරන්නේයැයි සේයි.

9. අචිරං වතා'යං කායො පඨවිං අධිසෙස්සති,
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො නිරත්ථං ව කලිඞ්ගරං.

10. දිසො දිසං යං තං කයිරා වෙරී වා පන වෙරිනං,
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ.

11. න තං මාතා පිතා කයිරා අඤ්ඤෙ වාපි ච ඤාතකා,
සම්මාපණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙ'ති.

චිත්තවග්ගො තතියො.

---

9. අයං කායො (මහණ තාගේ) මේ කය; අචිරං, නොබෝකලකින් ම; වත, එකාන්තයෙන්; අපෙතවිඤ්ඤාණො, පහවූ සිත් ඇත්තේ; ඡුද්ධො, (අපගතවූ විඤ්ඤාණ ඇතිබැවින්) දමනලද්දේ; නිරත්ථං කලිඞ්ගරං ඉව, දරුසම්භාරයෙන් ප්‍රයොජන ඇත්තවුන්ට නිරූපකාරවූ පූතිශුෂ්කකාෂ්ඨයක් මෙන්, හෙවත් වලදමාපු දිරාගිය දඬුකඩක් මෙන් නිෂ්ප්‍රයොජනවූයේ; පඨවිං අධිසෙස්සති, පොළොව මත්තෙහි හෝනේ යි.

10. දිසො, (එක්තරා එකක්හුගේ අඹුදරු කෙත්වත් දූසිදස් ගෙරිම්වුන් ආදීවූ සර්වස්වහරණය කළාවූ) මිත්‍රද්‍රොහීවූ සොරෙක්; දිසං, (නැවත එසේම තමාගේ සැපත් හැරගත් සොරෙකු දැක; තං, ඔහට; යං කයිරා, සර්වස්වහරණ ජීවිතහරණාදි යම් අනර්ථව්‍යසනයක් කෙරේද; වෙරී වා පන, කිසිකාරණයෙකින් බද්ධවෛර ඇති එකෙක් හෝ; වෙරිනං, එසේම තමා කෙරෙහි බද්ධවෛර ඇති එකක්හු දැක; යං තං කයිරා, යම් ඒ අවැඩක් ඔහට කෙරේද, (එයට වඩා); මිච්ඡාපණිහිතං චිත්තං, වරදවා දශඅකුශලකර්මපථයෙහි පිහිටුවනලද චිත්තය; තතො, ඒ හේතුවෙන්: නං, ඔහු; පාපියො කරෙ, අතිශයින් ලාමක කරන්නේයි ... සොරෙක් හෝ සතුරෙක් හෝ එක්තරා එකක්හට අවැඩක් කෙරෙමින් එකම ජාතියෙක්හි ඔහුගේ පුත්‍රදාරදාසිදාසගවමහිෂාදීන්ට පීඩාකරන්නේ හෝ ය, කෙත්වත් ආදිය නසන්නේ හෝ ය, ඔවුන්ගේ ධනහරණය හෝ ජීවිතහරණය හෝ කරන්නේය, දශඅකුශලකර්මපථයෙහි පිහිටුවනලද සිතවනාහි මේ ජාතියෙහි ම ගණීවට ද විධබන්ධනයට ද පමුණුවන්නේය, පරලොව නොයෙක් ජාතිශතසහස්‍රයෙහි සතරඅපායෙහි හෙළා ගෙණ හිසනැගිය නොදෙන්නේය යි සේයි.

11. තං, ඒ කාරණය, හෙවත් යම්කාරණයෙක් ස්වර්ගමොක්ෂසම්පත්තිදායකද ඒ කාරණය; මාතා න කයිරා, මවු නොකරන්නීය; පිතා න කයිරා, පියා නොකරන්නේය; අඤ්ඤෙ වාපි ච ඤාතකා, සත් ලේ බැඳුනු ආදි සෙසු නෑයෝ හෝ; (න කරෙය්‍යුං,

1. කො ඉමං පඨවිං විජෙස්සති යමලොකඤ්ච ඉමං සදෙවකං,
කො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව පචෙස්සති.

2. සෙඛො පඨවිං විජෙස්සති යමලොකඤ්ච ඉමං සදෙවකං,
සෙඛො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව පචෙස්සති.

---

නොදකරන්නාහ); සම්මාපණිහිතං චිත්තං, දශකුශලකර්මපථයෙහි මනාකොට පිහිටුවනලද සිත වනාහි; තතො, ඒ හෙතුවෙන්; නං, ඒ පුද්ගලයා; සෙය්‍යසො කරෙ, අතිශයෙන් උතුම් කරන්නේයි— මව්පියෝ පවා දරුවන්ට දයාද දෙන්නාහු එකල ජාතියෙක කර්මාන්ත නොකොට යෙහෙන් ජීවත්වන පමණක් දෙති, විශාඛාවන්ගේ මව්පියෝ පවා ඒසාමහාධනමහාභොගඇත්තාහු ඒ විශාඛාවන්ට එකම අත්බැවෙක යෙහෙන් ජීවත්වන පමණක් දුන්හ, චක්‍රවර්තිරාජ්‍යශ්‍රීපමණකු දූ දරුවන්ට දෙන්නට පොහොසත් මව් පිය කෙනෙක් නම් නැති, දිව්‍යසම්පත් හෝ ධ්‍යානසම්පත් හෝ දෙන්නට පොහොසත්හු කැලම නැත, ලොකොත්තරසම්පත්තීමෙහි නොපොහොසත් බැව් කියයුතු ම නැත. දශකුශලකර්ම පථයෙහි මනාකොට පිහිටුවනලද සිත වනාහි මේ සියලු සැපත් ම දෙන්නට පොහොසතැ යි යනුභාවයි.

## චිත්තවග්ගො තතියො.

---

1. ඉමං පඨවිං, ආත්මභාවසඞ්ඛ්‍යාතවූ මේ පෘථිවිය; කො විජෙස්සති, කවරෙක් දනන්නේ ද, (කවරෙක් ප්‍රතිවෙධ කරන්නේ ද); යමලොකඤ්ච, සතරඅපාය ද; සදෙවකං, දෙව්ලෝ සහිතවූ; ඉමං, මේ මනුෂ්‍යලොකය ද; කො විජෙස්සති, කවරෙක් දනන්නේ ද; (කවරෙක් ප්‍රතිවෙධ කරන්නේ ද); සුදෙසිතං, (යථාස්වභාවවශයෙන් දෙසනලද හෙයින්) මනාකොට දෙසනලද්දවූ; ධම්මපදං, සත්තිස් බොධිපාක්ෂිකධර්මසඞ්ඛ්‍යාතධර්ම(කොට්ඨාස)ය; පුප්ඵං, මල් කඩා රැස්කරන්නාවූ; කුසලො ඉව, දක්‍ෂවූ මාලාකාරයක්හු මෙන්; කො, කවරෙක්; පචෙස්සති, පරීක්‍ෂාකරන්නේ ද, හෙවත් කවරෙක් ප්‍රතිවෙධ කරන්නේද.

2. සෙඛො, (අධිශීල-අධිචිත්ත-අධිප්‍රඥායයි කියනලද ත්‍රිවිධශික්‍ෂාවෙහි හික්මෙන හෙයින් සෙඛනම්වූ ශ්‍රොතාපත්තිමාර්ගස්ථයා කෙරෙහි පටන් අර්හත්මාර්ගස්ථයා දක්වා) සප්තවිධ ශෛක්‍ෂතෙම; පඨවිං, ආත්මභාවයයි කියනලද මේ පෘථිවිය; විජෙස්සති,(අර්හත්මාර්ගයෙන් ආත්මස්නෙහය දුරුකිරීම් වසයෙන්) දනන්නේය, හෙවත් ප්‍රතිවෙධ කරන්නේය; යමලොකඤ්ච, සතරඅපායයි කියනලද යම ලොව ද; සදෙවකං, දෙව්ලොව සහිතවූ; ඉමං, මේ මනුෂ්‍යලොකයද;

46 **3. ඵෙණූපමං කායමිමං විදිත්වා මරීචිධම්මං අභිසම්බුධානො,**
**ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ.**

47 **4. පුප්ඵානි හෙව පචිනන්තං ව්‍යාසත්තමනසං නරං,**
**සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡති.**

48 **5. පුප්ඵානි හෙව පචිනන්තං ව්‍යාසත්තමනසං නරං,**
**අතිත්තං යෙව කාමෙසු අන්තකො කුරුතෙ වසං.**

---

විජෙස්සති, දැනගන්නේය, හෙවත් ප්‍රතිවෙධ කරන්නේය: සෙඛො, එම සප්තවිධශෛක්ෂපුද්ගල තෙම; සුදෙසිතං, (සමාස-ව්‍යාස-සාකල්‍යාදිවශයෙන් ද එකත්වනය නානාත්වනයාදි නය වශයෙන් යථාස්වභාව වශයෙන් ද දෙසනලද හෙයින්) මනාකොට දෙසන-ලද්දාවූ; ධම්මපදං, සත්තිස් බොධිපාක්ෂික ධර්ම(කොට්ඨාස)ය; කුසලො පුප්ඵං ඉව, (පුෂ්පාරාමයට වැද ළා කැකුලුමල් පරමල් ගැටවණුමල් හැර යහපත්මල් කඩා රැස්කරන්නාවූ) දක්ෂමාලාකාරයෙකු මෙන්; පචෙස්සති, පරීක්ෂා කරන්නේයි, හෙවත් ප්‍රතිවෙධ කරන්නේයි.

3. ඉමං කායං, (කෙස්ඇදෙතිස්කුණුකොටස් සමූහයයි කියනලද) මේ කය; ඵෙණූපමං, (අබල-දුර්බල-අනවස්ථිත-තාවත්කාලිකාර්ථ-යෙන්) පෙණපිඩක් වැන්නයි; විදිත්වා, දැන; මරීචිධම්මං, (ක්ෂණ-යෙහි නස්නා බැවින් ද ස්වල්පව වැටහෙන කාරණයෙන් ද මේ කාය) මිරිඟුවැන්නයි; අභිසම්බුධානො, සලකන්නාවූ මහණතෙම; මාරස්ස, ක්ලෙශමාරයා අයත්වූ; පපුප්ඵකානි, පඤ්චකාමගුණයන්, නොහොත් කර්මවර්තය ක්ලෙශවර්තය විපාකවර්තය යන මේ ත්‍රෛභූමික දුඃඛධර්මයන්; ඡෙත්වාන, ආර්යමාර්ගශස්ත්‍රයෙන් කපා; මච්චුරාජස්ස, මෘත්‍යුමාරයාහට; අදස්සනං, අවිෂයවූ අමෘතමහානිර්වාණයට; ගච්ඡෙ, ආලම්බනකිරණවශයෙන් යන්නේයි.

4. පුප්ඵානි පචිනන්තං ඉව, පුෂ්පාරාමයෙන් මල්කඩා රැස්කරන්-නාවූ මාලාකාරයකු මෙන් පඤ්චකාමගුණ පුෂ්පයන් සොයන්නා-වූ; ඉහ; මේ සත්වලොකයෙහි; ව්‍යාසත්තමනසං, (අසම්ප්‍රාප්තවස්තු-වෙහි ප්‍රාර්ථනාවශයෙන්ද සම්ප්‍රාප්තවස්තුවෙහි ගෙධවශයෙන් ද) නොයෙක් පරිද්දෙන් පඤ්චකාමගුණයෙහි ඇලුනු සිත්ඇති; නරං, සත්වයා; සුත්තං ගාමං, නිදන්නාවූ ගම්වැසි ජනයා (මුහුදට ගෙණ-යන); මහොඝො ඉව, (දෙතුන් යොදනක් තැන පැතිරයන ගැඹුරු) මහවතුරක් මෙන්; මච්චු, මරණ තෙම; ආදාය, හැරගෙණ; ගච්ඡති, යන්නේයි-අපාය මහමුහුදට පමුණුවන්නේයි යත්යි.

5. පුප්ඵානි පචිනන්තං ඉව, (පුෂ්පාරාමයෙන් මල්කඩා රැස්-කරන්නාවූ මාලාකාරයකු මෙන්) පඤ්චකාමගුණපුෂ්පයන්

49 6. යථාපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං,
පලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ.

50 7. න පරෙසං විලොමානි න පරෙසං කතාකතං,
අත්තනොව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච.

---

සොයන්නාම්වූ; ඉහ, මේ සත්ත්වලොකයෙහි; ව්‍යාසත්තමනසං, අසම්ප්‍රාප්තවස්තුවෙහි ප්‍රාර්ථනාවශයෙන් ද සම්ප්‍රාප්තවස්තුවෙහි ගෘද්ධවශයෙන් ද) නොයෙක් පරිද්දෙන් පඤ්චකාමගුණයෙහි ඇලුනු සිත්ඇති; නරං, සත්ත්වයා; කාමෙසු, වස්තුකාම ක්ලේශකාමයෙහි; අතිත්තං යෙව, (පර්යේෂණයෙන් ද ප්‍රතිලාභයෙන් ද නිධාන කිරීමෙන් ද) අතෘප්තවූවහු ම; අන්තකො; මාරතෙම; වසං කුරුතෙ, (හඬන්නහු වලප්නහු ම ගෙණ තමා වසඟකරන්නේයි.

6. යථාපි, යම්සේ; භමරො, (පුෂ්පාරාමයෙහි මුවරදගෙණ ඇවිදිනා) බමරතෙම; පුප්ඵං, මල් ද; වණ්ණගන්ධං, වර්ණය ද ගන්ධය ද; අහෙඨයං, නොනසමින් ඇවිදිමින්; රසං ආදාය, පුෂ්පරසය පමණක් හැරගෙණ; පලෙති, වනයට නැගීයේ ද; එවං, එපරිද්දෙන් ම, හෙවත් මලකට පෙත්තකට කෙසුරකට වර්ණ-ගන්ධයට හානියක් නොකොට රේණුපමණක් ම හැරගණියන්නාවූ බමරක්හු මෙන්; මුනි, සෙඛවූ ද අසෙඛවූ ද අනගාරයී මුනිතෙම; ගාමෙ, ගොදුරුගම්හි; චරෙ, (උපාසකකුලයාගේ ශ්‍රද්ධාවට ද භොගයට ද හානියක් නොකොට නෙපිළිවෙළින් දොර දොර සිට යැපෙන පමණක්) බික් සිගා ඇවිදිනේයි.

7. පරෙසං, මෙරමාගේ; විලොමානි, ජාත්‍යාදීන් ගටා බණනලද මර්මච්ඡේදකවූ පරුෂවචනයෝ; න, මෙතෙහි නොකට යුත්තාහ; පරෙසං, මෙරමාගේ; කතාකතං, කරණලද්දවූ ද නොකරණලද්දවූ ද දුශ්චරිත සුචරිතයන්; න, නො බලන්නේය; අත්තනො එව, තමාගේ ම; කතානි, කරණලද දුශ්චරිතයන් ද; අකතානි ච, නොකරණලද සුචරිතයන් ද අවෙක්ඛෙය්‍ය, බලන්නේයි— අසො උපාසකයා අශ්‍රද්ධය අප්‍රසන්නය ලාබත් පමණත් සැදිබත් පමණත් නොදෙන්නේය යනාදීන් ද, අසෝ මහණ ඇදුරුවත් තෙරවත් ආගන්තුකවත් ගමිකවත් ගිලන්වත් නොකරන්නේය ධුතඞ්ගසමාදානයක් නො-කරන්නේය යනාදීන් ද, අනුන්ගේ ගුණ නුගුණ නොසැලකිය යුත්තේය. "කථංභූතස්ස මෙ රත්තින්දිවා වීතිපතන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" යි වදාරණලද අවවාද සිහි කරන්නාවූ ශ්‍රද්ධාප්‍රව්‍රජිත කුලපුත්‍රයා විසින් කිමෙක්දෝහෝ රෑදවල්හු වත්පිළිවෙත් කරන්නාවූ බණ හදා-රන්නාවූ කමටහන්වෙනෙහි කරන්නාවූ මට ඉක්මෙද්දෝහෝ

51 8. යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං,
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො.

52 9. යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං,
එවං සුභාසිතා වාචා සඵලා හොති සකුබ්බතො.

53 10. යථාපි පුප්ඵරාසිම්හා කයිරා මාලාගුණෙ බහූ,
එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං.

---

කායදඬ්ඩබහුලව් නිද්‍රාරාමව භස්සාරාමව සඞ්ගණිකාරාමව විස්සට්ඨ කාය චිත්තව වසන්නාවූ මට ඉක්මෙන්දේහෝ යි මෙසේ තමාගේ ම සගපත නපුර සැලකියයුත්තේය යනු භාවයි.

8. රුචිරං, සිත්කලුවූ; වණ්ණවන්තං, මනාවූ පැහැඇති, හෙවත් මනාවූ සටහන්ඇති; අගන්ධකං, සුවඳ නැති; පුප්ඵං, (එරබදු-ගිරිනිල් බඳුවද ආදිවූ) මල්; යථාපි, යම්සේ පලඳනාහුගේ ශරීරයෙහි සුවඳ නොපතුරුවා ද; එවං, එපරිද්දෙන් ම; සුභාසිතා වාචා, (සමාසව්‍යාශ සාකල්‍යාදිවශයෙන් ද එකත්වනයනානත්වනයාදිනයවශයෙන් ද) මනාකොට දෙසනලද (ත්‍රිපිටකබුද්ධවචන සඞ්ඛ්‍යාතවූ) වාචා තොම; අකුබ්බතො, (ශ්‍රවණ-ධාරණ-ප්‍රතිපත්තිවශයෙන් ඒ ධර්මය) නොකරන්නාහට; අඵලා හොති, (ශ්‍රැතගන්ධය ද ත්‍යාගගන්ධය ද ප්‍රතිපත්ති-ගන්ධය ද නොඑලවන හෙයින්) නිෂ්ඵල වන්නීයි.

9. රුචිරං, මනොඥවූ; වණ්ණවන්තං, වර්ණසම්පන්නවූ, නොහොත් මනාවූ සටහන්ඇති; සගන්ධකං, සුගන්ධසහිතවූ; පුප්ඵං, (සපු-දුනුකේ දෑසමන් ආදිවූ) සුවඳ මල්; යථාපි, යම්සේ පලඳනාහුගේ ශරීරයෙහි සුවඳ පතුරුවා ද; එවං, එපරිද්දෙන් ම; සුභාසිතා වාචා, (සමාස-ව්‍යාශසාකල්‍යාදිවශයෙන් ද එකත්වනයනානත්වනයාදිනයවශයෙන් ද) මනාකොට දෙසනලද ත්‍රිපිටකබුද්ධවචනසඞ්ඛ්‍යාත වාචා තොම; සකුබ්බතො, (සත්කාරසහිතව ශ්‍රවණ-ධාරණ-ප්‍රතිපත්තිවශයෙන් ඒ ධර්මය) මනාකොට කරන්නාහට, සඵලා හොති, (ශ්‍රැතගන්ධ-ත්‍යාගගන්ධ-ප්‍රතිපත්තිගන්ධයන් එලවනහෙයින්) සඵලවන්නීයි.

10. පුප්ඵරාසිම්හා, (වර්ණගන්ධසම්පන්නවූ නානාප්‍රකාර) පුෂ්ප-රාශියකින්; බහූ මාලාගුණෙ, (එකතොවණ්ටිකඋභතොවණ්ටිකාදි-වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇති) බොහෝ මල්දම්; යථාපි කයිරා, (දක්‍ෂවූ මාලාකාරයෙක්) යම්සේ කෙරේද, හෙවත් බොහෝ මල්දම් ගොතා රැස්කෙරේද; එවං එපරිද්දෙන් ම, හෙවත් නින්වැදුරුම්වූ සුවඳමල්රැසෙකින් බොහෝ මල්දම් ගොතා රැස්කරන්නාවූ දක්‍ෂ

54 11. න පුප්ඵගන්ධෝ පටිවාතමෙති න චන්දනං තගරමල්ලිකා වා,
සතඤ්ච ගන්ධෝ පටිවාතමෙති සබ්බා දිසා සප්පුරිසෝ පවාති.

55 12. චන්දනං තගරං වා පි උප්පලං අථ වස්සිකී,
එතෙසං ගන්ධජාතානං සීලගන්ධෝ අනුත්තරෝ.

56 13. අප්පමත්තෝ අයං ගන්ධෝ යා'යං තගරචන්දනී,
යෝ ච සීලවතං ගන්ධෝ වාති දෙවෙසු උත්තමෝ.

57 14. තෙසං සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං,
සම්මදඤ්ඤා විමුත්තානං මාරෝ මග්ගං න වින්දති.

---

මාලාකාරයෙකු මෙන්; ජාතෙන, උපන්නාවූ; මච්චෙන, සත්ත්වයා විසින්; බහුං කුසලං, (දානසීලාදිවශයෙන්) බොහෝවූ කුසලය, කත්තබ්බං, කටයුත්තේයි.

11. පුප්ඵගන්ධෝ, (සපු-දුනුකේ ආදිවූ) පුෂ්පයන්ගේ සුගන්ධය; පටිවාතං, උඩුසුලඟට; න එති, නොපැමිණෙන්නේයි, (සෙසුමල් තබා සියක් යොදුන් තැන සුවඳ පැතිරෙණ පරසතුමල් පවා උඩු සුලඟට අඟලක් පමණ තැනට ද නොහමන්නේයි); චන්දනං, සඳුනෙහි සුවඳ ද; තගර, තුවරලාහෙයි සුවඳ ද; මල්ලිකා වා, සීනිද්ද-බෝලිද්දයෙහි සුවඳ ද; න, උඩුසුලඟට නොයන්නේය; සතඤ්ච ගන්ධෝ, (බුදු-පසේබුදු-බුදුසවු යන) සත්පුරුෂයන්ගේ සීලසුගන්ධය වනාහි; පටිවාතං, උඩුසුලඟට; එති, පැමිණෙන්නේයි; කුමක් හෙයින්දයත්? සප්පුරිසෝ, සත්පුරුෂ තෙම; සබ්බාදිසා පවාති, යම්හෙයකින් සීලසුගන්ධයෙන් සියලු දශදිග් මැඩ පවතී ද එහෙයිනි.

12. චන්දනං, සඳුන් ද; තගරං වා, තුවරලා ද; අපි, නැවත; උප්පලං, මහනෙල්මල් ද; අථ, නැවත; වස්සිකී, දාසමන්මල් ද යන; එතෙසං ගන්ධජාතානං, මෙකියනලද සුගන්ධසමූහයන්ගේ සුගන්ධයට වඩා; සීලගන්ධෝ, (බුද්ධාදිසත්පුරුෂයන්ගේ) සීලසුගන්ධය තෙම; අනුත්තරෝ, තමහට ඉතිරියක්හු නැතිහෙයින් නිරුත්තරයි.

13. තගර, තුවරලාහෙයි සුවඳය; චන්දනී, සඳුනෙහි සුවඳය යන; යො අයං ගන්ධෝ, යම් මේ සුගන්ධයෙක් ඇද්ද, (සො අයං ගන්ධෝ, එහි මේ සුගන්ධය තෙම) අප්පමත්තෝ, ස්වල්පප්‍රමාණය; සීලවතං, සිල්වත්වූ බුද්ධාදිසත්පුරුෂයන්ගේ; යො ච අයං ගන්ධෝ, යම් මේ සීලසුගන්ධයෙක් ඇද්ද; (සො, හෙතෙම;) උත්තමෝ, උතුම් ම වූයේ; දෙවෙසු, දෙව්ලොව්හි දු; වාති, හමන්නේයි.

14. සම්පන්නසීලානං, පරිපූර්ණවූ ලෞකිකලොකොත්තරශීල ඇති; අප්පමාදවිහාරිනං, සමෘතිසම්පන්න බැවින් අප්‍රමාද විහාරඇති;

15. යථා සඞ්කාරධානස්මිං උජ්ඣිතස්මිං මහාපථෙ,
පදුමං තත්ථ ජායෙථ සුචිගන්ධං මනොරමං.

16. එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ,
අතිරොචති පඤ්ඤාය සම්මාසම්බුද්ධසාවකො.

පුප්ඵවග්ගො චතුත්ථො,

1. දීඝා ජාගරතො රත්ති දීඝං සන්තස්ස යොජනං,
දීඝො බාලානං සංසාරො සද්ධම්මං අවිජානතං.

---

සම්මා, මනාකොට; අඤ්ඤාය, චතුරාර්‍ය්‍යසත්‍යයන් වූ පරිද්දෙන් දැන; විමුත්තානං, (තදඞ්ගවිමුක්ත්‍යාදිපඤ්චවිධවිමුක්තීන්ගේ වශයෙන්) සකල ක්ලේශයන් කෙරෙන් මුක්තවූ; තෙසං, ඔවුන් විසින්, මෙබඳු ගුණයෙන් යුක්තවූ ඒ මහාක්ෂීණාශ්‍රවයන් විසින් ගතලද්දාවූ; මග්ගං, මග; මාරො, දිව්‍යපුත්‍ර මාරතෙම; න වින්දති, (සියලු උත්සාහයෙන් බලා ද) නොදන්නේයි.

15. මහාපථෙ, මහමඟෙක්හි; උජ්ඣිතස්මිං, දමනලද්දාවූ; සඞ්කාර ධානස්මිං, ඒ කසලගොඩෙක්හි; සුචිගන්ධං, සුවඳ ඇති; මනොරමං, සිත් අලවන්නාවූ; පදුමං, පද්මයෙක්; යථා ජායෙථ, යම්සේ උපදී ද.

16. එවං, එසේම, හෙවත් මහමඟදැමූ කසලගොඩෙක නැඟී මුවරද බර සුවඳහමන පියුමක් මෙන්; සඞ්කාරභූතෙසු, කසලගොඩක් බඳුවූ; අන්ධභූතෙ, නුවනැස් නැතිහෙයින් අන්ධවූ පුථුජ්ජනෙ, පුහුදුන් ලෞකිකමහාජනයා කෙරෙහි උපන්නාවූ ද, සම්මාසම්බුද්ධසාවකො, සම්‍යක්සම්බුද්ධයන්ගේ ශ්‍රාවකවූ මහාක්ෂීණාශ්‍රව තෙම; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; අතිරොචති, පෘථග්ජනවූ ලෞකිකමහා ජනයා ඉක්ම දිලියෙන්නේයි-හොබනේයි යේයි.

පුප්ඵවග්ගො චතුත්ථො.

---

1 ජාගරතො, නොනිදන්නාහට; රත්ති, රාත්‍රිතොම; දීඝා, දිග; සන්තස්ස, ශ්‍රාන්තයාහට (=ගමන්විඩාව මගම්රිකුණහට; යොජනං, යොදන; දීඝං, දිග; සද්ධම්මං අවිජානතං, (සත්තිස්බොධපාක්ෂික) සද්ධර්ම්‍ය නොදන්නාවූ; බාලානං, (මෙලෝ පරලෝ වැඩ නොදන්නා) අඥන ජනයන්ට, සංසාරො, (අවිච්ඡින්නව පවත්නා ස්කන්ධධාත්වා-යතනපරිපාටියයි කියනලද) සංසාරය; දීඝො, තමාගේ ධර්මතා වශයෙන්ම දිග [illegible] රැ නිදිමරන්නාහට තුන්යමක් පමණවූ රාත්‍රිය ද ශ්‍රාන්තව ගියාහට සතරගව්වක් පමණවූ යොදන ද කල්පනාවශ-යෙන් දික්ව වැටහෙයි සත්තිස් බොධපාක්ෂිකධර්මයන් නොදන්-නාවූ අඥනජනයනට වනාහි සංසාරය තමාගේ ධර්මතාවශයෙන් ම දිගය යනු භාවයි.

61 2. චරං චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො,
එකචරියං දළ්හං කයිරා නත්‍ථි බාලෙ සහායතා.

62 3. පුත්තා මත්‍ථි ධනම්මත්‍ථි ඉති බාලො විහඤ්ඤති,
අත්තා හි අත්තනො නත්‍ථි කුතො පුත්තා කුතො ධනං,

63 4. යො බාලො මඤ්ඤති බාල්‍යං පණ්ඩිතො වාපි තෙන සො,
බාලො ච පණ්ඩිතමානී ස වෙ බාලොති වුච්චති.

---

2. චරං, තමා හා සහවාසයට නිසි කල්‍යාණමිත්‍රයෙකු සොයන්නාවූ මහණතෙම; සෙය්‍යං, ශීලසමාධිප්‍රඥාගුණයෙන් තමහට අධිකවූ හෝ; සදිසං, තමා හා සදෘශවූ හෝ කල්‍යාණමිත්‍රයෙකු; චෙ, ඉදින්; නාධිගච්ඡෙය්‍ය, නොලද්දේ වීනම්; එකචරියං, එක්චරියාව, (=සතර ඉරියව්වෙහි ම හුදකලාව විසීම); දළ්හං කයිරා, තර කරන්නේයි; කුමක්හෙයින් ද යත්; බාලෙ, (මෙලෝ පරලෝ වැඩ නොදන්නා) අඥනයා කෙරෙහි; සහායතා, (චුල්ලසීලය දශකථාවස්තුගුණය තෙලෙස් ධුතගුණය විදර්ශනාය සතරමගසතරඵලය ත්‍රිවිද්‍යාය ෂඩභිඥය යන මේ) සහායතා තොම; නත්‍ථි, යම්හෙයකින් නැද්ද එහෙයිනි.

3. මෙ, මාගේ; පුත්තා අත්‍ථි, (රූපයෞවනබලපරාක්‍රමසම්පන්නවූ) දරුවෝ ඇත්තාහ; මෙ, මාගේ; ධනං අත්‍ථි, (රන්රිදී මුතුමැණික් ආදී) ධන ඇත්තේයි; ඉති, මෙසේ; බාලො, නුවණනැත්තේ; විහඤ්ඤති, (පුත්‍රතෘෂ්ණාවෙන් ද ධනතෘෂ්ණාවෙන් ද) නස්නේය, (=දුකට පැමිණෙන්නේය); අත්තාහි අත්තනො නත්‍ථි, (තමහට උළා ගදවා පලදවා කවා පොවා නොයෙක් පරිද්දෙන් පොෂණයකළ) ආත්මීය ආත්මා යම්හෙයකින් තමහට නැද්ද, හෙවත් සුවඑලවනට වත් දුක් එලවන්ට වත් නොපොහොසද්ද (එහෙයින්); පුත්තා, පුත්‍රයෝ; කුතො, කොයින් ද; ධනං, ධනය; කුතො, කොයින්ද—සුව එලවන්ට වත් දුක් එලවන්ටවත් කැලම අසමර්ථයහයි සේයි.

4. යො, යම් පුද්ගලයෙක්; බාලො, තෙමේ අපණ්ඩිතවූයේ; බල්‍යං, තමාගේ බාලභාවය; මඤ්ඤති, (මම බාලයෙමියි තමා නුවනනැති බව) දනිද; තෙන, ඒ කාරණයෙන්, (=තමා බාලබව දන්නා කාරණයෙන්), සො, ඒ පුද්ගලතෙම; පණ්ඩිතො වාපි, පණ්ඩිත හෝ වන්නේය, පණ්ඩිත සමාන හෝ වන්නේය; (කුමක්හෙයින්ද යත්? එතෙමේ තමා බාලබව දන්නේ අනික් නුවනැත්තක්හු කරා එළඹෙන්නේ භජනය පයිරුපාසනය කරන්නේ පණ්ඩිතවූ ඔහු විසින් පණ්ඩිතභාවය පිණිස අවවාද අනුශාසනා කරණුලබන්නේ ඔහුගේ අවවාද පිළිගෙණ පණ්ඩිත හෝ වන්නේය, පණ්ඩිතසමාන හෝ වන්නේයි), බාලො ච, යම් බාලයෙක් වනාහි; පණ්ඩිතමානී,

64 5. යාවජීවම්පි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති,
න සො ධම්මං විජානාති දබ්බි සූපරසං යථා.

65 6. මුහුත්තම්පි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති,
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා.

66 7. චරන්ති බාලා දුම්මෙධා අමිත්තෙනෙව අත්තනා,
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං.

---

(තෙමෙ බාලපුද්ගලයෙක් වී මා ගා සම්බහුශ්‍රුතයෙක් ධර්මකථිකයෙක් විනය ධරයෙක් ඇද්දැයි) පණ්ඩිතමානී වේද, (=තමා පණ්ඩිතයකාට සිතාද) සො, ඒ පුද්ගලතෙම; වෙ, එකාන්තයෙන්; බාලො ඉති වුච්චති. බාලයයි ම කියනු ලැබේ.

5. බාලො, අඥනවූ පුද්ගලතෙම; යාවජීවම්පි, දිවිපමණිනු දු; චෙ, ඉදින්; පණ්ඩිතං පයිරුපාසති, නුවණැත්තන් කරා එළඹ එත්-තේවීනමුදු; සො, හෙතෙම; ධම්මං න විජානාති, (මේ බුද්ධවචනයයි කියාවත් බුද්ධවචන නම් මෙතෙකැයි කියාවත් මෙසේ) පර්‍යාප්ති ධර්මය ද (මේ චාරය මේ විහාරය මේ ආචාරය මේ ගොචරය මේ සාවද්‍යය මේ අනවද්‍යය මේ සෙවිතව්‍යය මේ අසෙවිතව්‍යය මේ පිළිවිදිය යුතුය මේ පසක්කටයුතුයයි මෙසේ) ප්‍රතිපත්තිප්‍රතිවේධ ධර්මය ද නොදන්නේයි; කුමක්මෙන්දයත්? දබ්බි සූපරසං යථා, (ගෙවී නොවිට යන තෙක්, නොයෙක් සූපව්‍යඤ්ජනයන් හා සංසර්ගයට පැමිණ ද) ලුණු ඇඹුල් තිත් කුළු ආදි රස නොදන්නා හැන්ද මෙනි.

6. විඤ්ඤූ පණ්ඩිත පුරුෂ තෙම; චෙ, ඉදින්; මුහුත්තං අපි, ඇසිල්ලකුදු; පණ්ඩිතං පයිරුපාසති, බුද්ධාදි නුවණැත්තන් කරා එළඹේ ද, (හෙතෙම ඒ ප්‍රාඥයන් කෙරෙහි උද්ග්‍රහණ පරිපුච්ඡාදිය කෙරෙමින්); ධම්මං, ත්‍රිපිටක බුද්ධවචනයයි කියනලද පර්‍යාප්ති ධර්මය ද චාරවිහාරාදිප්‍රතිපත්ති ධර්මය ද කම්මට්ඨානානුයොගයෙන් ලොකොත්තර ධර්මය ද; ඛිප්පං, වහා ම; විජානාති, දන්නේයි; කුමක් මෙන් දයත? සූපරසං, (මුවෙහි තුබූ විගස ම) සූපව්‍යඤ්ජන-යෙහි ලුණු ඇඹුල් ආදි රස දන්නාවූ; ජිව්හා යථා, විඥනාධිෂ්ඨිත වූ ජිව්හාප්‍රසාදය මෙනි.

7. බාලා, මෙලෝ පරලෝ වැඩ නොදන්නාවූ; දුම්මෙධා, අඥන සත්වයෝ; යං, යම් අකුශලකර්මයෙක්; කටුකප්ඵලං හොති. කකීශවූ විපාක ඇත්තේ වේ ද; පාපකං කම්මං කරොන්තා, ඒ අකුශලකර්මය කෙරෙමින්; අමිත්තෙන ඉව, තමන්ට සතුරෙකු වැනිවූ; අත්තනා; ආත්මයෙන් යුක්තව; චරන්ති, ඇවිදිනාහුයි — සතරඉරියව්වෙහිම අකුසල් කෙරෙමින් පවත්නාහයි සේයි.

67 8. න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති,
යස්ස අස්සුමුඛෝ රෝදං විපාකං පටිසේවති.

68 9. තඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති,
යස්ස පතීතෝ සුමනෝ විපාකං පටිසේවති.

69 10. මධුවා මඤ්ඤති බාලෝ යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ බාලෝ දුක්ඛං නිගච්ඡති.

---

8. යං, කත්වා, (නරකාදි අපායෝත්පත්ති සාධක වූ ප්‍රාණවධාදී) යම් අකුශල කර්මයක් කොට; අනුතප්පති, (සත්ව තෙම සිහිකළ කෙණෙහි) පශ්චාත්තාපයෙන් තැවේ ද; යස්ස, යම් අකුශලකර්මයක්හුගේ; විපාකං, අනිෂ්ටවිපාකය; අස්සුමුඛෝ රෝදං, කඳුළෙන් තෙත්මුහුණුඇතිව හඬමින්; පටිසේවති, අනුභව කෙරේ ද; තං කම්මං, එබඳුවූ අකුශලකර්මය; කතං, කරණලද්දේ; න සාධු, නොමැනවි.

9. යං කත්වා, (දිව්‍යමනුෂ්‍යසම්පත්ති-නිර්වාණසම්පත්ති නිපදවන්නට සමර්ථවූ සුඛදායකවූ) යම් කුශලකර්මයක් කොට; නානුතප්පති, (සත්වතෙම මෙලොව ද පරලොව ද පශ්චාත්තාපයෙන්) නො තැවේ ද; යස්ස, යම් කුශලකර්මයක්හුගේ; විපාකං, ඉෂ්ටවිපාකය; පතීතෝ, මෙලොව ද ප්‍රීතිවේගයෙන් පිනා ගියේ, සුමනෝ, (සෞමනස්‍යවේගයෙන්) සුන්දරවූ සිත්ඇත්තේ; පටිසේවති, (ආයත භවයෙහිදු ප්‍රීතිසෞමනස්‍යයෙන් යුක්තව) අනුභව කෙරේ ද; තං කම්මං, එබඳුවූ කුශලකර්මය; කතං, කරණලද්දේ; සාධු, මැනවි.

10. පාපං, සත්වයා විසින් කරණලද අකුශලකර්මය; යාව, යම්තාක්කල්; න පච්චති, (දෘෂ්ටධර්මවේද්‍ය ව මෙලොව ම හෝ උපපද්‍යවේද්‍ය අපරාපර්‍යායවේද්‍ය ව පරලොව හෝ) විපාක නොදේ ද; තාව, ඒ තාක්කල්; බාලෝ, අඥාන තෙම; මධු ඉව මඤ්ඤති, (පාපකර්මය) මී අනුභවකිරීමක් මෙන් මිහිරි කොට සිතන්නේය; යදා ච, යම් කලෙක වනාහි; පාපං, (බාලයා විසින් කරණලද) අකුශල කර්මය; පච්චති, (මෙලොව අත්පාකන්නාසා කැපීම් ආදි විසින් නොයෙක් කම්කටොළු කරණු ලබන්නාහට වත් පරලොව නරකාදි සතරඅපායෙහි ඉපැද මහදුක් විඳිනාහට වත්) විපාක දේ ද; අථ, එකල්හි; බාලෝ, (දුශ්චරිතසම්බන්ධව විසූ) අඥාන තෙම, දුක්ඛං, බලවත් කායික චෛතසික දුඃඛයට; නිගච්ඡති, පැමිණෙන්නේයි.

70 **11.** මාසෙ මාසෙ කුසග්ගෙන බාලො භුඤ්ජෙථ භොජනං,
න සො සඞ්ඛාතධම්මානං කලං අග්ඝති සොළසිං.

71 **12.** න හි පාපං කතං කම්මං සජ්ජු ඛීරංව මුච්චති,
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නොව පාවකො.

---

11. බාලො, (කොහොත් තපස් කරණ) අඥානපුද්ගල තෙම; මාසෙ මාසෙ, මසක් මසක් සම්ප්‍රාප්තවූ කල්හි, හෙවත් මසක් මසක් පාසා එකවරක; කුසග්ගෙන, තණ අගින් ගෙණ; භොජනං භුඤ්ජෙථ, තෙල් මී සකුරු ආදි භොජනය අනුභව කරන්නේ වේද; සො, ඒ පුද්ගල තෙම; සඞ්ඛාතධම්මානං, පිරිසිඳ දන්නාලද චතුරාර්‍ය්‍යසත්‍යධර්මයන් ඇති ක්ෂීණාශ්‍රවයන්ගේ; සොළසිං කලං න අග්ඝති, සොළොස්වන කලාවට ද නොපැමිණෙන්නේයි ---- අපරිඥාතධර්මයන් ඇති ශීලාදිගුණයෙන් පරිබාහිර වූ තීර්ථායතනයෙහි පැවිදිවූ කොහොත් තපස් කරණ අඥාන පුද්ගල තෙම ආහාර අනුභවකළහොත් මාගේ තපස් බිඳී යෙයි එහෙයින් වාතභක්ෂණය කොට සිලපරිපූරණය කෙරෙමි යි අන්ධබාලලොකයා වඤ්චා කොට ආහාර නොවලඳ මහාජනයා විසින් හඳු කරණුලදුව තොපට අනුග්‍රහ කරණ පිණිස මුත් මට අහරින් කම් නැත, වැලිදු ගෙණෙවයි උපස්ථායකයන් විසින් එවනලද තෙල් මී සකුරු ආදියෙන් කිසිවක් තණ අගින්ගෙණ මසකට එකවරක දිවග පහරවා සෙසු අහරක් නොවලඳින්නේ හෝ වේ ද, අචේලකයන් වැලඳියයුතු වෙලාව ඉකුත්ව ගියේයයි වෙලාවෙහි කුකුස් කොට හෝ අචේලකව්‍රතයට නුසුදුසු පරිද්දෙන් උපනැයි ආහාරයෙහි කුකුස් කොට හෝ ආහාර නොවලඳන්නේ වේ ද, මෙසේ මොහු කෂ්ටව්‍රතසමාදානය කොට හවුරුදු සියයක් පිරූ තපසෙහි ඵල, පරිඥාතධර්මයන් ඇති ක්ෂීණාශ්‍රවයන්ට වෙලාවෙහි කුකුස් කොට හෝ ආහාරයෙහි කුකුස් කොට හෝ එකදවසක් අහර නොවැලඳීමෙන් උපන් කුසල්චෙතනාවගේ සොළොස්වන කලාව ද නො අගනේය යනු භාවයි:

12. කතං, සත්වයා විසින් කරණලද; පාපං කම්මං, අකුශලකර්මය තෙම; සජ්ජු, එකෙණෙහි ම, හෙවත් අකුසල් කළ විගසම; ඛීරං ඉව, (දෙනගේ තනයෙන් දොවනාලද කෙණෙහි ම මිදී නො යන) කිරි මෙන්; න මුච්චති, නොපෙරළෙන්නේයි; (ඇඹුලක් නො පහරණතක් දෝතලද විගස ම මිදී නොයන කිරිමෙන් කරණලද අකුශලකර්මය ද පෙර කළ කුශලකර්මයෙන් උපන් ස්කන්ධයන් දරමින් සිටියදී අපායෙහි නො උපදවන්නේය, කාලවිපත්ති ගතිවිපත්ති ආදියට පැමිණ කාලාන්තරයෙකින් විපාක දෙන්නේහු එසේ

72 13. යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති,
හන්ති බාලස්ස සුක්කංසං මුද්ධමස්ස විපාතයං.

73 14. අසතං භාවනමිච්ඡෙය්‍ය පුරෙක්ඛාරං ච භික්ඛුසු,
ආවාසෙසු ච ඉස්සරියං පූජා පරකුලෙසු ච.

---

විපාක දෙන්නේ ද); තං බාලං, ඒ අඥානයා; භස්මච්ඡන්නො පාවකො ඉව, හලුයෙන් වැසුනු සාලඟුරු රැසක්හු මෙන්; ඩහං, (මෙදවන තුන්වන අත්බැව නරකාදියෙහි උපන්නාහු) දවමින්; අන්වෙති, අනුව යන්නේයි.

13. බාලස්ස, බාලයා විසින්; ඤත්තං, දත්තාලද ශිල්පය, නොහොත් බොහෝදෙනාකෙරෙහි ප්‍රකටවූ බාලයාගේ ඉසුරුබව; යාව දෙව අනත්ථාය, බාලයාහට අවැඩ පිණිස ම; ජායති, වන්නේයි; බාලස්ස, බාලයාගේ; මුද්ධං, ප්‍රඥා නැමැති සිරස; විපාතයං, පලමින්; සුක්කංසං, ඔහුගේ කුසලකොට්ඨාසය; හන්ති, නසන්නේයි.— බාලයා තමා විසින් දත්තාලද ශිල්පය නිසා ද පැමිණෙනලද ඉසුරු නිසා ද තමහට අවැඩ ම කරන්නේයයි සේයි.

14. අසතං භාවනං ඉච්ඡෙය්‍ය, (අඥාන මහණ තෙම අපගේ තෙරුන්වහන්සේ ධ්‍යානලාභීසේක, සෝවාන්-සෙදගැමි-අනගැමි-රහත්සේකැයි) තම සතන්හි නො උපන් මහද්ගතලෝකොත්තරධර්මයන් අරබයා මහජනයා විසින් කරණ සම්භාවනාව කැමති වන්නේය, නොහොත් (ශ්‍රද්ධාදි ගුණරහිතවූයේ ම අපගේ තෙරුන්වහන්සේ ශ්‍රද්ධාසම්පන්නසේක, ශීලසම්පන්නසේක, බහුශ්‍රැතසේකයනාදීන්) අසද්ගුණහෙතුවෙන් ජනයා කරණ සම්භාවනා කැමති වන්නේය; භික්ඛුසු, භික්ෂූන් කෙරෙහි, හෙවත් භික්ෂූන් විසින්; පුරෙක්ඛාරං ච, (පැණ පිළිවිසීම් ආදිය කෙරෙමින් විහාරයෙහි සියලු භික්ෂූහු මා ම පිරිවරා විසූනම් යෙහෙකැයි ඉච්ඡාචාරයෙහි සිට භික්ෂූන්) පිරිවැරීම ද කැමති වන්නේය; ආවාසෙසු, සඞ්ඝික ආවාසයෙහි; ඉස්සරියං ච, ඉසුරුබව ද (හෙවත් වෙහෙර මැද පිහිටිවාසල් ඇතිව තුබූ මනා සෙනසුන් තමහට ද තමා නැකෑ නිසිවූවන්ට ද පමුණුවා වෙහෙරපසත වාසල්නැතිව තුබූ කසලබොහෝ සෙනසුන් ද යකුන් ඇති සොපද්‍රව සෙනසුන් ද ආගන්තුක භික්ෂූන්ට පමුණුවා මා මුත් අනික් කවුරුදැයි මෙසේ ආවාසයෙහි ඉසුරුබව ද) කැමති වන්නේය; පරකුලෙසු, (මවු පියන් නොවූ මල් බෑ බූනුන් ඈ නෑකම් නැති) අන් උපාසකකුලයෙහි; පූජා ච, චතුර්විධප්‍රත්‍යය පූජාව ද මට ම කෙරෙත්වයි අන්හට නොකෙරෙත්වයි කියා; ඉච්ඡති, කැමති වන්නේයි.

74 15. මමෙව කතමඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො,
මමෙව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මිචි;
ඉති බාලස්ස සඞ්කප්පො ඉච්ඡා මානො ච වඩ්ඪති.

75 16. අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බානගාමිනී,
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො;
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රූහයෙ ති.

බාලවග්ගො පඤ්චමො.

---

15. ගිහී, ගිහිමිනිස්සු ද; පබ්බජිතා, පැවිජිවූවෝ ද යන; උභො, දෙදෙන ම; මමෙව කත මඤ්ඤන්තු, (මේ පොහෝගෙය මේ බණගෙය මේ භෝජනශාලාව අපගේ තෙරුන්වහන්සේ විසින් කරණලදැයි විහාරයෙහි සියලු නවකර්මාන්ත) මා විසින් ම කරණලද්දැයි කොට සිතත්වයි කියා ද; කිස්මිචි කිච්චාකිච්චෙසු, කිසි කුදු මහත් කටයුත්තෙක්හි; මමෙව අතිවසා අස්සු, (ගෘහිප්‍රව්‍රජිතදෙපක්ෂයෙහිම ඇත්තෝ) මා ම අනුව පැවතුම් ඇති වෙත්වයි (මා වශයෙහි පවතිත්වයි මා විචාරා මුත් මට නොකියා කිසි කුදුමහත්කටයුත්තක් නොකෙරෙත්වයි කියා ද); ඉති, මෙසේ; බාලස්ස, බාලයාහට; සඞ්කප්පො, විතර්කය; (උප්පජ්ජති, උපදනේ වේ ද ඕහට විදර්ශනාමාර්ගඵලයෝ නොවඩනාහ හුදෙක්) ඉච්ඡා, සදෙර උපදනා කාමතෘෂ්ණාදි අටතුරාසියක් පමණ තෘෂ්ණා ද; මානො ච, "සෙය්‍යස්ස සෙය්‍යො හමස්මි" යනාදීන් උපදනා නවවිධමානයද; වඩ්ඪනි, (වර්ෂාදයෙහි ඔදවැඩි මුහුද මෙන්) වඩනේයි.

16. ලාභූපනිසා, ලාභ උපදවන්නාවූ ප්‍රතිපත්ති තොම; අඤ්ඤා හි, අනිකක්මය; නිබ්බානගාමිනී, නිවණට පමුණුවන්නා වූ ප්‍රතිපත්ති තොම, අඤ්ඤා හි, අනිකක් මය, (ලාභ උපදවනු කැමති මහණ විසින් කායවඞ්කාදි මද අකුශලකර්මයන් කටයුතු බැවින් ලාභ උපදවන පිළිවෙත් තොම අනිකක්මය, නිර්වාණගාමිනී පිළිවෙත් පුරණ මහණහු විසින් කායවඞ්කාදිය දුරු කොට අනන්ධ ව අන්ධයා මෙන් නොබිහිරි ව බිහිරා මෙන් නොගොළු ව ගොළුවා මෙන් අසඨ ව අමායාවී ව විසියයුතු බැවින් නිවණට පමුණුවන පිළිවෙත් තොම අනිකක්මයයි සේයි); එවං, මෙසේ; එතං, මේ ලාභොත්පාදකවූ ද නිර්වාණප්‍රාපකවූ ද කාරණය, අභිඤ්ඤාය, විශේෂයෙන් දැන; බුද්ධස්ස සාවකො, සම්‍යක්සම්බුද්ධයන්ගේ ශ්‍රාවක වූ; භික්ඛු, මහණ තෙම; සක්කාරං නාභිනන්දෙය්‍ය, අධර්මයෙන් උපදවනලද චතුර්විධප්‍රත්‍යයසඞ්ඛ්‍යාතසත්කාරය නොඉවසන්නේය; විවෙකං, කායවිවෙකාදි ත්‍රිවිධවිවෙකය; අනුබ්‍රූහයෙ, වඩන්-

76 1. නිධීනං ව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ;
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො.

77 2. ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ,
සතං හි සො පියො හොති අසතං හොති අප්පියො.

---

ගත්හි ~ ගණසඞ්ගණිකාවෙන් දුරු ව එකීභාවයයි කියනලද කායවිවෙකය ද කෙලශසඞ්ගණිකාවෙන් දුරු ව අෂ්ටසමාපත්තියයි කියනලද චිත්තවිවෙකය ද සංස්කාරසඞ්ගණිකාවෙන් දුරුව නිර්වාණයයි කියනලද උපධිවිවෙකය ද උපදවා වසන්නේයයි සේයි.

## බාලවග්ගො පඤ්චමො.

---

1. වජ්ජදස්සිනං, (මේ අසාරුප්‍යයෙන් මේ වරදින් මොහු සඟමැද නිගන්මි කරබාවම් සි රන්ධ්‍රගවෙෂී නොව නොදත් දෙය උගන්වම් දත් දෙය තර කරමි යන අනුග්‍රහබුද්ධියෙන් පුද්ගලයාගේ) වරද දක්නා සුලුවූ; නිග්ගය්හවාදිං, (කායිකවාචසික වූ කිසි නොසරුප් දෙයක් දුටු ඇසූ කල වරදට සුදුසු පරිද්දෙන් තර්ජනය කොට නිශ්‍රයප්‍රණාමනය කොට දඬුවම් කරවා සහරවින් නෙරා හික්මවමින්) නිග්‍රහ කොට බණන්නා වූ; මෙධාවිං, ධර්මෞජස්ප්‍රඥයයි කියනලද විදර්ශනාඥානයෙන් යුක්තවූ; යං, යම් කල්‍යාණමිත්‍රයෙකු; නිධීනං පවත්තාරං ඉව, (නොයෙක් රත්රුවණින් පිරුණු) මහා නිධාන සැළ තුබූ තැන් කියන්නක්හු වැනි කොට, පස්සෙ, දක්නේවේ ද; තාදිසං පණ්ඩිතං, එබඳුවූ ප්‍රාඥයා; භජෙ, සෙවුනේය; තාදිසං භජමානස්ස, එබඳු පණ්ඩිතයා සෙවුනාහට; සෙය්‍යො හොති, මෙලොව ද පරලොව ද ශ්‍රෙයස් ම (=වෘද්ධි ම) වන්නේය; න පාපියො, අවැඩෙක් නොවන්නේයි.

2. ඔවදෙය්‍ය, (යම් කල්‍යාණමිත්‍රයෙක් අන්තෙවාසිකසද්ධිවිහාරිකාදීන් අතුරෙහි යම් කිසිවක්හට උපන් වස්තුවෙහි) අවවාද කෙරේද; අනුසාසෙය්‍ය, (අනුත්පන්නවස්තුවෙහි හිතව අයසයෙකුදු වන්නේයයි අනාගතය පෑ) අනුශාසන කෙරේද, නොහොත්; ඔවදෙය්‍ය, සම්මුඛයෙහි අවවාද කෙරේද; අනුසාසෙය්‍ය, අසම්මුඛයෙහි දූතයෙකු හෝ අස්නක් හෝ යවා අනුශාසන කෙරේද; නොහොත්; ඔවදෙය්‍ය, එකවරෙක කියන්නේ අවවාද කෙරේද; අනුසාසෙය්‍ය, නැවත නැවත කියන්නේ අනුශාසන කෙරේද; අසබ්භා ච නිවාරයෙ, අකුශල ධර්මයෙන් වළකාද, හෙවත්; කුශල ධර්මයෙහි පිහිටුවාද; සො, මෙබඳු ඒ කල්‍යාණමිත්‍ර වූ පුද්ගල තෙම;

78 3. න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ,
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථ පුරිසුත්තමෙ.

79 4. ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා,
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො.

80 5. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා.

---

සතං, බුද්ධාදිසත්පුරුෂයන්ට; පියො හොති; ප්‍රියවන්නේය; අසතං, ජීවිකාර්ථි ව පැවිජිවූ අසත්පුරුෂයන්ට; අප්පියො හොති, අප්‍රිය වන්නේයි.

3. පාපකෙ මිත්තෙ, (කායදුශ්චරිතාදිඅකුශලකර්මයෙහි ඇලුණු) පාපමිත්‍රයන්; න භජෙ, නොසෙවුනේය, (=භජනය පයිරුපාසනය නොකරන්නේය); පුරිසාධමෙ, (උමං බිඳීම් මං පැහැරීම් ආදි අකෘත්‍යයෙහි යොදන ගිහිය, එක්විසි අනෙස්නෙහි අස්ථානයෙහි යොදන ප්‍රව්‍රජිතයෝය යන මේ) අධමපුරුෂයන්; න භජෙ, නො-සෙවුනේය (=භජනය පයිරුපාසනය නොකරන්නේය); කල්‍යාණෙ මිත්තෙ, (බුදු-පසේබුදු-බුද්ධශ්‍රාවකයෝය, කාය සුචරිතාදි කුශලකර්ම-යෙහි ඇලුණු සෙසු සත්පුරුෂයෝය යන මේ) කල්‍යාණමිත්‍රයන්; භජෙථ, සෙවුනේය (=භජනය පයිරුපාසනය කරන්නේය); පුරි-සුත්තමෙ, (කායදුශ්චරිතාදියෙන් දුරුව දැහැමෙන් සෙමෙන් ජීවත්-වන ගිහිය, එක්විසි අනෙස්නෙන් දුරුව පිණ්ඩපාතචර්‍යාදියෙන් ජීවත්වන ප්‍රව්‍රජිතයෝය යන මේ) උත්තම පුරුෂයන්; භජෙථ, සෙවුනේය (=භජනය පයිරුපාසනය කරන්නේයි.

4. ධම්මපීති, (නවලොකොත්තරධර්මය නාමකායයෙන් ස්පර්ශ කෙරෙමින් ආලම්බනකරණවශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් පරිඥා-ප්‍රහාණ-සච්ඡිකිරියා-භාවනාවශයෙන් දුඃඛාදිචතුරාර්‍ය-සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙමින්) ධර්මය බොන්නාවූ, හෙවත් නව-ලොවුතුරාදහම්රස වළඳන්නාවූ මහණ තෙම; සුඛං සෙති, සුවසේ සතරඉරියව්වෙන් උසන්නේයි; පණ්ඩිතො, ප්‍රාඥ වූ මහණ තෙම; විප්පසන්නෙන චෙතසා, විශෙෂයෙන් ප්‍රසන්න වූ (=නොකැලඹුණු, නිරුපක්ලෙශ වූ) සියින් යුක්තව; අරියප්පවෙදිතෙ ධම්මෙ, බුද්ධාදි-ආර්‍යයන් විසින් දන්නාලද්දාවූ සතිපට්ඨානාදි ප්‍රභේද ඇති සත්තිස් බොධිපාක්ෂික ධර්මයෙහි; සදා, හැමකල්හි ම; රමති, ඇලෙන්නේයි.

5. නෙත්තිකා, දියාළුවෝ (කෙත් ආදියට දිය මඟණ යන්නාහු); උදකං, (සිත්පින්නැති) දිය; නයන්ති, (ඇළ බිඳගෙණ වෙහෙලි

81 6. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා.

82 7. යථාපි රහදො ගම්භීරො විප්පසන්නො අනාවිලො,
එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති පණ්ඩිතා.

83 8. සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති න කාමකාමා ලපයන්ති සන්තො,
සුඛෙන ඵුට්ඨා අථවා දුඛෙන න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති.

---

නහාගෙණ පිහිලි පටවා ගෙණ තමන් කැමැති තැනකට) ගෙණ යන්නාහ; උසුකාරා, හීවඩුවෝ; තෙජනං, සිත්පිත් නැති හීදඬු; නමයන්ති, (තවා හැද මැඩ තමන් කැමැති ලෙසට) නමන්නාහ; තච්ඡකා, වඩුවෝ; දරුං, සිත්පිත් නැති දඬු; නමයන්ති, (නිම්වලලු ආදීන් පිණිස වක්කොට ද ඉදිකොට ද සැස තමන් කැමතිලෙසට) නමන්නාහ; පණ්ඩිතා, නුවනැත්තාහු; අත්තානං, තමන්ගේ සිත; දමයන්ති, (සතරමග සතරපලයට පැමිණීමෙන්) දමනයකරන්නාහුයි.

6. එකඝනො, (රන්ධ්‍රයක් පටලයක් නැතිව හැසුණු හෙයින්) එකඝන වූ; සෙලො, (පාංසුපර්වත-මිශ්‍රපර්වත නොවූ) ශෛලපර්වතය තෙම; වාතෙන, සතරදිගින් හමන ප්‍රචණ්ඩවාතයෙන්; යථා න සමීරති, යම්සේ කම්පා නොවේ ද (=නොසැලේ ද); එවං, එපරිද්දෙන් ම; පණ්ඩිතා, නුවනැත්තාහු; නින්දාපසංසාසු, නින්දා ප්‍රශංසා දෙක්හි; (හෙවත් ලාභය අලාභය අයසය යසය නින්දාය ප්‍රශංසාය සුඛය දුක්ඛය යන අෂ්ටලොකධර්මයෙහි අනුරොධ විරොධයක්, උන්නතාවනතියක් නැතිහෙයින්) න සමිඤ්ජන්ති, කම්පා නොවන්නාහුයි, (=නොසැලෙන්නාහුයි).

7. ගම්භීරො, ගැඹුරුවූ; රහදො, මහමුහුද, හෙවත් (සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති මහමුහුද යට මස්කැස්බන් විසින් චලිතවූ සතළිස්දහසක් යොදුන් තැන්ද මත්තෙහි පවනින් කම්පිත වූ සතළිස් දහසක් යොදුන් තැන්ද හැර මධ්‍යයෙහි නිශ්චල වූ සාරදහසක් යොදුන් ගැඹුර ඇති) සාගරජලය; යථාපි, යම්සේ; විප්පසන්නො, අනාකූල වූ බැවින් විශෙෂයෙන් ප්‍රසන්න ද; අනාවිලො, මඩ නැති බැවින් හා නිශ්චල බැවින් හා) නොකැලඹිනි ද; එවං, එපරිද්දෙන් ම; ධම්මානි සුත්වාන, බුදුන්ගේ දෙශනාධර්මයන් අසා (ශ්‍රොතාපත්තිමාර්ගාදියට පැමිණීම්වසයෙන් නිරුපක්ලෙශ වූ සිත් ඇතිබවට පැමිණෙන්නාවූ); පණ්ඩිතා, නුවනැත්තාහු; විප්පසීදන්ති, විශෙෂයෙන් ම ප්‍රසන්න වන්නාහුයි.

8. සප්පුරිසා, (ශීලාදිගුණයොගයෙන් ප්‍රශස්ත වූ) උත්තම පුරුෂයෝ; වෙ, ඒකාන්තයෙන්; සබ්බත්ථ, ස්කන්ධායතනාදි

84 9. න අත්තහෙතු න පරස්ස හෙතු,
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං;
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො,
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා.

85 10. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.

---

සියලු ධර්මයෙහි ඡන්දරාගය; වජන්ති (අර්හත්මාර්ගඥානයෙන්) දුරු-කරන්නාහ, හෙවත් නසන්නාහ; සන්තො, ඒ සත්පුරුෂයෝ; කාම-කාමා; වස්තුකාමයන් කැමතිව, හෙවත් සතරපස එලවා ගන්නා කැමැති ව; න ලපයන්ති, ඉච්ඡාචාරයෙහි සිට (කිමෙක්ද උපාසකයෙනි තොපට සුවද, රෝදුක් නැද්ද, යනාදීන්, උපාසකවරුන් සිත් ගන්නා තෙපුල් නොකියන්නාහ; සුඛෙන ඵුට්ඨා, සුවයෙන් වළඳනාලද්දවූ ද; අථවා, නොහොත්; දුක්ඛෙන ඵුට්ඨා; දුඃඛයෙන් වළඳනාලද්දවූ ද, හෙවත් අෂ්ටලෝකධර්මයෙන් වළඳනාලද්දවූ; පණ්ඩිතා, නුවණැත්තෝ; උච්චාවචං, (උපාසකජනයාගේ ගුණාගුණ කීම් වශයෙන්) උසවූ ද නීච වූ ද ආකාරයක්; න දස්සයන්ති, නොදක්වන්නාහුයි.

9. න අත්තහෙතු, (පණ්ඩිතපුරුෂ තෙම) තමා හේතු කොට ගෙණ ද, හෙවත් තමා පිණිස ද පව් නොකරන්නේය; න පරස්ස-හෙතු, මෙරමා හෙතුකොට ගෙණ ද, හෙවත් අනුන් පිණිස ද පව් නොකරන්නේය; පුත්තං, පව්කම් කිරීමෙන් ලැබියයුතු පුතෙකු ද; න ඉච්ඡෙ, නොකැමැති වන්නේය; ධනං, පව්කම් කිරීමෙන් ලැබියයුතු ධනය ද; න ඉච්ඡෙ, නොකැමැති වන්නේය; රට්ඨං, පව්කම් කිරීමෙන් ලැබියයුතු රටක් ද; න ඉච්ඡෙ, නොකැමැති වන්නේය; අධම්මෙන, අධර්මයෙන්; අත්තනො, තමහට ලැබියයුතු; සමිද්ධිං, සමෘද්ධිය; න ඉච්ඡෙය්‍ය, යමෙක් නොකැමැතිවේ ද; සො, හෙතෙම; සීලවා, සිල්වත් නමුදු වන්නේය; පඤ්ඤවා, ප්‍රඥාවත් නමුදු වන්නේය; ධම්මිකො සියා, ධාර්මික නමුදු වන්නේයි.

10. මනුස්සෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; යෙ ජනා, යම් ජන-කෙනෙක්; පාරගාමිනො, පාරයයි කියනලද නිර්වාණයට යන සුල්ලෝ ද; තෙ, ඒ ජනයෝ; අප්පකා, ස්වල්පයහ, හෙවත් මඳ මඳතෙනක; අථ, නැවත; ඉතරා, ඔවුන් කෙරෙන් අන්‍යවූ, (=නිවණට නොයන සුලුවූ); අයං පජා, මේ ප්‍රජා තොම, හෙවත් මේ සත්වයනු-

86 **11. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො,**
**තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.**

87 **12. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො,**
**ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.**

88 **13. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො,**
**පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.**

---

භයා වූ කලි; තීරමෙව, සකායතීරයට ම," හෙවත් මෙතරට ම; අනුධාවන්ති, දිවත්තේයි — එතෙරට යන්නවුන්ට වඩා මෙතෙරට එන්නෝ ම බොහෝවූහයි සේයි.

11. යෙ ච ඛො, යම් පණ්ඩිත කෙනෙක් වනාහි; සම්මදක්ඛාතෙ, නිවණට පමුණුවන සේ මනා කොට දෙසනලද්දා වූ; ධම්මෙ, දෙශනා ධර්මයෙහි; ධම්මානුවත්තිනො, (ඒ ධර්මය අසා එයට අනුරූපවූ පිළිවෙත් පුරා මාර්ගඵලප්‍රත්‍යක්ෂ කිරීමෙන්) ධර්මය අනුව පවතිද්ද; තෙ ජනා, ඒ පණ්ඩිතජනයෝ; මච්චුධෙය්‍යං, ක්ලේශමාරයාහට වාසස්ථාන වූ, හෙවත් ක්ලේශමාරයාගේ ආඥ පවත්නා වූ; සුදුත්තරං, දුවසෙසින් ම එතරවිය නොහැක්කා වූ (ත්‍රෛභූමිකවෘත්තය ඉක්ම); පාරං, නිර්වාණයයි කියනලද පාරයට; එස්සන්ති, පැමිණෙන්නාහුයි.

12. පණ්ඩිතො, නුවණැති මහණ තෙම; කණ්හං ධම්මං විප්පහාය, කායදුශ්චරිතාදි අකුශලධර්මය දුරුකොට; ඔකා, ආලයෙන් නික්ම, හෙවත් ආලයසංඛ්‍යාත ගිහිගෙන් නික්ම; අනොකං ආගම්ම, ගේනැති ප්‍රව්‍රජ්‍යාවට පැමිණ, නොහොත් නිරාලයයි කියනලද නිර්වාණය පිණිස, හෙවත් ඒ නිර්වාණය ප්‍රාර්ථනා කරන්නේ; සුක්කං භාවෙථ, කායසුචරිතාදිභෙද ඇති කුශලධර්මය අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත්මාර්ගාධිගමය දක්වා වඩන්නේයි; යත්ථ විවෙකෙ, නිර්වාණයයි කියනලද යම් උපධිවිවෙකයෙක්හි; දූරමං, මේ සත්වයන් විසින් අභිරමනය කරන්නට නොපිළිවන් ද.

13. තත්‍ර, (මේ ලෞකිකමහාජනයා විසින් සිත් අලවන්නට නොපිළිවන් වූ) ඒ නිර්වාණයෙහි; අභිරතිං, ඇල්ම; ඉච්ඡෙය්‍ය, කැමැති වන්නේය; පණ්ඩිතො, නුවණැති මහණ තෙම; කාමෙ, වස්තුකාමක්ලේශකාමයන්, හිත්වා, දුරු කොට, හෙවත් සිතින් පහකොට; අකිඤ්චනො, රාගාදික්ලේශපලිබොධරහිත වූ යේ නොහොත් පුත්‍රදාර-දාසිදාස-ගවමහිෂ-ධනධාන්‍යාදි) පලිබොධයක් නැත්තේ; චිත්තක්ලෙසෙහි, චිත්තසන්තානය කෙලෙසන

89 11. යෙසං සම්බොධි අඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා;
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතාති.

## පණ්ඩිතවග්ගො ඡට්ඨො,

---

90 1. ගතද්ධිනො විසොකස්ස විප්පමුත්තස්ස සබ්බධි,
සබ්බගන්ථප්පහීනස්ස පරිළාහො න විජ්ජති.

---

හෙයින් විනාශකළඤ නම් වූ කාමච්ඡන්දාදිපඤ්චනීවරණයන් කෙරෙන්; අත්තනං, තමා; හෙවත් තමාගේ සිත; පරියොදපෙය්‍ය, මනා කොට දුවූ රන්රනක් මෙන් නිර්මල කරන්නේයි.

14. යෙසං, යම් ක්ෂීණාශ්‍රව කෙනෙකුන්ගේ; චිත්තං, සිත; සම්බොධි අඞ්ගෙසු, සප්තබොධ්‍යඞ්ගධර්මයන් විෂයෙහි, නොහොත් සප්තත්‍රිංශද්බොධපාක්ෂිකධර්මයන් විෂයෙහි; සම්මා, මනා කොට නයහෙයින් කාරණහෙයින්; සුභාවිතං, මනා කොට වඩනලද ද; අනුපාදාය, (කාමොපාදානාදි චතුරුපාදානයන් අතුරෙන් කිසි උපාදානයක් මමාය මාගේ යයි නොගෙණ; ආදානපටිනිස්සග්ගෙ, ආදානයයි කියනලද ග්‍රහණයට ප්‍රතිපක්ෂවූ, හෙවත් ග්‍රහණයක් නැත්තාවූ නිර්වාණයෙහි; යෙ, යම් ක්ෂීණාශ්‍රවකෙනෙක්;' රතා, ඇලුනාහු ද; ජුතිමන්තො, අනුභාවවත්වූ, හෙවත් ඥානානුභාව ඇති; තෙ ඛීණාසවා, ක්ෂීණවූ චතුරාශ්‍රව ඇති ඒ ආර්‍ය්‍යයෝ; ලොකෙ, ස්කන්ධායතනාදිලොකයෙහි; පරිනිබ්බුතා, පිරිනිවියෝ නම් වෙත්. අර්හත්ඵලයට පැමිණි තැන් පටන් ක්ලෙශවර්තය ක්ෂය කළ හෙයින් සඋපාදිශෙෂනිර්වාණධාතුවෙන් ද චරිමවිඥානනිරොධයෙන් ස්කන්ධවර්තය ක්ෂය කළ හෙයින් අනුපාදිශෙෂනිර්වාණධාතුවෙන් දැයි මේසේ විවිධ පරිනිර්වාණයෙන් පිරිනිවියාහු නිරුපාදාන වූ ප්‍රදීපයක් මෙන් අප්‍රඥප්තික බවට හෙවත් නම් නැතිබවට පැමිණෙන්නාහයි යී.

## පණ්ඩිතවග්ගො ඡට්ඨො.

---

1. ගතද්ධිනො, සසරනැමැති කතරමග ඉක්ම ගියහෙයින් ගතද්ධි වූ, හෙවත් ගොස් නිමවනලද සංසාරමාර්ගී ඇති; විසොකස්ස, වට්ටමූලක වූ ශොකය අනාගාමිමාර්ගයෙන් ම ප්‍රහීණ කළහෙයින් නිශ්ශොකවූ; සබ්බධි, ස්කන්ධායතනාදි ප්‍රභෙද ඇති සියලු ධර්මයෙහි නොඇලි; විප්පමුත්තස්ස, එයින් මුක්තවූ; සබ්බගන්ථප්පහීනස්ස, අභිධ්‍යාකායග්‍රන්ථාදි සියළු ග්‍රන්ථයන් ප්‍රහීණ කළාවූ ක්ෂීණාශ්‍රවයාහට; පරිළාහො, චෛතසික පරිදාහයෙක්; න විජ්ජති, නැත්තේයි.

91 2, උය්‍යුඤ්ජන්ති සතිමන්තො න නිකෙතෙ රමන්ති තෙ,
හංසාව පල්ලලං හිත්වා ඔකමොකං ජහන්ති තෙ.

92 3. යෙසං සන්නිචයො නත්ථි යෙ පරිඤ්ඤාතභොජනා,
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යෙසං ගොචරො;
ආකාසෙව සකුන්තානං ගති තෙසං දුරන්නයා.

---

2. සතිමන්තො, සමෘතිසම්පන්නවූ ක්ෂීණාශ්‍රවයෝ; උය්‍යුඤ්ජන්ති, (තමන් විසින් ප්‍රතිවෙධ කරනලද ලොකොත්තර ගුණයෙහි ද ධ්‍යානවිදර්ශනාදියෙහි ද ආවජ්ජන-සමාපජ්ජන-උට්ඨාන-අධිට්ඨාන-පච්චවෙක්ඛණවශයෙන්) යෙදෙත් නාහ (=ඝටනය ව්‍යායාමය කරත්නාහ); තෙ, ඒ ක්ෂීණාශ්‍රවයෝ; නිකෙතෙ, ආලයෙහි; න රමන්ති, නො ඇලෙත් නාහ; (ඔවුන්ට පඤ්චකාමසඞ්ඛ්‍යාත ආලයෙහි ද ගිහිගෙයයි කියනලද ආලයෙහි ද අභිරතියෙක් නම් නැති); තෙ, ඒ ක්ෂීණාශ්‍රවයෝ; පල්ලලං හිත්වා, (ගොදුරු ගත් විල ආලයක් නොකොට නිරපෙක්ෂව ඒ) විල හැර පියා යන්නාවූ; හංසා ඉව, හංසයන් මෙන්, හෙවත් හංස-පිලව-කාරණ්ඩව-බක-බලාකාදි-පක්ෂීන් ගොචරසම්පන්න වූ පියුම්විලෙක ගොචරග්‍රහණය කොට ඒ ඒ අත යන කල මේ මාගේ දියය මාගේ මඩය මාගේ පියුමය මාගේ උපුලය මාගේ තණයයි ඒ විල කිසිවෙක ආලයක් නොකොට නිරපෙක්ෂව ම, ඒ) විල හැර අහසට නැගී කෙලිමින් ඒ ඒ තැනට යන්නවුන් මෙන්; ඔකමොකං, ආලයක් ආලයක් පාසා; ජහන්ති, හරණාහුයි, හෙවත් සියලු ආලයන් හරණාහුයි ― ක්ෂීණාශ්‍රවයෝ යම්කිසි තැනක වසන්නාහු ද කුලෙහි වත් ගෙණෙහි වත් අලගනාව ම වෙසෙති, එයින් අනිත් තැනකට යන්නාහු ද මේ මාගේ විහාරය මේ මාගේ පිරිවෙණය මේ මාගේ උපාසකවරු යයි විහාරාදියෙහි ආලය නොකොට පක්ෂීන් මෙන් නිරපෙක්ෂව ම යන්නාහයි සේයි.

3. යෙසං, යම් ක්ෂීණාශ්‍රව කෙනෙකුන්ට; සන්නිචයො නත්ථි, කුශලාකුශලසඞ්ඛ්‍යාත කර්මසන්නිචයෙක් වත් චීවරාදී චතුර්විධප්‍රත්‍යය සන්නිචයෙක් වත් නැද්ද; යෙ, යම් ක්ෂීණාශ්‍රවකෙණෙක්; පරිඤ්ඤාතභොජනා, පිරිසිඳ දත්නාලද ආහාර ඇත්තාහු ද, හෙවත් යාගුභත්තාදීන්ගේ ධාර්මිකාධාර්මිකභාවය දන්ම යයි කියනලද ඤාතපරිඥාය ආහාරයෙහි ප්‍රතිකූලසංඥ යයි කියනලද තීරණපරිඥාය කබලීකාරාහාරයෙහි ඡන්දරාගප්‍රහාණය යන පහාණපරිඥාය යන මේ ත්‍රිවිධපරිඥාවශයෙන් පිරිසිඳ දත්නාලද ඛජ්ජ-භොජ්ජ-ලෙය්‍ය-පෙය්‍ය-සඞ්ඛ්‍යාත චතුර්විධආහාර ඇත්තාහු ද; සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො, රාගාදියෙන් ශූන්‍යහෙයින් ද ඔවුන්

4\. යස්සාසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො,
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො;
ආකාසෙව සකුන්තානං පදං තස්ස දුරන්නයං.

5\. යස්සින්ද්‍රියානි සමථං ගතානි අස්සා යථා සාරථිනා සුදන්තා,
පහීනමානස්ස අනාසවස්ස දෙවාපි තස්ස පිහයන්ති තාදිනො.

---

කෙරෙන් විමුක්ත හෙයින් ද සුඤ්ඤතවිමොක්ඛ නම් වූ ද රාගාදි නිමිත්ත රහිත හෙයින් ද ඔවුන් කෙරෙන් විමුක්ත හෙයින් ද අනිමිත්තවිමොක්ඛ නම් වූ ද රාගාදිප්‍රණිධි රහිත හෙයින් ද ඔවුන් කෙරෙන් විමුක්ත හෙයින් ද අප්පණිහිතවිමොක්ඛ නම් වූ ද නිර්වාණය තෙම; යස්සයි සේසී-යෙසං, ඵලසමාපත්තිවසයෙන් නිවන් අරමුණු කොට වසන්නාවූ යම් ක්ෂීණාශ්‍රව කෙනෙකුන්ට; ගොචරො, අරමුණු වේ ද; තෙසං, ඒ ක්ෂීණාශ්‍රවයන්ගේ; ගති, දෙව-ගතිආදිවූ උත්පත්තිගති තොම; ආකාසෙ සකුන්තානං ඉව, ආකාශ-යෙහි පක්ෂීන් ගිය මග මෙන්; දුරන්නයා, නොදතහැක්කිසි.

4\. යස්ස, යම් ක්ෂීණාශ්‍රවයක්හට; ආසවා, කාමාශ්‍රවාදි චතුරා-ශ්‍රවයෝ; පරික්ඛීණා, ක්ෂයවූහු ද; ආහාරෙ ච, කබලිඞ්කාරාහාර-යෙහි ද; අනිස්සිතො, තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් යමෙක් නොඇලිති ද; සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො, රාගාදියෙන් ශූන්‍ය හෙයින් ද ඔවුන් කෙරෙන් විමුක්ත හෙයින් ද සුඤ්ඤතවිමොක්ඛ නම් වූ ද රාගාදිනිමිත්ත රහිත හෙයින් ද ඔවුන් කෙරෙන් විමුක්තහෙයින් ද අනිමිත්තවිමොක්ඛ නම් වූ ද රාගාදිප්‍රණිධි රහිත හෙයින් ද එයින් විමුක්ත හෙයින් ද අප්පණිහිතවිමොක්ඛ නම් වූ ද නිර්වාණය; යස්ස, (ඵලසමාපත්තිවසයෙන් නිවන් අරමුණුකොට වසන්නාවූ) යම් ක්ෂීණාශ්‍රවයක්හට; ගොචරො, අරමුණු වේ ද; තස්ස, ඒ ක්ෂීණාශ්‍රව-යාගේ, පදං, පිය; ආකාසෙ සකුන්තානං ඉව, ආකාශයෙහි පක්ෂීන්ගේ පය මෙන්; දුරන්නයං, නොදතහැක්කේයි.— යම්සේ අහස යන පක්ෂීන්ගේ පියක් නොදක්ක හැකි ද මෙතන පයින් ඇන්ම ගියේය මෙතැන ළෙන් පැහැර ගියේය මෙතැන හිසින් පැහැර ගියේය මෙතැන පියාපයන් පැහැර ගියේයයි දක්නට නොපිළිවන් ද එසේම මෙබඳු මහණුන්ගේ පිය ද නරකපියෙන් ගියේය තිරිසන්යොන්පියෙන් ගියේය යනාදීන් ගිය පිය දක්නට නොපිළිවනැයි සේයි.

5\. යස්ස, යම් ක්ෂීණාශ්‍රවයක්හුගේ; ඉන්ද්‍රියානි, චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ; සාරථිනා, දක්ෂවූ රථාචාර්යයක්හු විසින්; සුදන්තා, මොනොකොට දම-නලද; අස්සා යථා, ආජානීය අශ්වයන් මෙන්; සමථං ගතානි,

95 **6. පඨවිසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො තාදි සුබ්බතො,**
**රහදොව අපෙතකද්දමො සංසාරා න භවන්ති තාදිනො.**

96 **7. සන්තං තස්ස මනං හොති සන්තා වාචා ච කම්ම ච,**
**සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො.**

---

සමථයට ගියෝ ද; (=මනා කොට දැමුනෝ ද, නිෂ්පාපිබවට පැමිණියෝ ද); පහීණමානස්ස, ("සෙය්‍යස්ස සෙය්‍යො හමස්මි"යනාදි වශයෙන් ප්‍රවෘත්ත වූ නවවිධ මානය ඉක්ම ගිය හෙයින්) ප්‍රහීණ වූ මන් ඇති; අනාසවස්ස, (චතුරාශ්‍රවයන්ගේ අභාවයෙන්) ආශ්‍රව-රහිත වූ; තාදිනො, (අෂ්ටලොකධර්මයෙහි අනුරොධවිරොධරහිත හෙයින්) තාදී වූ; තස්ස, ඒ ක්ෂීණාශ්‍රවයාගේ දැක්ම; දෙවාපි, දෙවියෝ ද මිනිස්සු ද; පිහයන්ති, පතත් නාහුයි,(=කැමතිවත් නාහුයි)

6. පඨවිසමො, (ශුචි වූ මාලාගන්ධාදීන්ගේ නිඃක්ෂෙපයෙහි ද අශුචි වූ මූත්‍රපුරීෂාදීන්ගේ නිඃක්ෂෙපයෙහි ද අනුරොධවිරොධරහිත වූ මහපොළොව මෙන් උපකාරාපකාරීන් කෙරෙහි අනුරොධවිරොධ රහිත හෙයින්) පොළොව හා සම වූ; ඉන්දඛීලූපමො, (මලමූත්‍රාදි-යෙන් කෙලෙසා අසත්කාරකරන්නවුන් කෙරෙහි ද මාලාගන්ධාදි-යෙන් පූජාසත්කාර කරන්නවුන් කෙරෙහි ද ප්‍රතිඝානුනය වර්ජිත වූ නුවර දොර හිඳුවනලද ඒෂිකාස්තම්භයක් මෙන් චතුර්විධ ප්‍රත්‍යයෙන් සත්කාර කරන්නවුන් කෙරෙහි ද නොකරන්නවුන් කෙරෙහි ද අනුනය ප්‍රතිඝරහිතව සම අදහස් ඇති බැවින් ඒෂිකා-ස්තම්භයක් බඳු වූ; තාදී, අෂ්ටලොකධර්මයෙන් අකම්ප්‍ය හෙයින් තාදිවූ; සුබ්බතො, සුන්දරවූ ධුතාඞ්ගව්‍රත ඇති යම් ක්ෂීණාශ්‍රවයෙක්; නො විරුජ්ඣති, (ජාත්‍යාදියෙන් ගර්‍වා ආක්‍රොශ කරන්නහුට වත් අතින් පයින් දණ්ඩෙන් සැතින් පහරණහුට වත්) විරුද්ධ නොවේ ද, ඉහවත් නොකිපේ ද; අපෙතකද්දමො, පහවූ මඩ ඇති; රහදො ඉව, විලක් මෙන් ප්‍රසන්නවේ ද, හෙවත් මඩ නැතිව පහන් සිහිල් දිය පිරුණු ගැඹුරු මහවිලක් මෙන් රාගාදි කෙලෙස් මඩ නැතිබැවින් ප්‍රසන්නවේ ද; තාදිනො, අෂ්ටලොකධර්මයෙහි නිර්විකාර හෙයින් තාදී වූ ඒ ක්ෂීණාශ්‍රවයාහට; සංසාරා න භවන්ති, (සුගති දුගතීයෙහි චුතිප්‍රතිසන්ධිවශයෙන් සංසරණයක් නැති හෙයින්) සංසාරයෝ නොවන්නාහුයි.

7. සම්මා, මනාකොට නය හෙයින් කාරණ හෙයින්; අඤ්ඤාය, චතුරාර්‍යසත්‍යයන් දැන; විමුත්තස්ස, තදඞ්ගවිමුක්ත්‍යාදිපඤ්චවිධ-විමුක්තියෙන් විශෙෂයෙන් මුක්ත වූ; තාදිනො, අෂ්ටලොකධර්ම-යෙහි අකම්ප්‍යවූ; තස්ස, ඒ ක්ෂීණාශ්‍රවයන්ගේ; මනං, චිත්තය;

97 8. අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො,
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො.

98 9. ගාමෙ වා යදි වාරඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ,
යත්ථ අරහන්තො විහරන්ති තං භූමිං රාමණෙය්‍යකං.

99 10. රමණීයානි අරඤ්ඤානි යත්ථ න රමතී ජනො,
වීතරාගා රමෙස්සන්ති න තෙ කාමගවෙසිනො ති.

අරහන්තවග්ගො සත්තමො.

---

සන්තං හොති, (අභිධ්‍යාදි ත්‍රිවිධමනොදුශ්චරිතයෙන් දුරු හෙයින්) ශාන්ත ම වන්නේය, (=සන්හුන්නේ ම, නිවීගියේ ම වන්නේය); වාචා ච සන්තා හොති, (මෘෂාවාදාදි චතුර්විධවාග්දුශ්චරිත රහිත හෙයින්) වාචා ද ශාන්තවන්නීය; (=සන්හිඳී ම නිවී ම පවත්නීය); කම්මං ච සන්තං හොති, (ප්‍රාණඝාතාදි ත්‍රිවිධකායදුශ්චරිතයෙන් දුරු වූ හෙයින්) කායකර්මය ද ශාන්ත ම වන්නේය, (=සන්හිඳී ම නිවී ම පවත්නේයි).

8. යො නරො, යම් පුද්ගලයෙක්; අස්සද්ධො, (තමා විසින් ප්‍රතිවෙධ කරනලද ධ්‍යානවිදර්ශනාමාර්ගඵලාදි ලෞකික ලොකොත්තර ගුණධර්මයන් තමා ම පසක් කොට දත් හෙයින්) අනුන්ගේ බසින් නොඅදහා ද, නොහොත් බුදුන් විනා අන්‍යශාස්තෘවක්හු කෙරේ ඇදහිලි නැත්තේ ද; අකතඤ්ඤූ ච, දිව්‍යබ්‍රහ්මාදි කිසිවෙක්හු විසින් නොකරනලද හෙයින් අකත නම් වූ) නිර්වාණය ආලම්බනකරණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කොට දත් ද; සන්ධිච්ඡෙදො ච, වෘත්තසන්ධිය ද සංස්කාරසන්ධිය ද සිඳ පී ද; හතාවකාසො, (කුශලාකුශලකර්මසඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධිබීජය ක්ෂීණ හෙයින්) නසනලද්දාවූ ප්‍රතිසන්ධ්‍යවකාශ ඇත්තේ ද; වන්තාසො, (චතුර්විධආර්‍යමාර්ගඥානමුඛයෙන්) වමනය කරනලද කාමතෘෂ්ණාදි සියලු ආශා ඇත්තේ ද; සො, ඒ පුද්ගල තෙම; වෙ, ඒකාන්තයෙන්; උත්තමපොරිසො, (ප්‍රතිවෙධකරනලද නවලොකොත්තරධර්ම ඇති හෙයින් සකලලොකයහට අග්‍රදක්ෂිණෙය්‍යනුයි) උත්තම පුරුෂ නම් වේ.

9. ගාමෙ වා, ගමෙක හෝ; යදි, නොහොත්; අරඤ්ඤෙ වා, අරණ්‍යයෙක හෝ; නින්නෙ වා, වළතැනෙක හෝ; යදි, නොහොත්; ථලෙ වා; ගොඩතැනෙක හෝ; යත්ථ, යම් තැනෙක්හි; අරහන්තො විහරන්ති, රහත්හු වාසය කෙරෙද්ද; තං භූමිං, ඒ භූමිප්‍රදෙශය; රාමණෙය්‍යකං, රමණීයයි, (=සිත්කලුයි).

10. අරඤ්ඤානි, (සුපුෂ්පිතතරුවනෂණ්ඩමණ්ඩිත වූ නිර්මලශුචිශීතල සලිල සම්පන්න වූ) මහාඅරණ්‍යයෝ; රමණීයානි, රමණීයහ, (=සිත්

100 **1. සහස්සමපි චෙ වාචා අනත්ථපද සංහිතා,**
**ඒකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.**

101 **2. සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා,**
**ඒකං ගාථා පදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.**

---

අලවන්නාහ); යත්, යම් මහාඅරණ්‍යයෙක්හි; ජනො, (වස්තුකාම්-ක්ලෙශකාමයන් සොයන සුලුවූ) ලෞකිකමහාජන තෙම; න රමති, (පුල්පියුම් වෙනෙහි නො ඇලෙන නිලමැස්සන් මෙන්) නොඇලේ ද; (මේ මහා අරණ්‍යයෙහි හුදකලාව වසන්නාවූ මට සිංහව්‍යාඝ්‍රයන් විසින් යක්ෂ රාක්ෂසයන් විසින් දීඝජාතීන් විසින් සොරුන් සතුරන් විසින් ජීවිතාන්තරාය ද වන්නේයයි භය ම උපදවා ද එසේවූ අරණ්‍යයෙහි) වීතරාගා, විගතවූ කාමරාගරූපරාග අරූපරාග ඇති ක්ෂීණාශ්‍රවයෝ; රමෙස්සන්ති, (පුල්පියුම්වට බඹරුන් මෙන් ප්‍රීතිමත්ව) ඇලෙන්නාහුයි; කුමක් හෙයින්ද යත්? න, ඒ ක්ෂීණාශ්‍රවයෝ; න කාමගවෙසිනො, යම් හෙයකින් වස්තුකාමක්ලෙශකාමයන් සොයන පුල්ලෝ නොවෙද්ද එහෙයිනි.

**අරහන්තවග්ගො සත්තමො.**

---

1. අනත්ථපදසංහිතා, (නිර්වාණ ප්‍රකාශක නොවූ ආකාශවර්ණනා-පර්වතවර්ණනා-වනවර්ණනා-පුරවර්ණනාදි වූ) අනර්ථපදයෙන් යුක්ත වූ; නොහොත් අවැඩකොටසින් යුක්ත වූ; වාචා, වාචාවෝ, හෙවත් තෙපුල්හු; චෙ, ඉදින්; සහස්සං අපි, දහසෙක් නමුදු ඔහු උත්තම නොවෙති; යං සුත්වා, (පඤ්චස්කන්ධවාදශායතනාදි වූ) යම් එක අර්ථපදයකු දු අසා; උපසම්මති, (පුද්ගල තෙම රාගාදික්ලෙශව්‍යුපශමයෙන්) සන්හිඳේ ද එසේ වූ; ඒකං අත්ථපදං, (නිර්වාණප්‍රතිසංයුක්ත වූ ස්කන්ධධාත්වායතනාදීන් ප්‍රකාශ කරන්නාවූ (අර්ථසාධක එකපදයකු දු; සෙය්‍යො, උත්තමයි.

2. අනත්ථපදසංහිතා, (නිර්වාණප්‍රකාශක නොවූ ආකාශවර්ණනා-පර්වතවර්ණනා-වනවර්ණනා-පුරවර්ණනාදි වූ) අනර්ථපදයෙන් යුක්ත වූ, නොහොත් අවැඩ කොටසින් යුක්ත වූ; ගාථා, ගාථාවෝ; චෙ, ඉදින්; සහස්සං අපි, දහසෙක් වූ නමුදු ඔහු උත්තම නොවෙති; යං සුත්වා, "අප්පමාදො අමතපදං" යනාදි වූ නිර්වාණප්‍රකාශක වූ) යම් එක ගාථාපදයකු දු අසා; උපසම්මති, පුද්ගල තෙම රාගාදික්ලෙශව්‍යුපශමයෙන් සන්හිඳේ ද එසේ වූ; ඒකං ගාථාපදං, එකගාථාපදයකු දු; සෙය්‍යො, උත්තමයි.

102 **3. යො ච ගාථාසතං භාසෙ අනත්ථපදසංහිතා,**
**එකං ධම්මපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.**

103 **4. යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ,**
**එකං ච ජෙය්‍ය අත්තානං ස වෙ සඞ්ගාමජුත්තමො.**

104 **5. අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා,**
**අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො.**

---

3. යො, යම් පුද්ගලයෙක් තෙම; ච, ඉදින්; අනත්ථපදසංහිතා, ආකාශවර්ණනාදි අනර්ථපදයෙන් යුක්ත වූ, නොහොත් අවැඩ කොටසින් යුක්ත වූ; ගාථාසතං භාසෙ, ගාථා සියයක් කියේ නමුදු, ඒ ගාථාවෝ උත්තම නොවෙති; යං සුත්වා, යම් එක ධර්මපදයකු දු අසා; උපසම්මති, (පුද්ගල තෙම රාගාදිකෙලෙශව්‍යුපසමයෙන්)සන්හිඳේ ද; එසේ වූ; එකං ධම්මපදං, ("අනභිජ්ඣා පරිබ්බාජකා ධම්මපදං අව්‍යාපාදො පරිබ්බාජකා ධම්මපදං" යනාදි වූ අර්ථසාධක වූ ස්කන්ධධාත්වායතනාදි ප්‍රතිසංයුක්ත වූ) එක ධර්මපදයකු දු; සෙය්‍යො, උත්තමයි.

4. යො, යම් සංග්‍රාමයොධයෙක්; සහස්සෙන, දහසකින් ගුණනලද; සහස්සං මානුසෙ, මිනිසුන් දහසක්, හෙවත් දශලක්ෂයක් පමණ මිනිසුන්; සංගාමෙ, එකම යුද්ධයෙක; ජිනෙ, දිනුයේ වී නමුත්, (හෙතෙම ජයලද්දේ නමුදු නොවෙයි, උත්තමයොධ නමුදු නොවේ; වැලි ජයලද්දේ නමුදු උත්තම යොධ නමුදු කවරේද යත්?); යො, යමෙක් වනාහි; එකං, එක ම; අත්තානං, ආත්මය, හෙවත් තමා ම; ජෙය්‍ය, (රාත්‍රිස්ථානදිවාස්ථානයෙහි ආධ්‍යාත්මික වූ කර්මස්ථානසනමශීනය කරන්නේ තමාගේ සන්තානයෙහි ලොභාදිකෙලශයන් දිනීමෙන්) දිනුයේ වී ද; සො, හෙතෙම; වෙ, එකාන්තයෙන්; සඞ්ගාමජුත්තමො, සංග්‍රාමජිත් නම, හෙවත් යුද්ධයෙහි දිනුවඋත්ව උත්තමයොධ නම් වේ.

5. අත්තා, ආත්මය තෙම; ජිතං, දිනනලද්දේ, හෙවත් තමාගේ චිත්තසන්තානයෙහි උපන් රාගාදිකෙලශයන් දිනීම් වසයෙන් පරදවනලද්දේ; හවෙ, එකාන්තයෙන්; සෙය්‍යො, උත්තමයි; යාචායං ඉතරා පජා, යම් මේ අන්‍ය වූ ප්‍රජාවක්, හෙවත් යම් මේ සෙසු සත්ව සමූහයක් දූකෙළීමෙන් හෝ ධනහරණයෙන් හෝ යුද්ධ කිරීමෙන් හෝ බලාභිභවයෙන් හෝ යමක්හු විසින් දිනනලද්ද ඔහුගේ ඒ දිනීම උත්තම නොවන්නේයි, කුමක් හෙයින් ද යත්?) අත්තදන්තස්ස, නිකෙලෙස් හෙයින් ආත්මදමනය කළා වූ; නිච්චං, සතතයෙන්; සඤ්ඤතචාරිනො, කයින් වචසින් සංයත වූ පැවතුම් ඇති; පොසස්ස, පුරුෂයාගේ දිනීම නො දිනුවා නො කොට හැකි ද එහෙයින්.

105 6. නෙව දෙවො න ගන්ධබ්බො න මාරො සහ බ්‍රහ්මුනා,
ජිතං අපජිතං කයිරා තථාරූපස්ස ජන්තුනො.

106 7. මාසෙ මාසෙ සහස්සෙන යො යජෙථ සතං සමං,
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ;
සායෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතං.

107 8. යො ච වස්ස සතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ,
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ;
සායෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතං.

---

6. තථාරූපස්ස, එබඳු වූ, හෙවත් ආත්මදමනය කළා වූ සතත-යෙක් කායවාක්සංයම ඇති; ජන්තුනො, පුද්ගලයාගේ; ජිතං, කෙලෙස් දිනීම; දෙවො, ශක්‍රාදිදෙවියෙක්; නෙව අපජිතං, කයිරා, නොදිනුවා නො ම කොට හෙන්නේය, න ගන්ධබ්බො, තිම්බරුනාර-දාදිගන්ධර්වයෙක් නොදිනුවා නො කොට හෙන්නේය; බ්‍රහ්මුනා සහ, මහාබ්‍රහ්මයා හා සමග; මාරො, වශවර්තී මාරයා ද; න, නොදිනුවා නොකොට හෙන්නේසි [illegible] කිසිවක්හු විසින් ධනහරණාදියෙන් පරදවනලද එකෙක් පසුබල ලදින් නැවත තෙමේ ඔහු පරදවා පියා ද එලෙස මොහු විසින් පරදවනලද කෙලශයන් නැවත උපද-වන්නට ශක්‍රබ්‍රහ්මාදීහු ද නොපොහොසත්හ යනු භාවයි.

7. මාසෙ මාසෙ, මසක් මසක් පාසා; සහස්සෙන, දහසක් වියදම් කිරීමෙන්; සතං සමං, හවුරුදු සියයක් මුළුල්ලෙහි; යො, යමෙක් තෙම; යජෙථ, ලෞකික මහාජනයාට දන් දුන්නේ වේ ද; යො ච, යමෙක් වනාහි; භාවිතත්තානං, සීලාදි ගුණවසයෙන් වඩනලද සිත් ඇති; එකං, එකම ආයතීයක්හු, හෙවත් යටත්පිරි-සෙයින් සෝවානක්හු උඩත්පිරිසෙයින් ක්ෂීණාශ්‍රවයක්හු, මුහුත්ත-මපි, ඇසිල්ලෙකු දු; පූජයෙ, (ගෙදොරට පැමිණියහු දැක බත් කෙනෙස්සක් හඹුසරලුවක් පමණ දීමෙන් හෝ) පිදූයේ වේ ද; චෙ, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක් මුලුල්ලෙහි දෙනලද; යං හුතං, යම් දානයෙක් ඇද්ද එයට වඩා; සායෙව පූජනා, ඇසිල්ලෙක ද ආයතීයත්ව කරණලද්දවූ ඒ ප්‍රත්‍යය පූජාව ම; සෙය්‍යො, උතුමමැ.

8. යො ජන්තු, යම් පුරුෂයෙක්; වනෙ, වෙනෙහි වැස, හෙවත් නිෂ්ප්‍රපඤ්චපරිහරණය පිණිස වනයට වැද ඒ වෙනෙහි දී; චෙ, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක් මුළුල්ලෙහි; අග්ගිං පරිචරෙ, (ක්ෂීරපායාස සංඛ්‍යාතමධුශර්කරාසිවනයෙන් සිදුහතු-සුත්සාල්-හීතණ ආදි යාග

108 9. යං කිඤ්චි යිට්ඨං ව හුතං ව ලොකෙ,
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො;
සබ්බම්පි තං න චතුභාගමෙති,
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො.

109 10. අභිවාදනසීලිස්ස නිච්චං වද්ධාපචායිනො,
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයුවණ්ණො සුඛං බලං.

---

ද්‍රව්‍ය ගින්මෙහි බහාලා) වහනිපූජාව කෙළේ වේ ද; යො ච, යම් පුරුෂයෙක් වනාහි, භාවිතත්තානං, සීලාදිගුණවශයෙන් වඩනලද සිත් ඇති; එකං, සෝවාන් ආදි එක ආර්‍ය්‍යපුද්ගලයකු; මුහුත්තම්පි, ඇසිල්ලකු දු; පූජයෙ, (ගෙදොරට පැමිණියහු දැක බත්කෙණෙස්සක් හඹුසරලුවක් පමණ දීමෙන් හෝ පෙරාන්කඩක් පමණ වූ ද කඩ පොල්ලක් දීමෙන් හෝ) පිදුයේ වේ ද; වස්සසතං, හවුරුදු සියයක් මුළුල්ලෙහි කරණලද; යං හුතං, යම් වහනිපූජාවෙක් ඇද්ද ඒ වහනි පූජාවට වඩා; සායෙව පූජනා, ඇසිල්ලෙක ද ආර්‍ය්‍යයන්ට කරණලද ඒ ප්‍රත්‍යයපූජාව ම; සෙය්‍යො, උත්තමයි.

9. ලොකෙ, මේ සත්වලොකයෙහි; පුඤ්ඤපෙක්ඛො, පින් කිරී-මෙහි අපෙක්ෂා ඇති පුරුෂ තෙම; යං කිඤ්චි යිට්ඨං වා, (මගුල්දවස් ආදියෙහි දියයුතුවූ) යම් කිසි ක්ෂුද්‍රදානවස්තුවක් හෝ; හුතං වා, (කම්මඵල අදහා සකස්කොට ගරහා දෙනලද) අමුතුමහදනක් හෝ; සංවච්ඡරං, හවුරුද්දක් මුළුල්ලෙහි; යජෙථ, (මුළුසක්වළ ලෞකික-මහාජනයාහට නිරන්තරයෙන්) දුන්නේ වී නමුදු; තං සබ්බම්පි, ඒ සියලු දානය ම; චතුභාගං න එති, (සෘජුගත වූ ශ්‍රොතාපන්නාදි ආර්‍ය්‍යයන් කෙරෙහි පහන්සිතින් කාය නමා වඳනාහුගේ එකවෙක පැවති කුසල චෙතනාව) සතරභාගයක් කළකල එයින් එක් භාගයකු දු නො අගනේය (එහෙයින්); උජ්ජුගතෙසු, කායවඞ්කාදිය රහිතහෙයින් සෘජුබවට පැමිණි සෝවාන්-සෙදගැමි-අනාගැමි-රහත්නට පහන් සිතින් කය නමා කරණලද; අභිවාදනා, වන්‍දනාව ම; සෙය්‍යො, උත්තමයි.

10. අභිවාදනසීලිස්ස, සිල්වතුන් එක්වන් වඳනාසුලු වූ; නිච්චං, සතතයෙන්; වද්ධාපචායිනො, ගුණවෘද්ධයන් පුදනා සුලු වූ; හෙවත් එම වන්‍දනක්‍රියායෙන් සතතයෙන් පුදනා සුලු වූ පුද්ගලයා හට; ආයුවණ්ණො සුඛං බලං, ආයුෂ ශරීරවර්ණය කායිකචෛතසික සුවය කායබලඥානබලය යන; චත්තාරො ධම්මා, මේ සතර ගුණයෝ; වඩ්ඪන්ති, වඩනාහුයි.

110 11. යො ච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො,
එකාහං ජීවිතං සෙය්‍යො සීලවන්තස්ස ඣායිනො.

111 12. යො ච වස්සසතං ජීවෙ දුප්පඤ්ඤො අසමාහිතො,
එකාහං ජීවිතං සෙය්‍යො පඤ්ඤවන්තස්ස ඣායිනො.

112 13. යො ච වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො,
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං.

113 14. යො ච වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයං.

---

11. දුස්සීලො, සීලසමාදානයක් නැතිහෙයින් දුස්සීල වූ; අසමාහිතො, උපචාරසමාධිඅර්පණාසමාධියෙන් සමාහිත නොවූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු ඔහුගේ ජීවත්වීමට වඩා; සීලවන්තස්ස, චතුඃපාරිශුද්ධිශීලයෙන් සමන්විත හෙයින් සිල්වත් වූ; ඣායිනො, ආලම්බනානුපනිධ්‍යාන-ලක්ෂණොපනිධ්‍යානයෙන් ධ්‍යායී වූ, හෙවත් ශමථවිදර්ශනාභාවනාවෙහි නියුක්ත වූ භික්ෂුහුගේ; එකාහං, එකදවසකු දූ; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

12. දුප්පඤ්ඤො; (ශමථවිදර්ශනාප්‍රඥය මාර්ගඵලප්‍රඥය යන ලෞකිකලොකොත්තරප්‍රඥාවෙන් යුක්ත නොවන හෙයින්) ප්‍රඥා නැත්තා වූ; අසමාහිතො, උපචාරසමාධිඅර්පණාසමාධියෙන් සමාහිත නොවූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු, (ඔහුගේ ජීවත්වීමට වඩා); පඤ්ඤවන්තස්ස, ශමථවිදර්ශනාප්‍රඥාවෙන් ද මාර්ගඵලප්‍රඥාවෙන් ද යුක්ත වූ; ඣායිනො, ශමථවිදර්ශනාභාවනායෙහි නියුක්ත වූ භික්ෂුහුගේ; එකාහං, එකදවසකු දූ; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

13. කුසීතො; කුසීත වූ, හෙවත් වත්පිළිවෙත් පිරීමෙහි හැදෑරීම් පිරිවීමෙහි) මැලි වූ; හීනවීරියො, කායිකචෛතසිකවීර්‍ය්‍ය නැත්තාවූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු ඔහුගේ ජීවත්වීමට වඩා; දළ්හං, දැඩි කොට; විරියං, කායිකචෛතසිකවීර්‍ය්‍යය; ආරභතො, පටන් භික්ෂුහුගේ; එකාහං, එකදවසකු දූ, ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

14. උදයව්‍යයං, පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය; අපස්සං, නොදක්නාවූ, හෙවත් "අවිජ්ජාසමුදයා රූපසමුදයො" යනාදීන් පස්විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන්ගේ උදය ද, "අවිජ්ජානිරොධා රූප-

114 15. යො ච වස්සසතං ජීවෙ අපස්සං අමතං පදං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො අමතං පදං.

115 16. යො ච වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො ධම්මමුත්තමං'ති.

සහස්සවග්ගො අට්ඨමො.

116 1. අභිත්ථරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ,
දන්ධං හි කරොතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො.

---

නිරොධො" යනාදීන් පස්විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන්ගේ ව්‍යය ද නො දක්නා වූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්ස-සතං, අවුරුදු සියයක්; ජීවෙ, ජීවත් විනමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා); උදයව්‍යයං පස්සතො, පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය ඥාන චක්ෂුසින් දක්නා භික්ෂුහුගේ; එකාහං, එකදවසකු දු; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

15. අමතං පදං, මරණ රහිතවූ කොට්ඨාසය, හෙවත් අමෘතමහා නිර්වාණය; අපස්සං, නො දක්නා වූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්සසතං, අවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වි නමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා); අමතං පදං, අමෘතමහා නිර්වාණය; පස්සතො, ඥානචක්ෂුසින් දක්නා පුද්ගලයාගේ; එකාහං, එකදවසකු දු; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

16. උත්තමං ධම්මං, උත්තම වූ නවලොකොත්තරධර්මය; අපස්සං, නුවණැසින් නො දක්නා වූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු (ඔහුගේ ජීවත් වීමට වඩා), උත්තමං ධම්මං, උත්තම වූ නවලොකොත්තරධර්මය; පස්සතො, නුවණැසින් දක්නා පුද්ගලයාගේ; එකාහං, එක දවසකු දු; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

සහස්සවග්ගො අට්ඨමො.

---

1. කල්‍යාණෙ, දානශීලාදි සුචරිතධර්මවිෂයෙහි; අභිත්ථරෙථ, යුහුසුලු වන්නේය; (ගෘහස්ථයා විසින් ලාබත් දීම් ආදි වූ කිසි පින්කමක් කෙරෙමියි සිතක් උපන්කල ඒ සිත මසුරුමල ආදියෙන් මඩනාලදුව පසුනොබස්නා තෙක් අනුන්ට අවසරයක් නොදී "අහං පුරෙ අහං පුරෙ"යි වහ වහාම කටයුත්තේය, ප්‍රව්‍රජිතයා

117 2. පාපං චෙ පුරිසො කයිරා න තං කයිරා පුනප්පුනං,
න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො.

118 3. පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථේනං පුනප්පුනං,
තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො.

---

විසින් ඇදුරුවත් තෙරවත් ආගන්තුකවත් ගිලන්වත් ආදීන්කරන්නහු විසින් අනුන්ට අවසරයක් නොදී "අහං පුරෙ අහං පුරෙ"යි වහ වහා ම කටයුත්තේයයි සේයි); පාපා, කායදුශ්චරිතාදි අකුශල් කර්මයෙන්, නොහොත් අකුශලචිත්තොත්පාදයෙන්; චිත්තං, සිත, (හෙවත් නොයෙක් තැනින් වැද ගොයම් කන තුළුගොනකු මෙන් නොරැක්ක හැකි වූ විසභාග අරමුණට දිවනහෙයින් තුන්දුසිරින් නොවැලකිය හැකි වූ මේ) කුළුසිත; නිවාරයෙ, වළකන්නේයි; කුමක් හෙයින්ද යත්? පුඤ්ඤං, දානාදිකුශලකර්මය; (යම් හෙයකින්): දන්ධං, දන්ධ ච, (හෙවත් දෙම් දෝ හෝ නො දෙම් දෝ හෝ කෙරෙම් දෝ හෝ නො කෙරෙම් දෝ හෝ කොටපියාහෙම් දෝ හෝ නොකොටපියාහෙම් දෝ හෝයි මෙසේ ලැසි ගෙණ); කරොතො, කරන්නහුගේ; මනො, සිත; පාපස්මිං, මසුරුමල ආදි අකුශලයෙහි; රමති, ඇලේ ද එහෙයිනි.

2. පුරිසො, පුරුෂ තෙම, චෙ, ඉදින්; පාපං, ප්‍රාණවධාදි අකුශල කර්මයක්; කයිරා, (ප්‍රමාදදොෂයකින් වත් අසත්සම්බාධයකින් වත් එක වරෙක) කොටපුයේ වී නමුත්; තං, ඒ අකුශලකර්මය; පුනප්පුනං, නැවත නැවත; න කයිරා, නොකරන්නේයි, (නොදූන සාලභූරු මැඩගත් එකක්හු වහා පස හා ගන්නා සේ එකෙණෙහි ම ප්‍රත්‍යවේක්‍ෂා කොට මෙ වැනි ලාමකක්‍රියා කිරීම තාගේ ජාත්‍යාදියට නුසුදුසුයයි සලකා) ඒ පාපය නොකරන්නේයි; තම්හි, ඒ අකුශලයෙහි; ඡන්දං, ආලයක්, (=රුචියක්); න කයිරාථ, නො කරන්නේයි; (කුමක් හෙයින් ද යත් ?) පාපස්ස, ප්‍රාණවධාදි අකුශලකර්මයාගේ; උච්චයො, රැස්කිරීම; දුක්ඛො, (මෙලොව ද පරලොව ද කායචිත්තදුක්ඛය එලවන හෙයින්) දුකී — අකුශල් රැස්කිරීම නම් යම් හෙයකින් මෙලොව ද පරලොව ද දුකට කාරණා ද එහෙයින් දුකැයි සේයි.

3. පුරිසො, පුරුෂ තෙම; චෙ, ඉදින්; පුඤ්ඤං, දානාදි එක්තරා කුශලකර්මයක්; කයිරා, එක වරෙක ද කෙළේ වී නම්; එනං, ඒ කුශලකර්මය; පුනප්පුනං, නැවත නැවත ද; කයිරාථ, කරන්නේයි, (එක් වරෙක මා විසින් පින්කමෙක් කරණලද එපමණෙකින් සෑහෙන්නේ වේදැයි පසුනොබැස නැවත නැවත ද පින්කම් කටයුත්තේය); තම්හි, ඒ කුශලයෙහි; ඡන්දං, ආලය, (=රුචිය);

119 4. පාපොපි පස්සති භද්‍රං යාව පාපං න පච්චති;
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති.

120 5. භද්‍රොපි පස්සති පාපං යාව භද්‍රං න පච්චති,
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රො භද්‍රානි පස්සති.

---

කයිරාථ, කරන්නේයි, (පින්කම් නොකරණ වේලෙහි ද ඒ කුශලයෙහි ඡන්දය රුචිය උත්සාහය කරන්නේයි) කුමක් හෙයින්ද යත? පුඤ්ඤස්ස, දානශීලාදි කුශලයාගේ; උච්චයො, රැස්කිරීම; සුඛො, (යම්හෙයකින් ස්වර්ගමොක්ෂසම්පත්තියට කාරණා ද එහෙයින්) සුවයි.

4. යාව, යම්තාක්කල්; පාපං, පුරුෂයා විසින් කරණලද අකුශල කර්මය; න පච්චති, මෙලොව හෝ පරලොව හෝ විපාක නොදේද; (තාව, ඒතාක්කල්); පාපොපි, කායදුශ්චරිතාදි පාපකර්මයෙන් සමන්විත වූ පුද්ගල ද, භද්‍රං, යහපත; පස්සති, දක්නේය, (පාපි පුද්ගල ද පූර්වජන්මයෙහි කරණලද සුචරිතබලයෙන් වැඩ දක්නේය සුවවිඳින්නේයයි සේයි) යදා ච, යම්කලෙක වනාහි; පාපං, ඔහු විසින් කරණලද පාපකර්මය; පච්චති, (දෘෂ්ටධර්මවේද්‍ය ව එම ජන්මයෙහි හෝ උපපද්‍යවේද්‍ය ව අපරාපර්‍ය්‍යායවේද්‍ය ව පරලොව හෝ) විපාක දේ ද; අථ, එකල්හි; පාපො, පව්කම්කල පුද්ගල තෙම; පාපානි පස්සති, (මෙලොව නොයෙක් වධබන්ධනාදියට ද පරලොව අපායදුක්ඛයට ද භාජනවීමෙන්) පාපඵලයන් දක්නේයි—තමා කල අකුශලයෙහි විපාක වූ නොයෙක් කායිකචෛතසික දුක් දක්නේයයි සේයි.

5. යාව, යම්තාක්කල්; භද්‍රං, පුරුෂයා විසින් කරණලද කුශල කර්මය; න පච්චති, (මෙලොව හෝ පරලොව හෝ) විපාක නොදේ ද; තාව, ඒතාක්කල්; භද්‍රොපි, කායසුචරිතාදි කුශලකර්මයෙන් සමන්විත වූ පුද්ගල ද; පාපං, අකුශලවිපාක වූ අවැඩ; පස්සති, (පූර්වජන්මයෙහි කරණලද දුශ්චරිතබලයෙන්) දක්නේය, දුක්විඳින්නේයයි සේයි; යදා ච, යම් කලෙක වනාහි; භද්‍රං, ඔහු විසින් කරණලද සුචරිතය, පච්චති, (දෘෂ්ටධර්මවේද්‍ය ව මෙලොව ම හෝ උපපද්‍යවේද්‍ය ව අපරාපර්‍ය්‍යායවේද්‍ය ව පරලොව හෝ) විපාක දේ ද; අථ, එකල්හි; භද්‍රො, කුශලකාරී වූ සත්පුරුෂ තෙම; භද්‍රානි පස්සති, (මෙලොව ලාභසත්කාරාදි සුව ද පරලොව දිව්‍යසම්පත්ති ආදි සුව ද අනුභවකරන්නේ) භද්‍ර වූ ඉෂ්ටවිපාකයන් දක්නේයි—ආයු-වර්ණ-සුඛ-බල-පටිභාන-ගව-මහිෂ-දාසි-දාස-ධන-ධාන්‍යාදිසමෘද්ධියට පැමිණ සුව විඳින්නේ යයි සේයි.

121 6. මාවමඤ්ඤෙථ පාපස්ස නමන්තං ආගමිස්සති,
උදබින්දුනිපාතෙන උදකුම්භො'පි පූරති;
පූරති බාලො පාපස්ස ථොකථොකම්පි ආචිනං.

122 7. මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස නමන්තං ආගමිස්සති,
උදබින්දුනිපාතෙන උදකුම්භො'පි පූරති;
පූරති ධීරො පුඤ්ඤස්ස ථොකථොකම්පි ආචිනං.

---

6. පාපස්ස, ප්‍රාණවධාදි අකුශලකර්මයට; මාප්පමඤ්ඤෙථ, අවඥ නොකරන්නේයි; නොහොත්, පාපස්ස, ප්‍රාණවධාදි අකුශලකර්මය; අප්පං, ස්වල්ප යයි, මා මඤ්ඤෙථ, නහමක් සිතන්නේයි; තං, ඒ ස්වල්පමාත්‍ර වූ අකුශලකර්මය; මං, මා කරා; නාගමිස්සති, විපාකදීම්-වසයෙන් නො එන්නේයයි; මාප්පමඤ්ඤෙථ, අවඥ නොකරන්නේයි, (මා විසින් කරණලද මේ පාපකර්මය ස්වල්පමාත්‍ර වූ ව එනම් කවර කලෙක මට විපාක දේදැයි අකුශල කර්මය ස්වල්පයයි අවඥ නොකරන්නේ යයි සේයි); කුමක් හෙයින් ද යත් ? උදබින්දුනිපා-තෙන, නිරන්තරයෙන් එකෙකි දියබිඳුවක්හුගේ හීමෙන්; උද-කුම්භො අපි, (වැසිවස්නාකල අබවස උඩු බලා තබනලද විවෘත වූ මුඛ ඇති) සටවාටි ආදි කුම්භකාර භාජනය; පූරති, යම්සේ ක්‍රම-ක්‍රමයෙන් පිරීයේ ද එපරිද්දෙන් ම; ථොකථොකම්පි, මඳමඳ කොට ද; ආචිනං, පව් රැස්කරන්නා වූ; බාලො, අඥාන තෙම; පාපස්ස, කාය-දුශ්චරිතාදි පාපකර්මය; පූරති, ක්‍රමක්‍රමයෙන් පූරන්නේයි.

7. පුඤ්ඤස්ස, දානශීලාදිකුශලකර්මයට, මාප්පමඤ්ඤෙථ, අවඥ නොකරන්නේය; නොහොත්, පුඤ්ඤස්ස, දානශීලාදිකුශලකර්මය, අප්පං, ස්වල්ප යයි; මා මඤ්ඤෙථ, නහමක් සිතන්නේයි; තං, ඒ ස්වල්පමාත්‍ර වූ කුශලකර්මය; මං, මා කරා; නාගමිස්සති, විපාක දීම්-වසයෙන් නො එන්නේ යයි; මාප්පමඤ්ඤෙථ, අවඥ නොක-රන්නේ යි, (මා විසින් කරණලද මේ කුශලධර්මය ස්වල්පමාත්‍ර වූ ව එනම් කවරකලෙක මට විපාක දේ දැයි කුශලකර්මය ස්වල්ප යයි අවඥ නොකරන්නේයි); කුමක් හෙයින්ද යත්? උදබින්දුනිපාතෙන, නිරන්තරයෙන් එකෙකි දිය බිඳුවක්හුගේ හීමෙන්; උදකුම්භොපි, (වැසිවස්නා කල අබවස උඩු බලා තබනලද විවෘත වූ මුඛ ඇති) සටවාටිආදි කුම්භකාර භාජනය; පූරති, යම්සේ ක්‍රමක්‍රමයෙන් පිරීයේ ද එපරිද්දෙන් ම; ථොකථොකම්පි, මඳමඳකොට ද; ආචිනං, කුශලකර්ම රැස්කරන්නාවූ; ධීරො, ප්‍රාඥ තෙම; පුඤ්ඤස්ස, දාන-ශීලාදි කුශලකර්මය; පූරති, ක්‍රමක්‍රමයෙන් පූරන්නේයි.

123 8. වාණිජෝ'ව භයං මග්ගං අප්පසත්ථෝ මහද්ධනෝ,
විසං ජීවිතුකාමෝ'ව පාපානි පරිවජ්ජයෙ.

124 9. පාණිම්හි චෙ වණෝ නාස්ස හරෙය්‍ය පාණිනා විසං,
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතෝ.

125 10. යෝ අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමෝ රජෝ පටිවාතං'ව ඛිත්තො.

---

8. භයං මග්ගං, සොරුන් සිටිහෙයින් භය කටයුතු වූ මග වලහන්නාවූ; අප්පසත්ථෝ, කැටිව යන සාත්තුවක් නැති; මහද්ධනො, බොහෝ දන ඇති; වාණිජො ඉව, වෙළඳක්හු මෙන් ද; විසං, හලාහල විසයක් දුරුකරන්නා වූ; ජීවිතුකාමෝ ඉව, ජීවත්වනු කැමති එකක්හු මෙන් ද; පාපානි පරිවජ්ජයෙ, අකුශලකර්මයන් දුරු කරන්නේයි.—අකුශලයෝ නම් සොරුන් සිටි මගක් මෙන් හලාහල විසයක් මෙන් සොපද්‍රවයහ සාදීනවයහ යි සලකා නුවණැති පුද්ගල තෙම ස්වල්ප ද වූ අකුශලය දුරින් දුරුකරන්නේයි ජ්යි.

9. පාණිම්හි, අත්ලෙහි; චෙ, ඉදින්; වණෝ නාස්ස, ව්‍රණයෙක් නොවීනම්; පාණිනා, අත්ලෙන්; විසං, විසය; හරෙය්‍ය, ගන්නේයි, නොහොත් ගන්නට පොහොසත් වන්නේයි; කුමක් මෙන්ද යත්? අබ්බණං, අත්ලෙහි ව්‍රණයක් නැත්තහු; විසං, ස්ථාවරජඞ්ගමවශයෙන් ද්විප්‍රකාර වූ ම විෂය; න අන්වෙති, අනුව නො යන්නේයි; (යම්සේ අත්ලෙහි ව්‍රණයක් නැත්තහු අතින් ගත් විසය ඔහු ශරීරයෙහි ව්‍යාප්තනොවේ ද එසේ ම) අකුබ්බතො, කායාදි මාර්ගයෙන් පව් නොකරන්නාහට; පාපං නත්ථි, (ශරචාප දිය එලවා දුන් ද අකුශලචෙතනා රහිත හෙයින් සිඩවන) අකුශලකර්මයෙක් නැති.

10. අප්පදුට්ඨස්ස, (තමහට වත් සියලු සත්ත්වට වත්) අදූෂව වූ, නොහොත් නිරපරාධ වූ හෙයින් ම සියලු සතුන් කෙරෙහි ම මෛත්‍රීපර වූ නොකැලඹුණු සිත් ඇත්තාවූ) සුද්ධස්ස, (නිරපරාධ වූ සිත් ඇති හෙයින්) පිරිසිදු වූ; අනඞ්ගණස්ස, නිඃක්ලේශ වූ; නරස්ස පොසස්ස, නරය පුරුෂයයි කියනලද සත්ත්වයාහට; යො, යම් පුද්ගලයෙක්; දුස්සති; දූෂවවේ ද, (අතින් පයින් සැතින් දණ්ඩෙන් පැහැරීම් ආදියෙන් අපරාධ කෙරේද) පාපං, ඔහු විසින් කරණලද ඒ පාපකර්මය තෙම; පටිවාතං ඛිත්තො, උඩුසුලඟට දමනලද;

126 11. ගබ්භමෙකෙ උප්පජ්ජන්ති නිරයං පාපකම්මිනො,
සග්ගං සුගතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවා.

127 12. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා.

128 13. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙය්‍ය මච්චු.

පාපවග්ගො නවමො.

---

සුඛුමො රජො ඉව, සියුම් රජසක් මෙන්; තමෙව බාලං, නිරපරාධයන්ට අපරාධ කළාවූ ඒ අඥානයා කරා; පච්චෙති, (මෙලොව හෝ පරලොව නරකාදියෙහි හෝ විපාක දුක් දෙමින්) පැමිණෙන්නේයි.

11. එකෙ, සමහර සත්වකෙණෙක්; ගබ්භං, මනුෂ්‍යගර්භයෙහි, හෙවත් මව්කුස; උප්පජ්ජන්ති, උපදනාහ; පාපකම්මිනො, පව්කම් කළ සත්වයෝ; නිරයං, නරකයෙහි; උප්පජ්ජන්ති, උපදනාහ; සුගතිනො, පින්කම් කළ හෙයින් සුන්දරගති ඇති සත්වයෝ; සග්ගං යන්ති, දෙව්ලොවට යන්නාහ; අනාසවා, ක්ෂීණ වූ චතුරාශ්‍රවයන් ඇති රහත්හු; පරිනිබ්බන්ති, නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන් උපලක්ෂිත ව පිරිනිවෙන්නාහුයි.

12. යත්ථට්ඨිතො, යම් තැනෙක සිටියා වූ සත්ව තෙම; පාපකම්මා, තමා විසින් කරනලද පාපකර්මයෙන්; මුඤ්චෙය්‍ය, විපාක දුක් අනුභව නො කොට මිදියේ ද; සො ජගතිප්පදෙසො, කොසගක් පමණ වූ ද එසේ වූ භූමිප්‍රදෙශයෙක්; න විජ්ජති, නැත්තේය; (හුදෙක් පෘථිවිතලයෙහි මතු නැත්තේ නොවෙයි) න අන්තලික්ඛෙ, ආකාශයෙහි දු (පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක්) නැත්තේය; න සමුද්දමජ්ඣෙ, සමුද්‍රමධ්‍යයෙහි දු පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තේය; න පබ්බතානං විවරං පවිස්ස, පර්වතයන්ගේ විවරයට වැද ද පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තේයි.

13. යත්ථට්ඨිතං, යම් තැනෙක්හි සිටි සත්වයා; මච්චු, මරණ තෙම; නප්පසහෙය්‍ය, අභිභවනය නො කෙරේ ද; හෙවත් මැඩනොපියා ද;

129 1. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ.

130 2. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙසං ජීවිතං පියං,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ.

---

යො ජගතිප්පදෙසො, කෙසගක් පමණ වූ ද එසේ වූ භූමිප්‍රදෙශයෙක්; න විජ්ජති, නැත්තේය; (හුදෙක් පෘථිවිතලයෙහි මතු නැත්තේ නොවෙයි) න අන්තලික්ඛෙ, ආකාශයෙහි ද මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයක් නැත; සමුද්දමජ්ඣෙ, සමුද්‍ර මධ්‍යයෙහි ද මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයක් නැත; න පබ්බතානං විවරං පවිස්ස, පර්වතයන්ගේ විවරයට වැද මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයක් නැත්තේමැයි.

## පාපවග්ගො නවමො.

---

1. සබ්බෙ, (කෙසරසිංහයන් හා ආජානෙය්‍යහස්ත්‍යශ්වයන් හා ක්ෂීණාශ්‍රවයන් තබා සෙසු) සියලු සත්ත්වයෝ ම; දණ්ඩස්ස, වධබන්ධනාදී කායදණ්ඩනයට; තසන්ති, ත්‍රස්ත වෙති; සබ්බෙ, එසේ ම සියලු සත්ත්වයෝ ම; මච්චුනො භායන්ති, මරණයට බිති, (මෙහි ක්ෂීණාශ්‍රවයෝ සත්කායදෘෂ්ටිය සුප්‍රහීණ හෙයින් රූපාරූපධර්මයන්ගේ භඞ්ගමාත්‍රයක් තබා අනික් මියන සත්තකු නොදක්නා හෙයින් මරණයෙහි භය නොකෙරෙති, කෙසරසිංහයන් හා ආජානෙය හස්තීන් හා ආජානෙය අශ්වයෝ සත්කායදෘෂ්ටිය බලවත් හෙයින් තමන්ට ප්‍රතිපක්ෂ සත්ත්වයෙක් නොදක්නාහු අහඞ්කාරපරවශ මරණයෙහි භය නො කෙරෙත්) අත්තානං උපමං කත්වා, තමා උපමා කොට, (හෙවත් මම යම්සේ දණ්ඩනයට බිම් ද එසේ ම සියලු සත්ත්වයෝ ද දණ්ඩනයට බිති, මම යම්සේ මරණට බිම් ද එසේ ම සියලු සත්ත්වයෝ ද මරණට බිති, මෙසේ තමා උපමා කොට) න හනෙය්‍ය, (නුවණැති පුරුෂ තෙම කිසි සතක්හු අතින් පයින් දණ්ඩෙන් සැහින්) නො මරන්නේය; න ඝාතයෙ, අනුන්ලවා ද නො මරවන්නේයි.

2. සබ්බෙ, [කෙසරසිංහයන් හා ආජානෙයහස්ත්‍යශ්වයන් හා ක්ෂීණාශ්‍රවයන් තබා සෙසු] සියලු සත්ත්වයෝ ම; දණ්ඩස්ස, වධබන්ධනාදිකාය දණ්ඩනයට; තසන්ති, ත්‍රස්ත වෙති; සබ්බෙසං, ක්ෂීණාශ්‍රවයන් තබා සෙසු සියලු සත්ත්වයන්ට ම; ජීවිතං, ජීවිතය; පියං, ප්‍රියය, (ක්ෂීණාශ්‍රවයෝ වනාහි "නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං කාලඤ්ච පතිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා" යි උදන්

131 3. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං.

132 4. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛං.

133 5. මාවොච ඵරුසං කඤ්චි වුත්තා පටිවදෙය්‍යු තං,
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩා ඵුසෙය්‍යු තං.

---

අතනහෙයින් ජීවිතයෙහි ද මරණයෙහි ද උපෙක්ෂක ම වෙත්) අත්තානං උපමං කත්වා, තමා උපමා කොට, (හෙවත් මම යම්සේ දණ්ඩනයට බම් ද එසේ ම සියලු සත්ත්වයෝ ද දණ්ඩනයට බනි, මාගේ ජීවිතය මට යම්සේ ප්‍රිය ද එසේම සියලු සතුන්ගේ ජීවිතය ද ඔවු-නොවුන්ට ප්‍රියයි මෙසේ තමා උපමා කොට) න හනෙය්‍ය, [නුව-නැති පුරුෂ තෙම කිසි සතකුහු අනින් පසින් දණ්ඩෙන් සැනින්] නො මරන්නේය; න ඝාතයෙ, අනුන් ලවා ද නො මරවන්නේයි.

3. යො, යම් පුද්ගලයෙක්; අත්තනො සුඛමෙසානො, (=අනුන් මරා තළා අනුන් ගැන්ත කොටගෙණ) තමහට සුව කැමති වූයේ; සුඛකාමානි භූතානි, කායිකචෛතසික සුව කැමති සත්ත්වයන්; දණ්ඩෙන; වාග්දණ්ඩ-ධනදණ්ඩ-කායදණ්ඩයෙන්; විහිංසති, පෙළා ද, දුකට පමුණුවා ද; සො, ඒ පුද්ගල තෙම; පෙච්ච, පරලොව; සුඛං න ලභතෙ, දිව්‍යමනුෂ්‍ය සුව ද නිවන්සුව ද නො ලබන්නේයි.

4. යො, යම් පුද්ගලයෙක්; අත්තනො සුඛමෙසානො, තමහට සුව කැමති වූයේ; සුඛකාමානි භූතානි, කායිකචෛතසික සුව කැමැති සත්ත්වයන්; දණ්ඩෙන, වාග්දණ්ඩ-ධනදණ්ඩ-කායදණ්ඩයෙන්; න හිංසති, නොපෙළා ද, (=දුකට නො පමුණුවා ද); සො, ඒ පුද්ගල තෙම; පෙච්ච, පරලොව; සුඛං ලභතෙ, දිව්‍යමනුෂ්‍යසුව ද නිවන් සුව ද ලබන්නේයි.

5. කඤ්චි, කිසි එක ද පුද්ගලයක්හට; ඵරුසං, පරුෂ වචනයක්; මා අවොච, නහමක් කිය, කුමක් හෙයින් ද යත්? වුත්තා, තා විසින් පරොස් තෙපුල් කියනලද්දා වූ අනුන්; තං, තට; පටිවදෙය්‍යුං, නැවැත පෙරළා පරොස් තෙපුල් බණන්නාහුයි; හි, යම්හෙයකින්, සාරම්භකථා, (කාරණොත්තරකාරණ කී මයයි කියනලද) යුගග්‍රාහකථා තොම; දුක්ඛා, දුක් ද, හෙවත් දුකට කාරණ ද; එහෙයින්; පටිදණ්ඩා, කායදණ්ඩාදිප්‍රතිදණ්ඩයෝ; තං, තා; ඵුසෙය්‍යුං, ස්පර්ශ කරන්නාහුය; [=තා කරා පැමිණෙන්නාහුයි].

134 6. සචෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා,
එස පත්තො'සි නිබ්බාණං සාරම්භො තෙ න විජ්ජති.

135 7. යථා දණ්ඩෙන ගොපාලො ගාවො පාචෙති ගොචරං,
එවං ජරා ච මච්චු ච ආයුං පාචෙන්ති පාණිනං.

136 8. අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති,
සෙහි කම්මෙහි දුම්මෙධො අග්ගිදඩ්ඪොව තප්පති.

137 9. යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති,
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති.

---

6. සචෙ, ඉදින්; උපහතො, මටින් කඩා හරණලද; කංසො යථා, ලොහොතලියක් මෙන්; අත්තානං,(තාගේ) සිත; නෙරෙසි, නිශ්චලකරන්නට පොහොසත්විනම් හෙවත් තා නිශ්ශබ්ද කෙළෙහි නම් (එසේකල්හි); එසො (ත්වං), මේ පිළිවෙත පුරන්-නාවූ) ඒ (තෝ); නිබ්බාණං පත්තො අසි,(දැන් නිවණට නොපැ-මිණියද) නිවණට පැමිණියානම් වෙහි; (එසේකල්හි) තෙ, තට; සාරම්භො නවිජ්ජති, (දුස්සීලයෙම් මමද නොසිද දුස්සීලයෙහි යනාදීන් කියන) යුගග්‍රාහය නොවන්නේයි.

7 යථා,යම්සේ,ගොපාලො,ගොපලුතෙම; දණ්ඩෙන, දණ්ඩෙන් පැහැර පැහැර ගාවො, ගෙරින්; ගොචරං, ගොචරභූමියට හෙවත් තණබිමට; පාචෙති, පමුණුවාද, (=ගෙණයද්ද) එවං, එපරිද්දෙන් ම; ජරාච, (ප්‍රකටජරා ද අප්‍රකට ජරා ද යන විවිධ) ජරාද; මච්චුච, (සන්තතිවිච්ඡේදය යන) මරණද (යන මොහු දෙදෙන); පාණිනං, ප්‍රාණීන්ගේ; ආයුං, ජීවිතෙන්ද්‍රිය; පාචෙන්ති, ක්ෂයට පමුණුවන්නාහුයි.

8. අථ, ඒ මතු නොවෙයි; (අඥානතෙම හුදෙක් පවුකම් කරන්නේ මතු නොවෙයි වැලි අතික් කිමෙක් ද යත්) පාපානි කම්මානි කරං, ප්‍රාණවධාදි පවුකම් කරන්නාවූ; බාලො, අඥාන තෙම; න බුජ්ඣති, මාවිසින් කරණලද මේ පාපකර්මයාගේ මෙසේ වූ අනිෂ්ටවිපාකයෙක් ඇතැයි නො දන්නේයි (නො සලකන්නේයි);දුම්මෙධො, ඒ නුවණ නැත්තේ; සෙහි කම්මෙහි, සවකීය වූ පාපකර්මයෙන්(නරකයෙහි උපන්නේ); අග්ගිදඩ්ඪො-ව, ගින්නෙන් දනලද්දක්හු මෙන්; තප්පති, කායිකචෛතසික-සන්තාපයෙන් තැවෙන්නේයි.

9. අදණ්ඩෙසු, කායදණ්ඩ-ධනදණ්ඩ-වාග්දණ්ඩරහිතවූ,එහෙ-යින් ම දණ්ඩනයට නො නිසිවූ; අප්පදුට්ඨෙසු, (තමහට වත් අනු-

138 10. වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං,
ගරුකං වාපි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ.

139 11. රාජතො වා උපස්සග්ගං අබ්භක්ඛානං ච දාරුණං,
පරික්ඛයං ච ඤාතීනං භොගානං ච පභඞ්ගුරං,

140 12. අථවස්ස අගාරානි අග්ගි ඩහති පාවකො,
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජති.

---

න්ටවත්) අද්‍රොහිවූ එහෙයින් ම සියලු සතුන් කෙරෙහි මෛත්‍රී-පරවූ (ක්ෂීණාශ්‍රවයන් විෂයෙහි) යො, යම් පුද්ගලයෙක් තෙම; දණ්ඩෙන, කායදණ්ඩාදිදණ්ඩයෙන්; දුස්සති අපරාධ කෙරේ ද; සො, හෙතෙම; දසන්නං, දසවිධදුක්ඛකාරණයන් අතුරෙන්; අඤ්ඤතරං ඨානං, එක්තරා දුක්ඛකාරණයකට; ඛිප්පං එව, වහාම; නිගච්ඡති, පැමිණෙන්නේයි; හේ කවරේදයත්?

10 ඵරුසං, කර්කශවූ; වෙදනං, (අත්පාබිඳීම් ආදියෙන් හෝ චක්ඛුරොග-සොතරොගාදියෙන් හෝ උපන් (බලවත් ශරීර) වෙදනාවකට හෝ; ජානිං, (මහතැවි නැසීම් නිධාන අපවත්වීම් ආදී වූ) මහත් අලාභහානියකට හෝ; සරීරස්ස ච භෙදනං, අත් පා කැපීම් බිඳීම් ඔළුපැළීම් ආදීවූ ශරීරභෙදයකට හෝ; අපි, නැවත; ගරුකං ආබාධං වා, (කාසශ්වාසාතිසාරසොථොදරකුෂ්ඨ-ගණ්ඩකිලාසශොෂාදි) බලවත් රොගදුකකට හෝ; (කාණ-කුණී-ඛඤ්ජ-පීඨසප්පිආදි බවට හෝ), චිත්තක්ඛෙපං වා, යක්ෂොන්මා-දයට හෝ පිත්තොන්මාදයට හෝ; පාපුණෙ, පැමිණෙන්නේයි.

11. රාජතො, රජුන් කෙරෙන් වන්නා වූ; උපස්සග්ගං වා, (සෙනෙවිරත් දනසිටු ආදි තනතුරු උදුරාගැන්මෙන්, දනවො-ලො ගැන්මෙන්) උපද්‍රවයකට හෝ; දාරුණං, දරුණු වූ; අබ්භ-ක්ඛානං වා, (අසෝ තැන උමං බුන්නේ මං පහළයේ මිනී මැරූයේ අසෝ රාජාපරාධය කෙළේ තෝ වෙහිදැයි නුදුටු නොඇසූ නොකී නොබිණූ නොකළ නො පිළිබඳ) බලවත් අභ්‍යාඛ්‍යානය-කට හෝ; ඤාතීනං පරික්ඛයං වා; තමාගේ සුවදුක බැඳී පිහිට-වන්නට නිසි වැඩිසිටි) නෑයන්ගේ විනාශයට හෝ; භොගානං පභඞ්ගුරං වා, (රත්රන් අගුරු වීමය, මුතු කපුඇට වීමය, කහ-වණු කැට කැබිලිති වීමය, වහල්-සරක් නැතිවීමය යනාදී වූ භොග විනාශයකට හෝ පැමිණෙන්නේයි.

අථවා, නොහොත්; අස්ස, ඒ පාපීපුද්ගලයාගේ; අගාරානි වා සාගාරයන්; හෙවත් ඔහුගේ ගෙය; පාවකො, පාවකය යන නම්ඇති; අග්ගි, ගිනිතෙම; ඩහති, (අවුරුද්දකට දෙතුන්වරෙක

13. න නග්ගචරියා න ජටා න පඞ්කා
නානාසකා ථණ්ඩිලසායිකා වා,
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං.

14. අලඞ්කතො චෙපි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී,
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු.

---

දවන්නේය; (අනික් දවනකෙනෙකුන් නැත්නම් සෙනගිනි හෝ ලැවුගිනි හෝ දවන්නේය); සො දුප්පඤ්ඤො, (නිරපරාධයන්ට අපරාධකළා වූ) ඒ අඥාන පුද්ගල තෙම; කායස්ස භෙදා, ජීවිතෙන්ද්‍රියොපච්ඡේදයෙන් මත්තෙහි; නිරයං උපපජ්ජති, (මෙලොව මේ දසවිධදුක්ඛකාරණයන් අතුරෙන් එක්තරා දුක්ඛකාරණයකට පැමිණ පරලොව ඒකාන්තයෙන්) නරකයෙහි උපදන්නේය.

13. අවිතිණ්ණකඞ්ඛං, (පුබ්බන්තාපරන්තාදි අටතන්හි උපදනා අෂ්ටවස්තුක වූ ශඞ්කාව නො ඉක්මුනු හෙයින්) එතර නොවූ ශඞ්කා මහවතුරු ඇති; මච්චං, පෘථග්ජනසත්ත්වයා; නග්ගචරියා, අචෙලව්‍රතසමාදානයෙන් නග්න ව ඇවිද කරණ තපස්හු ද; න සොධෙන්ති, ශුද්ධනොකරන්නාහ; (ලොකනිස්සරණයයි කියන ලද නිර්වාණයට නො පමුණුවන්නාහ); ජටා, ජටාවෝ ද, හෙවත් ජටාදැරීම්හු ද; න සොධෙන්ති, ශුද්ධ නො කරන්නාහ; පඞ්කා, දන්තමලධාරණය ඇඟ මඩ ගැල්වීමය යන මොහු ද; න සොධෙන්ති, ශුද්ධ නො කරන්නාහ; අනාසකා, අහර නොවළඳ කරණ තපස්හු ද; න සොධෙන්ති, ශුද්ධ නො කරන්නාහ; ථණ්ඩිලසායිකා වා, භූමිසෙය්‍යාවෝ ද හෙවත්(අජව්‍රතගොව්‍රතසමාදානයෙන්) බිමහෙව කරණ තපස්හු ද; න සොධෙන්ති,ශුද්ධ නොකරන්නාහ; රජොජල්ලං ච, ආගන්තුකරජස් දැරීම, නො නහා ලෙවර දැලිඉසිලීම යන මේ ද; උක්කුටිකප්පධානං, උත්කුටිකයෙන් ම හිඳ ඇවිද කරණ තපස් ද යන මොහු ද; න සොධෙන්ති, (සත්ත්වයා) ශුද්ධ නො කරන්නාහුයි; (නිවණට නො පමුණුවන්නාහුයි).

14. අලඞ්කතො අපි, වස්ත්‍රාභරණයෙන් සැරහුනු පුද්ගල ද; චෙ, ඉදින්; සමං චරෙය්‍ය, කායවිෂමාදියෙන් දුරු ව කායසමාධිසංයමයෙහි යෙදී පවතී ද; සන්තො, රාගාදිකෙලෙසුන් සන්හුන්බැවින් ශාන්ත ද; දන්තො, ඉන්ද්‍රියදමනයෙන් දැමුනේ වී ද; නියතො,

143 **15. හිරීනිසෙධො පුරිසො කොචි ලොකස්මිං විජ්ජති,**
**යො නිද්දං අපබොධති අස්සො භද්‍රො කසාමිව.**

144 **16. අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො ආතාපිනො සංවෙගිනො භවාථ,**
**සද්ධාය සීලෙන ච විරියෙන ච, සමාධිනා ධම්මවිනිච්ඡයෙන ච,**
**සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා පහස්සථ දුක්ඛමිදං අනප්පකං.**

---

චතුර්විධ මාර්ගනියමයෙන් නියම කරණලද සත්තක්ඛත්තුපරමතා ආදිබැවි ඇත්තේවේ ද; බ්‍රහ්මචාරී, ශ්‍රෙෂ්ඨ වූ ශාසනබ්‍රහ්මචර්‍ය්‍ය–මාර්ගබ්‍රහ්මචර්‍ය්‍ය ඇත්තේ වේ ද; සබ්බෙසු භූතෙසු, සියලු සතුන් කෙරෙහි; දණ්ඩං, කායදණ්ඩාදිදණ්ඩය; නිධාය, බහාතබා (=දුරුකොට) වෙසේ ද; සො, (මෙබඳු ගුණයෙන් යුක්ත වූ) ඒ ක්ෂීණාශ්‍රව තෙම; බ්‍රාහ්මණො, සන්තානයෙන් බාහිත වූ පාපයන් ඇතිබැවින් බ්‍රාහ්මණ යයි ද කියයුතුය; සො, හෙතෙම; සමණො, ශමිතවූ පාපයන් ඇති බැවින් ශ්‍රමණ යයි ද කියයුතුය; සො, හෙතෙම; භික්ඛු, භින්න වූ කෙලශයන් ඇති බැවින් භික්ෂුයයි ද කියයුතුවේ.

15. කසං, සැමිටිය වළගන්නා වූ හෙවත් මමත් සැමිටියෙන් පහරණුලැබෙම්දැයි තමා ඇඟ සැමිටිය ගසාලිය නොදෙන්නා වූ; භද්‍රො අස්සො ඉව, සුශික්ෂිත වූ උත්තමඅශ්වයකුහු මෙන්; යො, යම් මහණෙක් තෙම; නිද්දං, නිඳුව (=තමා සතන්හි උපන් කාමවිතර්කාදි අකුශලවිතර්කය); අපබොධති, තමා සන්තානයෙන් පහකෙරේ ද, හෙවත් අකුශලවිතර්කයෙහි ආදිනව දනී ද; හිරීනිසෙධො, (මාවැනි ජාතිගොත්‍රසම්පන්න ඥාතවෘද්ධවයොවෘද්ධබහුශ්‍රැතශ්‍රද්ධාසම්පන්න කුලපුත්‍රයක්හට අකුශල විතර්කවසඟවීම නරම් දැයි මෙසේ) පාපයෙහි ලජ්ජායෙන් කාමවිතර්කාදි අකුශලවිතර්කයන් දුරු කරන්නා වූ; පුරිසො, පුරුෂයෙක් තෙම; ලොකස්මිං, සත්ත්වලොකයෙහි; කොචි, කිසිවෙක් ම; විජ්ජති, ඇත්තේයි; (සුලභ නො වන්නේයි).

16. කසානිවිට්ඨො, (කිසි ප්‍රමාදහෙතුවකින්) සැමිටියෙන් පහරණලද; භද්‍රො අස්සො ඉව, (මමත් සැමිටියෙන් පහරලදිම්දැයි එතැන් පටන් අප්‍රමාදව වීර්‍ය්‍ය කරන්නා වූ සුශික්ෂිත වූ) උත්තම අශ්වයකුහු මෙන්; ආතාපිනො භවාථ, වීර්‍ය්‍යවත් වවු; සංවෙගිනො භවාථ, සංසාරයෙහි උද්වෙගබහුල වවු; (මෙසේ වසන්නා වූ තෙපි) සද්ධාය, (ලෞකිකලොකොත්තරවශයෙන් ද්වි විධ වූ) ශ්‍රද්ධාවෙන් ද; සීලෙන ච, චතුපාරිසුද්ධි සීලයෙන් ද; විරියෙන ච, (වත් පිළිවෙත් පුරණ– හදරණ– පිරිවහන) කායිකවීර්‍ය්‍යයෙන් ද (කෙලෙසුන් තවන) චෛතසිකවීර්‍ය්‍යයෙන් ද; සමාධිනා, (රූපාරූප අෂ්ට–

145 17. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති සුබ්බතා.

දණ්ඩවග්ගො දසමො.

---

146 1. කොනු හාසො කිමානන්දො, නිච්චං පජ්ජලිතෙ සති,
අන්ධකාරෙන ඕනද්ධා පදීපං න ගවෙස්සථ.

---

සමාපත්ති සඞ්ඛ්‍යාත) සමාධියෙන් ද; ධම්මවිනිච්ඡයෙන ච, (කාරණාකාරණ දැක්ම ලකුණු කොට ඇති) ධර්මවිනිශ්චයෙන් ද හෙවත් විදර්ශනාප්‍රඥාවෙන් ද සමන්විතව; සම්පන්නවිජ්ජාචරණා, (ත්‍රිවිද්‍යාවන්ගේ ද අෂ්ටවිද්‍යාවන්ගේ ද පසළොස් චරණධර්මයන්ගේ ද සමෘධිය හෙතු කොට ගෙණ) සම්පූර්ණ වූ විද්‍යාචරණ ඇතු ව; පතිස්සතා, (සියලුකුදුමහත්කටයුත්තෙහි එළඹ සිටි සිහි ඇති බැවින්) සමෘතිසම්ප්‍රජාන ච; අනප්පකං, අනල්ප වූ (=ඉතා බොහෝ වූ); ඉදං දුක්ඛං, මේ සංසාරදුක්ඛය; පහස්සථ, දුරුකරවු.

17. නෙත්තිකා, දියඑවෝ (කෙත්වත් ආදියට දිය ගෙණ යන්නාහු); උදකං, සිත්පිත් නැති දිය; නයන්ති, (ඇල බිඳගෙණ පිහිලි පටවාගෙණ වෙහෙලි නගාගෙණ) තමන් කැමති තැනකට ගෙණයන්නාහ; උසුකාරා, හීවඩුවෝ; තෙජනං, සිත්පිත් නැති හීදඬු; නමයන්ති, (තවා ඇද මැඩ) කැමතිලෙසට නමන්නාහ; තච්ඡකා, වඩුවෝ; දාරුං සිත්පිත්නැති දඬු; නමයන්ති, (නිම්වලලු ආදීන් පිණිස වක්කොට ද ඉදි කොට ද සැස තමන්කැමතිලෙස නමන්නාහ; සුබ්බතා, සුවසේ අවවාදඅනුශාසනා කටහැකි සුවචයෝ; අත්තානං, ආත්මය; දමයන්ති, දමනය කරන්නාහුයි; (තමන්ගේ සිත දමනයකොට රහත්පලයට පැමිණෙන්නාහුයි.)

දණ්ඩවග්ගො දසමො.

---

1. නිච්චං, සතතයෙන්; පජ්ජලිතෙ සති, (මේ ලොකසන්නිවාසය රාගාදි එකොළොස් ගින්නෙන්) ඇවිලගෙණ දිලියෙනකල්හි; හාසො, (තොප හැමදෙනහට) සොම්නසෙක් වත්; ආනන්දො, සතුටෙක් වත්; කො නු, කවරේ ද? අන්ධකාරෙන, (දුක්ඛාදි අටතන්හි උපදනා සම්මොහ යයි කියනලද) අවිද්‍යාන්ධකාරයෙන්; ඕනද්ධා, වළඳනාලද්දා වූ තෙපි; පදීපං, (ඒ මොහාන්ධකාරය නසන පිණිස) මාර්ගඵලප්‍රඥා යයි කියනලද ප්‍රදීපය; කිං න ගවෙස්සථ, කුමට නොසොයවුද.

147 2. පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති.

148 3. පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඩං පභඞ්ගුරං, 1
භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං.

149 4. යානි මානි අපත්ථානි අලාපූනෙව සාරදෙ,
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රති.

---

2. යස්ස,යම් මේ ශරීරයක්හුගේ; ධුවං ඨිති නත්ථි,නිත්‍යවූ පැවැත්මෙක් නැද්ද, (එකාන්තයෙන් නස්නා සුලු ද, විසිරෙණ සුලුද); අරුකායං, (නවමහාවණමුඛයන්ගේ වසයෙන්) ව්‍රණස්වභාව වූ, (-ව්‍රණසමූහ වූ);සමුස්සිතං,තුන්සියයක් ඇටින් ගලපාසිටුවන ලද්දවූ; අතුරං (හැමකල්හි ම කැවීමෙන් පෙවීමෙන් නැහැවීමෙන් ඉලීමෙන් ඉරියව්පෙරළීම්ආදියෙන් පරිහරණයකටයුතුහෙයින් සතතයෙන්) ගිලන්වූ; බහුසඞ්කප්පං, බොහෝදෙනා විසින් සුභය සුඛ යයි කල්පනාකරණලද්දවූ; චිත්තකතං,(වස්ත්‍රාභරණ-මාලාගන්ධාදියෙන් සරහා) විසිතුරු කරණලද්ද වූ; බිම්බං, මේ ශරිරය (මේ මෘතකලෙබරය); පස්ස, (අසුචිදුගඳපිළිකුල් සේ) බල.

3. ඉදං රූපං,(භගිනිය තීගේ ශරීරයයි කියනලද) මේරූපය තෙම; පරිජිණ්ණං, මහලුවගිය හෙයින් ඉතා ජීණ්ව ගියේය [=ජරාවෙන් ඉතා දුරුව ගියේය]; (හෙද වැලිත්) රෝගනිඩ්ඩං, (නොයෙක් රෝගයන්ට වාසස්ථාන බැවින්) රෝගයට කසල්ලක් බඳුය; පභඞ්ගුරං, 1 වහා නස්නාසුලුය; පූතිසන්දෙහො,(රන්වන් වූ ව ද නවදොරින් සතතයෙන් වැහෙන කුණු ඇති බැවින්) කුණුවූ මේ කාය තෙම; භිජ්ජති, නොබෝ කලකින් බිඳෙන්නේයි; කුමක් හෙයින් ද යත්? ජීවිතං, සියලු සතුන්ගේ ජීවිතය තෙම; හි, යම් හෙයකින්; මරණන්තං, මරණය ම අන්තකොට ඇත්තේ ද එහෙයින් වහා බිඳෙන්නේයි.

4. සාරදෙ,සරත් කාලයෙහි; අපත්ථානි, ඒ ඒ තන්හි දමනලද්දවූ; අලාපූනි ඉව, ලබුවැනි වූ; කාපොතකානි, කොබෝවන් පැහැඇත්තා වූ; යානි ඉමානි අට්ඨීනි, යම් මේ මිනීඇටකෙනෙක් ඇද්ද; තානි දිස්වාන, ඒ මිනීඇට දැක; කා රති, කවර නම් කාමරතියක් (තොපට වන්නී)ද,-- සරත්කල ඒ ඒ තැන දමනලද ලබුවැනි වූ මේ මිනීඇට දැක දැක ස්වල්පමාත්‍ර වූ ද කාමරතියක් ඉපදවීම නොපරිසුදුසුදැයි සේයි.

---

1 පභංගුණං. ඇතම්

150 **5. අට්ඨීනං නගරං කතං මංසලොහිතලෙපනං,**
**යත්ථ ජරා ච මච්චු ච මානො මක්ඛො ච ඔහිතො.**

151 **6 ජීරන්ති වෙ රාජරථා සුචිත්තා අථො සරීරම්පි ජරං උපෙති,**
**සතඤ්ච ධම්මො න ජරං උපෙති සන්තො හවෙ සබ්භි**
**පවෙදයන්ති.**

152 **7. අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති,**
**මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති.**

---

5. යත්ථ, යම් තැනෙක්හි; ජරා ච, ස්කන්ධපරිපාකලක්ෂණ වූ ජරාද;මච්චු ච, ස්කන්ධභෙදලක්ෂණ වූ මරණ ද; මානො ච, ('සෙය්‍යස්ස සෙය්‍යො හමස්මි" යනාදි ජාත්‍යාදිය නිසා උපදනාවූ උන්නති ලක්ෂණ වූ) නවවිධ මානය ද; මක්ඛො ච, මෙරමාවිසින් කරණලද උපකාර මැකීම ලකුණු කොට ඇති මකුකෙලෙස් ද; ඔහිතො, පිහිටුවනලද ද, හෙවත් පටවනලද ද; මංසලොහිතලෙපනං, මසින් හා ලෙහෙයෙන් ගල්වනලද; නගරං, නුවරක්, හෙවත් කොටුගෙයක්; අට්ඨීනං, ඇටින්; කතං, කරණලදී. තුන් සියයක් ඇට පිහිටුවා නවසියයක් නහරවැලින් වෙලා කරණලදී.

6. සුචිත්තා,(මුතුමැණික් ඈ සත්රුවනින් ද සෙසු රථාලඞ්කාරයෙන්ද)විශෙෂයෙන් විසිතුරු කරණලද්දා වූ; රාජරථා, රජුන්ගේ මඟුල් රථයෝ ද; වෙ, ඒකාන්තයෙන්; ජීරන්ති, ජරාවට පැමිණෙති(=මහලුව දිරති); අථො, නැවත; සරීරම්පි, (කවා පොවා නහවා උළා හඳවා පළඳවා නොයෙක්ලෙස පරිහරණය කරණලද්දා වූ)මේ ශරීරය ද; ජරං උපෙති, (වියස් මිහිකිරීමෙන් ඛාණ්ඩිත්‍යාදියට පැමිණෙමින්) ජරාවට එළඹෙයි; සතං ධම්මො, බුද්ධාදි-සත්පුරුෂයන්ගේ නවලොකොත්තර ධර්මය වනාහි;ජරං න උපෙති; ජරාවට නො පැමිණෙන්නේයයි; සන්තො, බුද්ධාදි සත්පුරුෂයෝ; සබ්භි, සත්පුරුෂයන් හා සමග; හවෙ, ඒකාන්තයෙන්; පවෙදයන්ති, බණන්නාහුයි.

7. අප්පස්සුතො, (මූලපණ්ණාසාදි එක් දෙපණ්ණාසයක් හෝ එක්දෙවගක් හෝ යටත්පිරිසෙයින් එක් දෙසූත්‍රයක් හෝ නුපුහුණුබැවින්) අල්පශ්‍රැත වූ; අයං පුරිසො, මේ පුරුෂ තෙම, හෙවත් මෙබඳු කුසීත මහණ තෙම; බලිවද්දො ඉව,(මවට වත් පියාට වත් සෙසුනෑයන්ට වත් කිසිම ප්‍රයොජනයක් පිණිස නුමුහුකුරා නිරර්ථකව ම මුහුකුරණ) ගොණෙකු මෙන්; ජීරති, (උපාධ්‍යායවතක් ආචාර්‍ය්‍ය වතක් ගිලන් වතක් නො කොට භාවනාවෙක නොයෙදී නිරර්ථකව ම) මුහුකුරන්නේය; තස්ස, ඒ මහණුට;

153 8. අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

154 9. ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා.

---

මංසානි වඩ්ඪන්ති, (සියට නොතිසියසි වලහැරපු පාබුන් ගොන්මාලේලකු වල ම කා ඇවිද මස්වැඩී තරව ගියා මෙන් ආචාර්‍ය්‍යඋපාධ්‍යායාදීන් විසින් හරණලද්‍ද ව සඞ්ඝයාට් උපන් සතරපසය අනුභව කොට වමනවිරෙචනාදියෙන් කායපෝෂණයෙහි නියුක්තයහට) ශරීරමාංසයෝ ම වඩනාහ; තස්ස, ඔහට; පඤ්ඤා, ලෞකික වූ ද ලොකොත්තර වූ ද ප්‍රඥා තොම; න වඩ්ඪති, මදකුදු නො වඩතීසි. වෙනෙහි ගස්-තුරු-ලියආදීන් වඩනා මෙන් සදොර නිසා පවත්නා තෘෂ්ණාමානාදී කෙලශයෝ ම වඩනා හුයි.

8. පුනප්පුනං ජාති, භවයෙහි නැවත නැවත උත්පත්ති තොම; දුක්ඛා, යම්හෙයකින් දුක් ද; නොහොත්, ජාති, මේ ජාතිතොම; පුනප්පුනං, නැවත නැවත එළඹෙන්නට; දුක්ඛා, ජරාව්‍යාධිමරණ මිශ්‍ර හෙයින්) යම් හෙයකින් දුක් ද; (හෙද වැලිත් තෘෂ්ණාවශ්‍යකීහු නුදුටු තෙක් කල්හි නො නවතී ද එහෙයින්)ගහකාරකං ගවෙසන්තො,මේ ආත්මභාව සඞ්ඛ්‍යාත ගෙය කරන්නාවූ තෘෂ්ණා නැමැති වඩුවා සොයන්නා වූ මම (යම් නුවනකින් ඔහු දක්නට පිළිවන් ද ඒ බොධිඥානාධිගමය පිණිස දීපඞ්කර පාදමූලයෙහි දී කරණලද අභිනීහාර ඇත්තෙමි මෙතෙක් කල් මුළුල්ලෙහි); අනෙකජාතිසංසාරං, නොයෙක්ජාතිකොටිශතසහස්‍රයයි කියනලද සංසාරවට්ටයෙහි; අනිබ්බිසං, ඒ බොධිඥානය නොලබන්නෙම් ම; සන්ධාවිස්සං, චුතිප්‍රතිසන්ධිවශයෙන් නැවත නැවත ඇවිද්දෙමි ද.

9. ගහකාරක, ආත්මභාවසඞ්ඛ්‍යාත වූ මේ ගෙය කරන්නා වූ තෘෂ්ණා නැමති වඩුව! දිට්ඨො අසි, (සර්‍වඥතාඥානය ප්‍රතිවෙධ කරන්නා වූ මා විසින් තෝ දැන්)දක්නාලද්දෙහිවී; පුන, නැවත; ගෙහං, ආත්මභාවසංඛ්‍යාත වූ ගෙයක්; න කාහසි, (මට) නො කරන්නෙහිය; තෙ, තාගේ; සබ්බා ඵාසුකා, සෙසු සියලු කෙලෙස් නැමැති පරාළයෝ, හෙවත් සියලු ගෘහොපකරණයෝ තාක්; භග්ගා, (සර්‍වඥතාඥානය ප්‍රතිවෙධකරන්නා වූ මා විසින්) බිඳපියනලදහ; ගහකූටං, තා විසින් කරණ ලද මේ ආත්මභාව සඞ්ඛ්‍යාත වූ ගෘහයාගේ අවිද්‍යා නැමැති කැණි-

156 10. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං,
ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙ'ව පල්ලලෙ.

157 11. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං,
සෙන්ති චාපාතිඛීණා'ව පුරාණානි අනුත්ථුනං ති.

ජරාවග්ගො එකාදසමො.

---

158 1. අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං,
තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො.

---

මඩල; විසංඛිතං, (අභිනමාගීඥත නමැති පොරෙවින් පළා) විසුරුවා පියන්ලද; චිත්තං, (දැන් මාගේ) සිත; විසඞ්ඛාරගතං, (ආලම්බනකරණ වසයෙන්) නිර්වාණයට වන; තණ්හානං ඛයං, (මම ද) කාමතෘෂ්ණාදීන්ගේ ක්ෂයයි කියනලද අර්හත්ඵලයට, අජ්ඣගා, පැමිණියෙම් වීමි.

10. බ්‍රහ්මචරියං අචරිත්වා, (ප්‍රව්‍රජ්‍යාවට යොග්‍යවූ තරුණ වයස පැවිදිව ගෙණ) බඹසරවස් නොවැස; යොබ්බනෙ, (නූපන්භොග උපදවන්නට ද උපන් භොග රක්නට ද යෝග්‍යවූ) යෞවන–වයස; ධනං අලද්ධා, (කෘෂිවණික්කර්මාන්තාදියෙන් ලැබබැකිවූ) ධනය ලැබ නො ගෙණ ප්‍රමාද ව විසූ අඥනජනයෝ; ඛීණමච්ඡෙ පල්ලලෙ, දියසුන් හෙයින් මසුන් නැති විලෙක මඩපිට හිඳ තැවෙන්නා වූ; ජිණ්ණකොඤ්චාඉව, (ගොදුරුඇති විලකට නැගී යන බලනැති පත් වගුල) මහලුකොස්ලිහිණියන් මෙන්; අවඣා–යන්ති, තැවෙන්නාහුයි.

11. බ්‍රහ්මචරියං අචරිත්වා, (ප්‍රව්‍රජ්‍යාවට යොග්‍ය වූ තරුණ වයස පැවිදිව ගෙණ) බඹසරවස් නොවැස; යොබ්බනෙ, (නූපන් භොග උපදවන්නට ද උපන් භොග රක්නට ද යොග්‍ය වූ) යෞවන වයස; ධනං අලද්ධා, (කෘෂිවණික්කර්මාන්තාදියෙන් ලැබබැකි) ධනය ලැබනොගෙණ ප්‍රමාද ව විසූ අඥන ජනයෝ; චාපා, දුන්–නෙන්; අතිඛීණා ඉව, හරණලද ශර මෙන්, හෙවත් දුන්නෙන් විදිනා ලදුව වළ හුනු සැර වේයන්ට බත් ව හුනුතැනම තිබී දිරා නස්නා මෙන්; පුරාණානි අනුත්ථුනං, (පෙර මෙසේ කෑම්හ මෙසේ පූම්හ මෙසේ ඇන්දම්හ පැලැන්දම්හ යනාදීන්) පෙර වූන් සුවසැපතට සොස්මින්; සෙන්ති, හොවිත්.

ජරාවග්ගො එකාදසමො.

---

1. චෙ, ඉදින්, අත්තානං, ආත්මය; පියං ජඤ්ඤා, තමහට ප්‍රියයයි

169 **2. අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ,**
**අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතො.**

160 **3. අත්තනා චෙ තථා කයිරා යථඤ්ඤමනුසාසති,**
**සුදන්තො වත දමෙථ අත්තා හි කිර දුද්දමො.**

---

දන්නේ වීනම්; තං,ඒ ආත්මය; සුරක්ඛිතං රක්ඛෙය්‍ය, තුන්වයස ම සුරක්‍ෂිත කොට රක්නේයි; (යමෙක් තමා රක්මි යී මතු මහල් තෙලෙහි සුපිහිතවූ දොර කවුළු ඇති ගර්භයකට වැද සම්පන්නවූ ආරක්‍ෂා ඇතිව වසන්නේ ද පණිවා ආදි අකුසලයෙහි යෙදිනි නම් හේ තමා රක්නා නම් නොවේ, යමෙක් වනාහි රුක්මුල් ආදි නිරාරක්‍ෂාස්ථානයෙක වසන්නේ ද පණිවාආදි අකුසලින් දුරු ව දානසිලාදි සුචරිතයෙහි යෙදිනි නම් හේ තමා රක්නා නම් වේ. එහෙයින්) පණ්ඩිතො, ප්‍රාඥ වූ පුරුෂ තෙම; තිණ්ණ-මඤ්ඤතරං යාමං, තුන්වයසින් එක්තරා වයසක; පටිජග්ගෙය්‍ය, අකුසලින් දුරු කොට ආත්මය රක්නේයි.

2. පඨමං, පළමුකොට: අත්තානං එව, තමා ම; පතිරූපෙ නිවෙසයෙ; සුදුසු ගුණයෙක්හි පිහිටු වන්නේය; (යමෙක් අපිස් බැව් ආදි ගුණයෙකින් හෝ අරිවස් පිළිවෙත් ආදියෙකින් හෝ අනුන්ට අවවාද කරණු කැමැති වේ ද ඔහු විසින් පළමු කොට ඒ ගුණයෙහි පිහිටියයුතුයයි සේයි); අථ, ඉක්බිත්තෙන්; අඤ්ඤං, අනිකෙක්හට; අනුසාසෙය්‍ය, (තමා පිහිටි ගුණයෙන්) අනුශාසනා කරන්නේය; පණ්ඩිතො, මෙසේ කරන්නාවූ ප්‍රාඥ තෙම; න කිලිස්සෙය්‍ය, නොකෙලෙසෙන්නේයි, හෙවත් නොතැවෙන්නේයි. තමා පළමු කොට සුදුසු ගුණයෙහි පිළිවෙතෙහි නො පිහිටුවා පරහට අවවාද කරණ මහණ අනුන්ගෙන් නින්දා ලබන හෙයින් කෙලෙසෙන්නේ නම් වෙයි, සුදුසු ගුණයෙහි පිළි-වෙතෙහි පිහිටා සිට පරහට අවවාද කරණ මහණ අනුන්ගෙන් ප්‍රශංසා ලබන හෙයින් නො කෙලෙසෙන්නේ නම් වෙයි සේයි.

3. අඤ්ඤං, අනිකෙකුට, යථා අනුසාසති, (පෙරයම අළුයම සක්මන් කටයුතුය පස්නීවරණයන් කෙරෙන් සිත පිරිසිදු කටයුතුය යනාදීන්) යම් ලෙසක අනුශාසනා කෙරේද, අත්තනා, තමා ද වෙ, ඉදින්; තථා කයිරා, එසේ ම පිළිවෙත් සරුකරන්නේ වී නම්; වත, එකාන්තයෙන්; සුදන්තො, තෙමේ මනා ව දමුනේ; දමෙථ, අනුන් දමන්නේය; හි, යම් හෙයකින්; අත්තා, මේ

161 4. අත්තා හි අත්තනො නාථො කො හි නාථො පරො සියා,
අත්තනා'ව සුදන්තෙන නාථං ලභති දුල්ලභං.

162 5. අත්තනා'ව කතං පාපං අත්තජං අත්තසම්භවං,
අභිමන්ථති දුම්මෙධං වජිරං ච'ස්මමයං මණිං.

163 6. යස්ස අච්චන්තදුස්සීල්‍යං මාලුවා සාලමිවොත්ථතං,
කරොති සො තථත්තානං යථා නං ඉච්ඡතී දිසො.

---

ආත්මය නම්; දුද්දමො කිර, දමනය නොකට හැකි ද, හෙවත් ආත්මදමනය නම් දුෂ්කර ද; (එහෙයින් යම් ලෙසක ආත්මය දමනලද්දේ මනා කොට දමනලද්දේ නම් වේ ද එලෙස දැමිය යුතුයි.)

4. අත්තනො, තමහට; අත්තා හි, ආත්මය ම; නාථො, පිහිට වන්නේය; පරො, අන්‍ය වූ; කො හි, කවරෙක් නම්; නාථො සියා, තමහට පිහිට වන්නේ ද, (තමහට පිහිට නම් තෙමේමය අනික් කවරෙක් තමහට පිහිට වේ දැයි සේයි); සුදන්තෙන; ෂඩින්ද්‍රිය දමනයෙන් මනාකොට දැමූනා වූ; අත්තනා එව, තමා විසින් ම; දුල්ලභං, පරම්දුර්ලභ වූ; නාථං, අර්හත්ඵලයයි කියනලද ප්‍රතිෂ්ඨාව; ලභති, ලබන්නේයි.

5 අත්තජං, තමා කෙරෙන් ම ජනිත වූ; අත්තසම්භවං, තමා කෙරෙන් ම උපන්නා වූ, අත්තනා එව කතං, තමා විසින් ම කරණලද්දාවූ; පාපං, ප්‍රාණවධාදි අකුශලකර්මය තෙම: අස්මමයං මණිං; පාෂාණමය වූ මැණික; (විද සිදුරු විසිදුරුකොට අපරිභොග කරන්නාවූ) වජිරං ඉව, පහණමයවූ විදුර මෙන්; දුම්මෙධං, පාපකාරිවූ ඒ අඥානයා, අභිමන්ථති, මඩනේයි–සතරඅපායෙහි ගලා දුක්දෙන්නේයි.–යම්සේ පහණමය වූ පහණින් ම උපන්නාවූ විදුර තමහට උත්පත්තිස්ථාන වූ පහණමිණිය කා සිදුරු විසිදුරු කොට කඩ කඩ කොට අපරිභොග කෙරේ ද, එසේ ම තමා කෙරෙන් ම උපන් අකුශලකර්මය ඒ පාපකාරී වූ අඥානයා සතර අපායෙහි ගලා නසන්නේය යතු භාවයි.

6. යස්ස, යම් පුද්ගලයක්හුගේ; අච්චන්තදුස්සීල්‍යං, එකාන්තයෙන් ම දුස්සීලභාවය; සාලං මාලුවා ඉව, සල්රුකක් වැළඳගෙණ සිටි මාලුවා ලියයක් මෙන්; ඔත්තතං, ඒ දුස්සීලයා • වැළඳගෙණ සිටියේ වේ ද; දිසො, එක්තරා එකක්හුගේ සතුරෙක්; නං, ඒ තමාගේ සතුරාට; යථා ඉච්ඡති, යම්සේ අනර්ථයක් කොට–පියනු කැමති වේ ද; සො, ඒ දුසසීලපුද්ගල ද; අත්තානං තමහට; තථා කරෙති, එසේ ම අනර්ථ කරන්නේයි.–යම්

7. සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච,
යං වෙ හිතං ච සාධුං ච තං වෙ පරමදුක්කරං.

8. යො සාසනං අරහතං අරියානං ධම්මජීවිනං,
පටික්කොසති දුම්මෙධො දිට්ඨිං නිස්සාය පාපිකං,
ඵලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලති.

9. අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති,
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති,
සුද්ධිඅසුද්ධිපච්චත්තං නාඤ්ඤොඤ්ඤං විසොධයෙ.

---

ගෘහස්ථයෙක් උපන්තැන්පටන් දශඅකුශල කර්මපථය කෙරේද, යම්ප්‍රව්‍රජිතයෙක් උපසම්පන්නවූ දවස් පටන් ගරුකාපත්තියට අවදි ද, එසේ වූ දුස්සීලයාගේ නොයෙක් ජාතියෙහි පුරුදු කොට ආ සදෙර උපන් තෘෂ්ණායයි කියනලද ඒ දුස්සීල-භාවය සල්රුකක් වැළඳ සිටි මාලුවාලියය වැසි වස්නා කල ගොටු සේ උඩු බලා සිටි මාලුවා පත් පුරාගත් දියබරින් ඒ සල්-රුක බිඳ සුණු විසුණු කරන්නාක් මෙන් දුස්සීලපුද්ගලයා සුගති-යෙන් චුත කොට සතර අපායෙහි හෙළා සතුරෙකු මෙන් අනර්ථ කරන්නේය යනු භාවයි.

7. අසාධූනි, යම් කර්මකෙනෙක් සාවද්‍යහෙයින් අසාධුහු ද; අත්තනො අහිතානි ච, (කරණලද්දාහු ද අපායසාධක බැවින් තමහට) අහිතයෝ ද; (එසේවූ අකුශල කර්මයෝ) සුකරානි (වළ තැනට ගෙණයන දිය මෙන්) සුවසේ කටහැක්කාහුයි; යං, යම් කර්මයෙක් කරණලද්දේ; හිතං ච, සුගතිසාධක බැවින් තමහට හිත ද; සාධුංච, නිරවද්‍ය බැවින් සාධු ද; තං, ඒ කුශලකර්මය; පරමදුක්කරං, (පැදුම් දෙසට නතු මහගඟක් පෙරලා පැළදෙසට නතුකිරීමක් මෙන්) අතිදුෂ්කරයි, (=කරන්නට ඉතා ම නො පිළිවනි.)

8. යො දුම්මෙධො, යම් අඥානපුද්ගලයෙක්; පාපිකං දිට්ඨිං නිස්සාය, (තමහට වන ලාභසත්කාරහානියෙහි භයින්) ලාමකවූ දෘෂ්ටිය නිසා; අරහතං, නිකෙලෙස් වූ; ධම්මජීවිනං, දැහැමින් ජීවත්වන සුලු වූ; අරියානං, බුඬාදි ආර්‍යයන්ගේ; සාසනං, අනුශාසනාව; පටික්කොසති, වළකා ද; (ඔහුගේ ඒ පටික්කොසනය ද ලාමක වූ ඒ දෘෂ්ටියද); කට්ඨකස්ස ඵලානි ඉව, හුන ගස්හුගේ පල ගැන්ම මෙන්; අත්තඝඤ්ඤාය, ආත්මවධය පිණිස හෙවත් තමහට විනාසය පිණිස; ඵල්ලති, පල ගන්නේයි හෙවත් නිපදනේයි.

9. අත්තනා එව,(යමෙක්හු)තමා විසින් ම;පාපං,අකුශලකර්මයෙක්;

**10. අත්තදත්ථං පරත්ථෙන බහුනාපි න හාපයෙ,**
**අත්තදත්ථමභිඤ්ඤාය සදත්ථපසුතො සියා ති.**

**අත්තවග්ගො ද්වාදසමො.**

---

**1. හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ,**
**මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය න සියා ලොකවඩ්ඪනො.**

---

කතං, කරණලද්දේ වේ ද; (හෙතෙම සතරඅපායෙහි ඉපිද දුක් අනුභව කිරන්නේ) අත්තනා එව, තෙමේ ම; සඞ්කිලිස්සති, වෙසෙසින් කෙලෙසේන්නේය හෙවත් නැවෙන්නේය; අත්තනා, (යමක්හු) තමා විසින්; පාපං; අකුශලකර්මයෙක්; අකතං, නො කරණලද්දේ වේ ද; (හෙතෙම සුගතියට යන්නේ ද අගතියට නො යන්නේ ද) අත්තනා එව, තෙමේ ම; විසුජ්ඣති, විශුඬවන්නේය; සුඞි, කුශලකර්මසඞ්ඛ්‍යාත වූ ශුඞිය ද; පච්චත්තං, (කුශලාකුශලකර්මයන් කළා වූ සත්ත්වයන්) තම තමන්ට ම වන්නේය, හෙවත් ඒ ඒ සත්ත්වයන්ට ම විපාකදෙන්නේය; එහෙයින්, අඤ්ඤො, අනික් පුද්ගලයෙක්; අඤ්ඤං, අන්‍ය පුද්ගලයක්හු; න විසොධයෙ, ශුඬ කරන්නේ නොවේ.

10. බහුනාපි, බොහෝ ද වූ; පරත්ථෙන, පරාර්ථයට වඩා; අත්තදත්ථං, ආත්මාර්ථය; න හාපයෙ, නො පිරිහෙලන්නේය; අත්තදත්ථං, අභිතඵලසඞ්ඛ්‍යාත ආත්මාර්ථය; අභිඤ්ඤාය, (මට ආත්මාර්ථය නම් මේමයයි) විශිෂ්ට වූ ඥනයෙන් දැන; සදත්ථපසුතො සියා, අභිතඵලාධිගමයයි කියනලද ස්වාර්ථයෙහි යුක්තප්‍රයුක්ත වන්නේයි—මම ස්වාර්ථය කරන්නෙම් වෙම්දැයි චෛත්‍යප්‍රතිසංස්කරණාදි සංස්කෘත්‍යය ද ආචාර්ය්‍ය වත්-උපාධ්‍යාය වත්-ආගන්තුක වත්-- ගිලන් වත් ආදි වතාවතු දු නොපිරිහෙලියයුතුය, ආභිසමාචාරික වත් නුපුරා ආදිබ්‍රහ්මචරියය පුරන්නේය යනු නැත, ආභිසමාචාරික වත් පුරණ මහණ ම අෘය්‍යඵලාදියට පැමිණෙන්නේය, එහෙයින් ආභිසමාචාරික වත් පිරීම ද ස්වාර්ථනම් වෙයි, යම් මහණෙක් වතාහි අතිශයින් වඩනලද විදර්ශනා ඇති ව අද අද ම රහත්පලය පසක්කෙරෙමියි ප්‍රතිවේධය ප්‍රාර්ථනාකෙරෙමින් වෙසේ ද, ඔහු විසින් උපාධ්‍යාය වත් ආදිය පිරිහෙලා ද ආත්මාර්ථයෙහි ම නියුක්තවිය යුතුය යනු භාවයි.

අත්තවග්ගො ද්වාදසමො.

---

1. හීනං ධම්මං, (හීනසත්ත්වයන් විසින් සෙවියයුතු බැවින් ද හීන වූ නරකාදියෙහි උපදවන හෙයින් ද) හීන වූ රූපාදි

169 2. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

170 3. ධම්මං චරෙ සුචරිතං න තං දුච්චරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

171 4. යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං,
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.

---

පඤ්චකාමගුණධර්මය; න සෙවෙය්‍ය, නො සෙවුණේය; පමාදෙන, (කුශලධර්මයෙහි සමෘතිවිප්‍රවාසයයි කියනලද) ප්‍රමාදය හා; න සංවසෙ, එක් ව නො වසන්නේය, හෙවත් ප්‍රමාදය ද නො සෙවුනේය; මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය, අනිත්‍යාදියට විරුඬ වූ ශාශ්වතොච්ඡෙද දෘෂ්ටිය ද නො සෙවුනේය; ලොකවඩ්ඪනො න සියා, මෙසේ යථොක්තවූ අකෘත්‍යය නො කිරීමෙන් ලොකවර්ධනය නො වන්නේයි.— සසර නො වඩන්නේ යයි සේයි.

2. උත්තිට්ඨෙ, භික්ෂාටනය හෙවත් ගෙපිළිවෙළින් දොර දොර සිට සිඟා ලැබියයුතු කොණෙසිඅහරෙහි; නප්පමජ්ජෙය්‍ය, (පිණ්ඩචාරිකවත නො පිරිහෙලා ගෙපිළිවෙළ නො ඉක්මවා දොරදොර සිට බික්සිඟන බැවින්) නො පමාවන්නේය; ධම්මං, එම භික්ෂාචර්‍ය්‍යාධර්මය; සුචරිතං චරෙ, (එක්විසි අනෙස්නෙන් දුරු ව සපදානචරියාවෙන්) සකස්කොට පුරුදු කරන්නේය; ධම්මචාරී, භික්ෂාචර්‍ය්‍යාධර්මයෙහි මනා ව පවත්නා සුලු මහණ; අස්මිං ලොකෙ, මේ ලෙව්හි ද පරම්හි ච, පරලෙව්හි ද; සුඛං සෙති, සතරඉරියව්වෙහි ම සුවසේ වසන්නේයි.

3. ධම්මං, භික්ෂාචර්‍ය්‍යාධර්මය; සුචරිතං චරෙ, (එක්විසි අනෙස්නෙන් දුරුව ගෙපිළිවෙළ නො ඉක්මවා දොරදොර සිට පිඬුසිඟීමෙන්) මනාකොට පුරන්නේයි; තං ඒ භික්ෂාචර්‍ය්‍යාධර්මය; දුච්චරිතං න චරෙ, (වෙසියගොචරාදි අගොචරයෙහි හැසිරීම් වසයෙන්) නපුරු කොට නුපුරන්නේයි; ධම්මචාරී, භික්ෂාචර්‍ය්‍යාධර්මයෙහි මනා ව පවත්නාසුලු මහණ; අස්මිං ලොකෙ, මේ ලෙව්හි ද පරම්හි ච, පරලෙව්හි ද; සුඛං සෙති, සතර ඉරියව්වෙහි ම සුවසේ වසන්නේයි.

4. බුබ්බුලකං, දියබුබුලක්; යථා පස්සෙ, (ඉපදලා වහා නස්නේ යයි ද තුච්ඡය අසාරයයි ද) යම්සේ බලා ද; මරීචිකං, (පව්නින් කම්පිත වූ හිරුරැස යයි කියනලද) මිරිඟු; යථා පස්සෙ,

171 5. එථ පස්සථිමං ලොකං චිත්තං රාජරථූපමං,
යත්ථ බාලා විසීදන්ති නත්ථි සඞ්ගො විජානතං.

172 6. යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

173 7. යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථීයති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

---

(ගන්නට නොනිසියුයි) යම්සේ බලා ද; එවං, එපරිද්දෙන් ම; ලොකං; ස්කන්ධායතනධාතුසඞ්ඛ්‍යාතලොකය; අවෙක්ඛන්තං, (ඉපදලා වහා නස්නේය තුච්ඡය අසාරය ආත්මආත්මීයභාවයෙන් ගන්නට නො නිසියයි) නුවනැසින් බලන්නා වූ මහණු; මච්චුරාජා, මරණරජ තෙම; න පස්සති, (තමහට අවිසය වූ නිවන්පුරයට ගියහෙයින්) නො දක්නේයි.

5. යත්ථ, යම් ආත්මභාවයෙක්හි; බාලා, අඥානජනයෝ; විසීදන්ති, තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් ගැලෙද්ද; විජානතං, නුවනැත්තවුන්ට; සඞ්ගො නත්ථි, (යම් ආත්මභාවයෙක්හි) රාගසඞ්ගාදි කිසි සඞ්ගයෙක් නැද්ද; චිත්තං, (රන්රිදී මුතුමැණික් ආදි සත්රුවනින්) විසිතුරු වූ; රාජරථූපමං, රාජරථයක් වැනි වූ, හෙවත් රජදරුවන් නැගෙණ මගුල්රථයක් මෙන් වස්ත්‍රාභරණාදියෙන් විසිතුරුකරණලද; ඉමං ලොකං, ස්කන්ධාදි ලොකයයි කියනලද මේ ආත්මභාවය; එථ, මෙහි එව; පස්සථ, බලව්.

6. යො, යම් පුද්ගලයෙක්; පුබ්බෙ, පූර්වභාගයෙහි; පමජ්ජිත්වා ච, (වත්පිළිවෙත් පිරීමෙන් හෝ බණ හැදෑරීම් ආදියෙන් හෝ යොනිශොමනස්කාරයෙහි) ප්‍රමාදව ද; සො, හෙතෙම; පච්ඡා, පසුව; නප්පමජ්ජති, (මාර්ගඵල සුවයෙන් දවස් යවන්නේ යොනිශොමනස්කාරයෙහි) නො පමා වේ ද; සො, එපුද්ගල තෙම; අබ්භා මුත්තො, වලාපටලයෙකින් මුක්ත වූ; චන්දිමා ඉව, පූර්ණචන්ද්‍රයා අවකාශලොකය බබුළුවන්නා මෙන්; ඉමං ලොකං; ස්කන්ධාදිසඞ්ඛ්‍යාත වූ මේ ලොකය; පභාසෙති, ඥානාලොකයෙන් බබුළුවන්නේයි.

7. යස්ස, යම් පුද්ගලයක්හු විසින්; කතං, කරණලද; පාපං කම්මං, ප්‍රාණවධාදි අකුශලකර්මය; කුසලෙන, (අර්හත්මාර්ගචිත්තසම්ප්‍රයුක්ත චෙතනා යයි කියනලද) කුශලයෙන්; පිථීයති, පිහියේ ද, හෙවත් මූවාව යේ ද; සො, ඒ පුද්ගල තෙම; අබ්භා මුත්තො, වලාපටලයකින් මුක්ත වූ; චන්දිමා ඉව, පූර්ණචන්ද්‍රයා අවකාශ-

174 **8. අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති,**
**සකුණො ජාලමුත්තොව අප්පො සග්ගාය ගච්ඡති.**

175 **9. හංසා ආදිච්චපථෙ යන්ති ආකාසෙ යන්ති ඉද්ධියා,**
**නීයන්ති ධීරා ලොකම්හා ජිත්වා මාරං සවාහිනිං.**

176 **10 එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො,**
**විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියං.**

---

ලොකය බබුලුවන්නා මෙන්; ඉමං ලොකං, ස්කන්ධාදිසඞ්ඛ්‍යාත වූ මේ ලොකය; පභාසෙති, ඥනාලොකයෙන් බබුලුවන්නේය.

8. අයං ලොකො, මේ ලෞකිකමහාජන තෙම; අන්ධභූතො, නුවනැස්නැති හෙයින් අන්ධවූයේය (=දෙ ඇස් නැත්තේය); එත්ථ, මේ මහාජනයා අතුරෙහි; තනුකො, ස්වල්ප වූ සත්ත්වයෙක් ම; විපස්සති, අනිත්‍යාදිවශයෙන් ස්කන්ධපඤ්චකය දක්නේය; ජාලමුත්තො සකුණො ඉව, දක්ෂ වූ ලිහිණිවැද්දකු විසින් දමනලද දැලට හසු ව එයින් මිදී පලායන වටුවෙකු මෙන් මාරජාලයෙන් වසනලද සත්ත්වයන් අතුරෙන්; අප්පො, ස්වල්ප වූ කිසි සත්ත්වයෙක් ම; සග්ගාය ගච්ඡති, සුෂ්ටුඅග්‍ර හෙයින් ස්වර්ගයයි කියනලද සුගතියට ද නිර්වාණයට ද යන්නේයි.

9. හංසා, මේ හංසයෝ; ආදිච්චපථෙ යන්ති, සූය්‍ර්‍යමාර්ගයෙහි හෙවත් ආකාසයෙහි; යෙති; ආකාසෙ යන්ති ඉද්ධියා, (සුභාවිත වූ සතර ඍද්ධිපාදයන් ඇති යොගීහු) ඍද්ධියෙන් ආකාසයෙහි යෙති, (යම්සේ මේ හංසයෝ කර්මවිපාකජඍද්ධියෙන් ආකාශයෙහි යේද්ද එසේ ම සුභාවිත වූ ඡන්දර්ද්ධිපාදාදි චතුර්විධඍද්ධිපාදභාවනා ඇති ක්ෂීණාශ්‍රවයෝ භාවනාමය ඍද්ධියෙන් ආකාශයෙහි යෙතියි සේයි;) ධීරා, හෙතුසම්පන්න වූ කෘතාධිකාර) ප්‍රාඥයෝ; සවාහිනිං මාරං ජිත්වා,("කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති", යනාදීන් දක්වනලද) මාරසෙනාව සහිත වූ වශවර්ත්තිමාරයා පරදවා; ලොකම්හා, සංසාරවට්ටයයි කියනලද මේ ලොකයෙන්; නීයන්ති, නික්මෙන්නාහුයි, හෙවත් නිර්වාණට පැමිණෙන්නාහුයි.

10. එකං ධම්මං අතීතස්ස, එක ම වාක්සත්‍යධර්මය ඉක්මුනා වූ; මුසාවාදිස්ස, (දසබසකින් එකබසකු දු සැබෑනොවන හෙයින් බොරු බොහෝකොට කියන සුලු වූ; විතිණ්ණපරලොකස්ස, (දිව්‍යමනුෂ්‍යසම්පත්තියට ද අවසාන නිර්වාණසම්පත්තියට ද හිමි නොවන හෙයින්) හරණලද පරලෝ ඇති; ජන්තුනො, මෙබඳු සත්ත්වයා විසින්; අකාරියං, නො කට හැකි වූ; පාපං, අකුසලයෙක් නම්; නත්ථි, නැති.

177 11. න වෙ කදරියා දෙවලොකං වජන්ති
බාලා හවෙ නප්පසංසන්ති දානං,
ධීරො ච දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථ.

178 12. පඨව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා,
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං.

ලොකවග්ගො තෙරසමො.

---

179 1. යස්ස ජිතං නාවජීයති ජිතමස්ස නො යාති කොචි ලොකෙ,
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ.

---

11. කදරියා, තදමසුරු සත්වයෝ; වෙ, එකාන්තයෙන්; දෙවලොකං, දෙව්ලොවට; න වජන්ති, නො යන්නාහ; බාලා, මෙලෝ පරලෝ වැඩ නො දන්නා අඥනජනයෝ; හවෙ, එකාන්තයෙන්; දානං, (අනුන් විසින් දෙනලද) දානයට; නප්පසංසන්ති, (=කළ සේ යහපතැයි) ප්‍රශංසාවක් නො කරන්නාහ; දානං, (අනුන් විසින් දෙනලද) දානය; අනුමොදමානො, අනුමෝදන්වන්නා වූ, ධීරො, ප්‍රාඥ වූ, සො, ඒ පුරුෂ වනාහි; තෙනෙව, ඒ දානානුමෝදනාමය වූ කුශලකර්මයෙන්; පරත්ථ, පරලොව; සුඛී හොති, (දිව්‍යසම්පත්ති අනුභව කරන්නේ කායිකචෛතසික සුවයෙන්) සුඛිත වන්නේයි; (=සුවයට පැමිණෙන්නේයි)

12. පඨව්‍යා, මුළුපොළොව; එකරජ්ජෙන, එකරාජ්‍යයට ද වඩා, (හෙවත් දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර-මහත් ඊපයෙන් හොබනා මුළුසක්වළ ගැබ ආධිපත්‍යය කරණ සක්විතිරජහුගේ ඒ ඓශ්වර්‍ය්‍යයට ද වඩා); සග්ගස්ස ගමනෙන වා, චාතුර්මහාරාජිකාදි සවිසිවැදෑරුම් ස්වර්ගයට යාමට ද වඩා; සබ්බලොකාධිපච්චෙන, (නාග- සුපර්ණ-වෛමානික ප්‍රේතයන් හා සමග) සියලු මේ ලොකයෙහි ආධිපත්‍යය ට ද වඩා; සොතාපත්ති-ඵලං වරං, සෝවාන්පලය ම උත්තමයි — යම් හෙයකින් මෙතෙක් තන්හි ආධිපත්‍යය කොට ද සත්වතෙම නරකාදියෙන් නො මිදුනේ ම වේද, සෝවාන්පුහුල් වනාහි පියනලද අපාය දොර ඇති බැවින් සමිදුම්ල ද, අටවැනි භවයෙහි නො උපදීද, එහෙයින් සකලලොකයෙහි ආධිපත්‍යයට ද වඩා සෝවාන්-පලය ම උතුමැයි සේයි.

ලොකවග්ගො තෙරසමො.

---

1. යස්ස, යම් සම්‍යක්සම්බුද්ධයක්හු විසින්; ජිතං, දිනනලද රාගාදි කෙලශ ජිතය; නාවජීයති,(නැවත නො උපදනා හෙයින්)

180 2. යස්ස ජාලිනි විසත්තිකා තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ,
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ.
181 3. යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා,
දෙවාපි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතිමතං.

---

නපුරා කොට දිනනලද්ද නම් නො වේද, හෙවත් නො දිනුවා නම් නො වේ ද; අස්ස, ඒ සම්‍යක්සම්බුද්ධයා විසින්; ජිතං, ඒ ඒ මාර්ගයෙන් දිනනලද රාගාදිකෙලශ ජිතය; ලොකෙ, ලොකයෙහි; කොචි, කිසිඑක ද කෙලශයෙක්; නොයාති, නැවත නොයේ ද, හෙවත් පස්සෙහි ලුහු බැඳ ගෙණ නො යේ ද; අනන්තගොචරං, (අනන්තාලම්බන වූ සර්වඥතාඥනවශයෙන්) අපර්යන්ත වූ ගොචර ඇති; අපදං, (භවත්‍රයෙහි පරිභ්‍රමණයට කාරණවූ රාගපදාදීන්) අතුරෙන් එක ද පදයක් නැත්තා වූ; තං බුඞං, ඒ සම්‍යක්සම්බුඞයා; කෙන පදෙන, කවර පදයකින්, නොහොත් කවර කාරණයෙකින්; නෙස්සථ, ගෙණ යෙව් ද—තොපගේ වසයට පමුණුවව්ද.

2. ජාලිනී, හිව්න වළඳනා අර්ථයෙන් දැලක් වැනි හෙයින් ජාලිනී නම් වූ; විසත්තිකා, රූපාදි පඤ්චාලම්බනයෙහි ආසක්තවිසක්තවන හෙයින් විසත්තිකා නම් වූ; තණ්හා, රූපතෘෂ්ණාදි වූ තෘෂ්ණා තොම; යස්ස, යම් සම්‍යක්සම්බුඩයක්හු; කුහිඤ්චි නෙතවෙ, කිසි භවයෙක්හි පමුණුවන්නට; නත්ථි, නැද්ද; හෙවත් සම්‍යක්සම්බුඞයන් කිසි භවයකට ගෙණ යන්නට කිසි තෘෂ්ණාවක් නම් නැද්ද; අනන්තගොචරං (අනන්තාලම්බනවූ සර්වඥතාඥනවශයෙන්) අපරියන්තවූ ගොචර ඇති; අපදං, (භවත්‍රයෙහි පරිභ්‍රමණයට කාරණ වූ රාගපදාදීන් අතුරෙන්) එක ද පදයක් නැත්තා වූ; තම්බුඞං, ඒ සම්‍යක්සම්බුඞයා; කෙන පදෙන, කවර පදයෙකින්, නොහොත් කවර කාරණයෙකින්; නෙස්සථ, ගෙණ යෙව් ද-තොපගේ වසයට පමුණුවව්ද.

3. යෙ ධීරා, යම් ප්‍රාඥකෙනෙක්; ඣානපසුතා, ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යාන වශයෙන් ද්විප්‍රකාර වූ ධ්‍යානයෙහි (ආවජ්ජන-සමාපජ්ජන-අධිට්ඨාන-වුට්ඨාන-පච්චවෙක්ඛන-වසයෙන්) යුක්තප්‍රයුක්තයෝ ද, හෙවත් සමථවිදර්ශනාභාවනා දෙක්හි නියුක්තයෝ ද; නෙක්ඛම්මූපසමෙ රතා, (කෙලශව්‍යුපශමනය නිර්වාණය යන මේ) නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනාහු ද; සතීමතං, ස්මෘතිමත්වූ; තෙසං සම්බුඩානං, ඒ සම්‍යක් සම්බුඩයන්ට; දෙවාපි, දෙවියෝ ද මිනිස්සු ද; පිහයන්ති කැමති වෙත්: (අපිත් බුදුවූමෝ නම් යෙහෙකැයි බුදු බව කැමතිවන්නාහු ප්‍රාර්ථනා කෙරෙත්)

4\. කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චාන ජීවිතං,
කිච්ඡං සද්ධම්මසවණං කිච්ඡො බුද්ධානං උප්පාදො.

5\. සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං.

6\. ඛන්ති පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා,
න හි පබ්බජිතො පරූපඝාති
සමණො හොති පරං විහෙඨයන්තො.

---

4\. මනුස්සපටිලාභො, මිනිසත්බව පිළිලැබීම නම්; කිච්ඡො, (මහත්ව්‍යායාමයෙන් මහත් කුසලයෙන් පිළිලැබියයුතු බැවින්) කෘච්ඡ්‍රය, (=දුලීභය;) මච්චානං, සත්‍වයන්ගේ; ජීවිතං, ජීවිතය, හෙවත් සත්‍වයන්ගේ ජීවිකාව ද; කිච්ඡං,(නිරන්තරයෙන් කෘෂි-වණික්කර්මාන්තාදීන් කොට ජීවිකාව කරණ බැවින් ද ස්වල්ප-කාලයක් පවත්නා බැවින්ද) කෘච්ඡ්‍රය, (=දුකය;) සද්ධම්මසවණං, සද්ධර්මශ්‍රවණය ද; කිච්ඡං, (නොයෙක් කප්කොළසුවහස්හි ධර්ම-දෙශකපුද්ගලයෙකු දුලීභ හෙයින්) කෘච්ඡ්‍රය; බුද්ධානං උප්පාදො, සම්‍යක්සම්බුද්ධවරයන්ගේ ඉපදීම ද; කිච්ඡො, කෘච්ඡ්‍රය; මහාව්‍යායාමයෙන් අභිනීහාරය සමෘද්ධවන බැවින් ද සමෘද්ධ වූ අභිනීහාර ඇති මහාපුරුෂයක්හුගේ උත්පත්තිය ද නොයෙක් කප්කෙළ සුවහසෙක්හිදු දුලීභ බැවින් (කෘච්ඡ්‍රය=දුලීභය.)

5\. සබ්බපාපස්ස අකරණං, (කායාදිචාරත්‍රයෙන් සිඩවන්නා වූ ප්‍රාණවධාදි වූ) සියලු අකුශලකර්මයාගේ නො කිරීම ද; කුසලස්ස උපසම්පදා, (ගේ හැර මහණ වූ තැන් පටන් රහත්ඵලයට පැමි-ණෙන තැන් දක්වා) සියලු ලෞකිකලොකොත්තරකුශලයාගේ ඉපදවීම ද, උපදවනලද කුසලයාගේ වැඩීම ද; සචිත්තපරියො-දපනං, පඤ්චනීවරණයන් කෙරෙන් තමාගේ සිත පිරිසුදුකිරීම ද යන; එතං, මේ සියල්ල; බුද්ධානං සියලු බුදුවරයන්ගේ; සාසනං, අනුශාසනයි-අවවාදයි.

6\. තිතික්ඛා ඛන්ති, (පරාපකාර-පරාපවාද ඉවසීමය යන යම් මේ) අධිවාසනක්ෂාන්තියෙක් ඇද්ද හෝ තොම; පරමං තපො, (ශීලාදිගුණධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ අකුශලධර්මයන් තවන හෙයින් මේ ශාසනයෙහි)උත්තම වූ තපසෙක; බුද්ධා, සියලු බුද්ධප්‍රත්‍යෙක-බුද්ධඅනුබුද්ධයෝ; නිබ්බාණං, ශාන්තිලක්ෂණ වූ නිර්වාණය, පරමං වදන්ති, ශාන්තප්‍රණීතාදී සර්වාකාරයෙන් උත්තමයයි කියති;

185 7. අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං;
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධානසාසනං.

186 8. න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති,
අප්පස්සාද දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො.

---

පරූපඝාතී, පරහට හිංසාකරණසුලු වූ යේ, හෙවත් අනුන් දිවිනසනසුලු වූ යේ; පබ්බජිතො න හොති, ("පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතොති වුච්චති" යන ප්‍රව්‍රජිතලක්ෂණ නැති හෙයින්) පැවිදි නම් නොවෙයි; පරං විහෙඨයන්තො, පාණිප්‍රහාරාදියෙන් පරහට වෙහෙස දෙන්නේ ද; සමණො න හොති, ("සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති," යන ශ්‍රමණලක්ෂණ නැතිහෙයින්) මහණ නම් නො වන්නේයි.

7 අනූපවාදො (ජාත්‍යාදීන් පරහට ආක්‍රොශාදිවශයෙන් වචසින්) උපවාදයක් නො කිරීම ද, අනූපඝාතො, (පාණිප්‍රහාරාදිවශයෙන් පරහට කයින්) උපඝාතයක් නො කිරීම ද; පාතිමොක්ඛෙ, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙහි; සංවරො ච, සංවරය ද, හෙවත් රක්ෂාව ද; භත්තස්මිං, ආහාරයෙහි; මත්තඤ්ඤුතා ච, මාත්‍රඥබව ද, හෙවත්) අහරපිරියෙස්නෙහි ද පිළිගැන්මෙහි ද වැළඳීමෙහි ද පරහට දීමෙහි ද) පමණ දන්නා බව ද, නොහොත් දැහැමින් සෙමින් උපන් සතරපසය පස්විකා වළඳන බව ද; පන්තං ච සයනාසනං, ජනවිවික්ත වූ ප්‍රාන්තසයනාසනයෙහි අභිරතිය ද, හෙවත් ගමට දුරු වූ ගැඹුරුවල්හි වූ සෙනස්හි ඇල්ම ද; අධිචිත්තෙ, රූපාරූප අෂ්ටසමාපත්තියෙහි; ආයොගො ච, සතතයෙන් යෙදීම ද යන; එතං, මේ සියල්ල; බුද්ධානං, සියලු බුදුවරයන්ගේ; සාසනං, අනුශාසනයි–අවවාදයි.

8. කහාපණවස්සෙන, කාෂාපණවර්ෂයෙනු දු, හෙවත් ආකාශය බලාඅ තපොළාපුකල්හි දෙළොස් යොදනක් තන්හි හිණිමසක්පමණ වස්නා සත්රුවන් වැස්සෙනු දු, කාමෙසු, වස්තුකාමක්ලෙශකාමයෙහි; තිත්ති, තෘප්ති තොම; න විජ්ජති, නො වන්නීය; කාමා, වස්තුකාමක්ලෙශකාමයෝ; අප්පස්සාදා, (ස්වප්නයෙන් දුටු පැනක් මෙන්) ආස්වාද රහිතයහ; දුඛා, දුක්ඛක්ඛන්ධ සූත්‍රයෙහි ආ දුක්ඛයන්ගේ වසයෙන්) බොහෝ දුක් ඇත්තාහ; පණ්ඩිතො, නුවණැති මහණ තෙම; ඉති විඤ්ඤාය, කාමයෝ ආස්වාදරහිතයහ, බොහෝ දුක් ඇත්තාහයි මෙසේ දැන–

187 9. අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛයරතො හොති සම්මාසම්බුද්ධසාවකො.

188 10. බහුං වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච,
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා.

189 11. නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං,
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

190 12. යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො,
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

---

9. දිබ්බෙසු කාමෙසු අපි, මානුසකකාමයන් තබා දිව්‍යවූ පඤ්ච කාමයෙහිද; සො, ඒ නුවණැති මහණතෙම; රතිං, ඇල්මකට; නාධිගච්ඡති, නො පැමිණෙන්නේය; සම්මාසම්බුද්ධසාවකො, සම්‍යක් සම්බුද්ධයාගේ ශ්‍රාවකවූ නුවණැති මහණතෙම; තණ්හක්ඛයරතො හොති, තෘෂ්ණාවගේ ක්ෂයාන්තයෙහි උපන් හෙයින් තණ්හක්ඛය නම්වූ අර්හත් ඵලයෙහිද තෘෂ්ණාක්ෂයට නිමිත්තහෙයින් තණ්හක්ඛය නම්වූ නිර්වාණයෙහිද අභිරතවන්නේයි-ඒ පතමින් කැමති වෙමින් වසන්නේයි.

10. භයතජ්ජිතා, රාජභයාදි ඒ ඒ භයින්තැතිගත්; බහුමනුස්සා, බොහෝ මිනිස්සු; නොහොත්, භයතජ්ජිතා, රාජභයාදි ඒ ඒ භයින් තැතිගත්; මනුස්සා, මිනිස්සු; බහූ, බොහෝවූ; පබ්බතානි (ඉසිගිලි වෙපුල්ල වෙභාරාදි) පර්වතයන් ද; වනානි ච, (සුභගවන මහාවන ගොසිඞ්ගසාලවනාදි) වනයන් ද; ආරාම, වේළුවන ජීවකම්බවනාදි ආරාමයන් ද; රුක්ඛචෙත්‍යානි, උදෙනචෛත්‍ය ගොතමක චෛත්‍යාදිචෛත්‍යවෘක්ෂයන් ද; වෙ, ඒකාන්තයෙන්; සරණංයන්ති, (ඒ ඒ භයින් මිදෙනු කැමැත්තාහු ද පුත්‍රලාභාදිය පතන්නාහු ද මොහු අපට සරණහයි) සරණ යන්නාහ-සරණකොට සලකන්නාහ.

11. එතං සරණං, මෙකියනලද සියලු සරණය ම; ඛෙමං න, ක්ෂෙමනොවෙයි-නිරුපද්‍රව නිර්භය නොවෙයි; එතං සරණං, මෙකියනලද සියලු සරණය ම; න උත්තමං, (මේ නිසා එකද සතක්හු ජාතිජරා මරණින් නොමිදෙන හෙයින්) උත්තම ද නොවෙයි; එතං සරණං ආගම්ම, මෙකියනලද පර්වතාදිසරණයට පැමිණ; සබ්බදුක්ඛා, සියලු සංසාරදුක්ඛයෙන්; න මුච්චති, සත්වතෙම කිසිකලෙකත් නො මිදෙන්නේයි.

12. යොච, යම්ගෘහස්ථයෙක්වත් ප්‍රව්‍රජිතයෙක්වත්; බුද්ධංච, (සර්වධර්මයන් සර්වාකාරයෙන්මනාකොටදත්) සම්‍යක්සම්බුද්ධයාද; ධම්මංච,

13. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

14. එතං ඛො සරණං ඛෙමං එතං සරණ මුත්තමං,
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

15. දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති,
යත්ථ සො ජායති ධීරො තං කුලං සුඛමෙධති.

---

(ස්වාඛ්‍යාතතාදි ගුණොපෙතනෛර්‍ය්‍යාණික) සද්ධර්මය ද; සඞ්ඝං ච, (සුප්‍රතිපන්නතාදි ගුණගණාඪ්‍යසඞ්ගත) අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝයා ද; සරණං ගතො, සරණ ගියේ ද; හෙවත් (මේ රත්නත්‍රය මට සරණ යයි) මාර්ගගතසරණාගමන වශයෙන්) සරණ යයි දත්තේ වේ ද; චත්තාරි අරියසච්චානි, චතුරාර්‍ය්‍ය සත්‍යයන්; සම්මා, මනාකොට; පඤ්ඤාය පස්සති, විදර්ශනඥානචක්ෂුසින් දක්නේවේ ද.

13. දුක්ඛං, (ත්‍රෛභූමකවෘත්තසඞ්ඛ්‍යාත) දුඃඛසත්‍යය ද; දුක්ඛසමුප්පාදං, (ඒ දුඃඛසත්‍යය උපදවන්නා වූ තෘෂ්ණාසඞ්ඛ්‍යාත) සමුදයසත්‍යය ද; දුක්ඛස්ස, ඒ දුඃඛසත්‍යයාගේ; අතික්කමං ච, ඉක්මීමට කාරණ වූ නිර්වාණසංඛ්‍යාත නිරොධසත්‍යය ද; දුක්ඛූපසමගාමිනං, දුක්ඛනිරොධයට පමුණුවන්නා වූ; අරියං, උත්තම වූ; අට්ඨංගිකං මග්ගං ච, සම්‍යග්දෘෂ්ට්‍යාදි අෂ්ටාංගිකමාර්ගසංඛ්‍යාත මාර්ගසත්‍යය ද; මනාකොට නුවණැසින් දක්නේ වේ ද.

14. එතං ඛො සරණං, රත්නත්‍රය සරණයාමය චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනාකොට දැක්මය යන මේ සරණය; ඛෙමං, ක්ෂෙමය, (=නිර්භයය); එතං සරණං, මේ කියනලද සරණය; උත්තමං, (සර්වදුඃඛනිශ්ශරණයට කාරණහෙයින්) උත්තමය; එතං සරණං ආගම්ම, මේ සරණයට පැමිණ; සබ්බදුක්ඛා පමුච්චති, සත්වතෙම සියලු සංසාර දුක්ඛයෙන් මිදෙන්නේයි.

15. පුරිසාජඤ්ඤො, පුරුෂාජානෙය වූ හෙවත් උත්තම පුරුෂවූ සම්‍යක් සම්බුද්ධතෙම; දුල්ලභො, දුර්ලභය; (හස්ත්‍යාජානෙයාදීන් මෙන් සුලභ නොවන්නේය); සො, ඒ පුරුෂාජානෙය වූ සම්‍යක් සම්බුද්ධතෙම; සබ්බත්ථ න ජායති, (ප්‍රත්‍යන්තදෙශයෙහි ද නීචකුලයෙහි ද නූපදනා හෙයින්) හැමතැන්හි ම උපදනේ නොවෙයි; (මධ්‍යදෙශයෙහි ම උපදනේය, එහිදු මහජනයා විසින් වැන්ද හිදියයුතු වූ ලොකසම්මත වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ කුලයෙහි ම උපදනේය, එසේ උපදනා වූ ද) සො ධීරො, ඒ ප්‍රාඥවූ සම්‍යක්සම්බුද්ධ තෙම; යත්ථ ජායති, යම් ක්ෂත්‍රිය බ්‍රාහ්මණ කුලයෙක උපදනේ වේ ද; තං කුලං, ඒ කුලය; සුඛං එධති, සුවයට පැමිණෙන්නේයි–සැපතින් වැඩෙන්නේයි.

194 16. සුඛො බුද්ධානං උප්පාදෙ සුඛා සද්ධම්මදෙසනා,
සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානං තපො සුඛො.

195 17. පූජාරහෙ පූජයතො බුද්ධෙ යදිව සාවකෙ,
පපඤ්චසමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ.

196 18. තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ,
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉමෙත්තමපි කෙනචි.

බුද්ධවග්ගො චුද්දසමො.

පඨමභාණවාරං.

---

16. බුද්ධානං, සම්‍යක්සම්බුද්ධවරයන්ගේ; උප්පාදෙ, ඉපැද්ම; සුඛො, සුවය, (යම්හෙයකින් බුදුවරයෝ ලොකයෙහි උපදනාහු සත්‍වයන් ජාතිකාන්තාරාදියෙන් එතරකොට නිවන්පුරයෙහි පිහිටුවද්ද එහෙයින් ඔවුන්ගේ ලොකයෙහි ඉපැද්ම ලොවීලොවුතුරු සුවයට කාරණහෙයින් සුවය); සද්ධම්මදෙසනා, සද්ධර්මදෙශනාවද; සුඛා, සුවය; (යම්හෙයකින් සද්ධර්මශ්‍රවණයට පැමිණි සත්‍වයෝ ජාතිජරාමරණින් මිදෙද්ද එහෙයින් සද්ධර්මදෙශනාව ද සුවයට කාරණහෙයින් සුවය); සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; සාමග්ගී, සමඟබැව් වූ එක්සිත්බැව්; සුඛා, සුවය; (යම්හෙයකින් සඞ්ඝයාගේ සමඟබව සියලු දෙව්මිනිසුන්ට හිත පිණිස සුව පිණිස වැටේද් එහෙයින් සඞ්ඝයාගේ සාමග්‍රිය සුවය); සමග්ගානං, සමඟ වූ භික්ෂූන්ගේ; තපො, තපසද; සුඛො, සුවයි; (යම්හෙයකින් භික්ෂූන්ගේ සමඟබව බුද්ධවචනය උගන්නට ද ධූතඞ්ගපරිහරණය කරන්නට ද මහණදම් කරන්නට ද පිළිවන් ද එහෙයින් සුවයයි සේයි)

17. පූජාරහෙ, පූජාර්හවූ, හෙවත් ප්‍රත්‍යයපූජාවටද ප්‍රතිපත්තිපූජාවටද සුදුසුවූ; පපඤ්චසමතික්කන්තෙ, තෘෂ්ණාප්‍රපඤ්චය දෘෂ්ටිප්‍රපඤ්චය මානප්‍රපඤ්චය යන ත්‍රිවිධප්‍රපඤ්චයන් මනාකොට ඉක්මුනාවූ; තිණ්ණ සොකපරිද්දවෙ, ඉක්මුනාවූ සොකපරිද්දව ඇති, හෙවත් ශොක පරිදෙවදුඃඛයෙන් එතරව ගියාවූ; බුද්ධෙ, බුදු–පසේබුදුන්ද, යදි වා, නොහොත්; සාවකෙ, බුදුසව්වන්ද; පූජයතො, වන්දනමානනාදියෙන් ද චතුර්විධප්‍රත්‍යයෙන් ද යමෙක් පුදා ද–

18. නිබ්බුතෙ, රාගාදි කෙලෙස්ගිනි නිවීමෙන් නිවිසිත් ඇති; අකුතොභයෙ, කිසි භයකින්වත් අරමුණකින්වත් භය නැත්තාවූ; තාදිසෙ, එබඳුවූ; හෙවත් මෙකියනලද ගුණෙන් යුක්තවූ; තෙ, ඒ බුදු-පසේබුදු-සව්වන්; පූජයතො, ධ්‍රියමානකල්හි ද පිරිනිවිකල්හි ද

197 1. සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො,
වෙරිනෙසු මනුස්සෙසු විහරාම අවෙරිනො.

198 2. සුසුඛං වත ජීවාම ආතුරෙසු අනාතුරා,
ආතුරෙසු මනුස්සෙසු විහරාම අනාතුරා.

199 3. සුසුඛං වත ජීවාම උස්සුකෙසු අනුස්සුකා,
උස්සුකෙසු මනුස්සෙසු විහරාම අනුස්සුකා.

---

පුදන්නහුගේ; පුඤ්ඤං, පින්කම්; ඉමං එත්තං ඉති, මේ මෙතෙ-කැයි; සඞ්ඛාතුං, ගණින්නට නෙවත් බුඩාදීන් පුදන්නහුගේ කුසල-විපාකය ගණන්නට වත් කිරන්නට වත් මනන්නට වත්; කෙනචි අපි, දිව්‍යබ්‍රහ්මාදී කිසිපුද්ගලයෙකු විසිනු දු; න සක්කා, නොපිළිවනි.

බුඩවග්ගො චුද්දසමො.

පඨමභාණවාරං.

---

1. වෙරිනෙසු මනුස්සෙසු, ප්‍රාණවධාදි පචවිධවෛරයෙන් වෛරිවූ මනුෂ්‍යයන් අතුරෙහි; අවෙරිනො, දුශ්චරිතවෛරයෙන් අවෛරීවූ අපි; මනුස්සෙසු, මනුෂ්‍යයන්; වෙරිනෙසු, පචවිධදුශ්ච-රිත වෛරයෙන් වෛරිව පවත්නාකල්හි; අවෙරිනො විහරාම, දුශ්චරිත වෛරයෙන් අවෛරීව වසමෝ ද; (එසේවූ අපි) වත, එකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත්වමු.)

2. ආතුරෙසු මනුස්සෙසු, කෙලශව්‍යාධියෙන් ආතුරවූ මනුෂ්‍ය-යන් අතුරෙහි; අනාතුරා, කෙලශව්‍යාධියෙන් ආතුරනොව පවත්-නාවූ අපි; මනුස්සෙසු, මනුෂ්‍යයන්; ආතුරෙසු, කෙලශව්‍යාධියෙන් ආතුරව පවත්නා කල්හි; අනාතුරා විහරාම, කෙලශව්‍යාධි-යෙන් ආතුරනොව වසමෝ ද; (එසේවූඅපි), වත, එකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත්වමු;

3. උස්සුකෙසු මනුස්සෙසු, පඤ්චකාමගුණ පරියෙසනයෙහි උත්සාහවත්වූ මනුෂ්‍යයන් අතුරෙහි; අනුස්සුකා, පඤ්චකාමගුණ පරියෙසනයෙහි නිරුත්සාහවූ අපි; මනුස්සෙසු, මනුෂ්‍යයන්; උස්සු කෙසු, පඤ්චකාමගුණපරියෙසනයෙහි උත්සාහවත්ව පවත්නා කල්හිද; අනුස්සුකා විහරාම, පඤ්චකාමගුණ පරියෙසනයෙහි නිරුත්සාහව වසමෝද; (එසේවූඅපි) වත, එකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත්වමු;

200 4. සුසුඛං වත ජීවාම යෙසංනො නත්ථි කිඤ්චනං,
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා.

201 5. ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතො,
උපසන්තො සුඛං සෙති හිත්වා ජයපරාජයං.

202 6. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි,
නත්ථි ඛන්ධාදිසා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛං.

---

4. යෙසං නො, යම් බඳු වූ අපට; කිඤ්චනං නත්ථි, සත්වයන් මඩනා අර්ථයෙන් කිඤ්චන නම්වූ රාගාදි කිසි පළිබෝධයක් නැද්ද, එසේ වූ අපි; වත, ඒකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත්වමු; ආභස්සරා දෙවා යථා, ආභස්සර බ්‍රහ්මයන් මෙන්; පීති–භක්ඛා භවිස්සාම, ප්‍රීතිය ම ආහාර කොට ඇත්තමෝ වමු—ප්‍රීතිය ම අනුභවකොට වසම්හයි සේයි-

5. ජයං, මෙරමා දිනන්නේ, හෙවත් (දූ කෙළීමෙන් සටන්කිරීමෙන් යුක්ති බිණීම් ආදියෙන්) අනුන් පරදවන්නේ; වෙරං පසවති, වෛර උපදවයි–වෛරීන් ඇති කෙරෙයි; පරාජිතො, අනුන් විසින් පරදවනලද්දේ; දුක්ඛං සෙති, (කවර දවසෙක සතුරා පිටි දකිම්දෝහෝයි සිතන්නේ සතරඉරියව්වෙහි ම ) දුකසේ වසන්නේය. උපසන්තො, සන්හුන් රාගාදිකෙලෙශයන් ඇති ක්ෂීණාශ්‍රව තෙම; ජයපරාජයං හිත්වා, ජයපරාජය දෙකම හැර; සුඛං සෙති, සතර ඉරියව්වෙහි ම සුවසේ වසන්නේයි.

6. රාගසමො අග්ගි, රාගය හා සමවූ ගින්නෙක්; නත්ථි, නැති; (දුමක් වත් ගිනිසිළක් වත් සාරහුලක් වත් නොදක්වා ඇතුළත්හි ම සිට සතුන් දවා භස්ම කරන්නට සමර්ථවූ අනික් ගින්නක් නැතිහෙයින් රාග ගින්න හා සමවූ අනික් ගින්නෙක් නැති) දොසසමො කලි, වෛෂය හා සම වූ අපරාධයෙක්; නත්ථි, (වෛෂ–යාගේ අනිවරණාවස්ථාවක් නැති හෙයින් සියුම් ව උපන් වෛෂය නිසා ද ධ්‍යානාභිඥාවන් පිරිහෙනහෙයින්) වෛෂය හා සම වූ අනික් අපරාධයෙක් නැති; ඛන්ධාදිසා දුක්ඛා, පඤ්චස්කන්ධයන් හා සම වූ දුක්ඛකෙනෙක්; නත්ථි, නැති; (පරිහරණය කරණලද්දා වූ ස්කන්ධයෝ යම්සේ දුක්හු ද එසේ වූ අනික් දුක්ඛ කෙනෙකු නැති) සන්තිපරං සුඛං, නිර්වාණයට වැඩි අනික් සුවයෙක් නම්; නත්ථි, නැති—සෙසු සුව සුවනම් ම වෙයි, පරම සුව නම් නො වෙයි; නිර්වාණයවූ කලි සියලු සුවයට වඩා උත්තම සුවයක් හෙයින් පරම සුවනම් වෙයි සේයි.

7\. ජිඝච්ඡාපරමා රෝගා සඞ්ඛාරපරමා දුඛා,
ඒතං ඤත්වා යථාභූතං නිබ්බාණං පරමං සුඛං.

8\. ආරෝග්‍යපරමා ලාභා සන්තුට්ඨීපරමං ධනං,
විස්සාසපරමා ඤාති නිබ්බාණං පරමං සුඛං.

9\. පවිවේකරසං පීත්වා රසං උපසමස්ස ච(1)
නිද්දරෝ හෝති නිප්පාපෝ ධම්මපීතිරසං පිබං-(2).

---

7\. රෝගා, අටඅනූවක් පමණ වූ සියලු රෝගයෝ; ජිඝච්ඡාපරමා; ජිඝච්ඡාව උතුම් කොට ඇත්තාහ; (සෙසු රෝගයෝ තාක් එකවරක පිළියම් කළ කල නස්නාහු හෝ වෙති, යැපි යන්නාහු හෝ වෙති, සාදුක් නැමැති රෝගය වූ කලී සතතයෙන් ම පිළියම් කටයුතු බැවින් ම සෙසු රෝගයන්ට වඩා උත්තම රෝගනම් වෙයි) දුඛා, සියලු කායිකචෛතසිකදුඃඛයෝ තාක්; සඞ්ඛාරපරමා,පඤ්චස්කන්ධයන් ප්‍රධාන කොට ඇත්තාහ;ඒතං,(සාදුක් හා සම වූ රෝගයෙක් නැත, ස්කන්ධපරිහරණය හා සම වූ අනික් දුකෙක් නැත යන) මේ දෙක; යථාභූතං ඤත්වා, වූ පරිද්දෙන් දැන, (ප්‍රාඥයෝ නිවන් පසක් කෙරෙති, එහෙයින්); නිබ්බාණං, නිර්වාණයතෙම; පරමං සුඛං, ස්කන්ධපරිහරණයයි කියනලද දුක් නැතිහෙයින් උත්තම වූ සුවයෙකි.

8\. ලාභා, සියලු ලාභයෝ තාක්; ආරෝග්‍යපරමා, නිරෝගි බව ප්‍රධාන කොට ඇත්තාහ; (රෝගීහු ලද ලාභයෝ ලාභනම් නොවෙත්නුයි නිරෝගි බව උත්තම ලාභ නම් වෙයි) ධනං, ධනය තෙම; සන්තුට්ඨී පරමං, සන්තුෂ්ටිය ප්‍රධාන කොට ඇත්තේය; (යම් ධනයෙක් තමා විසින් ලබනලද ද,යම් ධනයෙක් තමා සතුද, එයින් ම සතුටුවන බව සෙසු ධනයට වඩා උතුම් ධනයෙක)ඤාතී, නෑයෝ නම්; විස්සාසපරමා, විශ්වාසය ප්‍රධාන කොට ඇත්තාහ; (මව්පියෝ ද යමෙකු හා විශ්වාස නැත්නම් හෙතෙම නො නෑමය, යමෙක් වනාහි නො නෑවූ වද විශ්වාස වී නම් හේ උතුම් නෑය) නිබ්බාණං, නිර්වාණය; පරමං සුඛං, උතුම් වූ සුවයෙකි (යම්හෙයකින් නිවන් හා සම වූ සුවයෙක් නැද්ද එහෙයින් නිර්වාණය උතුම් සුවයෙකි).

9\. පවිවේකරසං, කායචිත්තවිවේකයෙන් උපන් සුඛසෞමනස්සයයි කියනලද රසය ද; උපසමස්ස ච රසං, ක්ලේශව්‍යුපශමයයි කියනලද නිර්වාණයාගේ රසය ද, පීත්වා, බී, (දුඃඛසත්‍යය පරිජානනාදීන් කෙරෙමින් ආලම්බනකරණයෙන් ද ප්‍රත්‍යක්ෂක-

---

1 උපසමෙස්ස ච.  2 පිපං.

206 10. සාහු දස්සනමරියානං සන්නිවාසො සදා සුඛො,
අදස්සනෙන බාලානං නිච්චමෙව සුඛී සියා.

207 11. බාලසඞ්ගතචාරී හි දීඝමද්ධාන සොචති,
දුක්ඛො බාලෙහි සංවාසො අමිත්තෙනෙව සබ්බදා,
ධීරෙ ච සුඛසංවාසො ඤාතීනං 'ව සමාගමො.

208 12. තස්මා හි, ධීරඤ්ච පඤ්ඤඤ්ච බහුස්සුතඤ්ච
ධොරය්හසීලං වතවන්තමාරියං,
තං තාදිසං සප්පුරිසං සුමෙධං
භජේථ නක්ඛත්තපථං 'ව චන්දිමා.

සුඛවග්ගො පණ්ණරසමො.

---

රණයෙන් ද) අනුභව කොට; ධම්මපීතිරසං පිබං, නවලොකොත්තර ධර්මවශයෙන් උපන් ප්‍රීතිරසය බොන්නාවූ ක්ෂීණාශ්‍රව මහණ තෙම; නිද්දරො හොති, (මේ උභයරසපානයෙන් රාගදරථාදීන් නැති හෙයින්) පීඩා රහිත ද වන්නේය; නිප්පාපො හොති, නිෂ්පාප ද වන්නේයි.

10. අරියානං, බුඬාදි ආර්‍ය්‍යයන්ගේ; දස්සනං, දැක් ම; සාධු, මැනවි, (බුදු–පසේබුදු–සඞ්ඝ යන සත්පුරුෂයන් මසැසින් දැක්ම ද නුවනැසින් දැක්ම ද යහපත, හුදෙක් දර්ශණය මතු නොවෙයි) සන්නිවාසො, ඔහුන් හා සමග එකතැන විසීම ද (ඔවුන් වැඳපුදා ගැන්ම ද වතාවත් කොට ගැන්ම ද); සදා, හැමකල්හි ම; සුඛො, සුවය; බාලානං, මෙලෝපරලෝ වැඩ නොදන්නා වූ අඥනයන්ගේ; අදස්සනෙන, නො දැක්ම හෙතු කොට ගෙණ; නිච්චං එව, සතතයෙන් ම; සුඛී සියා, සත්‍වතෙම සුඛිතවන්නේය.

11. හි, එසේමැයි; බාලසංගතචාරී, බාලයන් හා එක්ව ඇවිදිනා සුලු වූයේ; දීඝං අඬානං, දීර්ඝකාලයක්; සොචති, සොක කරන්නේයි, (බාලයා හා යහලු වූයේ උමං බිඳිනට වර, මං පහරනට වර යනාදීන් ඒ ඒ නොකටයුත්තෙහි යොදනලද්දුව ඔහු හා සමග ඒ ඒ වරදකරන්නේ මෙලොව අත් පා කැපීම් ආදියට ද පරලොව නරකදුක් ආදියට ද පැමිණ බොහෝ කලක් සොස්නේයි) බාලෙහි සංවාසො, බාලයන් හා එක්ව විසීම; අමිත්තෙන ඉව (කඩුගත් අත්ඇති) පසමිතුරෙකු සමග වාසයක් මෙන්; සබ්බදා, හැමකල්හි ම; දුක්ඛො, දුක; ධීරො ච, ප්‍රාඥ වනාහි; ඤාතීනං සමාගමො ඉව, ප්‍රිය වූ නෑයන්ගේ සමාගමයක් මෙන්; සුඛසංවාසො, සුව වූ සහවාසය ඇත්තේය.

12. තස්මා හි එහෙයින්,(හෙවත් යම්හෙයකින් නුවනනැත්තවුන් හා සහවාසය දුක්ද නුවනැත්තන් හා සහවාසය සුවද එහෙයින්)

**1. අයොගෙ යුඤ්ජමත්තානං යොගස්මිං ච අයොජයං,
අත්ථං හිත්වා පියග්ගාහී පිහෙතත්තානුයොගිනං.**

**2. මා පියෙහි සමාගඤ්ජී අප්පියෙහි කුදාචනං,
පියානං අදස්සනං දුක්ඛං අප්පියානඤ්ච දස්සනං.**

---

ධීරඤ්ච, ධෘතිසම්පන්නවූ ධීරයා ද; පඤ්ඤඤ්ච, ලෞකික ලොකොත්තර ප්‍රඥාවෙන් යුක්ත වූ ප්‍රාඥයා ද; බහුස්සුතඤ්ච, ආගමාධිගම සම්පන්නවූ බහුශ්‍රැතයා ද; ධොරය්හසීලං, රහත්පලයට පමුණුවන ප්‍රතිපත්තිධුරය උසුලන සුලු බැවින් ධුරවහන සීලයා ද; වතවන්තං, (ශීලව්‍රතයෙන් ද ධුතාඞ්ගව්‍රතයෙන් ද යුක්ත වූ) ව්‍රතසම්පන්නයා ද; ආරියං, කෙලෙසුන් කෙරෙන් දුරුවූ ආය්‍ය්‍යියා ද යන; සුමෙධං, සුන්දර වූ ප්‍රඥා ඇති; තාදිසං, එබඳු වූ; තං සප්පුරිසං, ඒ සත්පුරුෂයා; නක්ඛත්තපථං චන්දිමා ඉව, නිර්මල වූ ආකාශපථය සෙවුනා වූ චන්ද්‍රයා මෙන්; භජෙථ, සෙවුනේයි.

සුඛවග්ගො පණ්ණරසමො.

---

1. අත්තානං, තමා; අයොගෙ, නො යෙදියයුතු වූ (වෙසියගොචරාදි ෂඩ්විධ අගොචරසෙවනයයි කියනලද) අයොනිශොමනස්කාරයෙහි; යුඤ්ජං, යෙදෙන්නා වූ ද; යොගස්මිං (කියනලද) යොනිශොමනස්කාරයෙහි; අයොජයං ච, නො යෙදෙන්නා වූද පුද්ගල තෙම; අත්ථං හිත්වා, (පැවිදිවූ තැන පටන් හික්මියයුතු වූ අධිශීලාදිශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත) අර්ථය හැරපියා; පියග්ගාහී; පඤ්චකාමගුණයයි කියනලද ප්‍රියයම ගන්නා සුලු වූයේ; අත්තානුයොගිනං, ආත්මාර්ථයෙහි යෙදුනහු; පිහෙති, පතන්නේය—තමාගේ විප්‍රතිපත්තිය හෙතු කොට ශෙණ ශාසනයෙන් චුත ව ගිහිභාවයට පැමිණියේ පසු ව යම් කෙනෙක් ආත්මාර්ථයෙහි යෙදී ශීලාදි ගුණසම්පාදනය කොට දෙවිමිනිසුන්ගෙන් පූජාසත්කාර ලබද්ද ඔවුන් දැක මමත් මෙබඳු වීම් නම් යෙහෙකැයි මෙසේ ඔවුන් පතන්නේයි—කැමතිවන්නේයයි සේයි.

2. පියෙහි, ප්‍රිය වූ පුත්‍ර-දාර-දාසි-දාස-ගව-මහිසාදිසත්ත්වයන් හා ද ස්වර්ණ-රජත-මණි-මුක්තාදිසංස්කාරයන් හා ද; අප්පියෙහි, අප්‍රියන් හා ද; කුදාචනං, කිසිකලෙක්හි දු, හෙවත් එකවරෙකද, මා සමාගඤ්ජි, තෘෂ්ණාසංස්තව වශයෙන් සමාගමය නො කරන්නේයි; (කුමක් පිණිසදයත්) පියානං, ප්‍රිය වූ සත්ත්වයන්ගේ ද සංස්කාරයන්ගේ ද; අදස්සනං, වියොගවශයෙන් නො දැක්ම; දුක්ඛං, දුක; අප්පියානං, අප්‍රිය වූ සත්ත්වයන්ගේ ද සංස්කාරයන්ගේ ද; දස්සනං, සමීපයට එලඹීම් වසයෙන් දැක්ම ද; දුක්ඛං, දුකි.

211 3. තස්මා පියං න කයිරාථ පියාපායො හි පාපකො,
ගන්ථා තෙසං න විජ්ජන්ති යෙසං නත්ථි පියාප්පියං.

212 4. පියතො ජායතී සොකො පියතො ජායතී භයං,
පියතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

213 5. පෙමතො ජායතී සොකො පෙමතො ජායතී භයං,
පෙමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

---

3. තස්මා, එහෙයින්, (යම් හෙයකින් ප්‍රියයන්ගේ නොදක්මද අප්‍රියන්ගේ දක්ම ද යන මේ දෙක ම දුක ද එහෙයින්); පියං න කයිරාථ, කිසි සත්ත්වයෙක් වත් සංස්කාරයක් වත් ප්‍රිය නොකරන්නේයි; හි, එසේමැයි; පියාපායො, ප්‍රියවූ සත්ත්වයන්ගේ ද සංස්කාරයන්ගේ ද වියොගය; පාපකො, ලාමකයි; යෙසං, යම් ක්ෂීණාශ්‍රවකෙනෙකුන්ට; පියාප්පියං නත්ථි, ප්‍රියවස්තුවෙකු දු අප්‍රියවස්තුවෙකු දු නැද්ද; තෙසං, ඔවුන්ට; ගන්ථා නවිජ්ජන්ති, අභිධ්‍යාකායග්‍රන්ථාදිචතුර්විධ කායග්‍රන්ථයෝ ද නැත්තාහුයි–ඔවුන්ගේ සන්තානයෙහි නොපවත්තාහුයි.— යම් කෙනෙකුන්ට ප්‍රිය වස්තුවෙක් නැද්ද ඔවුන්ටඅභිධ්‍යාකායග්‍රන්ථය ප්‍රහීණ වෙයි, යම්කෙනෙකුන්ට අප්‍රියවස්තුවෙක් නැද්ද ඔවුන්ට ව්‍යාපාදකායග්‍රන්ථය ප්‍රහීණ වෙයි, ඔවුන් දෙදෙන ප්‍රහීනවූ කල්හි ඉතිරි දෙදෙන ම ප්‍රහීණම්වෙති, එහෙයින් කිසි වස්තුවක් තමහට ප්‍රියද අප්‍රියද නොකටයුතුය යනු භාවයි.

4. සොකො, (සංසාරවට්ටය මුල් කොට ඇති) යම්කිසි සොකයෙක් උපදනේ වේ ද හෙතෙම; පියතො ජායති, ප්‍රියවූ ම සත්ත්වයෙක් වත් සංස්කාරයක් වත් නිසා උපදනේය; භයං, (එසේ ම සංසාරවට්ටය මූල්කොට ඇති) යම්කිසි භයෙක් උපදනේ ද හෙතෙම; පියතො ජායති, ප්‍රිය වූ සත්ත්වයෙක් වත් සංස්කාරයක් වත් නිසා උපදනේය, එහෙයින්; පියතො විප්පමුත්තස්ස, ප්‍රිය වස්තුවෙන් මුක්ත වූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, කිසි සොකයෙක් නැත; භයං, භයතෙම; කුතො, කොයින් ම වේ ද.— ප්‍රියවස්තූන් නිසා උපදනා භයෙක් කැලම නැතැයි සේයි.

5. සොකො, (සංසාරවට්ටය මූල් කොට ඇති) යම් කිසි සොකයෙක් උපදනේ වේ ද හෙතෙම; පෙමතො ජායති, (පුත්‍රදාරාදීන් කෙරෙහි කළ) ප්‍රේමය නිසා ම උපදනේය; භයං, (එසේම සංසාර වට්ටය මූල්කොට ඇති යම්කිසි) භයෙක් උපදනේ වේද, හෙතෙම; පෙමතො ජායති, (පුත්‍රදාරාදීන් කෙරෙහි කළ) ප්‍රේමය නිසාම උපදනේය, එහෙයින්; පෙමතො විප්පමුත්තස්ස, (පුත්‍රදාරාදීන් කෙරෙහි කළ) ප්‍රේමයෙන් මුක්ත වූ, සිත් ඇත්තාහට; සොකො නත්ථි, කිසි සොකයෙක් නැත; භයං, භයතෙම; කුතො, කොයින් ම වේ ද.— ප්‍රේමය නිසා උපදනා භයෙක් කැලම නැතැයි සේයි.

6. රතියා ජායති සොකො රතියා ජායති භයං,
රතියා විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

7. කාමතො ජායති සොකො කාමතො ජායති භයං,
කාමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං,

8. තණ්හාය ජායති සොකො තණ්හාය ජායති භයං,
තණ්හාය විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

---

6. සොකො, (සංසාරවට්ටය මුල්කොට ඇති) යම් කිසි සොකයෙක් උපදනේ වේ ද හෙතෙම; රතියා ජායති, පඤ්චකාමගුණරතිය නිසා උපදනේය; භයං, (එසේ ම සංසාරවට්ටය මුල්කොට ඇති) යම්කිසි භයෙක් උපදනේ වේ ද හෙතෙම; රතියා ජායති, පඤ්චකාම ගුණරතිය නිසා උපදනේය, එහෙයින්; රතියා විප්පමුත්තස්ස, පඤ්චකාමගුණරතියෙන් මුක්ත වූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, කිසි සොකයෙක් නැත; භයං, භය තෙම; කුතො, කොයින් ම වේ ද—(පඤ්චකාම ගුණ රතිය නිසා උපදනා භයෙක් තෙම කැලම නැතැයි සේයි.

7. සොකො,(සංසාරවට්ටය මුල් කොට ඇති) යම් කිසි සොකයෙක් උපදනේ වේ ද හෙතෙම; කාමතො ජායති, වස්තුකාමකෙලශකාම යන විප්‍රකාර වූ කාමයන් නිසා ම උපදනේය; භයං, (එසේම සංසාරවට්ටය මුල්කොට ඇති)යම් කිසි භයෙක් උපදනේ වේ ද හෙතෙම; කාමතො ජායති, වස්තුකාම කෙලශකාම යන විප්‍රකාරවූ කාමයන් නිසා ම උපදනේය, එහෙයින්; කාමතො විප්පමුත්තස්ස, වස්තුකාමකෙලශ කාමයෙන් මුක්තවූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, යම්කිසි සොකයෙක් නැත;භයං, භය තෙම; කුතො, කොයින්ම වේ ද—වස්තුකාමකෙලශකාමය නිසා උපදනා භයෙක් කැලම නැතැයි සේයි.

8. සොකො, (සංසාරවට්ටය මුල්කොට ඇති) යම් කිසි සොකයෙක් උපදනේ වේ ද හෙතෙම; තණ්හාය ජායති, සදෙර උපදනා කාමතෘෂ්ණාව නිසා ම උපදනේය; භයං,(එසේ ම සංසාරවට්ටය මුල් කොට ඇති) යම් කිසි භයෙක් උපදනේ වේ ද හෙතෙම; තණ්හාය ජායති, සදෙර උපදනා කාමතෘෂ්ණාව නිසා ම උපදනේය, එහෙයින්; තණ්හාය විප්පමුත්තස්ස, තෘෂ්ණාවෙන් මුක්ත වූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, සොකයෙන් නැත; භයං, භය තෙම; කුතො, කොයින් ම වේද—කාමතෘෂ්ණාව නිසා උපදනා භයෙක් කැලම නැතැයි සේයි.

217 **9. සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවාදිනං,**
**අත්තනො කම්මකුබ්බානං තං ජනො කුරුතෙ පියං.**

218 **10. ඡන්දජාතො අනක්ඛාතෙ මනසා ච ඵුටො සියා,**
**කාමේසු ච අප්පටිබද්ධචිත්තො උද්ධංසොතොති වුච්චති.**

219 **11. චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං,**
**ඤාති මිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං.**

---

9. සීලදස්සන සම්පන්නං, චතුපාරිසුද්ධිසීලයෙන් ද මාර්ගඵල සම්ප්‍රයුක්ත වූ සම්‍යග්දෘෂ්ටියෙන් ද යුක්තවූ; ධම්මට්ඨං, නවලොකොත්තර ධර්මයෙහි පිහිටියා වූ, හෙවත් පසක් කරණලද නවලොවුතුරු දහම් ඇති; සච්චවාදිනං, (චතුරාර්‍ය්‍යසත්‍යයන් පරිඥෙයප්‍රහාණාදි සොළොස් ආකාරයෙන් පසක් කළ හෙයින්) සත්‍යඥානයෙන් සත්‍යවාදී වූ; අත්තනො කම්මං කුබ්බානං, (ත්‍රිවිධ වූ ශික්ෂාපූරණයයි කියනලද) තමාගේ කාර්‍ය්‍ය කරන්නා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවපුද්ගලයා; ජනො, ලෞකිකමහාජන තෙම; පියං කුරුතෙ, ප්‍රිය කරන්නේයි–ඔහු දක්නා වඳනා කැමැති වන්නේයි, චතුර්විධ ප්‍රත්‍යය පූජාවෙන් පූජකරණු කැමති වන්නේයි.

10 අනක්ඛාතෙ, නිර්වාණයෙහි, හෙවත් අසවල්හු විසින් කරණලදූයි කියා වත් නීලය පීතය දීර්ඝය හ්‍රස්වය වෘත්තය චතුරශ්‍රයයි කියා වත් නොකියනලද හෙයින් අනක්ඛාතනම් වූ නිර්වාණයෙහි; ඡන්දජාතො, යම් මහණෙක් කර්තෘකාම්‍යතාවසයෙන් උපන් ඡන්දය ඇත්තේ ද, හෙවත් නිවන් පසක්කිරීමෙහි බලවත් උත්සාහයට පැමිණියේ වේ ද; මනසා ච ඵුටො සියා, යට තුන්මග තුන්පලසිතින් පිරුණේත් වේ ද; කාමෙසු ච අප්පටිබද්ධචිත්තො, අනාගාමි මාර්ගයාගේ වශයෙන් රූපාදිපඤ්චකාමයෙහි ද නො ඇලුනු සිත් ඇත්තේ වේ ද; උද්ධං සොතොති වුච්චති,(මෙසේ වූ මහණ තෙම අවිහයෙහි ඉපද එතැන්පටන් ප්‍රතිසන්ධිවශයෙන් අකණිෂ්ඨබ්‍රහ්මලොකයට යන්නේ උඩුබලා පැවැති ප්‍රතිසන්ධිශ්‍රොතස් ඇති හෙයින්) උද්ධංසොතයයි කියනුලැබේ.

11. චිරප්පවාසිං පුරිසං,බොහෝකලක් විදෙශයට ගියා වූ පුරුෂයකු; දූරතො, දුරුරටකින්; සොත්ථිං ආගතං, (වෙළඳාම් හෝ රාජසෙවය හෝ කොට ලබනලද ලාභ ඇති ව සමෘද්ධ වූ කාර්‍ය්‍ය ඇතිව නිරුපද්‍රව ව) සුවසේ ආවහු දැක; ඤාති, නෑයෝ ද; මිත්තා,

12. තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතිංව ආගතං'ති.

## පියවග්ගො සොළසමො.

221 1. කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා.

---

දුටු අඳුනන මිත්‍රයෝ ද; සුහජ්ජා ච, ල ඇති යහලුවෝ ද; ආගතං, ඔහුගේ ඊමට; අභිනන්දන්ති, යම්සේ සතුටුවේද්ද, හෙවත් ආබව යහපත යනාදී වූ ප්‍රියවචනයෙන් ද සිපගැන්මෙන් ද දෑහොත් නගා වැඳීමෙන් ද නොයෙක් පඬුරු එලවීමෙන් ද යම්සේ සාදර කෙරෙද්ද.

12. තථා එව, එපරිද්දෙන් ම; කතපුඤ්ඤම්පි, දානසීලාදිවස-යෙන් කරණලද පින්කම් ඇති පුරුෂයා ද; අස්මා ලොකා, මෙලොවින් මිය; පරං ගතං, පරලොවට ගියහු; පුඤ්ඤානි, මව්පිය තන්හි සිටියා වූ ඔහු විසින් කරණලද කුසලයෝ; ආගතං පියං, දුරසිට ආ ප්‍රිය නෑයක්හු පිළිගන්නා වූ; ඤාතී ඉව, සෙසුනෑයන් මෙන්; පතිගණ්හන්ති, (දිව්‍ය වූ ආයු-වර්ණ-සුඛ-යශ-ආධිපත්‍යය, දිව්‍ය වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පෘෂ්ටව්‍ය යන මේ දසවැදෑරුම් වූ පඬුරු ගෙණ අවුත්) පිළිගන්නාහුයි.

## පියවග්ගො සොළසමො.

---

1. කොධං, (යම්කිසි ක්‍රොධකාරණයෙකින් උපන් සර්වප්‍රකාර වූ ම) ක්‍රොධය; ජහෙ, දුරු කරන්නේය; මානං, නවවිධ වූ ම මානය; විප්පජහෙය්‍ය, විශෙෂයෙන් ම පහ කරන්නේය; සබ්බං සඤ්ඤොජනං, කාමරාග සංයොජනාදි සියලු දසවිධ සංයොජ-නය; අතික්කමෙය්‍ය, ඉක්මෙන්නේය; නාමරූපස්මිං, නාමරූප දෙක්හි; අසජ්ජමානං, (මාගේ රූපය මාගේ වෙදනාය යනාදීන්) ඇලුම් නොකරන්නාවූ; අකිඤ්චනං, රාගාදි කෙලෙසුන් නැති හෙයින් අකිඤ්චන වූ; තං, ඒ පුද්ගලයා; දුක්ඛා, කායික චෛත-සික දුඃඛයෝ; නානුපතන්ති, අනුව නොපවත්නාහුයි.

222 **2. යො වෙ උප්පතිතං කොධං රථං භන්තං'ව ධාරයෙ,**
**තමහං සාරථිං බ්‍රූමි රස්මිග්ගාහො ඉතරො ජනො.**

223 **3. අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ,**
**ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං.**

224 **4. සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය දජ්ජාප්පස්මිම්පි යාචිතො,**
**එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවාන සන්තිකෙ.**

---

2. යො, යම්පුද්ගලයෙක් තෙම; වෙ, එකාන්තයෙන්; උප්පතිතං කොධං (යම් කිසි ක්‍රොධකාරණයෙකින්) උපන්නාවූ ක්‍රොධය; භන්තං රථං ඉව, භ්‍රාන්තවූ රථයක් මෙන්, හෙවත් අතිවෙගයෙන් දුවන්නා වූ රථයක් වළකා තමා කැමැති තැනකට මෙහෙයන දක්‍ෂ වූ රථාචාර්‍ය්‍යයෙකු මෙන්; ධාරයෙ, නිගණී ද, (=වළකාද); තං, ඒ පුද්ගලයා; අහං, මම; සාරථිං බ්‍රූමි, රථාචාර්‍ය්‍ය යයි කියමි; ඉතරො ජනො, (රජ යුවරජ ආදීන්ගේ) අන්‍ය වූ සාරථිජන තෙම; රස්මිග්ගාහො, රස්මිග්‍රාහක නම් වෙයි, හෙවත් රැහැණ ගන්නා නම් වෙයි— උත්තම රථාචාර්‍ය්‍ය නම් නො වෙයි සේයි.

3. කොධං, ක්‍රොධී පුද්ගලයා; අක්කොධෙන, ක්‍රොධ නො කිරීමෙන්; ජිනෙ, දිනන්නේය; අසාධුං, අසාධු පුද්ගලයා හෙවත් ගුණනුපුරු තැනැත්තහු; සාධුනා, සාධුගුණයෙන්; ජිනෙ, දිනන්නේය; කදරියං, තද මසුරු පුද්ගලයා; දානෙන, තමා සතු දෙය දීමෙන්; ජිනෙ, දිනන්නේය; අලිකවාදිනං, බොරු කියන පුද්ගලයා; සච්චෙන, සැබෑකීමෙන්; ජිනෙ, දිනන්නේය.

4. සච්චං භණෙ, සත්‍යවචනයක් ම කියන්නේය; න කුජ්ඣෙය්‍ය, පරහට නොකිපෙන්නේය; යාචිතො, ඉල්වනලදුයේ හෙවත් සිල්වතුන් අවුත් ගෙදොර සිටිකල්හි (සිල්වත්හු මට දෙවයි නො ඉල්වන්නාහුද "උද්දිස්ස අරියා තිට්ඨන්ති එසා අරියාන යාචනා" යනු හෙයින් බික උදෙසා දොර දොර සිටිනා බැවින් අර්ථහෙයින් ඉල්වන්නෝ නම් ම වෙත් නුයි යාචිතො යි කියනලදී) අප්පස්මිම්පි, දෙයධර්මය ස්වල්ප කල්හිදු; දජ්ජා, එයින් මඳදෙයකු දු දෙන්නේය; එතෙහි තීහි ඨානෙහි, බොරු නො කීමය ක්‍රොධ නො කිරීමය මඳින් මඳක් දීමය යන මෙතුන් කාරණයෙන්; දෙවානං සන්තිකෙ, දෙවියන් සමීපයට, හෙවත් දෙව්ලොවට; ගච්ඡෙ, ප්‍රතිසන්ධිවශයෙන් යන්නේය— දෙව්ලොව උපදනේයි සේයි.

225 5. අහිංසකා යෙ මුනයො නිච්චං කායෙන සංවුතා,
තෙ යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ.

226 6. සදා ජාගරමානානං අහොරත්තානුසික්ඛිනං,
නිබ්බානං අධිමුත්තානං අත්ථං ගච්ඡන්ති ආසවා.

227 7. පොරාණමෙතං අතුල නෙතං අජ්ජතනාමිව,
නින්දන්ති තුණ්හිමාසීනං නින්දන්ති බහුභාණිනං,
මිතභාණිනම්පි නින්දන්ති නත්ථි ලොකෙ අනින්දිතො.

---

5. යෙ මුනයො, (මොනෙය්‍ය ප්‍රතිපදාවෙන් මාර්ගඵලයට පැමිණියා වූ) යම් අශෛක්‍ෂමුනිකෙනෙක්, හෙවත් යම් ක්‍ෂීණාශ්‍රව කෙනෙක්; අහිංසකා, අනුන්ට හිංසාවක් නො කොරෙද්ද; නිච්චං සතතයෙන්; කායෙන සංවුතා, කයින් සංවෘතයෝ ද, හෙවත් තුන්දොර සංවරයෙන් යුක්තයෝ ද; තෙ, ඒ අශෛක්‍ෂමුනීහු; යත්ථ ගන්ත්වා, යම් තැනකට ගොස්; න සොචරෙ, සත්වයෝ සොක නො කෙරෙද්ද; අච්චුතං, චුතිරහිත වූ; තං ඨානං, අමෘත-මහානිර්වාණ සඞ්ඛ්‍යාත) ඒ ස්ථානයට; යන්ති, (ආලම්බනකරණ-වශයෙන්) පැමිණෙන්නාහුයි.

6. සදා, හැමකල්හිම; ජාගරමානානං, කෙලශනිද්‍රාවෙන් නො නිදන්නා වූ; අහොරත්තං, දිවාරාත්‍රියෙහි; අනුසික්ඛිනං, ත්‍රිවිධශික්‍ෂාවෙහි හික්මෙන්නා වූ; නිබ්බානං අධිමුත්තානං, කෙලශපරිනිර්වාණයෙහි ඇලුනා වූ යොගාවචරයන්ට; ආසවා, කාමාශ්‍රවාදිචතුරාශ්‍රවයෝ; අත්ථං ගච්ඡන්ති, නැස්මට යන්නාහුයි.

7. අතුල, අතුලය! එතං, නින්දනය පසංසනය යන මෙය; පොරාණං, පුරාතනය; එතං, මේ; න අජ්ජතනං ඉව, අද වූ දෙයක් මෙන් නොවෙයි (දැන්වූ දෙයක් නොවෙයි සේයි); තුණ්හිමාසීනං අපි, තුෂ්ණීම්භූත ව හුන්නහුට ද; නින්දන්ති, (මේ ගොළුවෙකුමෙන් බිහිරෙකුමෙන් කිසිවක් නො දන්නෙකු මෙන් මුවෙන් නො බැණ ම වැදහුන්නේ යයි) නින්දාකෙරෙති; බහුභාණිනං අපි, බොහෝ කොට බණනසුල්ලහට ද; නින්දන්ති, (මේ සුළඟින් සැලෙන මාල්ලමක් මෙන් කරකරයා දොඩා ම යෙයි, මූගේ කථාපරියන්තයෙක් නැත, මේ කිමෙක්දැයි) නින්දා කෙරෙති; මිතභාණිනම්පි, මද කොට බණනසුල්ලහට ද; නින්දන්ති, (මේ තමාගේ බස රත්රන් මසුරන් කොට සිතයි, එක් බසක් දෙබසක් කියාලා එතෙකින් මුයෙන් නොබිණී යයි) නින්දා කෙරෙති; (එහෙයින්) ලොකෙ, මේ සත්වලොකයෙහි; අනින්දිතො, (සර්වප්‍රකාරයෙන්) අනින්දිත සතෙක් නම්; නත්ථි, නැති.

228 **8. නචාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති,**
**එකන්තං නින්දිතො පොසො එකන්තං වා පසංසිතො.**

229 **9. යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ,**
**අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං.**

230 **10. නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,**
**දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො.**

231 **11. කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා,**
**කායදුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ.**

---

8. එකන්තං, එකාන්තයෙන්; නින්දිතො පොසො, නින්දා කරණලද පුරුෂයෙක් හෝ; එකන්තං, එකාන්තයෙන්; පසංසිතො වා, ප්‍රශංසාකරණලද පුරුෂයෙක් හෝ; නචාහු, අතීතයෙහි ද නොවීය; න ච භවිස්සති, අනාගතයෙහි ද නො වන්නේසි; එතරහි ච, දැන් වර්තමාන කාලයෙහි ද; න විජ්ජති, නැත්තේසි.

9. චෙ, ඉදින්; විඤ්ඤූ, (බාලයන්ගේ නින්දාව ද ප්‍රශංසාව ද අප්‍රමාණ බැවින්) ප්‍රාඥයෝ; සුවෙ සුවෙ, දවස දවස; අනුවිච්ච, විමසා (=නින්දාවට ද ප්‍රශංසාවට ද කාරණය දැන); යං, යමක්හට; පසංසන්ති, ප්‍රශංසා කෙරෙද්ද; අච්ඡිද්දවුත්තිං, අච්ඡිද්‍ර වූ ශික්ෂාවෙහි පවත්නා වූ, නොහොත් අච්ඡිද්‍ර වූ ජීවිතවෘත්ති ඇත්තා වූ; මෙධාවිං, ධර්මෞජඃප්‍රඥා සඞ්ඛ්‍යාත වූ විදර්ශනඥානයෙන් සමන්විත වූ; පඤ්ඤාසීලසමාහිතං, ලෞකිකලොකොත්තර ප්‍රඥාවෙන් ද චතුපාරිසුද්ධිසීලයෙන් ද සමන්විත වූ; තං, ඔහු.

10. ජම්බොනදස්ස නෙක්ඛං ඉව, ජාම්බොනදකනකපුඤ්ජයකටමෙන්; තං, ඒ මහණුට; නින්දිතුං, නින්දාකරන්නට; කො අරහති, කවරෙක් සුදුසුද; තං, ඒ මහණුට; දෙවාපි, (දෙවියෝද නුවනැති මිනිස්සුද;) පසංසන්ති, ප්‍රශංසා කෙරෙති; බ්‍රහ්මුණාපි, (දෙව්මිනිසුන් තබා දසදහසක් සක්වළ පවත්නා ආනුභාව ඇති) මහාබ්‍රහ්මයා විසිනි දු; පසංසිතො, ප්‍රශංසා කරණලද්දේ ම වේ.

11. කායප්පකොපං රක්ඛෙය්‍ය, ප්‍රාණවධාදි ත්‍රිවිධකායදුශ්චරිතය රක්නේය හෙවත් ත්‍රිවිධකායදුශ්චරිතයෙන් දුරුවන්නේය; කායෙන සංවුතො සියා, කායද්වාරයෙන් දුශ්චරිතප්‍රවෙශය වළකා පිහිත වූ කායද්වාරය ඇති වන්නේය; කායදුච්චරිතං හිත්වා, කායද්වාරයෙන් සිද්ධවන ත්‍රිවිධදුශ්චරිතය දුරුකොට; කායෙන සුචරිතං චරෙ, කායද්වාරයෙන් සුචරිතය පුරන්නේසි.

232 12. වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා,
වචීදුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ.

233 13. මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා,
මනොදුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ.

234 14. කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා,
මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතා'ති.

කොධවග්ගො සත්තරසමො.

———o———

235 1. පණ්ඩුපලාසොව'දානිසි යමපුරිසාපි ච තං උපට්ඨිතා,
උය්‍යොගමුඛෙ ච තිට්ඨසි පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති.

---

12 වචීපකොපං රක්ඛෙය්‍ය, මෘෂාවාදාදි චතුර්විධ වාග්දුශ්චරිතය රක්නේය හෙවත් චතුර්විධ වාග් දුශ්චරිතයෙන් දුරුවන්නේය; වාචාය සංවුතො සියා, වාග්ද්වාරයෙන් දුශ්චරිත ප්‍රවෙශය වළකා පිහිතවූ වාග්ද්වාරය ඇතිවන්නේය; වචීදුච්චරිතං හිත්වා, වාග්ද්වාරයෙන් සිඬවන චතුර්විධ දුශ්චරිතය දුරුකොට; වාචාය සුචරිතං චරෙ, වාග් ද්වාරයෙන් සුචරිතය පුරන්නේය.

12 මනොපකොපං රක්ඛෙය්‍ය, අභිධ්‍යාදි ත්‍රිවිධ මනොදුශ්චරිතය රක්නේය හෙවත් ත්‍රිවිධමනොදුශ්චරිතයෙන් දුරු වන්නේය; මනසා සංවුතො සියා, මනොද්වාරයෙන් දුශ්චරිතප්‍රවෙශය වළකා පිහිත වූ මනොද්වාර ඇතිවන්නේය; මනොදුච්චරිතං හිත්වා, මනොද්වාරයෙන් සිඬවන ත්‍රිවිධදුශ්චරිතය දුරුකොට; මනසා සුචරිතං චරෙ, මනොද්වාරයෙන් සුචරිතය පුරන්නේය.

14 යෙ ධීරා, යම් ප්‍රාඥකෙනෙක්; කායෙන සංවුතා, ප්‍රාණිවධාදීන් නො කරන්නාහු කායද්වාරයෙන් සංවෘතයෝ ද, (=සුපිහිත වූ කායද්වාර ඇත්තෝ ද); අථො, නැවත; වාචාය සංවුතා, මෘෂාවාදාදිය නොකියන්නාහු වාග්ද්වාරයෙන් සංවෘතයෝ ද,(=සුපිහිත වූ වාග්ද්වාර ඇත්තෝ ද;)මනසා සංවුතා, අභිධ්‍යාදීන් නොවුපදවන්නාහු මනොද්වාරයෙන් සංවෘතයෝ ද,(=සුපිහිත වූ මනොද්වාර ඇත්තෝ ද); තෙ ධීරා, ඒ ප්‍රාඥයෝ; වෙ, ඒකාන්තයෙන්; සුපරිසංවුතා, මනා කොට රක්‍ෂිතගොපිත වූ පිහිත වූ තුන්දෙර ඇත්තාහුයි.

කොධවග්ගො සත්තරසමො.

———o———

1. ඉදානි, දැන්; පණ්ඩුපලාසො ඉව අසි, පැසී විලික්සෑ බිම හෙන්නට සිටි පරණලාපතක් මෙන් විහි; යමපුරිසාපි ච තං උපට්ඨිතා, යමදූතයෝ ද තට එළඹ සිටියාහ, හෙවත් මරණ තට

236 2. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව,
නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං අරියභූමිමෙහිසි.

237 3. උපනීතවයො ච දානි'සි සම්පයාතොසි යමස්ස සන්තිකෙ,
වාසො පි'ච තෙ නත්ථි අන්තරා පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති

238 4. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව,
නිද්ධන්තමලො අනඞ්ගණො න පුන ජාතිජරං උපෙහිසි.

---

ඵළඹ සිටියේය; උය්‍යොගමුඛෙ ච තිට්ඨසි, විනාසමුඛයෙහිද(=පරිහානි මුඛයෙහිද) සිටියෙහි; තෙ, තට; පාථෙය්‍යම්පි ච, මාර්ගෝපකරණයෙකු ද; න විජ්ජති, නැති; (ගමනී මිනිසුන්ගේ පූපාපූප- ලුණු- (2) සාල්-බත් ආදි වූ මාර්ගෝපකරණ මෙන් පරලොව යන්නා වූ තට සපයා තුබූ කුසල් නැමැති මාර්ගෝපකරණයෙක් ද නැති.)

2. සො [ත්වං], හේතෝ; අත්තනො, තමහට; දීපං කරොහි, ප්‍රතිෂ්ඨාවක් කර, (නැව බුන් කල්හි පිහිටවන දිවයිනක් මෙන් තට කුසල් නැමැති පිහිටක්කර, කරන්නෙහි දු); ඛිප්පං වායම, වහාම වීර්‍ය්‍යකර; පණ්ඩිතො භව,(තට කුසල් නැමැති පිහිට කිරීමෙහි) නුවනැති ව අඥබාල නො ව; නිද්ධන්තමලො, (රාගාදීන් සන්තානයෙන් පහකළ බැවින්) නසනලද රාගාදිමල ඇත්තෙහි, අනඞ්ගණො, එහෙයින් ම රාගාදි අඞ්ගණරහිත වූ යෙහි; දිබ්බං, දිව්‍යානුභාවයෙන් යුක්ත වූ, නොහොත් ශොභාමත් වූ; අරියභූමිං, ආර්‍ය්‍යයන්ට වාසස්ථාන වූ සුද්ධාවාසභූමියට; එහිසි, පැමිණෙන්නෙහිය.

3. ඉදානි, දැන්; උපනීතවයො ච, අසි, ගියා වූ වයස් ඇත්තෙහි ද විහි, (තුන්වයස ම ඉක්ම මරණමුඛයෙහි සිටියෙහි); යමස්ස සන්තිකෙ සම්පයාතො අසි, යමයා සමීපයට හෙවත් මරණමුඛයට පැමිණියෙහි, (මරුමුවට යන්ට සැරහී සිටියේ විහි); තෙ, තට; අන්තරා, අතුරෙහි; වාසොපි ච නත්ථි, වාසයකු දු නැත, (යම්සේ මග යන්නාහු අතරමග ලැගලැග යෙද්ද, එසේ ම පරලොවට යන්නාවූ තට අතරමග ලැග්මෙකු දු නැත; තෙ, තට; පාථෙය්‍යම්පි ච න විජ්ජති, මාර්ගෝපකරණයෙකු දු නැත, (ගමන් යන මිනිස්සු යම්සේ මාර්ගෝපකරණ සපයාගණිද්ද, පරලොව යන්නා වූ තා විසින් එලෙස සපයාගත් කුශල සඞ්ඛ්‍යාත මාර්ගෝපකරණයෙකු දු නැත.)

4. සො[ත්වං],හේ තෝ;අත්තනො,තමහට;දීපං කරොහි,පිහිටක්කර,(කරන්නෙහි දු)ඛිප්පං වායම, වහාම වීර්‍ය්‍යකර; පණ්ඩිතො

---

2 සන්තිකං. 2 පුපුළු.

239 5. අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ,
කම්මාරො රජතස්සෙ'ව නිද්ධමෙ මල මත්තනො.

240 6. අයසා'ව මලං සමුට්ඨිතං තදුට්ඨාය තමෙව ඛාදති,
එවං අතිධොන (1)චාරිනං සකකම්මානි නයන්ති දුග්ගතිං.

241 7. අසජ්ඣායමලා මන්තා අනුට්ඨානමලා ඝරා,
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලං.

---

තව, කුසල් කිරීමෙහි නුවනැතිවෙව (අඥබාල නොව); නිද්ධන්තමලො, රාගාදීන් සන්තානයෙන් පහකළබැවින් නසනල්ද රාගාදි මල ඇත්තෙහි; අනඞ්ගණො, එහෙයින්ම රාගාදි අඞ්ගණරහිතවූයෙහි; පුන, නැවත; ජාතිජරං, ජාතිජරාව්‍යාධිමරණයට; න උපෙහිසි, නො එළඹෙන්නෙහි යි.

5 අනුපුබ්බෙන, පිළිවෙළින්; මෙධාවී, ධර්මෞජඃප්‍රඥවෙන් සමන්විත වූ ප්‍රාඥතෙම; ඛණෙ ඛණෙ, ක්ෂණක්ෂණයෙහි,(ලද ලද අවකාසයෙහි); ථොක ථොකං, මඳමඳ කොට, හෙවත් මදින් මදින් කුසල්කරන්නේ; රජතස්ස, සවර්ණයාගේ ආගන්තුක වූ කෘත්‍රිම දෙෂය දවන්නා වූ; කම්මාරො ඉව, සවර්ණකාරයෙකු මෙන්; (නැවත නැවත තවතවා තළතළා ක්‍රමක්‍රමයෙන් සවර්ණයාගේ දෙෂය පහකරන්නාවූ සවර්ණකාරයෙකුමෙන්); අත්තනො, තමාගේ; මලං, රාගාදිමලය; නිද්ධමෙ, දුරුකරන්නේයි.

6. අයසාව, යකඩින් ම; සමුට්ඨිතං, නැංගා වූ; මලං, මලය; තදුට්ඨාය, එයින් ම නැගී; තමෙව, ඒ යකඩම; ඛාදති, යම්සේ කාද; එවං, එසේ ම; අතිධොන (1) චාරිනං, සතරපසය පස්විකා පරිභොගකරණ ප්‍රඥවෙන් ඉක්මුණුහු; හෙවත් සතරපසය නො පස්විකා වළඳකරණ මහණු; සකකම්මානි, සවකීය වූ ඒ පාපකර්මයෝ හෙවත් තමා සතන්හි උපන්නාවූ තෘෂ්ණාසඞ්ඛ්‍යාත අකුශලකර්මයෝ; දුග්ගතිං න යන්ති, ඔහු දුගතියට පමුණුවන්නා හුයි.

7. මන්තා, හදාරණ ලද ශාස්ත්‍රයෝ; අසජ්ඣායමලා; නො පිරිවීම මල කොට ඇත්තාහ; (හදාළ බණ වත් ශාස්ත්‍ර වත් නො පිරිවීමෙන් අනුයොගය නො කිරීමෙන් නස්නේ හෝය,නිරන්තරරව නොවැටහෙන්නේ හෝය) ඝරා, ගෘහයෝ; අනුට්ඨානමලා, අනුට්ඨානය,(=වීර්‍ය්‍ය නො කිරීම) මල කොට ඇත්තා හ, (පුරුෂයා වීර්‍ය්‍ය කොට සුන්බුන් තැන් තර නො කිරීමෙන් ගෙය නස්නේය) නොහොත්-ඝරා,ගෘහවාසීහු;අනුට්ඨානමලා,කෘෂිවණික්කර්මාන්තාදියෙහි වීර්‍ය්‍ය නොකිරීම මල කොට ඇත්තාහ; වණ්ණස්ස, ශරීරවර්ණයට; කොසජ්ජං, කුසීත බව; මලං, මලය; (කුසීත බැවින් නැගැවීම් හිස්පදවීම් ආදිය නොකිරීම ශරීරවර්ණයට කිලිටෙක);

---

1 අතිධොත

242 **8. මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං,**
**මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච.**

243 **9. තතො මලා මලතරං අවිජ්ජා පරමං මලං,**
**එතං මලං පහන්ත්වාන නිම්මලා හොථ භික්ඛවො.**

244 **10. සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා,**
**පක්ඛන්දිනා පගබ්භෙන සංකිලිට්ඨෙන ජීවිතං.**

---

රක්ඛතො, කෙත්-වත්-ගව-ඝරක්ආදි යම් කිසිවක් රක්නාහට; පමාදෙ, ප්‍රමාදවීම; මලං, මලය, (ගොයම්රක්නහු ප්‍රමාදවශයෙන් නිදියදී කෙළියදී හූරු-කුරුළු-ගෙරි-මීවුන් ආදීන්විසින් නොයෙක් අලෙසිවන හෙයින් ද, ගවයන් රක්නහු ප්‍රමාද ව නිදියදී කෙළියදී ගවයන් දියෙන් නැඟීයන හෙයින් ද, දිවියන් කාපියන හෙයින් ද, සොරුන් ගෙණයන හෙයින් ද, අනුන්ගේ හැල්කෙත් ආදිය කාපීමෙන් නස්නාහෙයින් ද, තමා ද නොයෙක් දඬුමුඩු ආදියට පැමිණෙන බැවින් ද, යමක් රක්නහුට ප්‍රමාදය කිලිටෙක.)

8. ඉත්ථියා, ස්ත්‍රියට; දුච්චරිතං, දුශ්චරිතය, (=ධූර්තවීම); මලං, මලය; (ධූර්ත වූ ස්ත්‍රිය ස්වාමියා ගෙන් නෙරපියන්නේය, මවු-පියෝ ද කුලාචාර නැත්තියයි ඇසින් දක්නාත් නොකැමැතිව ගෙන් නෙරපියන්නාහ, එහෙයින් ධූර්තවීම ස්ත්‍රියට කිලිටෙක) දදතො, දන්දෙන්නාහට; මච්ඡෙරං, මසුරුසිත; මලං, මලය; (කුඹුරු සානාකල ලාබන් ආදිය දෙමි සිතා පසුව ගොයම් තිපන් කල මසුරුමලයෙන් මඩනාලද්දූ ව දුනවෙහනා පමණකු දු නූපදවන්නේය. දිව්‍යමනුෂ්‍යසම්පත්තීන් ද නිර්වාණසම්පත්තීන් ද පිරිහෙන්නේය, එහෙයින් දන් දෙන්නහුට මසුරු සිත් කිලිටෙක); පාපකා ධම්මා, අකුශලධර්මයෝ; අස්මිං ලොකෙ, මෙලොව ද; පරම්හි ච, පරලොව ද; වෙ, ඒකාන්තයෙන්; මලා මලයෝයි.

9. භික්ඛවො, මහණෙනි; තතො මලා, ඒ සියලු මලට වඩා; මලතරං, අධිකතර මලයක් නොපට කියමි; අවිජ්ජා, (දුක්ඛාදි අටතන්හි පැවැත්තා වූ අඥාන යයි කියනලද) අවිද්‍යා තොමෝ; පරමං මලං, උත්තම වූ මලයෙක; එතං මලං පහන්ත්වාන, මේ අවිද්‍යා නැමැති මලය අර්හත්මාර්ගඥානයෙන් ප්‍රහීණ කොට; නිම්මලා හොථ, නිර්මලවව්.

10. අහිරිකෙන, පාපයෙහි හිරිඔතප් නැත්තා වූ; කාකසූ-රෙන, ගසා කෑමෙහි සූරු කවුඩෙකු වැනිවූ; ධංසිනා, අනුන්ගේ ගුණමකුවූ; පක්ඛන්දිනා, එගෙන් එගෙට දිවන සුලුවූ; පගබ්භෙන,

245 **11. හිරීමතා ච දුජ්ජීවං නිච්චං සුචිගවෙසිනා,**
**අලීනෙනප්පගබ්භෙන සුද්ධාජීවෙන පස්සතා.**

246 **12. යො පාණමතිපාතෙති මුසාවාදඤ්ච භාසති,**
**ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති.**

247 **13. සුරාමෙරයපානඤ්ච යො නරො අනුයුඤ්ජති,**
**ඉධෙවමෙසො ලොකස්මිං මූලං ඛණති අත්තනො.**

---

කායපාගබ්භියාදින් යුක්ත හෙයින් බුහුටි වූ; සඞ්කිලිට්ඨෙන, සකිලිටු වූ ආජීව ඇති මහණහු විසින්; ජීවිතං, ජීවත්වීම; සුජීවං, සුවසේ කටහැක්කේයි.

11. හිරිමතා ච, පාපයෙහි හිරිඔතප් ඇත්තා වූ; නිච්චං, සතතයෙන්; සුචිගවෙසිනා, සුචි වූ කායකර්මාදිය සොයන සුලු වූ; අලීනෙන, ජීවිතවෘත්තියෙහි නො ඇලුනාවූ; අප්පගබ්භෙන, කායප්‍රගල්භාදි ප්‍රගල්භරහිතවූ; සුද්ධාජීවෙන, (එක්විසි අනෙස්නෙන් දුරුව ගෙපිළිවෙළින් පිඬු සිඟා ඇවිද ජීවත්වන හෙයින්) සිරිසිදු වූ ආජීවඇති; පස්සතා, එම පිරිසිදු වූ ආජීවය සාරකොට දක්නා වූ ලජ්ජීමහණු විසින්; දුජ්ජීවං, ජීවත්වීම දුකි; (ඒ රූක්‍ෂජීවිකායෙන් ජීවත්වන්නේ නම්වේ.)

12. යො, යම් පුද්ගලයෙක්; පාණං අතිපාතෙති, යම්කිසි සතෙක්හු (ඝාතකාදි සපියෝ අතුරෙන් එක්තරා පියෝවෙකින්) ජීවිතෙන්ද්‍රියයෙන් චුත කෙරේ ද; මුසාවාදං ච භාසති, (මෙරමාහට වන වැඩ නසන්නාවූ) අභූත කථා බොරුකියා ද; ලොකෙ, මේ සත්වලොකයෙහි; අදින්නං, වස්තුස්වාමීහු විසින් කයින් හෝ වචසින් හෝ නොදෙනලද පරසන්තක වස්තුව; ආදියති, (ථෙය්‍යාවහාරාදි පස්විසි අවහාරයෙකින්) සොරා ගණී ද; පරදාරං ච ගච්ඡති, අනුන් විසින් රක්‍ෂිත ගොපිත වූ ස්ත්‍රීන්කරා යේද.

13. යො නරො, යම් පුරුෂයෙක්; සුරාමෙරය පානඤ්ච, රහමෙර පීමෙහි ද; අනුයුඤ්ජති, නැවත නැවත යෙදේද; එසො, මෙබඳු පුද්ගලතෙම; ඉධ එව ලොකස්මිං, පරලෝ තබා මෙලොව දීම; අත්තනො මූලං ඛණති, තමාගේ ප්‍රතිෂ්ඨාමූලය කණන්නේයි ග්‍රාම–ක්‍ෂෙත්‍ර—වස්තු–දාසි–දාස–ගව–මහිස–ධන–ධාන්‍යාදි යම් ප්‍රතිෂ්ඨාමූලයෙකින් පිහිටාද එසේ වූ, ප්‍රතිෂ්ඨාමූලය කෘෂිවණික්කර්මාන්තාදි සුදුස්සෙහි නොයොදා උකස්තිබීමෙන්, විකිණීමෙන්, වෙසින්ට දීමෙන්, ඒ වියදම් කොට රා පීමෙන්, මස්කෑමෙන්, තමා කළ වරදට දඩ දීමෙන් නසාපියා අනාථ ව අසරණ ව බැගෑ ව ඇවිදිනේ යයි සේයි.

248 14. එවම්භො පුරිස ජානාහි පාපධම්මා අසඤ්ඤතා,
මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං.

249 15. දදාති 1 වෙ යථාසද්ධං යථාපසාදනං ජනො,
තත්ථ චෙ මඞ්කු සො හොති 2 පරෙසං පානභොජනෙ;
න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.

250 16. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං,
සවෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.

---

14. භො පුරිස, (පඤ්චදෞශ්ශීල්‍යකර්මයෙහි නියුක්තවූ) භවත් පුරුෂය; පාපධම්මා, ලාමක වූ අකුශල ධර්මයෝ; අසංයතා, නො වැළැක්විය හැක්කාහයි; එවං ජානාහි, මෙසේ දනු; ලොභො, විසම වූ ලොභය ද; අධම්මො ච, ද්වේෂය ද යන මේ අකුසලමූලයෝ දෙදෙන; තං, තා; චිරං, බොහෝ කලක්; දුක්ඛාය, නරකාදි දුකට; මා රන්ධයුං, නහමක් පවතින් වා, (=නහමක් පමුණුවත්වා).

15. ජනො, (රූක්ෂ වූ ද ප්‍රණීත වූ ද යම් කිසිවක් දෙන්නා වූ) ජන තෙම; යථාසද්ධං, ශ්‍රද්ධාවට අනුරූපපරිද්දෙන්; යථාපසාදනං, (ස්ථවිර-නව-මධ්‍යමාදීන් කෙරෙහි උපන් තමාගේ) ප්‍රසාදයට අනුරූප පරිද්දෙන්; පරෙසං, අනුන්ට; දදාති, දෙන්නේය; තත්ථ පානභොජනෙ, ඒ පානභොජනයෙහි; යො, යම් මහණෙක්; මඞ්කු හොති, (මාවිසින් මඳදෙයක් ලබනලද, රූක්ෂදෙයක් ලබනලදැයි) දොම්නස්වේද; සො, ඒ මහණ තෙම; වෙ, ඒකාන්තයෙන්; දිවා වා, දවලෙක වත්; රත්තිං වා, රාත්‍රියක වත්; සමාධිං, උපචාරසමාධි-අර්පණසමාධියකට වත් මාර්ගසමාධි-ඵලසමාධියකට වත්; න අධිගච්ඡති, නො පැමිණෙන්නේයි.

16. යස්ස ච, යම් මහණකු විසින් වනාහි; එතං, මේ මංකුභාවයයි කියනලද අකුසලය; සමුච්ඡින්නං, මනාකොට සිඳිනලද ද; මූලඝච්චං සමූහතං; අවිද්‍යා-තෘෂ්ණා නැමැති කෙලෙසමූලය අනාගාමි මාර්ගයෙන් මනා කොට නසනලද ද; සො, ඒ මහණ තෙම; වෙ, ඒකාන්තයෙන්; දිවා වා, දවල් වත්; රත්තිං වා, රාත්‍රියෙහි වත්; සමාධිං, උපචාරසමාධි-අර්පණසමාධියට ද මාර්ගසමාධි-ඵලසමාධියට ද; අධිගච්ඡති, පැමිණෙන්නේයි.

---

1 දදන්ති. (සෑම පොත්හි).

2 තත්ථ සො මංකුභාවං වා. (ඇතැම් පොත්හි).

251 **17.** නත්ථි රාගසමො අග්ගි නත්ථි දෝසසමො ගහො,
නත්ථි මෝහසමං ජාලං නත්ථි තණ්හාසමා නදී.

252 **18.** සුදස්සං වජ්ජං අඤ්ඤෙසං අත්තනො පන දුද්දසං,
පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථාභුසං;
අත්තනො පන ඡාදෙති කලිං'ව කිතවා සඨො.

253 **19.** පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො,
ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා.

---

17. රාගසමො අග්ගි, රාගය හා සමගින්නෙක්; නත්ථි, නැත; (දුම් වත් ගිනිසිලු වත් සාලුහරු වත් නො දක්වා ඇතුළත්හි ම සිට සතුන් දවා හලු කරන්නට සමර්ථ වූ අනික් ගින්නෙක් නැති හෙයින් රාගය හා සමගින්නෙක් නැත); දෝසසමො ගහො; ද්වේෂය හා සම වූ ගැන්මෙක්; නත්ථි, නැත; (යක්ෂ-රාක්ෂසයන්ගේ ගැන් ම කිඹුලුන්-මෝරුන්ගේ ගැන්ම සිංහ-ව්‍යාඝ්‍රයන්ගේ ගැන්ම යනාදි ගැනුම්හු තාක් එක ජාතියෙක ම දුක් දෙන්නාහ, ද්වේෂ නැමැති ගැන් ම වනාහි එලෙස ගන්නේ නොවෙනුයි ද්වේෂය හා සම වූ ගැන්මෙක් නැත); මෝහසමං ජාලං, (සතුන් හාත්පසින් බඳනා වෙළඳනා කාරණයෙන්) මෝහසම වූ දැලෙක්, නත්ථි, නැත; තණ්හාසමා නදී, තෘෂ්ණාව හා සම වූ ගඞ්ගාවෙක්; නත්ථි, නැත; (ගඞ්ගා-යමුනා ආදි සෙසු ගඞ්ගාවන්ගේ පිරුණු කලෙකු දු අඩු කලෙකු දු වියලි කලෙකු දු පෙණෙන්නේය, තෘෂ්ණාව පිරුණු කලෙක් වත් වියලි කලෙක් වත් නැති හෙයින් හැම කල්හි ම ඌනව පෙණේනුයි නො පිරෙණ අර්ථයෙන් තෘෂ්ණාව හා සම වූ ගඞ්ගාවෙක් නම් නැත)

18. අඤ්ඤෙසං, අනුන්ගේ, වජ්ජං, අණුමාත්‍ර වූ වරද; සුදස්සං, සුවසේ දක්කහැක්ක; අත්තනො පන, තමාගේ වූ කලි මහත් වරද ද, දුද්දසං, නො පෙණෙන්නේය; සො, ඒ අනුන්ගේ වරද සොයන පුද්ගල තෙම; පරෙසං වජ්ජානි, ස්වල්ප වූ ද අනුන්ගේ දෝෂයන්; භුසං යථා, උස්තැනක සිට රොඩු බොල් පොළන්නා වූ එකක්හු මෙන්, ඔපුණාති, පොළන්නේය, (=නගා පාන්නේය); අත්තනො පන, තමාගේ වූ කලි මහත් වරද ද; ඡාදෙති, වසන්නේය; (=පැවි කරන්නේයි, වළහන්නේයි); කුමක් මෙන් ද යත් ? කිතවා, කොළපැලලි ආදියෙන්; කලිං, ශරීරය මුවාකරන්නා වූ; සඨො ඉව, ලිහිණි වැද්දා මෙනි.

19. පරවජ්ජානුපස්සිස්ස, අනුන්ගේ වරද දක්නා සුලු වූ; නිච්චං, සතතයෙන්; උජ්ඣානසඤ්ඤිනො, අනුන්ගේ රැඬුගනෙවසී බැවින් උජ්ඣානසඤ්ඤි වූ * (=උදෙගන සුලු වූ), තස්ස, ඒ මහණුට; ආසවා

---

* "උජ්ඣානසංඥිහට" පොත්හි.

254 20. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ,
පපඤ්චාභිරතා පජා නිප්පපඤ්චා තථාගතා.

255 21. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ,
සඞ්ඛාරා සස්සතා නත්ථි නත්ථි බුද්ධානං ඉඤ්ජිතං'ති.

මල වග්ගො අට්ඨාරසමො.

---

256 1. න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සහසා නයෙ,
යො ච අත්ථං අනත්ථඤ්ච උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො.

---

වඩ්ඪන්ති, කාමාදී ආශ්‍රවයෝ වඩනාහ; (ධ්‍යානාදීන් අතුරෙන් එක-ධර්මයක් නොවඩනේය එහෙයින්) සො, ඒ මහණ තෙම; ආසවක්ඛයා, රහත්ඵලයෙන්; ආරා, දුරැයි.

20. ආකාසෙ, ආකාශයෙහි; පදං නත්ථි, (මේ පියය මෙබඳු වර්ණයක් ඇත්තේය මෙබඳු සටහනෙක් ඇත්තේයයි පැණවියයුතු) පියයෙක් නැත; බාහිරෙ, බාහිර සස්නෙහි; සමණො නත්ථි, මාර්ගස්ථ ඵලස්ථ මහණෙක් නම් නැත; පජා; මේ සත්ත්වලොක සඞ්ඛ්‍යාත වූ ප්‍රජා තොම; පපඤ්චාභිරතා, තෘෂ්ණා-මාන-දෘෂ්ටි ප්‍රපඤ්චයෙහි ඇලුනාහ, තථාගතා, සර්වඥවරයෝ; නිප්පපඤ්චා, (බොධිමූලයෙහිදී ම සියලු ප්‍රපඤ්චයන් ප්‍රහීනකළ හෙයින්) නිෂ්ප්‍රපඤ්චයෝයි; (=ප්‍රපඤ්චරහිතයෝයි).

21. ආකාසෙ පදං නත්ථි, ආකාශයෙහි (මේ පියය මෙබඳු වර්ණයක් ඇත්තේය මෙබඳු සටහනෙක් ඇත්තේයයි පැණවියයුතු) පියයෙක් නැත; බාහිරෙ, බාහිර සස්නෙහි; සමණො නත්ථි, මාර්ගස්ථ ඵලස්ථ මහණෙක් නම් නැත; සස්සතා, ශාශ්වතවූ, (=නිත්‍ය ව පවත්නා වූ); සඞ්ඛාරා නත්ථි, ස්කන්ධකොණෙක් නම් නැත; බුද්ධානං, සම්‍යක්සම්බුද්ධවරයන්ට; ඉඤ්ජිතං නත්ථි, (තෘෂ්ණා-මාන-දෘෂ්ටි ප්‍රපඤ්චයන් අතුරෙහි යම් ඉඤ්ජිතයක් නිසා සංස්කාරයෝ ශාශ්වතයහයි ගණිද්ද එසේ වූ) එක ද ඉඤ්ජිතයෙක් නැති.

මලවග්ගො අට්ඨාරසමො.

---

1: යෙන, යම් කාරණයෙකින්; අත්ථං, විනිශ්චය කටයුතු වූ අර්ථය, හෙවත් විනිශ්චය කොට දතයුතු වූ ජයපරාජය; සහසා නයෙ, ඡන්දගති ආදියෙහි පිහිටා සාහසයෙන් (=මුසාවාදයෙන්) විනිශ්චය කෙරේ ද, (බොරු කීමෙන් ජයපරාජයාට පමුණුවා ද); තෙන, එපමණ කාරණයෙකින්; ධම්මට්ඨො න හොති, (රජුන් විසින් විනිශ්චය ධර්මයෙහි සිටුවනා ලද්දේ ද) විනිශ්චය ධර්මයෙහි පිහිටියා නම් නොවෙයි; පණ්ඩිතො, නුවනැත්තා වූ; යො ච, යමෙක්

257 **2. අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ,**
**ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨො'ති පවුච්චති.**

258 **3. න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති,**
**ඛෙමී අවෙරී අභයො පණ්ඩිතො'ති පවුච්චති.**

259 **4. න තාවතා ධම්මධරො යාවතා බහු භාසති,**
**යො ච අප්පම්පි සුත්වාන ධම්මං කායෙන පස්සති;**
**සවෙ ධම්මධරො හොති යො ධම්මං නප්පමජ්ජති.**

---

වනාහි; අත්ථං, (විනිශ්චය කටයුතු වූ) භූත වූ කාරණය ද; අනත්ථං ච, අභූත වූ කාරණය ද යන; උභො, දෙක; නිච්ඡෙය්‍ය, නිශ්චය කෙරේ ද හෙවත් නිසව කොට කියා ද.

2. අසාහසෙන, අසාහසයෙන්,(=නොබොරු තෙපුලෙන්); ධම්මෙන, විනිශ්චය ධර්මයෙන්; සමෙන, අපරාධ වූ පරිද්දෙන්; පරෙ, අනුන්; නයති, ජයපරාජයට පමුණුවා ද; ධම්මස්ස, විනිශ්චය ධර්මය විසින්; ගුත්තො, රක්නාලද්දා වූ; මෙධාවී, නුවණැති පුරුෂ තෙම; ධම්මට්ඨො ඉති, විනිශ්චය ධර්මයෙහි පහිටියේ ය සි; පවුච්චති, කියනු ලැබේ.

3. යාවතා, යම් පමණ කාරණයෙකින්; බහුභාසති, (සභාවැද ආදියෙහි අත්තුක්කංසන-පරවම්භනවසයෙන්) බොහෝ කොට බෙණේ ද; තෙන, ඒ කාරණයෙන්; පණ්ඩිතො න හොති, පණ්ඩිත නම් නොවෙයි; ඛෙමී, යමෙක් වනාහි තෙමේ ක්‍ෂෙමී වේ ද; අවෙරී, පඤ්චදුශ්චරිතයන් කෙරෙන් භය නැත්තේ ද; නොහොත් අනුන් නොබවා ද හෙතෙම; පණ්ඩිතො ඉති පවුච්චති, පණ්ඩිතයයි කියනු-ලැබේ.

4. යාවතා, (බණ හැදෑරීම්-පිරිවීම්-දෙසීම් ආදි) යම් පමණ කාරණයෙකින්; බහුභාසති, බොහෝ කොට බෙණේ ද; තාවතා, එපමණ කාරණයෙකින්; ධම්මධරො න, ධර්මධර නම් නොවෙයි; (වංශානුරක්ෂක නමුදු ප්‍රවෙණිපාලක නමුදු නොවෙයි); යො ච, යමෙක් වනාහි; අප්පම්පි සුත්වාන, මදමදයකු දු අසා (ධර්මය දැන අර්ථය දැන ධර්මානුධර්මයට පැමිණ) කායෙන, නාමකායයෙන් (දුඃඛාදීන් පිරිසිඳ දත්තේ) ධම්මං, චතුස්සත්‍යධර්මය; පස්සති, දකී ද; සො, ඒ මහණ තෙම, වෙ, එකාන්තයෙන්; ධම්මධරො හොති, ධර්මධර නම් වෙයි; යො, යම් මහණෙක්; ධම්මං, චතුස්සත්‍ය ධර්මයෙහි; නප්පමජ්ජති, වඩනාලද වීර්‍ය ඇති ව අද අද ම රහත්-ඵලය ගණිමිසි ප්‍රතිවේධය කැමතිවෙමින් වෙසේ ද හෙද ධර්මධර නම් වේ.

260 5. න තෙන ථෙරො හොති යෙනස්ස පලිතං සිරො,
පරිපක්කො වයො තස්ස මොඝජිණ්ණො'ති වුච්චති.

261 6. යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො,
ස වෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චති.

262 7. න වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා,
සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො.

263 8. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං,
ස වන්තදොසො මෙධාවී සාධුරූපො'ති වුච්චති.

---

5. යෙන, යම් වයොවෘද්ධකාරණයකින්; අස්ස, ඔහුගේ; සිරො, හිස; පලිතං හොති, පලිත වේ ද, (=හිස නරව යේ ද); තෙන, ඒ නර නැගී කාරණයෙන්; ථෙරො න හොති, ස්ථවිර නම් නො වෙයි; තස්ස, ඔහුගේ; වයො, වයස; පරිපක්කො හොති, පරිපාකයට (=මුහුකුළුබවට) පැමිණියේ වෙයි; මොඝජිණ්ණොති වුච්චති, හෙතෙම (ඇතුළත්හි ශිලාදි ස්ථවිරකර ධර්මයන් නැති හෙයින්) තුච්ඡජීර්ණයයි කියනු ලැබේ.

6. යම්හි, යම් පුද්ගලයකු කෙරෙහි වනාහි; සච්චං ච, සොළොස් ආකාරයෙකින් ප්‍රතිවෙධ කරණලද සත්‍යය ද; ධම්මො ච, ප්‍රඥාවෙන් ප්‍රතිවෙධ කරණලද නවලොකොත්තර ධර්මය ද; අහිංසා, කිසිවක් හට හිංසා නොකිරීමෙන් අහිංසාව ද, හෙවත් මෛත්‍රී-කරුණා-මුදිතා-උපෙක්ෂා ද; සඤ්ඤමො, කාය-වාක්සංයමය ද, හෙවත් ප්‍රාතිමොක්ෂසංවරශීලය ද; දමො, ඉන්ද්‍රියදමනය යි කියනලද ඉන්ද්‍රියසංවරශීලය ද යන මේ ගුණ ඇද්ද; වන්තමලො, අර්හත්මාර්ගඥාන මුඛයෙන් වමනය කරණලද රාගාදිමල ඇති; ධීරො, ධෘතිසම්පන්න වූ; සො, ඒ මහණතෙම; ථෙරො ඉති පවුච්චති, (ශාසනයෙහි ස්ථිරභාවය කරන්නාවූ මේ ගුණධර්මයන් යුක්ත හෙයින්) ස්ථවිරය යි කියනු ලැබේ.

7. වාක්කරණමත්තෙන, (ශිනනස්වර-භින්නස්වර-ගද්ගදස්වර-කාකස්වර නොව ගම්භීරතාදිවශයෙන්) ලක්ෂණසම්පන්න තෙපුල් ඇති පමණකින් හෝ; වණ්ණපොක්ඛරතාය වා, ශරීරවර්ණය යහපත් බැවින් හෝ, ඉස්සුකී, පරලාභාදියෙහි ඊර්ෂ්‍යාසිත් ඇති; මච්ඡරී, ආවාසමාත්සර්‍ය්‍යාදිපඤ්චවිධමාත්සර්‍ය්‍යයෙන් සමන්විත වූ; සඨො, කෛරාටිකපක්ෂය භජනය කිරීමෙන් වඤ්චක වූ; නරො, නර තෙම; සාධුරූපො න හොති, සාධු වූ ස්වරූප ඇත්තේ නො වෙයි.

8. යස්ස, යමකුහු විසින් වනාහි; එතං, මේ ඊර්ෂ්‍යාදිදෝෂජාතය; සමුච්ඡින්නං, මනා කොට සිඳිනාලද ද; මූලඝච්චං සමූහතං, අවිද්‍යා-

264 9. න මුණ්ඩකෙන සමණො අබ්බතො[1] අලිකං භණං,
ඉච්ඡාලොභසමාපන්නො සමණො කිං භවිස්සති.

265 10. යො ච සමෙති පාපානි අණුං ථූලානි සබ්බසො,
සමිතත්තා හි පාපානං සමණො'ති පවුච්චති.

266 11. න තෙන භික්ඛු හොති යාවතා භික්ඛතෙ පරෙ,
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා.

267 12. යො'ධ පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහෙත්වා බ්‍රහ්මචරියවා,
සඞ්ඛාය ලොකෙ චරති ස වෙ භික්ඛූ'ති වුච්චති.

---

තෘෂ්ණාදී කෙලශමූලය හා සමග අර්හත්මාර්ගඥානයෙන් නසනලද ද; වන්තදොසො, අර්හත්මාර්ගඥානයෙන් නසනලද ඊර්ෂ්‍යාදිදොෂ ඇති; මෙධාවී, ධර්මෞජඃප්‍රඥාවෙන් යුක්ත වූ; සො, ඒ පුද්ගල තෙමේ; සාධුරූපොති වුච්චති, සාධුස්වරූප ඇත්තේ යයි කියනු ලැබේ.

9. අබ්බතො, ශීලව්‍රත–ධුතාඞ්ගව්‍රතයෙන් විරහිත වූ; අලිකං භණං, බොරු කියන්නා වූ පුද්ගල තෙම; මුණ්ඩකෙන, හිසමුඩුපමණකින්; සමණො න, ශ්‍රමණ නම් නොවෙයි; ඉච්ඡාලොභසමාපන්නො, අසම්ප්‍රාප්ත අරමුණෙහි ඉච්ඡායෙන් ද සම්ප්‍රාප්ත අරමුණෙහි ගෙධයෙන් ද සමන්විත වූයේ; කිං සමණො භවිස්සති, කෙසේ නම් ශ්‍රමණ වේ ද, ඒ මහණ නම් නො වෙයි යේයි.

10. යො ච, යමෙක් වනාහි; අණුං ථූලානි, අණු වූ ද මහත් වූ ද; පාපානි, අකුසලයන්; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; සමෙති, අර්හත්මාර්ගඥානයෙන් සමුච්ඡෙද කෙරේ ද; පාපානං, අකුසලයන්; සමිතත්තා හි, සන් හිඳුවනලද බව හෙතු කොට ගෙණ; සමණොති පවුච්චති, ශ්‍රමණ යයි කියනු ලැබේ.

11. යාවතා, යම් පමණකින්; පරෙ භික්ඛතෙ, අනුන් සිගා ද, හෙවත් යම් කාරණයෙකින් අනුන්ගේ දෙර දෙර සිට සිගා ද; තෙන, ඒ කාරණයෙන්, භික්ඛු න හොති, භික්ෂු නම් නොවේ; විස්සං ධම්මං සමාදාය, විෂම වූ පාපධර්මය සමාදන් ව, නොහොත් දුර්ගන්ධ වහනය කරන්නා වූ කායකර්මාදිධර්මය සමාදන් ව වසන්නේ; තාවතා, එපමණකින්, හෙවත් දෙර දෙර සිට සිගන පමණකින්; භික්ඛු න හොති, භික්ෂු නම් නොවේ.

12. ඉධ, මේ ශාසනයෙහි; යො, යම් මහණෙක්; පුඤ්ඤඤ්ච, කුසලය ද; පාපඤ්ච, අකුසලය ද යන මේ දෙක ම; බාහෙත්වා, මාර්ග-බ්‍රහ්මචර්යයෙන් දුරු කොට; බ්‍රහ්මචරියවා, මාර්ගබ්‍රහ්මචර්යයෙන්

---

1 අබ්බූතො.

268 13. න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු,
යො ච තුලං ව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

269 14. පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනි,
යො මුනාති උභො ලොකෙ මුනී තෙන පවුච්චති.

270 15. න තෙන අරියො හොති යෙන පාණානි හිංසති.
අහිංසා සබ්බපාණානං අරියො'ති පවුච්චති.

---

යුක්ත වේ ද; ලොකෙ, ස්කන්ධාදිලොකයෙහි සර්වධර්මයන්; සඞ්ඛාය, නුවනින් සලකා; චරති, හැසිරේ ද, (හෙවත් මොහු ආධ්‍යාත්මික වූ ස්කන්ධයෝය, මොහු බාහිර වූ ස්කන්ධයෝ යයි සියලු ධර්මයන් දැන වෙසේ ද); සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; භික්ඛූති වුච්චති, මාර්ගඥානයෙන් භින්න වූ සකලක්ලේශයන් ඇතිහෙයින් භික්ෂුය යි කියනු ලැබේ.

13. මූළ්හරූපො, මුස් වූ (තුච්ඡ වූ) ස්වරූප ඇති; අවිද්දසු, අඥාන පුද්ගල තෙම; මොනෙන, තූෂ්ණීම්භූතවීමෙන්, (=මුවෙන් නොබැණ හුන් පමණකින්); මුනි න හොති, මුනි නම් නොවෙයි; පණ්ඩිතො, ප්‍රාඥ වූ; යො ච, යම් කිසි පුද්ගලයෙක් වනාහි; තුලං ඉව පග්ගය්හ, ඉදිතුලාවක් ගෙණ සිටි එකක්හු මෙන්, හෙවත් තරාදියක් ගෙණ කිරන්නට සිටි එකක්හු මෙන්, වරමාදාය, ගතයුතු වූ උතුම්දෙය ගෙණ වෙසේ ද; (යම්සේ තරාදියක් ගෙණ කිරියයුතු දෙය කිරන්නා වූ පුරුෂ තෙම වැඩිදෙය හැරපියා අඩු දෙය බහාලා කිරා ද, එරිද්දෙන් ම හැරියයුතු අකුසල් හැරපියා ගතයුතු වූ කුසල් පුරන්නේ ශීල-සමාධි-ප්‍රඥා-විමුක්ති-විමුක්තිඥාන දර්ශන යයි කියනලද උත්තම වූ කුශලධර්මය ගෙණ;)

14. පාපානි පරිවජ්ජෙති, දුරු කටයුතු වූ අකුසලයන් දුරුකෙරේ ද; සො, හෙතෙම; මුනි, මුනි නම් වේ; කුමක් හෙයින් ද යත්? සො, හෙතෙම; තෙන, ඒ යට කියනලද කාරණයෙන්; මුනි, මුනි නම් වේ; ඒ එසේමැයි; යො, යමෙක් තෙම; උභොලොකෙ, ආධ්‍යාත්මික-බාහ්‍ය වූ ස්කන්ධාදි උභයලොකයන්; මුනාති, (මොහු ආධ්‍යාත්මික වූ ස්කන්ධයහ මොහු බාහ්‍ය වූ ස්කන්ධයහ යි මේ උභය ලොකයන් තරාදියට නගා කිරන්නක්හු මෙන්) නුවනින් පිරිසිඳ දනී ද; තෙන, ඒ කාරණයෙන්; සො, හෙතෙම; මුනි පවුච්චති, මුනි යයි කියනු ලැබේ.

15. යෙන, යම් කාරණයකින්; පාණානි හිංසති, ප්‍රාණීන් නසා ද, (=ප්‍රාණීන්ට හිංසා කෙරේ ද); තෙන, ඒ කාරණයෙන්; අරියො න හොති, ආර්ය නම් නොවෙයි; සබ්බපාණානං, සියලු සත්ත්වයන්ට;

271 16. න සීලබ්බතමත්තෙන බාහුසච්චෙන වා පුන,
අථ වා සමාධිලාභෙන විවිත්තසයනෙන වා.

272 17. ඵුසාමි නෙක්ඛම්මසුඛං අපුථුජ්ජනසෙවිතං,
භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං’ නි.

ධම්මට්ඨවග්ගො එකූනවීසතිමො.

---

273 1. මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා,
විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානඤ්ච චක්ඛුමා.

---

අහිංසා, පාණිප්‍රහාරදියෙන් හිංසා නො කිරීම හෙතු කොටගෙණ (මෛත්‍රීභාවනා ආදියෙහි පිහිටි බැවින්, හිංසායෙන් දුරුව සිටි බැවින්); අරියොති පවුච්චති, ආර්‍ය්‍ය යයි කියනු ලැබේ.

16. සීලබ්බතමත්තෙන, චතුෂ්පාරිශුද්ධිශීලමාත්‍රයෙකින් හෝ තෙළෙස් ධූතගුණමාත්‍රයෙකින් හෝ; පුන, නැවත; බාහුසච්චෙන වා, ත්‍රිපිටකධර මාත්‍රයෙකින් හෝ; අථ වා, නොහොත්; සමාධිලාභෙන, (සවිතර්කසවිචාරසමාධිය, අවිතර්කවිචාරමාත්‍රසමාධිය, අවිතර්කඅවිචාර සමාධිය, යන) ත්‍රිවිධසමාධිලාභයෙන් හෝ, හෙවත් රූපාරූප අෂ්ට සමාපත්තිලාභී පමණ කින් හෝ; විවිත්තසයනෙන වා, විවික්තශය්‍යා වෙන් හෝ, හෙවත් ගණසඞ්ගනිකායෙන් වෙන් ව කායවිවෙකයෙන් යුක්ත ව විසීම් පමණකින් හෝ;

17. අපුථුජ්ජනසෙවිතං, පෘථග්ජනයන් විසින් නො සෙවුනාලද; නෙක්ඛම්මසුඛං, නෛෂ්ක්‍රම්‍ය සුඛය, හෙවත් අනාගාමිඵල සුවය; ඵුසාමි, නාමකායයෙන් ස්පර්ශ කෙරෙමියි හෝ; භික්ඛු, මහණ; ආසවක්ඛයං අප්පත්තො, අර්හත් ඵලයට නොපැමිණියා වූ තෝ; විස්සාසං; භවයෙහි විශ්වාසයට; න ආපාදි, නහමක් පැමිණ— මහණ අනාගාමිඵලයට පැමිණියා වූ ද තෝ ඉදින් රහත්පලයට නොපැමිණියෙහි වී නම් ශීලසමාධ්‍යාදිගුණයෙන් යුක්ත වූ මට භවය ලුහුඬු වී ගියේ වේ දැයි භවයෙහි විශ්වාසයක් නො කර; යම්සේ ස්වල්ප වූ ද ගූථය දුර්ගන්ධ ද එසේ ම ස්වල්ප වූ ද භවය දුක්ඛය යනු භාවයි.

ධම්මට්ඨවග්ගො එකූනවීසතිමො.

---

1. මග්ගානං,(ජඞ්ඝමාර්ග-ශකටමාර්ග-වාෂ්පවිදුෂ්ටිනතමාර්ගාදී මාර්ගයන් අතුරෙන්; අට්ඨඞ්ගිකො මග්ගො, සම්‍යග්දෘෂ්ට්‍යාදිඅෂ්ටාඞ්ගායථමාර්ගය; සෙට්ඨො, (මිථ්‍යාදෘෂ්ට්‍යාදි අෂ්ටමිථ්‍යාමාර්ගයන් ප්‍රහීණ කරණබැවිනු ද

274 2. එසො'ව මග්ගො නත්'ථඤ්ඤො, දස්සනස්ස විසුද්ධියා,
එතම්හි තුම්හෙ පටිපජ්ජථ මාරස්සෙතං පමොහනං(1).

275 3. එතම්හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ,
අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසන්තනං.

276 4. තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා,
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා.

---

නිර්වාණය අරමුණු කෙරෙමින් චතුස්සත්‍යයෙහි දුඃඛපරිඥානාදිකෘත්‍ය සාධක බැවිනු දු) ශ්‍රේෂ්ඨ (උතුම්ය); සච්චානං, (වාක්සත්‍යය සංවෘති සත්‍යය දෘෂ්ටිසත්‍යය පරමාර්ථසත්‍යය යන මේ) සත්‍යයන් අතුරෙන්; චතුරො පදා, දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන මේ සත්‍යපදයෝ සතරදෙන; සෙට්ඨා, (තථ අවිතථ යනාදි සත්‍යාර්ථයෙන්) ශ්‍රේෂ්ඨයහ; ධම්මානං, (ප්‍රත්‍යයසමුත්පන්න වූ ද අසමුත්පන්න වූ ද සියලු) ධර්මයන් අතුරෙන්; විරාගො, නිර්වාණසංඛ්‍යාත වූ විරාගධර්මය; සෙට්ඨො, ශ්‍රේෂ්ඨය; ද්විපදානං; දිව්‍යමනුෂ්‍යප්‍රෙතාදී ඇති සියලු ද්විපදසත්ත්වයන්ට; චක්ඛුමා, බුදුඇස් ආදි පසැස් ඇති තථාගත තෙම; සෙට්ඨො, ශ්‍රේෂ්ඨ යි.

2 දස්සනස්ස, මාර්ගඵලසංඛ්‍යාතදර්ශනයාගේ; විසුද්ධියා, විශුද්ධිය පිණිස; එසො එව මග්ගො, (යම් මාර්ගයක් මා විසින් උතුම්ය යි කියනලද ද) මේ ම මගය; අඤ්ඤො නත්ථි, අනික් මගෙක් නැති; (මාර්ගඵලසංඛ්‍යාතදර්ශනයාගේ විශුද්ධියට උපාය නම් මේ මගය, අනික් උපායයක් නැතැයි සේයි;) තුම්හෙ, තෙපි; එතම්හි, මේ මාර්ගයෙහි ම; පටිපජ්ජථ, පිළිපදු ව; එතං, මේ අෂ්ටාඞ්ගිකමාර්ගය, මාරස්ස පමොහනං, මාරයා මුළාකරන්නේ යි — "කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති" යනාදීන් දක්වනලද කෙලෙස් නැමැති මාරසෙනාව හා සහිත වූ දිව්‍යපුත්‍රමාරයා විමා කරන්නේ යි සේයි.

3 එතම්හි පටිපන්නා, මේ අෂ්ටාඞ්ගිකමාර්ගයට පිළිපන්නා වූ; තුම්හෙ, තෙපි; දුක්ඛස්ස, සියලු වෘත්තදුඃඛය; අන්තං කරිස්සථ, අන්තකරව්, (නැසූ කොට පියව්); සල්ලසන්තනං, සියලු රාගාදිශල්‍යයන් මඩනා වූ, ගනාහොත්, රාගාදි උල් උදුරන්නා වූ මේ ආර්යමාර්ගය; අඤ්ඤාය, (අනුශ්‍රවානුමානාදියක් නැතිව) ප්‍රත්‍යක්ෂ ඥානයෙන් ම දැන; මග්ගො, නිවණට පමුණුවන්නා වූ මේ ආර්යමාර්ගය; වෙ, ඒකාන්තයෙන්, මයා, මා විසින්; අක්ඛාතො, කියනලද.

4. තුම්හෙහි, (මහණෙනි දූන්) තොප විසින්; ආතප්පං, (කෙලෙසුන් තවන හෙයින් ආතප්පය යි කියනලද) සම්‍යක්ප්‍රධානවීර්යය;

---

(1) මාරසෙනප්පමද්දනං.

277 5. සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

278 6. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

279 7. සබ්බෙ ධම්මා අනත්තා'ති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

---

කිච්චං, (ඒ ආර්‍ය්‍යමාර්ගාධිගමය පිණිස) කටයුතුයි; තථාගතා, සර්වඥවරයෝ, අක්ඛාතාරො, නිවණට පමුණුවන මග හුදෙක් කියන්නාහුම වෙති; (අත අල්වාගෙණ නිවණට පමුණුවන්නාහු නොවෙති) පටිපන්නා, තථාගතයන් විසින් වදාරණ 1 ලෙස පිළිපන්නා වූ; ඣායිනො, (ආලම්බනොපනිධ්‍යාන-ලක්ෂණොපනිධ්‍යානවශයෙන්) ද්විප්‍රකාර වූ ධ්‍යානයෙන් ධ්‍යායී වූ, හෙවත් සමථවිදර්ශනාභාවනායෙහි නියුක්ත වූ යොගාවචරයෝ; මාරබන්ධනා, ත්‍රෛභූමිකවෘත්තය යි කියනලද මාරබන්ධනයෙන්; පමොක්ඛන්ති, මිදෙන්නාහුයි.

5. සබ්බෙ සඞ්ඛාරා, (කාමභවාදියෙහි උපදවන්නා වූ ස්කන්ධයහ යි කියනලද) සියලු සංස්කාරයෝ; අනිච්චා ඉති, ඒ ඒ භවයෙහි ම ඉපද නස්නාහෙයින් අනිත්‍යය හයි; යදා, යම් කලෙක්හි; පඤ්ඤාය, විදර්ශනාප්‍රඥායෙන්; පස්සති, දකී ද; අථ, එකල්හි; දුක්ඛෙ, මේ ස්කන්ධපරිහරණය යි කියනලද දුක්ඛයෙහි; නිබ්බින්දති, (ශිඛාප්‍රාප්ත වූ ව්‍යුත්ථානගාමිනිවිදර්ශනාවශයෙන්) කලකිරෙන්නේය; (එසේ කලකිරුණේ දුක්ඛපරිඥානාදිවශයෙන් සත්‍යප්‍රතිවේධය කරන්නේය, එහෙයින්) එසො, මේ සංස්කාරයන් කෙරෙහි නිර්වේදය; විසුද්ධියා, නිර්මල බවට, නොහොත්, නිර්වාණයට; මග්ගො, මාර්ගයයි — කාරණය යි සේයි.

6. සබ්බෙ සඞ්ඛාරා, භවත්‍රයපර්‍ය්‍යාපන්න වූ සියලු සංස්කාරධර්මයෝ; දුක්ඛා ඉති, උදයව්‍යයෙන් පෙළෙන හෙයින් දුඃඛය හයි; යදා, යම් කලෙක්හි; පඤ්ඤාය, විදර්ශනාප්‍රඥායෙන්; පස්සති, දකී ද; අථ, එකල්හි; දුක්ඛෙ, මේ ස්කන්ධපරිහරණය යි කියනලද දුක්ඛයෙහි; නිබ්බින්දති, (ශිඛාප්‍රාප්ත වූ ව්‍යුත්ථානගාමිනීවිදර්ශනාවශයෙන්) කලකිරෙන්නේය; (එසේ කලකිරුණේ දුක්ඛපරිඥානාදි වශයෙන් සත්‍යප්‍රතිවේධය කරන්නේය, එහෙයින්) එසො මේ සංස්කාරයන් කෙරෙහි නිර්වේදය; විසුද්ධියා, නිර්මලබවට, නොහොත්, නිර්වාණයට; මග්ගො, මාර්ගයයි — කාරණයයි සේයි.

7. සබ්බෙ ධම්මා, සියලු ධර්මයෝ, හෙවත් නිවන්පණින් සහිත වූ සියලු පස්කඳහු ම; අනත්තා ඉති, තමා වසයෙහි නොපවත්නා

---

1 කියනලද.

280 8. උට්ඨානකාලම්හි අනුට්ඨහානො
යුවා බලී ආලසියං උපෙතො,
සංසන්නසඞ්කප්පමනො කුසීතො
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති.

281 9. වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා,
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං.

---

ලෙහසින් අනාත්මය හයි; යදා, යම් කලෙක්හි; පඤ්ඤාය, විදර්ශනා-ප්‍රඥයෙන්; පස්සති, දකී ද; අථ, එකල්හි; දුක්ඛෙ, මේ ස්කන්ධපරි-හරණය යි කියනලද දුඃඛයෙහි; නිබ්බින්දති, (ශිඛාප්‍රාප්ත වූ ව්‍යුත්ථා-නගාමිනී විදර්ශනාවශයෙන්) කලකිරෙන්නේය; (එසේ කලකිරුණේ දුඃඛපරිජානනාදිවශයෙන් සත්‍යප්‍රතිවේධය කරන්නේය, එහෙ-යින්) එසො, මේ සංස්කාරයන් කෙරෙහි නිර්වේදය; විසුද්ධියා, නිර්මල භාවට, නොහොත්, නිර්වාණයට; මග්ගො, මාර්ගය ... කාරණය යි යෙයි.

8. උට්ඨානකාලම්හි, වීර්‍ය්‍ය කරන්ට සුදුසු වූ කල්හි; අනුට්ඨ-හානො, වීර්‍ය්‍ය නො කරන්නා වූ මහණ තෙම; යුවා, ප්‍රථම යෞවන-යෙහි සිටියේ ද; බලී, කායබලසම්පන්න වූ යේ ද; ආලසියං උපෙතො, ඉදින් ආලස්‍යයෙන් යුක්ත වූ යේ ද, (බඩ පුරා බත් වළඳා පියා කිසි මහණදමක් නො කොට වැදහෝනේ ම වේ ද); සංසන්නසඞ්කප්පමනො, කාමවිතර්කාදිත්‍රිවිධවිතර්කයන් විසින් මනා කොට ම යට ගලන ලද සම්‍යක්සඞ්කල්පනාසිත් ඇති; කුසීතො, කුසීත වූ; අලසො, අලසයා (=ඒ මහ මැළියා); පඤ්ඤාය මග්ගං, ප්‍රඥ-වෙන් දක්කයුතු වූ ආර්‍ය්‍ය මාර්ගය; න වින්දති, නො ලබන්නේය; නොහොත්, පඤ්ඤාය, ලෞකිකලොකොත්තරප්‍රඥවට; මග්ගං, උපා-යයක්; න වින්දති, නො ලබන්නේයි.

9. වාචානුරක්ඛී, (යම් පුද්ගලයෙක් මෘෂාවාදාදිචතුර්විධවාග්දුශ්ච-රිතයන් දුරුකිරීමෙන්)වචසින් රක්නා සුලුවේ ද; මනසා සුසංවුතො, (අභිධ්‍යාදි ත්‍රිවිධමනොදුශ්චරිතයන් දුරුකිරීමෙන්) මනසින් සුසං-වෘත වේ ද (=සුපිහිත වූ මනො ද්වාර ඇත්තේ වේ ද); කායෙන ච අකුසලං න කයිරා, (ප්‍රාණවධාදිත්‍රිවිධකායදුශ්චරිතයන් දුරුකිරී-මෙන්) කයින් අකුසලය නො කරන්නේ වේ ද; එතෙ තයො කම්ම-පථෙ විසොධයෙ, කාය-වාග්-මනඃසඞ්ඛ්‍යාත වූ මේ කර්මපථයන්

282 10. යොගා වෙ ජායතී භූරි අයොගා භූරිසඞ්ඛයො;
එතං ද්වෙධාපථං ඤත්වා භවාය විභවාය ච;
තථත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති.

283 11. වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතී භයං,
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච නිබ්බනා හොථ භික්ඛවො.

284 12. යාවං හි වනථො න ඡිජ්ජති අණුමත්තොපි නරස්ස නාරිසු,
පටිබද්ධමනොව තාව සො වච්ඡො ඛීරපකොව මාතරි.

---

තුන්දෙනා පිරිසිඳ කරන්නේ වේ ද, ඒ පුද්ගල තෙම; ඉසිප්පවෙදිතං, (ශීලස්කන්ධාදිපඤ්චවිධධර්මස්කන්ධයන් එක්තැන් කළා වූ) බුද්ධාදිඍෂිවරයන් විසින් ප්‍රතිවෙධය කරණලද; මග්ගං, ආර්‍ය්‍යමාර්ගය; ආරාධෙය්‍ය, සිද්ධකරන්නේ සි—බුදු-පසේබුදු-මහරහතන් විසින් ප්‍රතිවෙධ කරණලද ආර්‍ය්‍යමාර්ගයට පැමිණෙන්නේය යි යේයි.

10. යොගා, පඨවිකසිණාදි අටතිස් අරමුණෙහි යොනිසොමනසිකාරයෙහි යෙදීම හෙතුකොටගෙණ; වෙ, ඒකාන්තයෙන්; භූරි, ලෞකිකලොකොත්තරප්‍රඥා තොමෝ; ජායති, උපදනීය; අයොගා, උක්තප්‍රකාර භාවනාමනස්කාරයෙහි නො යෙදීම හෙතුකොටගෙණ; භූරිසඞ්ඛයො, ලෞකිකලොකොත්තරප්‍රඥාවගේ විනාශය වෙයි; භවාය විභවාය ච, වැඩපිණිස ද අවැඩ පිණිස ද පවත්නා වූ; එතං ද්වෙධාපථං ඤත්වා, යොගය ද අයොගය ද යන මේ දෙමග දැන; යථා භූරිපවඩ්ඪති, යම්ප්‍රකාරයෙකින් ප්‍රඥාව වඩී ද; තථා, එපරිද්දෙන්; අත්තානං, තමා; නිවෙසෙය්‍ය, යොනිසොමනසිකාරයෙහි පිහිටුවන්නේයි.

11. භික්ඛවෙ, මහණෙනි; වනං ඡින්දථ, රාගාදිකෙලෙස් වනය කපව්; මා රුක්ඛං, (වනය කපව යි කීහෙයින් වැලිත්) රුක් නො කපව්; (කෙලෙස් නැමැති වනය කැපීමෙහි ප්‍රයොජන කිම යත්?) වනතො, රාගාදි කෙලෙස්වනයෙන්; භයං ජායති, ජාතිභයාදි භය උපදනේයි; (යම්සේ පියවිවනයෙන් සිංහාදිභය වේ ද එසේ ම කෙලෙස්වනය නිසා ජාතිභයාදි සියලු භය උපදනේයි, එසේ හෙයින්) වනඤ්ච, භවොත්පත්තිසාධක වූ මහත් කෙලෙස් නැමැති වනය ද; වනථඤ්ච, ප්‍රවෘත්තිවිපාකදායක වූ ස්වල්ප වූ කෙලෙස් නැමැති වනථය ද; නොහොත්, වනඤ්ච, පළමු කොට උපදනා කෙලෙස් නැමැති වනය ද; වනථඤ්ච, පසුව උපදනා කෙලෙස් නැමැති වනථය ද; ඡෙත්වා, අර්හත්මාර්ගඥාන නැමැති ශස්ත්‍රයෙන් කපා; නිබ්බනා හොථ, කෙලෙස්වන රහිතවව්.

12. නරස්ස, පුරුෂයාගේ; නාරිසු, ස්ත්‍රීන් කෙරෙහි; අනුමත්තො අපි, ස්වල්පමාත්‍ර ද වූ; වනථො, කෙලෙස් නැමැති වනථයෙක්,

285 13. උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකංව පාණිනා,
සන්තිමග්ගමෙව බ්‍රෑහය නිබ්බානං සුගතෙන දෙසිතං.

286 14. ඉධ වස්සං වසිස්සාමි ඉධ හෙමන්තගිම්හිසු,
ඉති බාලො විචින්තෙති අන්තරායං න බුජ්ඣති.

287 15. තං පුත්තපසුසම්මත්තං බ්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡති.

---

හෙයින් තෘෂ්ණාලවයෙක්; යාවං හි, යම්තාක්කල්; න ඡිජ්ජති, නො සිඳේ ද; තාව, ඒතාක්කල්; සො, ඒ පුරුෂ තෙම; මාතරි, මව කෙරෙහි ප්‍රෙමයෙන් ඇලුනු; ඛීරපකො වච්ඡො ඉව, කිරිබොන ලමා වස්සෙකු මෙන්, පටිබද්ධමනො ව (හොති,) ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් ඇත්තේ ම වේ.

13. සාරදිකං; වප් හිල් දෙමසෙහි සිටියනලද (ශරත්කාලයෙහි වූ; කුමුදං, කුමුදු මලක්; පාණිනා ඉව, අතින් ගෙණ උදුරන්නාක්හු මෙන්; අත්තනො, තමාගේ; සෙනහං, තෘෂ්ණාසඞ්ඛ්‍යාත වූ ස්නෙහය; උච්ඡින්ද, අර්හත්මාර්ගඥානශස්ත්‍රයෙන් 1 උපුටාපියා (=මුලින් ම සිඳපියා); සන්තිමග්ගමෙව, නිර්වාණයට පමුණුවන්නා වූ අෂ්ටාඞ්ගිකමාර්ගය ම; බ්‍රෑහය, වඩ,(=තාගේ සන්තානයෙහි උපදව); කුමක්හෙයින් ද යත්? නිබ්බාණං, නිර්වාණය; සුගතෙන, තථාගතයා විසින්; දෙසිතං (යම්හෙයකින් ශාන්තය ප්‍රණීතය ශාස්වතය යනාදි විසින්) දෙසනලද ද; එහෙයින් ඒ නිර්වාණට පමුණුවන්නා වූ අෂ්ටාඞ්ගිකමාර්ගය ම උපදව.

14. වස්සං, වර්ෂාරම්භ; ඉධ වසිස්සාමි; (මේ මේ කටයුතු කෙරෙමින් මෙතැනහි ම වෙසෙමි; හෙමන්තගිම්හිසු, හිමන්තාරම්භ ද ග්‍රීෂ්මාරම්භ ද; ඉධ වසිස්සාමි, (මේ මේ කටයුතු කෙරෙමින්) මෙතැන්හි ම වෙසෙමි; ඉති, මෙසේ; බාලො, (මෙලෝ පරලෝ වැඩ නො දන්නා වූ) අඥානපුද්ගල තෙම; විචින්තෙති, නොයෙක් පරිද්දෙන් සිතන්නේයි; අන්තරායං න බුජ්ඣති, (අසෝ කල, අසෝ දා, අසෝතැනදී, අසෝ වයස මියයෙමියි) අතුරෙහි තමහට වන ජීවිතාන්තරාය නො දන්නේයි.

15. පුත්තපසුසම්මත්තං, දරුවන් කරණකොටගෙණ ද ගවමහිෂාදින් කරණකොටගෙණ ද වෙසෙසින් මත් වූ; (හෙයින් මාගේ දරුවෝ රූ ඇත්තෝය, බල ඇත්තෝය, නුවණැත්තෝය, සියලු කටයුත්තෙහි දක්‍ෂයෝය හි මෙසේ දරුවන් නිසා ද; මාගේ ගොන්හු

---

1 හස්තයෙන්.

288 16. න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා,
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා.

289 17. එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො,
නිබ්බාණගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ ති.

මග්ගවග්ගො වීසතිමො.

---

බලසම්පන්නයෝය, නිරෝගීය, බර ඉසිලිය හෙති; මාගේ දෙන්නු අභිරූපයෝය, බොහෝ කිරිඇත්තෝ ය යි මෙසේ ගවයන් නිසා ද) ඉතා මත් වූ; බ්‍යාසත්තමනසං, (නොලද වස්තු පැතීම් වසයෙන් ද ලද වස්තුයෙහි බලවත් ගෙධවසයෙන් ද නොයෙක් පරිද්දෙන් රූපාදිපඤ්චකාමයෙහි) විශේෂයෙන් ලග්න වූ සිත්ඇති; තං නරං, ඒ පුරුෂයා; සුත්තං ගාමං, නිද්‍රාවට පැමිණි සත්වසමූහයා නොහොත්, නිදන්නා වූ ගම් වැසි ජනයා මුහුදට ගෙණ යන්නා වූ; මහොඝො-ඉව, (දෙතුන්යොදුනක පැතිර යන ගැඹුරු) මහවතුරක් මෙන්; මච්චු, මරණ තෙම; ආදය, ගැරගෙණ; ගච්ඡති, යන්නේයි (=අපාය නමැති මහමුහුදට පමුණුවන්නේයි).

16. අන්තකෙන, මරහුවිසින්; අධිපන්නස්ස, මඩනාලද සත්වයාහට; තාණාය, රක්ෂාව පිණිස; පුත්තා, (ද්‍රය පුත්‍රය යන) දරුවෝ; න සන්ති, නොවන්නාහ; පිතා, වැදූ පියා ද; න, රක්ෂාවපිණිස නොවන්නෝය; අපි, වැලි; බන්ධවා, (සෙසු නෑ-මල්-බෑ-බුහුනන්-නෑදිමයිල් ආදී) නෑයෝ ද; න, රක්ෂාව පිණිස නොවන්නාහ, (මෙකියනලද සියල්ලෝ ම සෙසු දවස් බත්-පිළී දීම් ආදියෙන්, කෘෂිවණික්සාමිපාත රාජකාර්‍යාදියටත් නැංවීමෙන් සත්වයාහට උපකාරිව ද මියන වේලෙහි කිසි උපායකිනු දු මරණ වළක්වන්ට අසමර්ථයෙහින් රක්ෂාව පිණිස නො වන්නාහ එහෙයින්;) ඤාතිසු, නෑයන් කෙරෙහි; තාණතා, පිහිටවියයුතුබවෙක්; නත්ථි, නැති.

17. එතං අත්ථවසං ඤත්වා, (මරහු විසින් මඩනාලද සත්වයාහට නෑයන් පිහිට වන්නට අසමර්ථබවය යි කියනලද) මේ කාරණය දැන; පණ්ඩිතො, නුවණැති මහණ තෙම; සීලසංවුතො, චතුපාරිසුද්ධිසීලයෙන් රක්ෂිතගොපිත වූ යේ; නිබ්බාණගමනං මග්ගං, නිවණට යනමග, (අෂ්ටාංගිමග); ඛිප්පමෙව, වහාම; විසොධයෙ, පිරිසිදු කරන්නේයි.

මග්ගවග්ගො වීසතිමො.

290 1. මත්තාසුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං,
චජෙ මත්තාසුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං.

291 2. පරදුක්ඛූපදානෙන අත්තනො සුඛමිච්ඡති,
වෙරසංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චති.

292 3. යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති,
උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා.

---

1. මත්තාසුඛපරිච්චාගා, ස්වල්පමාත්‍ර වූ සුවයක් හැරීම හේතු කොට ගෙණ; චෙ, ඉදින්; විපුලං සුඛං, උදාරවූ නිර්වාණ සුඛය; පස්සෙ, යම් හෙයකින් දක්නේ වේ ද, එහෙයින්; විපුලං සුඛං සම්පස්සං, උදාර වූ නිර්වාණසුඛය දක්නා කැමැත්තා වූ; ධීරො, ප්‍රාඥපුද්ගල තෙම; මත්තාසුඛං චජෙ, ඒ ස්වල්පවූ සුඛය හරණේයි—එක් බත්පැළියක් සරහා අනුභව කරන්නා හට මෙලොව ස්වල්ප වූ යම්සුවයෙක් උපදී ද, ඒ සුවය හැර එදවස් පෙහෙවත්නහුට හෝ දන්දෙන්නහුට හෝ විපුල වූ යම් නිවන් සුවයෙක් ලැබේ ද, ඒ නිවන්සුවය කැමැති පුරුෂ තෙම ස්වල්ප වූ ඒ සුවය දුරු කරන්නේ යයි සේයි.

2. පරදුක්ඛූපදානෙන, (අනුන් මරා තළා අනුන් ගැත්ත කොට ගෙණ මෙසේ) පරහට දුක් දීමෙන්; යො, යම් පුද්ගලයෙක්; අත්තනො, තමහට; සුඛං ඉච්ඡති, සුවකැමැති වේ ද; සො, ඒ පුද්ගල තෙම; වෙරසංසග්ගසංසට්ඨො, (බිණුවහට පෙරලා බිණීමය ගැසුවහට පෙරලා ගැසීමය යනාදි විසින් ඔවුනොවුන්ට කරණලද) වෛරසංසර්ගයෙන් මිශ්‍රවූයේ; වෙරා, වෛරයෙන්; න පරිමුච්චති, නො මිදෙන්නේයි, (වෛරවශයෙන් සතතයෙන් දුකට පැමිණෙන්නේයි).

3. යං හි, යමෙක් තෙම; කිච්චං, මහණුන් විසින් කටයුතු ද, (ගෙවත් අප්‍රමාණ ශීලස්කන්ධගොපනය, අරණ්‍යවාසය, ධුතාඞ්ගපරිහරණය, භාවනාරාමතාය, යනාදි වූ යමෙක් මහණුන් විසින් කටයුතු ද;) තං, ඒ; අපවිද්ධං, යම් කෙණකුන් විසින් හැරපියන ලද ද; අකිච්චං පන, (මහණුන් විසින් නො කටයුතුවූ ශරීරමණ්ඩනය, පාත්‍රචීවරාදිපරිෂ්කාරමණ්ඩනය යන මේ) අකාරිය වන්නාහි; කයිරති, කරණු ලැබේ ද; උන්නළානං, හුවනලද මානනලඇත්; පමත්තානං, ස්මෘතිවිප්‍රවාසයෙන් ප්‍රමාද වූ; තෙසං, ඒ පුද්ගලයන්ට; ආසවා, කාමාශ්‍රවාදිචතුරාශ්‍රවයෝ; වඩ්ඪන්ති, වඩනාහුයි.

293 4. යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතා සති,
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො;
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා.

294 5. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ,
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො.

---

4. යෙසඤ්ච, යම් පුද්ගලකෙනෙකුන් විසින් වනාහි, කායගතාසති, කායගතාසති භාවනා තොමෝ; නිච්චං, සතතයෙන්; සුසමාරද්ධා, මනා කොට වඩනලද ද: කිච්චෙ, මහණුන් විසින් කටයුතු වූ සීලපරිපූරණය, ධුතාඞ්ගපරිහරණය, භාවනාරාමතාය යන මෙහි; සාතච්චකාරිනො, සතතකාරී වූ (=සතතක්‍රියා ඇත්තා වූ); තෙ, ඔහු; අකිච්චං න සෙවන්ති, (ශරීරමණ්ඩන-පරිෂ්කාරමණ්ඩනාදි) අකෘත්‍යය නො සෙවිත්තාහු; සතානං, සිහි ඇත්තා වූ; සම්පජානානං, චතුසම්පජඤ්ඤ වශයෙන් සම්පජානකාරී වූ; තෙසං, ඒ පුද්ගලයන්ට; ආසවා, කාමාශ්‍රවාදිචතුරාශ්‍රවයෝ ම; අත්ථං ගච්ඡන්ති, පරික්ෂයට යන්නාහුයි.

5. මාතරං, තෘෂ්ණා නැමැති මව ද; පිතරං, අස්මිමාන නැමැති පියා ද; ද්වෙ ච ඛත්තියෙ රාජානො ච, ශාශ්වතදෘෂ්ටිය උච්ඡෙදදෘෂ්ටිය යන ක්ෂත්‍රිය රජුන් දෙදෙනා ද; හන්ත්වා, අර්හත්මාර්ගඥාන නැමැති ඛඞ්ගයෙන් නසා; සානුචරං, නන්දිරාගය යි කියනලද අයකැමියා හා සහිත වූ; රට්ඨං, ද්වාදශායතනය යි කියනලද රටත්; හන්ත්වා, අර්හත්මාර්ගඥාන නැමැති ඛඞ්ගයෙන් නසා; බ්‍රාහ්මණො, බාහිතපාපී වූ ක්ෂීණාශ්‍රව තෙම; අනීඝො යාති, නිදුක් ව නිවන්පුරයට යන්නේ යි. මෙහි "තණ්හා ජනෙති පුරිසං" යි වදාළ හෙයින් භවත්‍රයෙහි සත්වයන් උපදවන හෙයින් තෘෂ්ණා තොමෝ මවු නම් වුව, අසෝ රජහුගේ අසෝ රාජාමාත්‍යයාගේ පුත්‍රයෙමියි පියා නිසා පුත්‍රට මානය උපදනා හෙයින් නවවිධ වූ අස්මිමානය පියා නම් විය, සිඟලු ලෝ වැස්සා රජහු භජනයකරන්නා මෙන් සියලු දෘෂ්ටීහු තාක් ශාස්වතෝච්ඡෙදදෘෂ්ටීන් දෙදෙනා භජනය කෙරෙත් නුයි ශාශ්වතොච්ඡෙද දෘෂ්ටීන් දෙදෙනා ක්ෂත්‍රිය රජුන් දෙදෙනෙක් නම් වූහ, චක්ඛායතනාදි දොළොස් ආයතනයෝ පතළ අර්ථයෙන් රටක් වැනි හෙයින් රට නම් වූහ. ඔවුන් නිසා පවත්නා වූ නන්දිරාගය රටින් අය නගණ අය කැමියකු වැනි හෙයින් අනුචර නම් වියයි දතයුතු.

6. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච සොත්ථියෙ,
වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො.

7. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතා සති.

8. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතා සති.

9. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතා සති.

---

6. මාතරං, තෘෂ්ණා නැමැති මව ද; පිතරං, අස්මිමාන නැමැති පියා ද; ද්වෙ ච සොත්ථියෙ රාජානො, ශාස්වතදෘෂ්ටිය උච්ඡෙදදෘෂ්ටිය යන බ්‍රාහ්මණ රජුන්දෙදෙනා ද; හන්ත්වා, අග්‍රමාර්ගඥාන නැමැති ඛඩ්ගයෙන් නසා; වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා, විචිකිත්සානිවරණය පස්වනු කොට ඇති කාමච්ඡන්දාදිනීවරණපඤ්චකය අග්‍රමාර්ගඥාන නැමැති ඛඩ්ගයෙන් සිටි නැති කොට නසා; බ්‍රාහ්මණො, බාහිතපාපී වූ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙම; අනීඝො යාති, නිදුක්ව නිවන්පුරට යන්නේයි. මෙහි ව්‍යාඝ්‍රසඤ්චාර ඇති භය සහිත වූ නො බැස්සහැකි වූ මග වෙය්‍යග්ඝ නම් වෙයි, විචිකිත්සානීවරණය ද ඒ හා සදෘශහෙයින් වෙය්‍යග්ඝ නම් වෙයි, ඒ වෙය්‍යග්ඝ පස්වනු වූයේ මේ කාමච්ඡන්දාදියට නුයි කාමච්ඡන්දාදිනීවරණපඤ්චකය වෙය්‍යග්ඝපඤ්චම නම් වේ.

7. යෙසං, යම් තථාගතශ්‍රාවකකෙනෙකුන්ට; දිවා ච, දිවාභාගයෙහි ද; රත්තො ච, රාත්‍රිභාගයෙහි ද; නිච්චං, සතතයෙන්; බුද්ධගතාසති, ("ඉතිපි සො භගවා අරහං" යනාදි වූ ප්‍රභෙදඇති) බුදුගුණ අරබයා උපදනා වූ සති තොමෝ ඇද්ද; ගොතමසාවකා, ගෞතමගොත්‍ර ඇති බුදුන්ගේ ඒ ශ්‍රාවකයෝ; සදා, හැමකල්හි ම; සුප්පබුද්ධං පබුජ්ඣන්ති, (බුදුගුණ සිතින් සලකාගෙණ ම නිද පුබුදිනා හෙයින්) සුප්‍රබුද්ධ ව පුබුදිනාහු යි. යෙහෙන් නිද යෙහෙන් පුබුදිනාහ යි සේයි.

මතු කියන ගාථා පසෙහි ද වෙනස් පදය තබා සෙසු පදයෙහි අර්ථ මෙම නයින් දතයුතු.

8. ධම්මගතාසති, ("ස්වාක්ඛාතො භගවතා ධම්මො" යනාදී වූ ප්‍රභෙද ඇති) සපර්‍යාප්තිකනවලොකොත්තරධර්මය අරබයා උපදනා සති තොමෝ ඇද්ද.

9. සඞ්ඝගතාසති, ("සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො" යනාදි වූ ප්‍රභෙද ඇති) සඞ්ඝගුණය අරබයා උපන් සති තොමෝ ඇද්ද.

299 **10. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති.**

300 **11. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො.**

30 **12. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,**
**යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො.**

302 **13. දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා,**
**දුක්ඛො 'සමානසංවාසො දුක්ඛානුපතිතද්ධගූ,**
**තස්මා න චද්ධගූ සියා දුක්ඛානුපතිතො සියා.**

---

10. කායගතාසති, (ද්වත්තිංසාකාරවසයෙන් හෝ නවසීවථිකා වසයෙන් හෝ චතුධාතුවවත්ථානවසයෙන් හෝ අජ්ඣත්තනීල-කසිනාදිරූපධ්‍යානවශ්යෙන් හෝ) කය අරබයා උපදනා සති තොමෝ ඇද්ද.

11. යෙසං, යම් තථාගතශ්‍රාවකකෙනෙකුන්ගේ; මනො, සිත; දිවා ච, දිවාභාගයෙහි ද; රත්තො ච, රාත්‍රිභාගයෙහි ද; නිච්චං, සතතයෙන්; අහිංසාය රතො,("සො කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති" යනාදි නයින් කියනලද) කරුණා භාවනාවෙහි ඇලිනී ද; තෙ ගොතමසාවකා, ගෞතමගොත්‍ර ඇති බුදුන්ගේ ඒ ශ්‍රාවකයෝ; සදා, හැමකල්හි ම; සුප්පබුද්ධං පබුජ්ඣන්ති, (කරුණාභාවනා සිතින් ගෙණ නිදා එම සිතින් ගෙණ පුබුදිනා හෙයින්) සුප්‍රබුද්ධ ව පුබුදිනාහුයි ... යෙහෙන් නිදා යෙහෙන් පුබුදිනාහු යි සේයි.

12. යෙසං, යම් තථාගතශ්‍රාවක කෙනෙකුන්ගේ; මනො, සිත; දිවා ච, දිවාභාගයෙහි ද; රත්තො ච, රාත්‍රිභාගයෙහි ද; නිච්චං, සතතයෙන්; භාවනාය රතො, මෛත්‍රිභාවනාවෙහි ඇලිනී ද; තෙ ගොතමසාවකා, ගෞතමගොත්‍ර ඇති බුදුන්ගේ ඒ ශ්‍රාවකයෝ; සදා, හැමකල්හි ම; සුප්පබුද්ධං පබුජ්ඣන්ති, (මෛත්‍රිභාවනාව සිතින්ගෙණ නිදා එම සිතින් ගෙණ පුබුදිනාහෙයින්) සුප්‍රබුද්ධ ව පුබුදිනාහුයි ... යෙහෙන් නිදා යෙහෙන් පුබුදිනාහු යි සේයි.

13. දුප්පබ්බජ්ජං, (මද වූ හෝ බොහෝ වූ හෝ භොගසම්පත්ති-ය ද බන්ධුජනයා ද හැරපියා මේ බුදුසස්නෙහි [illegible]දී) මහණවීම දුක, හෙවත් උගහටය; දුරභිරමං, (එසේ පැවිදි වූ වහු විසිනු ද භික්ෂා චර්‍ය්‍යාවෙන් ජීවිතවෘත්තිය පවත්වමින් අපරිමාණ වූ ශීලස්කන්ධය රක්ෂාකිරීමෙන් ධර්මානුධර්මප්‍රතිපත්තිපූරණවශයෙන්) ශාසනයෙහි සිත ඇලවීම දුක (උගහට ය); ඝරා, ගෘහයෝ; දුරාවාසා, දුක් වූ වාස

303 **14. සද්ධො සීලෙන සම්පන්නො යසො භොගසමප්පිතො,**
**යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතො.**

304 **15. දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තො'ව පබ්බතො,**
**අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථා සරා.**

---

ඇත්තාහ(=වසන්නට නො පිළිවන්හ); (යම් හෙයකින් ගිහිගෙයි, වසන්නහු විසින් රාජකාරිය කටයුතු ද, නමහට ඉසුරු ව සිටිය වුන්ට කළමනා කාරිය කටයුතු ද, පරිජනයාහට ද ධාර්මික ශ්‍රමණබ්‍රාහ්මණයන්ට ද සංග්‍රහකටයුතු ද, එසේ කල්හි ගෘහවාසය සිල්කලයක් මෙන් ද මහමුහුද මෙන් ද නො පිරිය හැකි ද, එහෙයින් ම) දුක්ඛා, ගෘහවාසයෝ දුක්හ (උගහටයහ); අසමාන සංවාසො,(ජාති ගොත්‍ර කුල භොගාදියෙන් සමානව ද තෝ කවරෙක්හි ද මම කවරෙකිම් දැයි යනාදීන් බැණ විවාදකරණසුලු ගිහිය, සීලාචාරබාහුසච්චාදියෙන් සමානව ද තෝ කවරෙක්හි ද මම කවරෙකිම් ද යනාදීන් බැණ විවාදකරණ සුලු වූ ප්‍රව්‍රජිතයෝය යන මේ) අසමාන වූ අදහස් ඇත්තවුන් හා එක් ව විසීම; දුක්ඛා, දුක (උගහටය); අඩගූ, යම් කෙනෙක් සසරවට නැමැති අදන්මගට පැමිණියෝ ද; දුක්ඛානුපතිතා, ඔහු ඒ සංසාරදුක්ඛයා විසින් අනුව යන ලද්දාහු නම් වෙති; තස්මා, ඒ කාරණයෙන්; අඩගූ නව සියා, සසර නැමැති අදන්මගට නො පැමිණෙන්නේය; දුක්ඛානුපතිතො නව සියා, ඒ සංසාරදුක්ඛයා විසින් අනුව යනලද්දේ නො ද වන්නේසි.

14. සද්ධො,(රත්නත්‍රය ඇදහීම ලක්ෂණකොට ඇත්තා වූ ද කර්මඵල හැදහීම ලක්ෂණ කොට ඇත්තා වූ ද) ලෞකිකලොකොත්තරශ්‍රද්ධාවෙන් සමන්විත වූ; සීලෙන සම්පන්නො, අගාරිකශීලයෙන් සමන්විත වූ; යසොභොගසමප්පිතො, (අනාථපිණ්ඩිකාදීන්ගේ පිරිවර බඳු වූ) අගාරිකයසසින් ද (ධනධාන්‍යය සප්තවිධ වූ ආයසීධනය යන මේ) විවිධ භොගසම්පත්තීන් ද යුක්ත වූ කුලපුත්‍ර තෙම; යං යං පදෙසං භජති, (පූර්විදිග්ආදීන් අතුරෙන්) යම් යම් ප්‍රදෙශයකට එළඹියේ වේ ද; තත්ථ තත්ථෙව, ඒ ඒ තන්හි ම; පූජිතො, (දිව්‍යමනුෂ්‍යයන් විසින් නොයෙක් පඬුරු එලවීමෙන් මහත් ලාභසත්කාරයෙන්) පුදනුලබන්නේසි.

සන්තො, (පූර්වබුද්ධවරයන් කෙරෙහි දානසීලාදිවසයෙන් කෘතාධිකාර වූ උත්සන්නකුශලමූලයන් ඇති භාවිත වූ භාවනා ඇති) සාධුහු; දූරෙ, දුරසිටියාහු ද; හිමවන්තො පබ්බතො ඉව, (තුන්දහසක් යොදුන් අයම්විතර ඇති පන්සියයක් යොදුන්

305 16. එකාසනං එකසෙය්‍යං එකො චරමතන්දිතො,
එකො දමයමත්තානං වනන්තෙ රමිතො සියාති.

**පකිණ්ණකවග්ගො එකවීසතිමො.**

---

306 1. අභූතවාදී නිරයං උපෙති යො වාපි කත්වා න කරොමීති චාහ,
උභොපි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා මනුජා පරත්ථ.

---

උස ඇති සුවාසූදහසක් කුළින් සැදුම්ලද) හිමාලයපර්වතය මෙන්; පකාසෙන්ති, බුදුනුවනට ප්‍රකට වෙති, (=පහළ වෙති); එත්ථ, මේ ලොකයෙහි; අසන්තො, (මෙලොව ම ගුරුකොට සිතන්නාවූ හළුවා වූ පරලොව ඇති පුත්‍රගෙධයෙන් යුක්ත වූ ජීවිකාර්ථී ව පැවැදි වූ) බාල පුද්ගලයෝ; රත්තිඛිත්තා සරා යථා, චතුරඞ්ග-සමන්විතසන්‍ධකාරරාත්‍රියෙහි වල විදි සැරයක් මෙන්; නදිස්ස-න්ති, නො පෙණෙන්නාහුයි ෴ එබඳු වූ පූර්ව හෙතුවක් නැති හෙයින් බුදුන්ගේ දකුණු දනමඬල සමීපයෙහි උන්නාහු ද බුදු නුවනට හමුනොවන්නාහයි සේයි.

16. එකාසනං, හුදකලා ඉඳීම සෙව්නේය, (ගණසඞ්ගණිකාවෙන් දුරුව ද කෙලශසඞ්ගණිකාවෙන් දුරුනු වූ ව හොත් හුදකලා උන්නා නම් නො වෙයි, භික්‍ෂූන් දහසක් මැද ද මූලකර්මස්ථානය නො හැර එම මනස්කාරයෙන් යුක්ත ව හුන්නහුගේ හිඳීම එකාසන නම් වෙයි, එසේ වූ එකාසනය සෙව්නේයි); එකසෙය්‍යං, හුදකලා හෙවීම සෙව්නේයි, (ගණසඞ්ගණිකාවෙන් දුරු ව ද කෙලශසඞ්ගණිකාවෙන් දුරුනු වූව හොත් හුදකලා හොත්තා නම් නො වෙයි, ලෝවාමහපාය වැනි මහපායක ද භික්‍ෂූන් දහසක් මැද පණවනලද විසිතුරු පසතුරුණු කන්වයින් ඇති මාහැඟි යහන්හි සිහි එලවා දකුණැලයෙන් මූලකර්මස්ථානයෙන් යෙදී ගොත්තහුගේ සෙය්‍යාව එකසෙය්‍යා නම් වෙයි, එසේ වූ එකසෙය්‍යාව සෙව්නේය); අතන්දිතො, ජඞ්ඝාබලයෙන් පිඬුසිඟා ජීවත් වන බැවින් අකුසිත වූ; එකො චරං, සතර ඉරියව්වෙහි ම හුදකලා ව පවත්මින්; අත්තානං, තමා; එකො දමයං, (රාත්‍රිස්ථානදිවාස්ථානාදියෙහි කර්මස්ථානයෙහි යෙදී) හුදකලාව ම තමා දමන්නාවූ මහණතෙම; වනන්තෙ රමිතො සියා, ස්ත්‍රීපුරුෂශබ්දාදියෙන් විවික්ත වූ ගැඹුරු වල්හි ම අභිරතවන්නේයි (=ඇලෙන්නේයි) ෴ හුදකලාව වැස මුත් ආකීර්ණවිහාරිව තමා දමන්නට නො පිළිවන්නැයි සේයි.

**පකිණ්ණකවග්ගො එකවීසතිමො.**

---

අභූතවාදී, (මෙරමාගේ දෙෂයක් නො දැක නො අසා ම පරහට අභ්‍යාඛ්‍යානය පිණිස නො කී නො කළ දෙය කී කළහයි)

307 2. කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ.

308 3. සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො,
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො.

309 4. චත්තාරි ඨානානි නරො පමත්තො ආපජ්ජති පරදාරූපසෙවී,
අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං නින්දං තතීයං නිරයං චතුත්ථං.

---

බොරු කියන පුද්ගල තෙම; නිරයං උපෙති, නරකයට යන්නේයි; අපි, නැවත; යො, යමෙක්; කත්වා, පව්කම් කොට; න කරොමීති චාහ, නො කෙළෙමියි කියා ද; (හෙද නරකයට යන්නේය) නිහීනකම්මා, ලාමක වූ ක්‍රියා ඇති; තෙ උභොපි මනුජා, ඒ මිනිස්සු දෙදෙන ම; පෙච්ච, මෙයින් මිය; පරත්‍ථ, පරලොව දී; සමා භවන්ති, නරකයෙහි උත්පත්තිය හෙතුකොටගෙණ ගති වශයෙන් සමවන්නාහුයි.— ගති වශයෙන් මේ දෙදෙන සමවුව ද විපාකානුභවනවසයෙන් වෙනස ඇති බැවින් යමක්හු විසින් බොහෝ පව්කම් කරණලද්දේ වී නම් බොහෝ කලක් නරකයෙහි පැසෙයි, යමක්හු විසින් මදපවක් කරණලද්දේ වී නම් ඒ මද කලක් පැසෙයි යනු මොවුන්ගේ වෙනසයි.

2. කාසාවකණ්ඨා, කෂායවස්ත්‍රයෙන් වෙළනලද ග්‍රීවා ඇති, හෙවත් දසරුවෙහි ලූ කසාකඩ ඇති; පාපධම්මා, (මිහණපිළිවෙත නොසේදුනු හෙයින්) ලාමකස්වභාව ඇති; අසඤ්ඤතා, කායවාක්සංයමරහිත වූ පුද්ගලයෝ; බහවො, බොහෝ වූය; තෙ පාපා, ඒ ලාමකපුද්ගලයෝ; පාපෙහි කම්මෙහි, තමා විසින් කරණලද පාපකර්මයෙන්; නිරයං, නරකයෙහි; උපපජ්ජරෙ, උපදනාහුයි.

3. දුස්සීලො, හීනශීලහෙයින් සිල්නැත්තා වූ; අසඤ්ඤතො, කාය වාක් සංයමරහිත වූ පුද්ගල තෙම; රට්ඨපිණ්ඩං, රටවැසියන් විසින් සැදැහැයෙන් දෙනලද අහර; චෙ, ඉදින්; භුඤ්ජෙය්‍ය, (මමත් ශ්‍රමණයෙමියි ප්‍රතිඥා කොට) වළඳන්නේ වේද; (එයට වඩා) තත්තො, දිලිසුනා වූ; අග්ගිසිඛූපමො, ගිනිසුලක් වැනි වූ; අයොගුළො, යවට; භුත්තො වළඳනලද්දේ; සෙය්‍යො, උත්තමයි.— කුමක් හෙයින් ද යත්? ලෝගුල ගිලූ පසයෙන් එකාම අත්බැවක දන්නේය, දුස්සීලයා ශ්‍රද්ධාදෙය වූ අහර වළඳා නොයෙක් ජාතිසතසහස්‍රයෙහි නරකයෙහි පැසෙන්නේය එහෙයිනි.

4. පරදාරූපසෙවී, පරසත්‍රීන් සෙවනය කරණ සුලු වූ; පමත්තො නරො, ප්‍රමාදශීලී වූ පුරුෂ තෙම; අපුඤ්ඤලාභං, පළමු වන වූ

310 5. අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා
භීතස්ස භීතාය රතී ච ථොකිකා,
රාජා ච දණ්ඩං ගරුකං පණෙති
තස්මා නරො පරදාරං න සෙවෙ.

311 6. කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති;
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති.

312 7. යංකිඤ්චි සිථිලං කම්මං සංකිලිට්ඨඤ්ච යං වතං,
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං.

---

අකුශලප්‍රතිලාභය ද; න නිකාමසෙය්‍යං, දෙවන වූ නිකාමසෙය්‍යාව නොලැබීම ද හෙවත් කැමති පරිද්දෙන් වැදහෙවීම නො ලදින් ස්වල්ප වූ මදකලක් වැදහෙවීම ද; තතියං, තුන්වන වූ; නින්දං, මෙලොව ලබන නින්දාව ද; චතුත්ථං, සතරවන වූ; නිරයං, අපුණ්‍යප්‍රතිලාභයෙන් සිද්ධවන්නා වූ නරකොත්පත්තිය දයත; චත්තාරි ඨානානි, මේ දුක්ඛකාරණයන් සතරදෙනාට; ආපජ්ජති, පැමිණෙන්නේයි.

5. අපුඤ්ඤලාභො ච, (මෙකී පරිද්දෙන් ඒ පුරුෂයාහට) මේ අකුශල ප්‍රතිලාභය ද; පාපිකා ච ගති, (ඒ අකුශල ප්‍රතිලාභයෙන් සිද්ධවන්නා වූ) නරකොත්පත්තිසඞ්ඛ්‍යාත වූ ලාමකගතියද යම් හෙයකින් වේ ද; භීතස්ස, භයපත් වූ පුරුෂයාගේ; භීතාය, භයපත් වූ ස්ත්‍රිය හා සමග සංසර්ගයෙන් උපදනා වූ; රතී ච, කාමරතිය ද; ථොකිකා, (සිත් සේ පවත්නට නො පිළිවන් බැවින්) ස්වල්ප වන්නීය; රාජා ච, රජ ද; ගරුකං දණ්ඩං පණෙති, (යම් හෙයකින් අත් පා කැපීම් ආදි වසයෙන්) ගරු වූ දණ්ඩනය යොදන්නේද; තස්මා, ඒ කාරණයෙන්; නරො, පුරුෂ තෙම; පරදාරං න සෙවෙ, පරස්ත්‍රීසෙවනය නො කරන්නේයි.

6. කුසො, යම් කිසි කරතණයෙක්; දුග්ගහීතො, වරදවා ගන්නාලද්දේ හෙවත් නො පිටට අදනාලද්දේ; හත්ථමෙව, ගත් අතම; යථා අනුකන්තති, යම් සේ කපා ද, එපරිද්දෙන් ම; සාමඤ්ඤං, ශ්‍රමණභාවය ද හෙවත් මහණ දම ද; දුප්පරාමට්ඨං, ඛණ්ඩ සීලාදිවසයෙන් වරදවා ගන්නාලද්දේ; නිරයාය, නරකයට; උපකඩ්ඪති, අදනේයි—ඔහු නරකයෙහි උපදවන්නේයයි සේයි.

7. සිථිලං, පසුබැස බැස සිථිල කොට කරණලද; යං කිඤ්චි කම්මං, යම්කිසි කුශලකර්මයෙක් ඇද්ද; සඞ්කිලිට්ඨං, වෙශ්‍යාවීථිආදි අගොචරයෙහි හැසිරීමෙන් සකිලිටු වූ; යං වතං, ශීලසඞ්ඛ්‍යාත වූ

313 8. කයිරා චෙ 1 කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ,
සිථිලො හි පරිබ්බාජො භිය්‍යො ආකිරතෙ රජං.

314 9. අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං,
කතඤ්ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පති.

---

යම් ව්‍රතයෙක් ඇද්ද; නොහොත්, සඞ්කිලිට්ඨං, ඉච්ඡාවෙන් මඩනා ලදුව මේ නිසා ලොකයා මට සම්භාවනා කෙරෙතියි ලාභාසාවෙන් කරණහෙයින් සකිලුටු වූ; යං වතං, ආරණ්‍යකාදි යම් ධුතාඞ්ග ව්‍රතයෙක් ඇද්ද; සඞ්කස්සරං, ශඞ්කාවෙන් යුක්ත ව හැසිරියයුතු වූ; හෙවත් (බොහෝපවුරුණු ආදිය පිණිස රැස් වූ සඞ්ඝයා දැක එකාන්තයෙන් මොහු මාගේ හසර දැන මට උත්ක්ෂෙපණීය කම් කරන්නට රැස්වූවහ යි මෙසේ)තමා විසින් ශඞ්කාවෙන් යුක්ත ව ඇවිද්ද යුතු වූ ද (යම්කිසිවක්හු විසින් විහාරයෙහිදී කරණලද අනාචාරයක් දැක මේ අනාචාරය කෙළේ වූ කලි මේ මහණය යි මෙසේ) අනුන් විසින් සැකකටයුතු වූ ද පැවතුම් ඇති හෙයින් ශඞ්කාවෙන් යුක්ත ව හැසිරියයුතු වූ; යං බ්‍රහ්මචරියං, යම් මහණ දමෙක් ඇද්ද; තං, ඒ සියල්ල; මහප්ඵලං න හොති, (ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිවිපාකවශයෙන්) මහත්ඵල ඇත්තේ නොවේ.

8. චෙ, ඉදින්; කයිරා, යම් කුශලකර්මයක් කරන්නේ වී නම්; කයිරාථ, ඒ කරන්නේ මය; එතං, ඒ කුශලකර්මය ද; දළ්හං, තර කොට ම; පරක්කමෙ, අවස්ථිත වූ සමාදන ඇති ව ම කරන්නේය; කුමක් හෙයින් ද යත්? හි, යම්හෙයකින්; සිථිලො, ඛණ්ඩාදි භාවයට පමුණුවනලද; පරිබ්බාජො, ශ්‍රමණධර්මය; භිය්‍යො, වඩාලා ම; (=බොහෝ කොට ම;) රජං, රාගාදිරජස; ආකිරතෙ, ඔහුගේ සන්තානයෙහි වත්කරන්නේ වේ ද එහෙයිනි.

9. දුක්කතං, සාවද්‍ය වූ දුඃඛවිපාක වූ අකුශලකර්මය; අකතං, නො කරණලද්දේ ම; සෙය්‍යො, උත්තම යි; කුමක් හෙයින් ද යත්? දුක්කතං, අකුශලකර්මය තෙම; පච්ඡා තපති, පසුව සිහි කළවිටක් පාසා මෙලොව උපදනා විපිළිසර තැවිල්ලෙන් ද පරලොව අපායතැවිල්ලෙන් ද තවන්නේය එහෙයිනි; යං කත්වා, යම් කර්මයක් කොට; පච්ඡා, පසුව; න අනුතප්පති, මෙලොව ද පරලොව ද නො තැවේ ද; සුකතං, එසේ වූ කුශලකර්මය; කතං, කරණලද්දේ; සෙය්‍යො, උත්තමයි.

---

1 කයිරචෙ.

315 **10.** **නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං,**
**එවං ගොපෙථ අත්තානං ඛණො වෙ මා උපච්චගා,**
**ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා.**

316 **11.** **අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ,**
**මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.**

317 **12.** **අභයෙ ච භයදස්සිනො භයෙ ච අභයදස්සිනො,**
**මිච්ඡාදිට්ඨිසමාදානා සත්තාගච්ඡන්ති දුග්ගතිං.**

---

10. පච්චන්තං, ප්‍රත්‍යන්තයෙහි වූ; හෙවත් රට කෙළවර පිහිටි; සන්තරබාහිරං, ප්‍රාකාරාදිය තර කිරීමෙන් ඇතුළත හා සහිත කොට දොරටුඅටලුපදනම්අගලආදි තරකිරීමෙන් පිටත සහිත කොට හෙවත් ඇතුළතින් පිටතින්; ගුත්තං, සොරුන් නො වැද්දහැකි සේ රක්නාලද; නගරං, නුවරෙක්; යථා, යම්සේ ද; එවං, එපරිද්දෙන් ම; අත්තානං, ආත්මය, හෙවත් තොප- ගේ සිත; ගොපෙථ, රක්කු, හෙවත් (චක්ෂුරාදි සදොර පියාලා සිහිනැමැති දොරටුගොව්වා එලවා සිටුවාලා) බාහිරායතනයන් සදෙනා විසින් අධ්‍යාත්මිකායතනයන් සදෙනාහට උපඝාතන- යක් නො වනලෙස සකස් කොට සිත රක්කු; හි, යම්හෙයකින්; ඛණාතීතා, බුද්ධොත්පාදක්ෂණය ඉක්මුණාහු; නිරයම්හි සමප්පිතා, නරකයෙහි ඉපද; සොචන්ති, බොහෝකලක් සොකකෙරෙද්ද එහෙයිනි; ඛණො, අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්ත වූ පරම දුර්ලභ වූ බුද්ධොත්පාදක්ෂණය තෙම; වෙ, එකාන්තයෙන්; මා උපච්චගා, නගමක් ඉක්මේවා.

11. අලජ්ජිතායෙ ලජ්ජන්ති, (භික්ෂාභාජනයෙහි රජස් වගුලේ ඒ නම් සියුම් සියුම් ප්‍රාණීන් දිවි නැසුවා නම් වම්හ යි පාපයෙහි ලජ්ජාවෙන් භික්ෂාභාජනය වසාගෙණ ඇවිදිනා ආජීවකයන් මෙන්) ලජ්ජා නො කටයුතු තන්හි යමෙක් ලජ්ජා කෙරෙද්ද; ලජ්ජිතායෙ න ලජ්ජරෙ, (ලජ්ජාස්ථානය වැසුමෝ නම් අපගේ තපස් බිඳියන්නාහයි පාපයෙහි ලජ්ජාවෙන් රහස්පියස නො වසා ඇවිදිනා නිගණ්ඨයන් මෙන්) යමෙක් ලජ්ජා කටයුතු තන්හි ලජ්ජා නො කෙරෙද්ද; මිච්ඡාදිට්ඨිසමාදානා, (ලජ්ජා නො කළ- මනා තන්හි ලජ්ජාකිරීමය ලජ්ජා කටයුතු තන්හි ලජ්ජා නො කිරීමය යන ඉම්) තුච්ඡ වූ (විපරීත වූ) දෘෂ්ටිය ගෙණ වසන්නාවූ; සත්තා, අඥානසත්ත්වයෝ; දුග්ගතිං ගච්ඡන්ති, නරකාදිසතර අපායට යන්නාහුයි.

12. අභයෙ ච භයදස්සිනො,(රජස් නම් ප්‍රාණීහුය, ඉදින් භික්ෂා- භාජනයෙහි රජස් වගුලේ ඒ නම් සියුම් ප්‍රාණීන් දිවි නැසුවා නම්

318 **13. අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙ චාවජ්ජදස්සිනො,**
**මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.**

319 **14. වජ්ජඤ්ච වජ්ජතො ඤත්වා අවජ්ජඤ්ච අවජ්ජතො,**
**සම්මාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති සුග්ගතින්ති.**

**නිරයවග්ගො මාවීසතිමො.**

---

320 **1. අහං නාගො'ව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං,**
**අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො.**

---

වම්හයි පාපයෙහි භයින් භික්ෂාභාජනය වසාගෙණ ඇවිදිනා ආජීවකයන් මෙන්) භය නො කළමනා තන්හි භය දක්නා සුළුවූ; භයෙච අභයදස්සිනො, (ලජ්ජාස්ථානය ඉදින් වැසුමෝ නම් අපගේ තපස් බිඳී යන්නාහයි පාපයෙහි භයින් රහස්පියස නො වසා ඇවිදිනා නිගණ්ඨයන් මෙන්) භය කළමනා තන්හි අභය දක්නා සුළු වූ; මිච්ඡාදිට්ඨි සමාදානා, මෙසේ තුච්ඡ වූ විපරිත වූ දෘෂ්ටිය ගෙණ වසන්නා වූ; සත්තා, අඥානසත්වයෝ; දුග්ගතිං ගච්ඡන්ති, නරකාදි වූ දුගීතීයට යන්නාහුයි.

13. අවජ්ජෙ, (දශවස්තුක වූ සම්‍යග්දෘෂ්ටිය ඒ සම්‍යග්දෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මය යන මේ) නිරවද්‍යයෙහි; වජ්ජමතිනො, මේ සාවද්‍ය යන බුඞි ඇත්තා වූ ද; වජ්ජෙ ච, (දශවස්තුක වූ මිථ්‍යාදෘෂ්ටිය ඒ මිථ්‍යාදෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මය යන මේ) සාවද්‍යයෙහි; අවජ්ජදස්සිනො, නිරවද්‍යය යි දක්නා සුළු වූ; මිච්ඡාදිට්ඨිසමාදානා, මෙසේ තුච්ඡ වූ විපරීතදෘෂ්ටිය ගෙණ වසන්නා වූ; සත්තා, අඥානසත්වයෝ; දුග්ගතිං ගච්ඡන්ති, නරකාදි දුගතියට යන්නාහු යි.

14. වජ්ජඤ්ච වජ්ජතො ඤත්වා, (දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය ඒ මිථ්‍යාදෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මය යන මේ) වරද වරද හෙයින් දැන; අවජ්ජඤ්ච අවජ්ජතො, (දශවස්තුකාවූ සම්‍යග්දෘෂ්ටිය ඒ සම්‍යග්දෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මය යන මේ) නිරවද්‍යය නිරවද්‍ය හෙයින්; ඤත්වා, දැන; සම්මාදිට්ඨිසමාදානා, මිථ්‍යාදෘෂ්ටිය හැර සම්‍යග්දෘෂ්ටිය මනා කොට ගන්නා වූ; සත්තා, නුවනැති සත්වයෝ සුගතිං ගච්ඡන්ති, දිව්‍යමනුෂ්‍යලොකය යි කියනලද සුගතියට යන්නාහුයි.

**නිරයවග්ගො මාවීසතිමො.**

---

1. හි, යම්හෙයකින්; බහුජ්ජනො, මේ ලෞකිකමහාජන තෙම; දුස්සීලො, දුස්සීල ද, (=සීලසංවරයක් නැත්තේ ද), එහෙ

321 **2. දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති,**
**දන්තො සෙට්ඨො මනුස්සෙසු යො'තිවාක්‍යං තිතික්ඛති.**

322 **3. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,**
**කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරං.**

323 **4. නහි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං.**
**යථාත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති.**

---

සින්; සඞ්ගාමෙ, යුද්ධභූමියෙහි; චාපාතො පතිතං සරං, දුන්නෙන් මුක්ත ව අවුත් තමා ඇඟ හුනු ශර තාක් ඉවසන්නා වූ; නාගො ඉව, සඞ්ග්‍රාමාවචර වූ සුශික්ෂිත ඇතකු මෙන්; අහං, මම; අතිවාක්‍යං, (බොහෝදෙනා විසින් අෂ්ටානාර්‍ය්‍යව්‍යවහාරවශයෙන් බණනලද) පරුෂවචන තාක්; තිතික්ඛිස්සං, ඉවසම් හෙවත් ක්‍ෂමා කෙරෙම්.

2. දන්තං, දමුනු ඇතකු අසකු ම; සමිතිං, (දියකෙළි උයන් කෙළි ආදියෙහි) බොහෝදෙනා රැස් වූ තැනට; නයන්ති, රථා-දියෙහි යොදා පමුණුවන්නාහ; රාජා, රජද; දන්තං, දමුනු ඇතකු අසකුට ම; අභිරූහති, නැගෙන්නේය (එහෙයින්) යො, යමෙක් තෙම; අතිවාක්‍යං, අනුන් බිණූ පරුෂ් තෙපුල්; තිතික්ඛති, ඉවසා ද, (=ක්‍ෂමා කෙරේ ද); සො, හෙතෙම; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; සෙට්ඨො, උත්තම යි.

3. අස්සතරා, (කොටළුවහට ද, වෙළඹකුස උපන්) අශ්වතර-යෝ ද; දන්තා, දමුණාහු ම; වරං, උත්තමයහ; ආජානීයා ච, (අශ්වදමකයා විසින් කරණලද ශික්‍ෂණය දන්නට වහා සමර්ථ හෙයින් ද පිට උන්නාහුගේ අදහස් දන්නා හෙයින් ද) ආජා-නෙය නම් වූ අශ්වයෝ ද; දන්තා, දමුණාහු ම; වරං, උත්තම යහ; සින්ධවා, (සින්ධුදෙශයෙහි උපන් හෙයින් සින්ධව නම් වූ) සෛන්ධව අශ්වයෝ ද; දන්තා, දමුණාහු ම; වරං, උත්තමයහ; මහානාගා, මහානාගය යි කියනලද; කුඤ්ජරා ච, ඇත්තු ද; දන්තා, දමුණාහු ම; වරං, උත්තමයහ; තතො, ඔවුන් හැම දෙනාට වඩා; අත්තදන්තො, චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන් තමා දමූයේ; වරං, උත්තම යි.

4. දන්තො, චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන් දමුණු මහණ තෙම; දන්තෙන, පූර්වභාගයෙහි ඉන්ද්‍රියදමනයෙන් දමුණා වූ; සුදන්තෙන, අපරභාගයෙහි ආර්‍ය්‍යමාර්ගභාවනාවෙන් මනා ව දමුණා වූ; අත්තනා, චිත්තය කාරණ කොට ගෙණ; අගතං දිසං, ස්වප්නයෙනුත් නොගිය විරූහෙයින් අගත නම් වූ නිර්‍වාණ නමැති

324 5. ධනපාලකො නාම කුඤ්ජරො
කටුකප්පභෙදනො දුන්නිවාරයො,
බද්ධො කබලං න භුඤ්ජති
සුමරති නාගවනස්ස කුඤ්ජරො.

6. මිද්ධී යදා හොති මහග්ඝසො ච නිද්දායිතා සම්පරිවත්තසායි,
මහාවරාහො'ව නිවාපපුට්ඨො පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.

---

දිගට; යථා ගච්ඡති, යම්සේ යේ ද; තථා, එසේ ම; එතෙහි යානෙහි, මේ ඇත් අස් ආදි යානාවෙන්; තහි ගච්ඡෙය්‍ය, නො යන්නේයි.

5. ධනපාලකො නාම, ධනපාලකය යන නමක් ඇති; කුඤ්ජරො, මාතුපොසක ඇත්තෙම; කටුකප්පභෙදනො, දෙකන්සිළින් වැහෙන තීව්‍ර වූ මද ඇත්තේ; දුන්නිවාරයො, කිසිවක්හු විසින් නො වැළකිය හැකි වූ යේ; බද්ධො, ඇත්හලට ගෙණවුත් විසිතුරු පටසාඩිතිරයෙන් පරික්ෂෙපකරණලද්දේ; කබලං න භුඤ්ජති, (උඩබඳනාලද විසිතුරු වියන් ඇති සුවඳපිරිබඩ ගන්නාලද භූමියෙහි ඇර සිටුවනලද්දේ රජහු විසින් එළවනලද නො යෙක් රසවුලෙන් යුක්තවූ) රාජභොජනය පවා මාතෘවියොග යෙන් දුඃඛිතහෙයින් නො කන්නේය; (වම ගැරපියා කනු මැලියේ එබදු රාජභොජනයෙන් කිසිවක් කනු නො කැමැති විය); කුඤ්ජරො, ඒ මාතුපොසක ඇත් තෙම; නාගවනස්ස සුම රති, මව වසන්නා වූ නාගවනය ම සිහිකරන්නේ සි...පුත්‍ර වියොගයෙන් දුඃඛිත වූ අන්ධ වූ මාගේ මෑනියෝ කණුකටු පයින් මැඩගෙණ බොන්නට පැන් නො ලදින් චණ්ඩොරණ නම් වනයෙහි හඬා ඇවිදිනීය; මාතුපට්ඨානධර්මය නොපිරෙණ කල මේ රාජභොජනය අනුභව කිරීමෙන් මට කම් කිම් ද, ඒ මාතුපට්ඨානධර්මය මට පිරෙන්නේ ඒ නාගවනයෙහිදී ම ය යි නාගවනය සිහිකෙරෙයි යනු භාවයි.

6. යදා, යම් කාලෙක්හි; මිද්ධී හොති, පුරුෂ තෙම මිඩබහුල වේ ද; හෙවත් පිනම්ඩයෙන් මඩනා ලැබේ ද; මහග්ඝසො ච (තමාගේජඨරාග්නියෙහි පමණ නො දත ආහරහත්ථක අලංසාටක තත්‍රවට්ටක කාකමාසක භුත්තවම්තක බමුණන් මෙන්) බොහෝ කොට කා ද; නිවාපපුට්ඨො, කුඩු දඹුකඩ තියුඩු කැඳ දෙවුන් දිය ආදිශූකරභක්තයෙන් බාලකාලපටන් පොෂ්‍යය කරණලද; මහා වරාහො ඉව, ස්ථූල වූ ශරීර ඇති මහගම්හූරෙකු මෙන්; නිද්දායිතා; හුන්තැන සිටිතැන නිදන්නේ ම වේ ද;

326 7. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්ථ කාමං යථාසුඛං,,
තදජ්ජහං නිග්ගහෙස්සාමි යොනිසො
හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො.

327 8. අප්පමාදරතා හොථ සචිත්තමනුරක්ඛථ,
දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නො'ව කුඤ්ජරො.

328 9. සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය තෙනත්තමනො සතිමා.

---

සම්පරිවත්තසායී, (සථූලවූ ශරීර ඇතිහෙයින් අතික් ඉරියව්ව කින් පවත්නට අසමර්ථ ව) පෙරළී පෙරළී වැදහෝනෝ වේ ද; (එකල්හි ඒ පුරුෂ තෙම අනිත්‍යය දුඃඛය අනාත්මය යි කියන ලද තිලකුණු මෙනෙහි කොට නො හෙන්නේය තිලකුණු මෙනෙහි නො කිරීමෙන්); මන්දො, ප්‍රඥාරහිත වූ යේ; පුනප්පුනං, නැවත නැවත; ගබ්භං, මවු කුසට; උපෙති, එළඹෙන්නේ යි; (=මවුකුස විසීමෙන් නො මිදෙන්නේ යි.)

7. ඉදං චිත්තං,, අනවස්ථිත වූ මේ චිත්තය; පුරෙ, මෙයින් පූර්වයෙහි; යෙනිච්ඡකං, රූපාදි අරමුණෙහි ලොභාදි යම් ආකාර යෙකින් පවත්නා කැමැත්තේ ද; යත්ථකාමං, රූපාදි යම් අර-මුණෙක්හි පවත්නා කැමැත්තේ වේද; යථාසුඛං, (යම්සේ පවත් නාහට සුවද එලෙස පවත්නාහෙයින්) සුවසේ; චාරිකං අචාරි, බොහෝ කලක් චාරිකා කෙළේද, (=සැරිසරා ඇවිද්දේද); තං, ඒ සිත; අජ්ජ, අද; අහං, මම; යොනිසො, නුවණින්; පභින්නං හත්ථිං, ගිලිහෙනමද ඇති ඇතක්හු නිගන්නා; අඞ්කුසග්ගහො විය, දක්ෂ වූ හස්ත්‍යාචාර්‍ය්‍යයක්හු මෙන්; නිග්ගහෙස්සාමි, නිග ණිම්, (=වළකම්).

8. අප්පමාදරතා හොථ, මහණෙනි! ස්මෘතිඅවිප්‍රවාසයයි කිය නලද නොපමාබව ඇලෙව්; සචිත්තමනුරක්ඛථ, රූපාදි නානා ලම්බනයෙහි දිවන්නා වූ තොපගේ සිත එයින් වළකා මනා කොට රකිව්; පඞ්කෙසන්නො කුඤ්ජරො ඉව, ගැඹුරු මඩෙහි ගැලුනු බාවේරු නම් ඇතු අතින් පයින් ව්‍යායාම කොට ඒ මඩින් නැගී ගොඩ පිහිටියා මෙන්; අත්තානං, කෙලශපඞ්කයෙහි ගැලීගිය තොප; දුග්ගා, ඒ කෙලෙස් දුදුලෙන්; උද්ධරථ, යොනි-සොමනස්කාරයෙන් යුක්ත ව වීය්‍ය කොට ගොඩනගව්.

9, නිපකං, ප්‍රඥාවත් වූ; සද්ධිං චරං, තමා හා සමග වසන්නට නිසි වූ; සාධුවිහාරිං, යහපත් වූ වාසඇති; ධීරං, ධෘතිසම්පන්න වූ; සහායං, කල්‍යාණමිත්‍රයෙකු; සචෙ, ඉදින්; ලභෙථ, ලද්දේ වී

329 **10. නො චෙ ලභෙථ නිපකං සහායං**
**සද්ධිං චරං සාධුවිහාරි ධීරං,**
**රාජා'ව රට්ඨං විජිතං පහාය**
**එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙ'ව නාගො.**

**11. එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා,**
**එකො චරෙ න ච පාපානි කයිරා**
**අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙ'ව නාගො.**

---

නම්; සබ්බානි පරිස්සයානි, (සිංහ ව්‍යාඝ්‍රාදි ප්‍රකට උපද්‍රවද රාග ද්වෙෂාදි අප්‍රකටඋපද්‍රව ද යන) සියලු උපද්‍රව තාක්; අභිභුය්‍ය, මැඩ; තෙන, ඒකල්‍යාණමිත්‍රයා හා සමග; අත්තමනො, සතුටු සිත්ඇතිව; සතිමා, සිහිනුවතින් යෙදී; චරෙය්‍ය, වසන්නේයි.

10. නිපකං, ප්‍රඥවත් වූ; සද්ධිං චරං, තමා හා සමග වසන්ට නිසි වූ; සාධුවිහාරිං, යහපත් වූ වාස ඇති; ධීරං, ධෘතිසම්පන්නවූ; සහායං, කල්‍යාණමිත්‍රයෙකු; නො චෙ ලභෙථ, ඉදින් නො ලද්දේ වී නම්; විජිතං, දිනනලද, හෙවත් අතට පැමිණි; රට්ඨං පහාය, රටහැරපියා, (රාජ්‍යසම්පත් නම් ප්‍රමාදයට කාරණයයි රජකිරීමෙහි ආදීනව දැක අතට පැමිණි රට හැරපියා) එකලාව වනයට වැද තාපසප්‍රව්‍රජ්‍යාවට එළඹි; රාජා ඉව, මහාජනක රජනු මෙන් ද; අරඤ්ඤෙ, ඇත්මුල හැරපියා මේ රක්ෂිතවනයෙහි හුදකලාව වසන්නාවූ; මාතඞ්ගො නාගො ඉව, මාතඞ්ග යන නම් ඇති මේ පාරිලෙය්‍යක ඇතු මෙන් ද; එකො චරෙ, ගණයා හැර එකලාව වසන්නේයි.

11. එකස්ස, හුදකලාහුගේ; චරිතං, වාසය; සෙය්‍යො, උතුම් මය; බාලෙ, මෙලෝ පරලෝ වැඩ නො දන්නා අඥනයා කෙරෙහි; සහායතා, සහායබැව්, හෙවත් චූලසීලය මජ්ඣිමසීලය මහාසීලය දශකථාවස්තුය තෙළෙස්ධුතාඞ්ගගුණයවිදර්ශනාඥනය චතුර්විධමාර්ගඵලය ත්‍රිවිද්‍යාය ෂඩභිඥය අමෘතමහානිර්වාණය යන මේ සහායබැව්; නත්ථි, නැති, (ඒ බාලයා නිසා මෙකියනලද සහායබැව් ලැබිය නො හැකියි) එහෙයින්; එකො චරෙ, ගණයා හැර එකලාව වසන්නේය; පාපානි, ස්වල්පමාත්‍ර වූ ද අකුසලකෙනෙකුන්; න ච කයිරා, නොම කරන්නේය; අරඤ්ඤෙ, ගණයා හැර රක්ෂිතවනයෙහි හුදකලාව වසන්නා වූ; මාතඞ්ගො නාගො ඉව, මාතඞ්ග යන නම් ඇති මේ පාරිලෙය්‍යක ඇතු මෙන්; අප්පොස්සුක්කො, ගණපරිහරණයෙහි නිරුත්සාහ ව; චරෙ, වසන්නේයි.

331 12. අත්ථම්හි ජාතම්හි සුඛා සහායා
තුට්ඨී සුඛා යා ඉතරීතරෙන,
පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි
සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහාණං.

332 13. සුඛා මත්තෙය්‍යතා ලොකෙ අථො පෙත්තෙය්‍යතා සුඛා,
සුඛා සාමඤ්ඤතා ලොකෙ අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා.

333 14. සුඛං යාව ජරා සීලං සුඛා සද්ධා පතිට්ඨිතා,
සුඛො පඤ්ඤාය පටිලාභො පාපානං අකරණං සුඛංති.

නාගවග්ගො තෙවීසතිමො.

---

12. අත්ථම්හි ජාතම්හි, (ප්‍රව්‍රජිතයන්ගේ චීවරකරණ පාත්‍රපචනාදි වූ හෝ ගිහින්ගේ කෘෂිවනිකකර්මාන්තාදි වූ හෝ කිසි) ප්‍රයොජනයක් උපන් කල්හි; සහායා, ඒ කටයුත්ත සපයන්ට සමත් වූ සහායයෝ; සුඛා, සුවයහ; ඉතරීතරෙන, හීන වූ ද ප්‍රණීත වූ ද මද වූ ද බොහෝ වූ ද තමාසතු යම්කිසි පසයෙකින් උපදනා වූ; යා තුට්ඨි, යම් තුෂ්ටියෙක් ඇද්ද; සා, ඒ තුෂ්ටි තොම; සුඛා, සුවය; ජීවිතසඞ්ඛයම්හි, මරණාසන්නකාලයෙහි; පුඤ්ඤං, කැමැති පරිද්දෙන් විපුලකොට කරණලද කුශලකර්මය; සුඛං, සුවය; සබ්බස්ස දුක්ඛස්ස, සියලු සංසාරදුක්ඛයාගේ; පහාණං, ප්‍රහාණය, හෙවත් අර්හත්ඵලය; සුඛං, සුවයි.

13. ලොකෙ, මේ සත්වලොකයෙහි; මත්තෙය්‍යතා, මවුන් කෙරෙහි මනා පිළිවෙත් ඇතිබැවි; සුඛා, සුවය; අථො, නැවත; පෙත්තෙය්‍යතා, පියන්කෙරෙහි මනා පිළිවෙත් ඇතිබැවි; සුඛා, සුවය; ලොකෙ, මේ සත්වලොකයෙහි; සාමඤ්ඤතා, ශ්‍රමණයන් කෙරෙහි මනාපිළිවෙත් ඇතිබැවි; සුඛා, සුවය; අථො, නැවත; බ්‍රහ්මඤ්ඤතා, (බාහිතපාපීවූ බුදු-පසේබුදු-මහරහත් යන) ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයන් කෙරෙහි මනාපිළිවෙත් ඇතිබැවි; සුඛා, සුවයි.

14. සීලං, (පංචශීලඅෂ්ටාඞ්ගශීලදශශීලාදිප්‍රභෙද ඇති) ශීලය; යාවජරා, ජරාවයසදක්වා, සුඛං, සුවය, (මිණිකොඩොල් මුත්හර මෙවුල්දම් ආදි සෙසු ආභරණයෝ ද විසිතුරු පැහැ ඇති නොයෙක් වස්ත්‍රජාත්හු ද ඒ ඒ වයස සිටියවුන්ටම හොබනාහ, තරුණයන්ගේ අලඞ්කාරයෝ වෘද්ධයන්ට ද වෘද්ධයන්ගේ අලඞ්කාරයෝ තරුණයන්ට ද නොහොබනාහ, පඤ්චශීල අෂ්ටාඞ්ගශීල දශශීලාදී වූ ශීලාලඞ්කාරය වනාහි තරුණයන්ට ද වෘද්ධයන්ට ද

334 1. මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාලුවා විය,
සො පලවතී හුරාහුරං ඵලමිච්ඡං'ව වනස්මිං වානරො.

335 2. යං එසා සහතී ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා,
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨං'ව බීරණං.

336 3. යො චෙ තං සහතී ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං,
සොකා තම්හා පපතන්ති උදබින්දූ'ව පොක්ඛරා.

---

හොබනේය එහෙයින් ශීලය ජරාවයස දක්වා සුවය); සද්ධා, ලෞකිකලොකොත්තරවශයෙන් ද්විප්‍රකාර වූ ශ්‍රද්ධා තොම; පතිට්ඨිතා, නිශ්චලවපිහිටිවීම; සුඛා, සුවය; පඤ්ඤාය පටිලාභො, ලෞකිකලොකොත්තර ප්‍රඥාවගේ ප්‍රතිලාභය ද; සුඛො, සුවය; පාපානං අකරණං, මාර්ගයෙන් සමුච්ඡින්න හෙයින් සියලු පාප යන්ගේ නො කිරීම; සුඛං, සුවයි.

## නාගවග්ගො තෙවීසතිමො.

---

1. පමත්තචාරිනො, (ස්මෘතිවිප්‍රවාසලක්ෂණවූ ප්‍රමාදයෙන්) ප්‍රමාදචාරීවූ; මනුජස්ස, පුරුෂයාහට; තණ්හා, සදෙරළුපදනා රූපතෘෂ්ණාදිවශයෙන් ෂට්ප්‍රකාර වූ තෘෂ්ණා තොම; මාලුවා විය, රුකක් වළඳිමින් වැඩෙන මාලුවාලිය ඒ රුකට විනාසයට වඩනාක් මෙන් ඒ පුද්ගලයාහට විනාසය පිණිස; වඩ්ඪති, වඩ නිය; සො, තෘෂ්ණාවසග වූ ඒ පුද්ගල තෙම; වනස්මිං, වනයෙහි; ඵලමිච්ඡං, අඹදඹ ඈ නොයෙක් පල කැමැතිව රුකින් රුකට පනින්නා වූ; වානරො ඉව, වඳුරකු මෙන්; හුරාහුරං, භවයෙන් භවයට; පලවති, පනින්නේයි, හෙවත් දිවන්නේයි.

2. ජම්මී, ලාමකවූ; විසත්තිකා, රූපාදි සඅරමුණෙහි ආසක්ත විසක්තහෙයින් විසත්තිකා යන නම් ඇති; (එසා) තණ්හා, ෂඩ් චාරික වූ (මේ)තෘෂ්ණා තොම; (ලොකෙ, ලොකයෙහි);1 යං, යම් පුද්ගලයක්හු; සහති, අභිභවනය කෙරේ ද, (=මැඩ පවතී ද); තස්ස, ඒ පුද්ගලයාහට, අභිවට්ටං, මහවැස්සෙන් නැවත නැවත වස්නාලද, හෙවත් තෙමනලද; බීරණං ඉව, හොටතණ වඩනා මෙන්; සොකා, වට්ටමූලක වූ සොකයෝ; වඩ්ඪන්ති, වඩනාහුයි.

3. ජම්මිං, ලාමක වූ; දුරච්චයං, ඉක්මවිය නො හැකි වූ; එතං තණ්හං, ෂඩ්චාරික වූ මේ තෘෂ්ණාව; (ලොකෙ, ලොකයෙහි;)2 යො ච, යම් පුද්ගලයෙක් වනාහි; සහති, මැඩ පවතී ද; තම්හා,

---

1. 2. සන්නයෙහි නොමැතිහි.

4. තං වො වදාමි භද්දං වො යාවන්තෙ'ත්ථ සමාගතා,
තණ්හාය මූලං ඛණථ උසීරත්ථො'ව බීරණං;
මා වො නළං'ව සොතො'ව මාරො භඤ්ජි පුනප්පුනං.

338 5. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං.

---

ඒ පුද්ගලයා කෙරෙන්; සොකා, වට්ටමූලක වූ සොකයෝ; පොක්ඛරා, පොකුරුපතින් ගිලිහෙන්නා වූ; උදබින්දු ඉව, දිය බිඳු මෙන්; පපතන්ති, ගිලිහෙන්නාහු යි, (=පහවන්නාහු යි).

4. යාවන්තො, යම් පමණකෙණෙක්; එත්ථ, මෙතැන්හි; සමාගතා, රැස් වූ ද ඒ තොප හැමදෙනාහට; භද්දං වො, හොතු, වැඩ වේවයි (මේ කපිලමත්ස්‍යයාහට මෙන් අවැඩෙක් නොවෙවයි); තං, ඒ කාරණයෙන්; වො, තොපහැමදෙනහට; වදාමි, මේ අව වාදයකියමි, හේ කිමෙක් ද යත්; උසීරත්ථො බීරණං ඉව, සුවඳ හොට මුලින් ප්‍රයොජන ඇති එකක්හු (මහ උදැල්ලකින්) බෙරු තණකණින්නාක් මෙන්; තණ්හාය මූලං ඛණථ, භවොත්පත්තියට ප්‍රධාන කාරණ වූ ෂඩ්වාරික තෘෂ්ණාවගේ මූලය යි කියනලද අවිද්‍යාව අර්හත්මාර්ගඥානය යි කියනලද මහහුදැල්ලෙන් කණනු; නළං ඉව, තංතෙර හටගත් රණහුණපඳුරක් හෝ බටහුණපඳු රක් හෝ කැණගෙණ යන්නා වූ; සොතො ඉව, මහා වෙගයෙන් ආ ගංවතුරක් මෙන්; මාරො, කෙලශමාරය මෘත්‍යුමාරය දිව්‍ය පුත්‍රමාරය යි යන ත්‍රිවිධ වූ මාරතෙම; වො, තොප ඇමදෙන; පුනප්පුනං, නැවත නැවත; මා භඤ්ජි, නහමක් බිඳීවා.

5. යථාපි, යම්සේ; මූලෙ, වෘක්ෂයාගේ පඤ්චමහාමූලය; අනුපද්දවෙ, (ඡේදනඵාලනකෘමිවෙධාදි එක්තරා උපද්‍රවයකින්) උපද්‍රවයකට නො පැමිණි කල්හි; දළ්හෙ, එහෙයින් ම ස්ථිරතර කල්හි; ඡින්නොපිරුක්ඛො, අගින්කපනලද්දවූ ද (තුග ඇසතු ආදි වනස්පති) වෘක්ෂය; පුනරෙව, නැවත ද; රූහති, ශාඛා ප්‍රශාඛාවශයෙන් හටගන්නේ ම වේ ද; එවම්පි, එහෙයින් ම; තණ්හානුසයෙ, තෘෂ්ණාසඞ්ඛ්‍යාතඅනුසය, හෙවත් කාරණ ලාභ යක් ඇති කල්හි මූෂිකාදිවිෂයක් මෙන් නැවත නැවත සන්තාන යෙහි උපදනට තිසිවූ) කාමරාගභවරාගානුසය; අනූහතෙ, අර්හත්මාර්ගඥානයෙන් සිඳ නො පියනලද කල්හි; ඉදං දුක්ඛං, (ඒ ඒ භවයෙහි ජාතිජරාව්‍යාධිමරණය යි කියනලද) මේ දුක්ඛ ජාතය; පුනප්පුනං, නැවත නැවත; නිබ්බත්තති, උපදනේ මැයි.

339 6. යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා,
වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා.

340 7. සවන්ති සබ්බධී සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති,
තඤ්ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ.

341 8. සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො,
තෙ සාතසිතා සුඛෙසිනො තෙ වෙ ජාතිජරූපගා නරා.

---

6. යස්ස, යම් පුද්ගලයක් හට; ඡත්තිංසතිසොතා, (චක්ඛුරාදි-ආධ්‍යාත්මිකායතනයන් විෂය කොට පවත්නා වූ තෘෂ්ණාවිචරිතයෝ අටළොස් දෙනය රූපාදිබාහිරායතනයන් විෂය කොට පවත්නා වූ තෘෂ්ණාවිචරිතයෝ අටළොස් දෙනය යන මේ තෘෂ්ණාවිචරිතයන්ගේ වශයෙන්) සතිස්වැදෑරුම්වූ තෘෂ්ණාස්‍රොතසින් සමන්විත වූ; මනාපස්සවනා, මනාප වූ රූපාදි අරමුණෙහි ශ්‍රවත්ව පවත්නා වූ තෘෂ්ණා තොම; භුසා, බලවත් ව උපදී ද; දුද්දිට්ඨිං, විපන්න වූ දෘෂ්ටි ඇතිබැවින් නුවණ නැති ඒ පුද්ගලයා; රාගනිස්සිතා, (ධ්‍යානයක් වත් විදර්ශනාවක්වත් ඇසුරු නො කොට) රාගය ඇසුරු කළා වූ; සඞ්කප්පා, විතර්කයෝ; වාහා, නැවත නැවත උපදනා බැවින් බලවත් වූවාහු; වහන්ති, අපායට පමුණුවන්නාහුයි.

7. සොතා, තෘෂ්ණාස්‍රොතස්හු, හෙවත් තෘෂ්ණා නැමැති ගංගාප්‍රවාහයෝ; සබ්බධී, (චක්ඛුරාදීන්ගේ වශයෙන් රූපාදි සඅරමුණෙන් ද කාමභවාදි සියලු භවයෙන් ද ශ්‍රවත් වනහෙයින්-වැගෙන හෙයින්) හැමතැන්හි ම පවත්නාහු නම් වෙති; ලතා, භවයෙන් භවය වෙලඳනා අර්ථයෙන් ද හිවන අර්ථයෙන් ද ලතා නම් වූ ඒ තෘෂ්ණා තොමෝ; උබ්භිජ්ජ, සදොරින් ඉපද; තිට්ඨති, රූපාදි සඅරමුණෙහි සිටිනීය, හෙවත් පවත්නීය; ජාතා, එසේ උපන්නා වූ; තං ච ලතං, ඒ තෘෂ්ණාලතාව වනාහි; දිස්වා, ("එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති"යි මෙසේ උත්පත්තිස්ථානවශයෙන්) දැක; පඤ්ඤාය, මාර්ගප්‍රඥාවෙන්; මූලං ඡින්දථ, (වනෙහි හටගත් පියවි ලියයක් සැතකින් කපන එකක්හු මෙන්) මුලින් ම සිඳපියව්.

8. සරිතානි, රූපාදි අරමුණෙහි විසිර පතළා වූ ද; සිනෙහිතානි ච, (උපභොගපරිභොගවස්තුයෙහි පැවැත්තා වූ) තෘෂ්ණාස්නෙහයෙන් ස්නෙහිත වූ ද, හෙවත් ගල්වනලද්දා වූ ද; සොමනස්සානි, සොම්නස්හු; ජන්තුනො, තෘෂ්ණාවසිකයන් සත්ත්වයාහට; භවන්ති, වන්නාහ; තෙ, ඒ තෘෂ්ණාවශික සත්ත්වයෝ; සාතසිතා, සුඛ

342 9. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො'ව බාධිතො,
සංයොජනසඞ්ගසත්තා දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය.

343 10. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො'ව බාධිතො,
තස්මා තසිණං විනොදයෙ භික්ඛු ආකඞ්ඛී(1)විරාගමත්තනො.

344 11. යො නිබ්බනථො වනාධිමුත්තො වනමුත්තො වනමෙව ධාවති,
තං පුග්ගලමෙව පස්සථ මුත්තො බන්ධනමෙව ධාවති.

---

සොම්නස් ඇසුරුකළාහු; සුඛෙසිනො, කායිකචෛතසික සුව සොයනසුලු වෙති; තෙ නරා, ඒබඳු වූ සත්ත්වයෝ; වෙ, එකාන්තයෙන්; ජාතිජරූපගා, (ජාතිජරාව්‍යාධිමරණයට පැමිණෙන්නාහු ම වෙත්නුයි) ජාතිජරාවට පැමිණෙන්නෝ නම් වෙත්.

9. තසිණාය, ත්‍රාසය උපදවන අර්ථයෙන් තසිනා යි කියන ලද තෘෂ්ණාව විසින්; පුරක්ඛතා, පිරිවරණලද්දා වූ, හෙවත් වළඳනාලද්දා වූ; පජා, මේ සත්ත්වයෝ; (සාවැද්දා විසින්); බාධිතො, බඳනාලද; සසො ඉව, සාවෙකු මෙන්, හෙවත් දැල බැඳුනු සාවෙකු මෙන්; පරිසප්පන්ති, සැපෙන්නාහ (=භයපත් වන්නාහ); සංයොජනසඞ්ග, දසවිධ සංයොජනසංගයෙන් ද රාගසඞ්ගාදි සප්තවිධසඞ්ගයෙන් ද; සත්තා, බැඳුනාහු, හෙවත් වළඳනාලද්දාහු; චිරාය, බොහෝ කලක්; පුනප්පුනං, නැවත නැවත; දුක්ඛං, ජාතිජරාව්‍යාධිමරණ දුක්ඛයට; උපෙන්ති, පැමිණෙන්නාහු යි.

10. තසිණාය, ත්‍රාසය ඊඡ්‍රෙගය උපදවන අර්ථයෙන් තසිනා යි කියනලද තෘෂ්ණාව විසින්; පුරක්ඛතා, පිරිවරණලද්දා වූ, හෙවත් වළඳනාලද්දා වූ; පජා, මේ සත්ත්වයෝ; බාධිතො, සාවැද්දා විසින් බඳනාලද; සසො ඉව, සාවෙකු මෙන්, හෙවත් දැල බැඳුනු සාවෙකු මෙන්; පරිසප්පන්ති, සැපෙන්නාහ (=භයපත් වන්නාහ); තස්මා, එහෙයින්; අත්තනො, තමාහට; විරාගං, රාගවිගමනය, හෙවත් නිර්වාණය; ආකඞ්ඛී, කැමැතිවන්නාවූ; භික්ඛු, මහණතෙම; තසිනං, සංසාරිකවූ තෘෂ්ණාව; විනොදයෙ, අර්හත්මාර්ගඥානයෙන් ප්‍රහීණ කරන්නේ යි.

11. යො, යම් පුද්ගලයෙක්; නිබ්බනථො, (ගිහිභාවයෙහි ආලය යි කියනලද වනයය හැර පැවිදි වූ බැවින්) තෘෂ්ණාරහිත වූයේ; වනාධිමුත්තො, විහාරය යි කියනලද තපොවනයෙහි ඇලුනේ; වනමුත්තො, ගිහිබන්ධනය යි කියනලද තෘෂ්ණාවනයෙන් මුක්තවූයේ;

---

1 ආකඞ්ඛි.

**12. න තං දළ්හං බන්ධනමාහු ධීරා යදායසං දාරුජං බබ්බජං ච, සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා.**

**13. එතං දළ්හං බන්ධනමාහු ධීරා ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං, එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො කාමසුඛං පහාය.**

---

බන්ධනමෙව ධාවති, නැවත ගිහිබන්ධනය කරා දුවයි; තෘෂ්ණාවනයට ම දිවේ ද; මුත්තො, ගිහිබන්ධනයෙන් මුක්තවූයේ; බන්ධනමෙව ධාවති, නැවත ඒ ගිහිබන්ධනයටම දිවේ ද; තං පුග්ගලං, ඒ පුද්ගලයා; එවං පස්සථ, ව්‍යඤ්ජනයට පැමිණියහු මෙසේ බලව්.

12. ආයසං, යකඩින් කරණලද්ද වූ ද; දාරුජං, දණ්ඩෙන් කරණලද්ද වූ ද; බබ්බජං ච, බබුස්තණින් කරණලද්ද වූ ද; යං, යම් බන්ධනයෙක් ඇද්ද නොහොත්; යං, යම් බන්ධනයෙක්; ආයසං, යකඩින් කරණලද ද; දාරුජං, යම් බන්ධනයෙක් දණ්ඩෙන් කරණලද ද; බබ්බජඤ්ච, යම් බන්ධනයෙක් බබුස්තණින් කරණලද ද; තං බන්ධනං, ඒ සියලු බන්ධනය ම; ධීරා, (බුදු-පසේබුදු-මහරහත් යන) ප්‍රාඥයෝ; න දළ්හමාහු, (කඩු ආදියෙන් කැපියහැකිබැවින්) දැඩි වූ බන්ධනයෙකැයි නො කියති; මණිකුණ්ඩලෙසු, ඉන්ද්‍රනීල මහානීලාදී මාණික්‍යයෙහි ද කුණ්ඩලාභරණයෙහි ද නොහොත් මැණිකින් පිසිතුරු වූ කුණ්ඩලාභරණයෙහි ද; සාරත්තරත්තා, අතිශයින් සංරක්ත ව ඇලුනා වූ ද නොහොත්; සාරත්තරත්තා, මිණිකොඩොල් ආදීන්ගේ සාර බව හේතු කොටගෙණ අතිශයෙන් ම ඇලුනා වූ ඒ රාගය ද; පුත්තෙසු, දරුවන් කෙරෙහි ද; දාරෙසු ච, අඹුවන් කෙරෙහි ද: යා අපෙක්ඛා, යම් අපෙක්ෂාවෙක් ඇද්ද, හෙවත් යම් තෘෂ්ණාවෙක් ඇද්ද ඒ තෘෂ්ණාව ද යන.

13. එතං, මේ ක්ලෙශබන්ධනය; ධීරා, බුඩාදිප්‍රාඥයෝ; දළ්හං බන්ධනං ආහු, (ශස්ත්‍රාදියෙන් කැපිය නො හැකි හෙයින්) ස්ථිර වූ බන්ධනයෙකැයි කියති; ඔහාරිනං, (සත්වයන් සතර අපායෙහි ඇද හෙලාගෙණ) යට බලා ගෙණ යන්නා වූ; සිථිලං, (බැඳිතැන සිවි-සුම්-මස් නො සිඳ ලේ නො සොල්වා බැඳිබව ද නො දන්වා ථලපථ-ජලපථ ආදියෙහි සියලු කර්මාන්තයන්ට අවසර දෙනහෙයින්) ලිහිල් වූ; දුප්පමුඤ්චං, (ලොභවිෂයෙන් එකවරක ද, උපන් ක්ලෙශ-බන්ධනය බැහැගත් තැනින් කට හරවා ගත නො හැකි කැස්බෑ මෙන් ගලවාගත නො හැකි හෙයින්) උනා හැර පිය නො හැකි වූ; එතම්පි, මේ ක්ලෙශබන්ධනය පවා; ඡෙත්වාන, ඥානඛඩ්ගයෙන් කපා හැර; අනපෙක්ඛිනො, වස්තුකාම-ක්ලෙශකාමයෙහි අපෙක්ෂා

347 14. යෙ රාගරත්තානුපතන්ති සොතං සයං කතං මක්කටකො’ව ජාලං,
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය.

348 15. මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ,
සබ්බත්ථ විමුත්තමානසො න පුන ජාතිජරං උපෙහිසි.(1)

349 16. විතක්කපමථිතස්ස ජන්තුනො තිබ්බරාගස්ස සුභානුපස්සිනො,
භිය්‍යො තණ්හා පවඩ්ඪති එස ඛො දළ්හං කරොති බන්ධනං.

---

රහිත වූවාහු; කාමසුඛං පහාය, කාමසුඛය හැර; පරිබ්බජන්ති, නුවණැත්තාහු ඇවිදිවන්නාහු යි.

14. රාගරත්තා, රාගයෙන් රත් වූ, ද්වෙෂයෙන් දුෂ්ට වූ මොහයෙන් මූඪ වූ; යෙ, යම් සත්වකෙනෙක්; සයං කතං ජාලං. තමා විසින් කරණලද දූල අනුව පවත්නා වූ එහිම වැද හෝනා වූ; මක්කටකො ඉව, මකුළුවා මෙන්; සයං කතං, තමා විසින් කරණලද්දා වූ තමන් ම උපදවා ගන්නා වූ; සොතං, (තෘෂ්ණා ශ්‍රොතස ඉක්මවන්නට උගහට වූවාහු ම) තෘෂ්ණාවතුරෙහි; අනුපතන්ති, හෙද්ද; (ඔහු තෘෂ්ණාශ්‍රොතස ඉක්මවන්නට නො පොහොසත් වන්නාහ;) ධීරා, ප්‍රාඥයෝ වනාහි; එතම්පි ඡෙත්වාන, මෙසේ ඉක්මවන්නට උගහට වූ මේ තෘෂ්ණාශ්‍රොතස පවා සිඳ පියා; අනපෙක්ඛිනො, වස්තුකාම-ක්ලේශකාමයෙහි නිරාලයව; සබ්බදුක්ඛං පහාය, රහත් මගින් සියලු සසරදුක් පහකොට; වජන්ති, නිවන්පුරයට යන්නාහුයි.

15. පුරෙ, අතීත වූ පඤ්චස්කන්ධයන් කෙරෙහි ප්‍රවෘත්ත වූ තෘෂ්ණාව; මුඤ්ච, හරෑ; පච්ඡතො, අනාගත වූ පඤ්චස්කන්ධයන් කෙරෙහි පවත්නා වූ තෘෂ්ණාව ද; මුඤ්ච, හරෑ; මජ්ඣෙ, වර්තමාන වූ පඤ්චස්කන්ධයන් කෙරෙහි පවත්නා වූ තෘෂ්ණාව ද; මුඤ්ච, හරෑ; භවස්ස පාරගූ. මෙසේ කල්හි ත්‍රිවිධභවයාගේ පාරයට පැමිණියා වූ තෝ; සබ්බත්ථ විමුත්තමානසො; ස්කන්ධධාත්වායතනය යි යනාදී ප්‍රභෙද ඇති සියලු ප්‍රත්‍යයසමුත්පන්නධර්මයන් කෙරෙන් මිදුනු සිත් ඇත්තෙහි; පුන, නැවත; ජාතිජරං, ජාතියට ජරාවට; න උපෙහිසි, නෝ පැමිණියෙහි වී (2).

16. විතක්කපමථිතස්ස, කාමවිතර්ක-ව්‍යාපාදවිතර්ක-විහිංසාවිතර්කය යි යන ත්‍රිවිධවිතර්කයන් විසින් මඩන ලද්දා වූ; තිබ්බ-

---

1 එසිතො. 2 නො පැමිණෙන්නෙහිසි.

350 **17. විතක්කූපසමෙ ච යො රතො අසුභං භාවයතී සදා සතො,**
**එස ඛො ව්‍යන්තිකාහිති එස ඡෙච්ඡති මාරබන්ධනං.**

351 **18. නිට්ඨඞ්ගතො අසන්තාසී විතතණ්හො අනඞ්ගණො,**
**අච්ඡින්දි (1) භවසල්ලානි අන්තිමොයං සමුස්සයො.**

---

රාගස්ස, තීව්‍ර වූ කාමරාග ඇති; සුභානුපස්සිනො, (ඉෂ්ටාලම්බනයෙහි සිත පිහිද අත්ල-පත්ල යහපත, තන බඩතුර යහපත, දත්-මුව යහපත යනාදීන් නිමිත්තානුව්‍යඤ්ජන ග්‍රහණය කොට විසභාග අරමුණු) සුභවශයෙන් බලන සුලු වූ; ජන්තුනො, සත්ත්වයාහට; භීයො, බොහෝකොට ම; තණ්හා, ෂඩ්වාරික වූ තෘෂ්ණා තොමෝ; පවඩ්ඪති, වඩනීය; එසො ඛො, මේ පුද්ගල වනාහි; බන්ධනං, තෘෂ්ණා නැමැති බන්ධනය; දළ්හං කරොති, තර කරන්නේ යි.

17. යො, යම් මහණෙක්; විතක්කූපසමෙ රතො, (කාමවිතර්කාදි ත්‍රිවිධවිතර්කයන්ගේ ව්‍යුපශමය යි කියනලද උද්ධුමාතකාදි දශඅශුභාලම්බනයෙහි උපන්) ප්‍රථමධ්‍යානයෙහි ඇලුනේ වේ ද; සදා, හැම කල්හි ම; සතො, සිහි ඇතිවූයේ; අසුභං භාවයති, ඒ අශුභධ්‍යානය උපදවා ද, (=වඩා ද); එසො ඛො, මේ මහණ වනාහි; ව්‍යන්තිකාහිති, භවත්‍රයෙහි උපදනා නිකන්තිය යි කියනලද තෘෂ්ණාව පහකරන්නේය, (=නසන්නේය); එසො, මේ මහණ තෙම; මාරබන්ධනං, ත්‍රෛභූමිකවෘත්තසඞ්ඛ්‍යාතමාරබන්ධනය; ඡෙජ්ජති, අර්හන්මාර්ගඥාන නැමැති ශස්ත්‍රයෙන් කපන්නේ යි.

18. නිට්ඨඞ්ගතො, යම් මහණෙක් තෙම අර්හත්ඵලසඞ්ඛ්‍යාත නිෂ්ඨාවට පැමිණියේ වේ ද, (මේ බුද්ධශාසනයෙහි පැවිදිවූවන්ගේ නිෂ්ඨාව නම් අර්හත්ඵලය යි, ඒ නිෂ්ඨාවය යි කියනලද අර්හත්ඵලය තමා සතන්හි උපදවීමෙන් නිෂ්ඨාවට පැමිණියේ වේ ද); අසන්තාසී, (තමා සතන්හි උපදනා රාගාදිසන්ත්‍රාසයක් නැතිහෙයින් ද ජීවිතනිකන්තිය ප්‍රහීණහෙයින් සිංහව්‍යාඝ්‍රාදීන් කෙරෙහි වන සන්ත්‍රාසයක් නැතිහෙයින් ද) සන්ත්‍රාසරහිත ද, (=භය නැත්තේ ද); විතතණ්හො, පහවූ කාමතෘෂ්ණා-භවතෘෂ්ණා-විභවතෘෂ්ණා ඇත්තේ වේ ද; අනඞ්ගණො, එහෙයින් ම රාගාද්‍යඞ්ගන රහිත ද, හෙවත් නිෂ්කලෂී ද; භවසල්ලානි, භවගාමී වූ සියලු රාගාදිකෙලශශල්‍යයන්; අච්ඡිඳ, අර්හන්මාර්ගඥානශස්ත්‍රයෙන් කපා පිද, හෙවත් රාගාදී වූ ඒ සියලු කෙලෙස්හුල් හාක් උදුරා හැරපි ද (ඒ මහණහුගේ); අයං,

---

1 අච්ඡිඳ.

352 **19. වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො,**
**අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බපරානි ච;**
**ස වෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසො'ති වුච්චති.**

353 **20. සබ්බාභිභූ සබ්බවිදූහමස්මි සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො,**
**සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො සයං අභිඤ්ඤාය**
**කමුද්දිසෙය්‍යං.**

---

මේ පවත්වමින් සිටි දෙහය; අන්තිමො සමුස්සයො, අන්තිම ආත්මභාවය යි. මෙබඳු මහණ භවපරිත්‍යන්තයෙහි සිටිහෙයින් ඔහුට මතුභවයෙහි පිළිසඳෙක් නැත්තුයි මේ පවත්වමින් සිටි ආත්මභාවය නම් කෙළවර ආත්මභාවය යි සේයි.

19. වීතතණ්හො, යම් මහණෙක් අර්හත්මාර්ගයෙන් පහකරණ ලද භවතෘෂ්ණා ඇත්තේ ද; අනාදානො, ස්කන්ධාදියෙහි ආත්මාත්මීයවශයෙන් ග්‍රහණයෙක් නැත්තේ ද; නිරුත්තිපදකොවිදො, නිරුක්තියෙහි ද සෙසුතුන්පදයෙහි ද දක්ෂ ද, හෙවත් සිවුපිළිසිඹියාවෙහි දක්ෂ ද; අක්ඛරානං සන්නිපාතං, අක්ෂරයන්ගේ සන්නිපාතය යි කියන ලද අක්ෂරසමූහය ද; පුබ්බපරානි ච, පූර්වාක්ෂරපරාක්ෂරයන් ද; ජඤ්ඤා, දත්තේ වේ ද, (හෙවත් පූර්වාක්ෂරයෙන් පරාක්ෂරය දනගත්තේ වේ ද, පරාක්ෂරයෙන් පූර්වාක්ෂරය දනගත්තේ වේ ද, පූර්වාක්ෂරය පෙනේ නම් පරාක්ෂරය නො පෙනේ නම් මේ පූර්වාක්ෂරයට මේ පරාක්ෂරය විය යුතුය යි පූර්වාක්ෂරයෙන් පරාක්ෂරය දනගණී ද, පරාක්ෂරය පෙනේ නම් පූර්වාක්ෂරය නො පෙනේ නම් මේ පරාක්ෂරයට මේ පූර්වාක්ෂරය විය යුතුය යි පරාක්ෂරයෙන් පූර්වාක්ෂරය දනගණී ද: අන්තිමසාරීරො, අන්තිම ශරීරයෙහි පිහිටියා වූ; සො, ඒ මහණ තෙම; වෙ, ඒකාන්තයෙන්; මහාපඤ්ඤො, (මහත් වූ අර්ථ-ධර්ම-නිරුක්ති-ප්‍රතිභානප්‍රතිසංයුක්ත වශයෙන් සිවුපිළිසිඹියාවන් ද මහත් වූ ශීලස්කන්ධාදි පඤ්චවිධධර්මස්කන්ධයන් ද පිරිසිඳ දන්නා වූ ප්‍රඥාවෙන් සමන්විත හෙයින්) මහත් ප්‍රඥා ඇත්තේය යි ද; මහාපුරිසො ඉති, සකලකෙලශයන් කෙරෙන් විමුක්ත වූ සිත් ඇතිහෙයින් මහාපුරුෂය යි ද; වුච්චති, කියනුලැබේ.

20. අහං, මම; සබ්බාභිභූ අස්මි, සියලු ත්‍රෛභූමිකධර්මයන් අභිභවනය කොළම් වීමි; සබ්බවිදූ අස්මි, සියලු චාතුර්භූමිකධර්මයන් සර්වාකාරයෙන් මනා කොට මම ම දත්තේ වීමි; සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො, සියලු ත්‍රෛභූමික ධර්මයෙහි තෘෂ්ණා-

21. සබ්බදානං ධම්මදානං ජිනාති සබ්බං රසං ධම්මරසො ජිනාති, සබ්බං රතිං ධම්මරති ජිනාති තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති.

---

දෘෂ්ටිලෙපයෙන් අනුපලිප්තවෙයමි, (=නො ඇලිනිමි); සබ්බඤ්ජහො, සියලු ත්‍රෛභූමික ධර්මයන් පහ කොට සිටියෙමි; තණ්හක්ඛයෙ විමුත්තො, තෘෂ්ණාක්ෂය යි කියනලද අර්හත්ඵලයෙහි අශෛක්ෂ-විමුක්තිවශයෙන් විශෙෂයෙන් ඇලිනිමි; සයං අභිඤ්ඤාය, අභිඥෙය-යාදි වූ ප්‍රභෙද ඇති චතුරාර්‍ය්‍යසත්‍යයන් මම ම ප්‍රත්‍යක්ෂ කොට දැන; කං උද්දිසෙය්‍යං, අනික් කවරක්හු මේ මාගේ උපාධ්‍යාය යි වත් ආචාර්‍ය්‍ය යි වත් කියම්ද.

21. ධම්මදානං, (ලාභසත්කාරාදියෙහි නිරපෙක්ෂ ව හිතාධ්‍යාශ-යෙන් සටුත් පිරිසෙයින් සතරපද ගාථාවකින් අනුමෙවෙනි වශයෙන් පවත්වන ලද්දා වූ) ධර්මදානය තෙම; සබ්බදානං ජිනාති, අන්නදාන පානදානාදි සියලු දශවිධදානවස්තුපරිත්‍යාගය දිනන්-නේය, (ඉදින් යමෙක් සක්වළගැබ මුළුල්ලෙහි බඹලොව දක්වා දතින් දත ගසා වැඩහුන් බුදු-පසේබුදු-මහරහතුන්ට කෙසෙල්-ගොප් වැනි සිවුරු දන් දුන්නේ වී නම් පාත්‍ර පුරා ප්‍රණීත පිණ්ඩ-පාත දන්දුන්නේ වී නම් එසේ ම පාත්‍ර පුරා තෙල් මී සකුරු ආදී ගිලන්පස බෙහෙත්සත්පිරිකර දන්දුන්නේ වී නම් මහාවිහාරය බඳු වූ නොයෙක් ලක්ෂ ගණන් විහාර කරවා දුන්නේ වී නම් ලෝවා-මහපාය බඳු නොයෙක් ලක්ෂගණන් ප්‍රාසාද කරවා දුන්නේ වී නම් ඒ සියලු දානට ද වඩා අනේපිඬු මහසිටාණන් ජෙතවන විහාරය උදෙසා කරණලද සිවුපණස් කෙළක් පමණ ධනපරිත්‍යාගයට ද වඩා ධර්මාශොක රජ්ජුරුවන් සුවාසූදහසක් විහාර උදෙසා කරණ-ලද සනූනු කෙළක් පමණ ධනපරිත්‍යාගයට ද වඩා යටත්පිරි-සෙයින් සතරපද ගාථාවකින් අනුමෙවෙනි වශයෙන් පවත්වන ලද ධර්මදානය ම උතුම් ය යි සේයි. කුමක් හෙයින් ද යත්? මෙකී-තාක් පින්කරන්නාහු බණ අසා ම කරන්නාහ, නො අසා කරන්-නාහු නො වෙත්, එහෙයින් ධර්මදානය ම උතුම් යි); ධම්මරසො, සත්තිස් බොධිපාක්ෂිකධර්මය නවලොකොත්තරධර්මය යන මේ ධර්මරසය ම; සබ්බං රසං ජිනාති, (ලොකයෙහි පවත්නා ලවණාම්ල-තික්ත කටුක කෂාය මධුර යන) සියලු රසයන් දිනන්නේ යි, (කුමක් හෙයින් ද යත්? උඩත්පිරිසෙයින් දෙවියන්ගේ සුධා-භොජනය ද සත්වයන් සංසාරවෘත්තියෙහි හෙළා දුක් අනුභව කරවීමට පස වන්නේය, ධර්මරසය වනාහි සත්වයන් අජරාමර

355 22. හනන්ති (1) භොගා දුම්මෙධං නො චෙ පාරගවෙසිනො,
භොගතණ්හාය දුම්මෙධො හන්ති අඤ්ඤෙ'ව අත්තනං.

356 23. තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා,
තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං.

---

කාරණ හෙයින්) සියලු රසයන්ට උතුම රස නම් වේ; ධම්මරතී, (ලාභසත්කාරාදියෙහි නිරපෙක්ෂ ව නිස්සරණාධ්‍යාශයෙන් ධර්මදෙශනා කරන්නාහට ද "මේ ගුණගණ අනුන් තෙප්ලෙහි දෙස් කියමි, මාගේ තෙප්ලෙහි අනුන් කී දෙස් මෙසෙයින් මුදමි, මට ලාභසත්කාර උපදවමි" මෙසේ අලගද්දූපපර්‍යාප්තියට නො පමුණුවා පර්‍යාප්ති පූරණයෙන් ප්‍රතිපත්ති පූරා අධිගම සිද්ධ කෙරෙමි යන නිස්සරණාධ්‍යාශයෙන් අසන්නහුට ද උපදනා ප්‍රීතිය යි කියනලද) ධර්මරතිය තොමෝ; සබ්බං රතිං ජිනාති, පුත්‍රරති-දුහිතෘරති ආදි වූ සියලු රති තාක් දිනන්නීය; තණ්හක්ඛයො, (සියලු තෘෂ්ණාවන් ක්ෂය කරණ හෙයින් තෘෂ්ණාක්ෂය යි කියනලද අර්හත්මාර්ගඥානාවසානයෙහි උපදනා වූ) අර්හත්ඵලය තෙම; සබ්බදුක්ඛං ජිනාති, සියලු සංසාරදුක්ඛය අභිභවනය කරණ හෙයින් සියලු දුක් තාක් පරදවන්නේ යි.

22. භොගා, වස්ත්‍රාභරණාදි උපභොගවස්තූහු ද දාසිදාසගවමහිෂාදිපරිභොගවස්තූහු ද; දුම්මෙධං, අඥානපුද්ගලයා; හනන්ති, නසන්නාහ; නො චෙ පාරගවෙසිනො, නිවන් නැමැති පරතෙර සොයන සුලු වූ ප්‍රාඥ පුද්ගලයන් නො නසන්නාහුයි, (යම් හෙයකින් අඥානවූ පුද්ගලතෙම ප්‍රාණවධාදියෙන් උමං බිඳීම් මං පැහැරීම් ආදියෙන් තුල කූට මානකූටාදියෙන් භොගපරියෙසනය කරන්නේ බොහෝ අකුසල් රැස් කෙරේ ද එහෙයින් භොගයෝ ඔහු නසන්නාහු නම් වෙති, ප්‍රාඥ පුද්ගලයෝ වනාහි ධාර්මික වූ කෘෂිවාණිජ්‍යාදියෙන් භොගපරියෙසනය කරන්නාහු අකුසල් රැස් නො කෙරෙත්නුයි හෙයින් ඔවුන් නො නසන්නාහු නම් වෙතියි සේයි); දුම්මෙධො, අඥාන පුද්ගල තෙම; භොගතණ්හාය, උපභොග පරිභොගවස්තූන්හි උපන් තෘෂ්ණාව හෙතු කොට ගෙණ බොහෝ පව් රැස් කොට; අත්තනං, තමා; අඤ්ඤෙ ඉව, අනුන් නසන එකක්හු මෙන්; හන්ති, නසන්නේ යි — තමා අපායෙහි හෙළන්නේ යි.

23. ඛෙත්තානි, ඇල්කෙත් ආදි වූ ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, (යම්සේ

---

1 හනති.

357 24. තිණදොසානි ඛෙත්තානි දොසදොසා අයං පජා,
තස්මා හි විතදොසෙසු දින්නං හොති මහප්ඵලං.

358 25. තිණදොසානි ඛෙත්තානි මොහදොසා අයං පජා,
තස්මා හි විතමොහෙසු දින්නං හොති මහප්ඵලං.

359 26. තිණදොසානි ඛෙත්තානි ඉච්ඡාදොසා අයං පජා,
තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං.

තණ්හාවග්ගො චතුවීසතිමො.

---

මාරතු කුඩුමැටි ආදි) තණ දෙස් කොට ඇත්තාහු ද එසේ ම; අයං පජා, මේ මනුෂ්‍ය ප්‍රජාව ද; රාගදොසා, රාගය දෙස් කොට ඇත්තිය; තස්මා හි, එහෙයින්; වීතරාගෙසු, පහ වූ කාමරාග-රූපරාග-අරූපරාග ඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද දනය; මහප්ඵලං හොති, මහත්ඵලවන්නේ ය, (ප්‍රතිසන්ධිවිපාක-ප්‍රවෘත්තිවිපාක වශයෙන් මහත්ඵල-මහානිසංස වන්නේ ය.)

24. ඛෙත්තානි, ඇල්කෙත් ආදි වූ ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, (සම්සේ මාරතු කුඩුමැටි ආදි වූ) තෘණ දෙෂ කොට ඇත්තාහු ද එසේම; අයං පජා, මේ මනුෂ්‍යප්‍රජාව ද; දොසදොසා, ද්වේෂය දෙස් කොට ඇත්තිය; තස්මා හි, එහෙයින්; වීතදොසෙසු, පහ වූ ද්වේෂ ඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද දනය; මහප්ඵලං හොති, මහත්ඵල වන්නේ ය; (ප්‍රතිසන්ධිවිපාක—ප්‍රවෘත්තිවිපාකවශයෙන් මහත්ඵල-මහානිසංස වන්නේ ය.)

25. ඛෙත්තානි, ඇල්කෙත් ආදි වූ ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, (සම්සේ මාරතු කුඩුමැටි ආදි වූ) තෘණ දෙෂ කොට ඇත්තාහු ද එසේම; අයං පජා, මේ මනුෂ්‍ය ප්‍රජාව ද; මොහදොසා, (චතුරාර්‍ය්‍ය-සත්‍යයන් දක්ක නොදී මුළා කොට සිටිනා අඥානලක්ෂණ වූ) මෝහය දෙස් කොට ඇත්තිය; තස්මා හි, ඒ කාරණයෙන්; වීත-මොහෙසු, අර්හත්මාර්ගයෙන් පහකරණලද මෝහ ඇති ක්ෂීණාශ්‍රව-යන්ට; දින්නං, දෙනලද දනය; මහප්ඵලං හොති; මහත්ඵල වන්නේ ය (ප්‍රතිසන්ධිවිපාක—ප්‍රවෘත්තිවිපාකවශයෙන් මහත්ඵල—මහානිසංස වන්නේ ය).

26. ඛෙත්තානි, ඇල්කෙත් ආදි වූ ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, (සම්සේ මාරතු කුඩුමැටි ආදි වූ) තෘණ දෙෂ කොට ඇත්තාහු ද එසේ ම; අයං පජා, මේ මනුෂ්‍යප්‍රජාව ද; ඉච්ඡාදොසා, (නොලද

360 1. චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො,
ඝානෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො.

361 2. කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො,
මනසා සංවරො සාධු සාධු සබ්බත්ථ සංවරො;
සබ්බත්ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චති.

---

(ලාභපැතීමය ලද ලාභයෙහි බලවත්ගෙධය යන) ඉච්ඡාව දෙස් කොට ඇත්තීය; තස්මා හි, ඒ කාරණයෙන්; විගතිච්ඡෙසු, අර්හත්මාර්ගයෙන් පහකරණලද තෘෂ්ණා ඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද දානය; මහප්ඵලං හොති, මහත්ඵල වන්නේයි; (ප්‍රතිසන්ධිවිපාක—ප්‍රවෘත්තිවිපාකවශයෙන් මහත්ඵල—මහානිසංස වන්නේයි)

### තණ්හාවග්ගො වස්තු විස්තර නිමා.

---

1. චක්ඛුනා සංවරො, චක්ෂුර්ද්වාරයට ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද රූපාරම්මණයක් හමුවූ කල්හි යෝනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලෝභ-ද්වේෂ-මෝහ නූපදවා ලෝභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ සිත රැක්ම; සාධු, යහපත; සොතෙන සංවරො, ශ්‍රොත්‍රද්වාරයට ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද ශබ්දාලම්බනයක් හමුවූ කල්හි යෝනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලෝභ-ද්වේෂ-මෝහ නූපදවා ලෝභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ සිත රැක්ම; සාධු, යහපත; ඝානෙන සංවරො, ඝ්‍රාණද්වාරයට ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද ගන්ධාලම්බනයක් හමුවූ කල්හි යෝනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලෝභ-ද්වේෂ-මෝහ නූපදවා ලෝභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ සිත රැක්ම; සාධු, යහපත; ජිව්හාය සංවරො, ජිව්හාද්වාරයට ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද රසාලම්බනයක් හමුවූ කල්හි යෝනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලෝභ-ද්වේෂ-මෝහ නූපදවා ලෝභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ සිත රැක්ම; සාධු, යහපති.

2. කායෙන සංවරො, කායප්‍රසාදය යන කායද්වාරයට ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද ස්පෘෂ්ටව්‍යාලම්බනයක් හමුවූ කල්හි යෝනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලෝභ-ද්වේෂ-මෝහ නූපදවා ලෝභාදි පාපධර්මයන් කෙරෙන් තමාගේ සිත රැක්ම ද; කායවිඥප්තිය යි කියනලද කායද්වාරයෙන් ජවනක්ෂණයෙහි සිද්ධවන ප්‍රාණඝාත-අදත්තාදාන-කාමමිථ්‍යාචාරයෙන් දුරු ව තමාගේ සිත

362 3. හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො
වාචාය සඤ්ඤතො සඤ්ඤතුත්තමො;
අජ්ඣත්තරතො සමාහිතො
එකො සන්තුසිතො තමාහු භික්ඛුං.

363 4. යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො,
අත්ථං ධම්මඤ්ච දීපෙති මධුරං තස්ස භාසිතං.

---

රැක්ම ද; සාධු, යහපත; වාචාය සංවරො, වචීවිඥප්තිය යි කියනලද වචීවාරයෙන් සිදුවන මිථ්‍යාවාද-පෛශුන්‍ය-පරුෂවචන-සම්ඵප්‍රලාපයෙන් දුරු ව තමාගේ සිත රැක්ම; සාධු, යහපත; මනසා සංවරො, මනොවාරාවර්ජනයට අනන්තරප්‍රත්‍යය වූ භවාංගය යි කියනලද මනොවාරයෙන් ජවනක්ෂණයෙහි සිදුවන අභිධ්‍යා-ව්‍යාපාද-මිථ්‍යාදෘෂ්ටියෙන් දුරු ව තමාගේ සිත රැක්ම; සාධු, යහපත; සබ්බත්ථ සංවරො, චක්ෂුරාදී සදොරම සංවරය; සාධු, යහපත; සබ්බත්ථසංවුතො භික්ඛු, සදොරම රක්ෂිතගොපිත වූ සිත් ඇති මහණ තෙම; සබ්බදුක්ඛා පමුච්චති, සියලු සංසාරදුක්ඛයෙන් මිදෙන්නේයි.

3. යො, යම් ක්ෂීණාශ්‍රව පුද්ගලයෙක්; හත්ථසඤ්ඤතො, (අත්-කෙළවීම් ආදියක් නැතිහෙයින් ද අතින් අනුන් පැහැරීම් ආදියක් නැති හෙයින් ද) අතින් සඤ්ඤත ද; පාදසඤ්ඤතො, (පාසැලීම් ආදියක් නැතිහෙයින් ද පයින් අනුන් පැහැරීම් ආදියක් නැති හෙයින් ද) පයින් සඤ්ඤත ද; වාචාය සඤ්ඤතො, මුසාවාදාදිය නො කියන හෙයින් වචනයෙන් සඤ්ඤත ද; සඤ්ඤතුත්තමො, (හිස් සැලීම් බැමබිඳීම් ආදි කායවිකාරයක් නැතිහෙයින්) කයින් සඤ්ඤත ද; අජ්ඣත්තරතො, ගොචරජ්ඣත්තය යි කියනලද කර්මස්ථානාදිකම්ස්ථානභාවනාවෙහි ඇලිනී ද; සමාහිතො, උපචාරසමාධි-අර්පණාසමාධියෙන් සමාහිත ද; එකො, සතර ඉරියව්වෙහි ම එකවිහාරී ද; සන්තුසිතො, විදර්ශනාරම්භයෙහි පටන් තමාගේ අධිගමයෙන් සතුටු ද, නොහොත් චීවරාදි චතුර්විධ-ප්‍රත්‍යයෙහි යථාලාභසන්තොෂාදියෙන් සතුටු ද; තං, ඔහු; භික්ඛුං ආහු, (බුද්ධාදිප්‍රාඥයෝ) භින්න වූ කෙලශයන් ඇති හෙයින් භික්ෂුව යි කියත්.

4. යො භික්ඛු, යම් මහණෙක්; මුඛසඤ්ඤතො, (අනුන්ට ජාත්‍යාදියෙන් ගරා නො බණනා බැවින් ද මුසාවාදාදිය නො කියන බැවින් ද) මුඛයෙන් සඤ්ඤත ද; මන්තභාණී, අචාලප්‍රත්‍යවේක්ෂා කොට නුවණින් සෙදී බණනා සුලු ද; අනුද්ධතො, සන්හුන් හිමිසින් ඇත්තේ ද; අත්ථං, (පාලි) අර්ථය ද; ධම්මඤ්ච, පාලිය ද, දීපෙති,

364 5. ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං,
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති.

365 6. සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ,
අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති.

366 7. අප්පලාභොපි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති,
තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවිං අතන්දිතං.

---

(පරිමණ්ඩල වූ පදව්‍යඤ්ජනයෙන් මනා කොට) ප්‍රකාශ කෙරේ ද; **තස්ස,** ඒ මහණහුගේ; භාසිතං, වචනය; මධුරං, මධුර නම් වේ.

5. ධම්මාරාමො, සමථ-විදර්ශනාධර්මය වාසස්ථාන කොට ඇති; ධම්මරතො, ඒ සමථ-විදර්ශනාධර්මයෙහි ඇලුනා වූ; ධම්මං අනුවිචින්තයං, ඒ සමථ-විදර්ශනාධර්මය නැවත නැවත මෙනෙහි කරන්නා වූ; ධම්මං අනුස්සරං, ඒ සමථ-විදර්ශනාධර්මය නැවත නැවත සිහිකරන්නා වූ; භික්ඛු, මහණ තෙමේ; සද්ධම්මා න පරිහායති, සත්තිස් බොධිපාක්ෂික නවලොකොත්තරධර්මය යි කියනලද සද්ධර්මයෙන් නො පිරිහෙන්නේ යි.

6. සලාභං, ස්වකීය වූ ලාභය, හෙවත් උච්ච-නීචකුලයෙහි ගෙපිළිවෙළින් දොර-දොර සිට සිඟා ලැබිය යුතුහෙයින් තමාසතු (මද වූ ද බොහෝ වූ ද රූක්ෂ වූ ද ප්‍රණීත වූ ද) ලාභය; නාතිමඤ්ඤෙය්‍ය, අවඥා නො කරන්නේය, (=ඒ ලාභය හෙළා නො දක්නේය); අඤ්ඤෙසං, අනුන්ගේ (බොහෝ වූ ප්‍රණීත වූ) ලාභය; පිහයං, ප්‍රාර්ථනාකරෙමින් (=කැමැතිවෙමින්); න චරෙ, නො හැසිරෙන්නේය; අඤ්ඤෙසං පිහයං භික්ඛු, අනුන්ගේ චීවරාදිලාභය පතන්නා වූ මහණ තෙම; සමාධිං නාධිගච්ඡති, උපචාරසමාධියට වත් අර්පණාසමාධියට වත් නො පැමිණෙන්නේ යි.

7. අප්පලාභොපි භික්ඛු, විපුල වූ ප්‍රණීත වූ චීවර-පිණ්ඩපාතාදි චතුර්විධ ප්‍රත්‍යයට ලාභී නො වූ ද මහණ තෙම; චෙ, ඉදින්; සලාභං, උච්ච-නීචකුලයෙහි ගෙපිළිවෙළින් දොර-දොර සිට සිඟා ලබනලද) තමාගේ ලාභය; නාතිමඤ්ඤති, අවඥා නො කෙරේ ද, (=හෙළා නො දකී ද): සුද්ධාජීවිං, සාර වූ ජීවිකා ඇතිබැවින් පිරිසිදු වූ ජීවිකා ඇති; අතන්දිතං, උත්සාහබල නිසා ජීවත්වන බැවින් අකුසීත වූ; තං, ඒ මහණහුට; දෙවාපි, දෙවියෝ ද; වෙ, ඒකාන්තයෙන්; පසංසන්ති, ප්‍රශංසා කෙරෙත් — ස්තුති කෙරෙතියි සේ යි.

367 8. සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
අසතා ච න සොචති ස වෙ භික්ඛූති වුච්චති.

368 9. මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ,
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.

369 10. සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තා තෙ ලහුමෙස්සති,
ඡෙත්වා රාගඤ්ච දොසඤ්ච තතො නිබ්බානමෙහිසි.

---

8. යස්ස, යම් ක්ෂීණාශ්‍රවපුද්ගලයක්හට; නාමරූපස්මිං, නාම-රූප දෙක්හි, හෙවත් රූප-වෙදනා-සඤ්ඤා-සංස්කාර-විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයෙහි; සබ්බසො, සර්වප්‍රකාරයෙන් ම; මමායිතං නත්ථි, මමත්වයක් නැද්ද; (=මමය මාගේ යයි ආත්ම ආත්මීය වශයෙන් ගැන්මක් නැද්ද; අසතා ච න සොචති, ඒ නාමරූපදෙක නට-කලත් නටබව හෙතු කොටගෙණ සොක නො කෙරේ ද), (නස්නා ස්වභාව වූ ධර්මය නටැයි සිතා මුත් මාගේ රූපය නට, වෙදනා-සඤ්ඤා-සංස්කාරයෝ නටහ, විඤ්ඤාණය නටැයි මෙසේ චිත්තදුඃඛයට නො පැමිණේ ද); සො, ඒ ක්ෂීණාශ්‍රවපුද්ගල තෙම; භික්ඛූති, වුච්චති, භින්න වූ ක්ලේශයන් ඇතිහෙයින් භික්ෂුව යි කියනු ලැබේ

9. යො භික්ඛු, යම් මහණෙක්; මෙත්තාවිහාරී, (මෛත්‍රීකර්මස්ථානයෙහි පරිකර්ම කිරීමෙන් ද, ත්‍රික-චතුෂ්කධ්‍යාන ඉපදවීමෙන් ද) මෛත්‍රී විහාර ඇත්තේ ද; බුද්ධසාසනෙ, සර්වඥශාසනයෙහි; පසන්නො, අචලශ්‍රද්ධාවෙන් යුක්තහෙයින් ප්‍රසන්න ද,(ඒ මහණ තෙම); සඞ්ඛාරූපසමං, සියලු සංස්කාරයන් සන්සිඳුවන්නා වූ; සුඛං, අත්‍යන්ත සුඛ වූ; සන්තං පදං, ශාන්ත වූ නිර්වාණය; අධිගච්ඡෙ, ලබන්නේයි—ශාන්ත වූ නිර්වාණයට පැමිණෙන්නේය යි සේයි.

10. භික්ඛු, මහණ; ඉමං නාවං, (කාමවිතර්ක-මිථ්‍යාවිතර්කාදිජලයෙන් හරිත වූ තාගේ) මේ ශරීර නැමැති නැවට වන් මිථ්‍යාවිතර්ක-ජලය; සිඤ්ච, ඉසපිය; තෙ, තාවිසින්; සිත්තා, (චක්ෂුරාදි ඒ ඒ සිදුරු සංවර නැමැති අණ ගසා ඇලෙ‍්‍රලා (1) ඈතුලුවවන් මිථ්‍යාවිතර්ක නැමැති ජලය) ඉස පියහලද්ද වූ මේ ශරීර නැමැති නෞකා තොම; ලහු, සැහැල්ලුව, නොහොත් වහා ම; එස්සති, සංසාරසාගරයෙහි නො ඇලී නිවන්පුරයට පැමිණෙන්නේයි; රාගඤ්ච, රාගබන්ධනය ද; දොසඤ්ච, ද්වෙෂබන්ධනය ද; ඡෙත්වා, අභිනවාශීඥන නැමැති ශස්ත්‍රයෙන් කපා හැර; තතො, ඉක්බිත්තෙන්; නිබ්බානං, එහිසි, නිරුපධිශෙෂනිර්වාණයට පැමිණෙන්නෙහියි.

---

1 නැසවාලා, වසාලා.

370 **11. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,**
**පඤ්චසඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චති.**

371 **12. ඣාය භික්ඛු මා ච පමාදො මා තෙ කාමගුණෙ භමස්සු චිත්තං,**
**මා ලොහගුළං ගිලී පමත්තො මා කන්දි දුක්ඛමිදන්ති ඩය්හමානො.**

372 **13. නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො,**
**යම්හි ඣානඤ්ච පඤ්ඤා ච ස වෙ නිබ්බාණසන්තිකෙ.**

---

11. **පඤ්ච ඡින්දෙ,** (යටදිසාව යයි කියනලද කාමධාතුවට (1) පමුණුවන හෙයින් ඔරම්භාගිය නම් වූ) සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-කාමරාග-ව්‍යාපාද යන සංයොජනයන් පස්දෙනා (පය බැඳි රැහැනක් ශස්ත්‍රයකින් කපන පුරුෂයකු මෙන්) ශ්‍රොතාපත්තිමාර්ගාදි යට තුන්මගින් කපන්නේය; **පඤ්ච ජහෙ,** (උඩ දිසාව යයි කියනලද රූපාරූපධාතූන්ට (2) පමුණුවන හෙයින් උද්ධම්භාගිය නම් වූ) රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන සංයෝජනයන් පස්දෙනා (ග්‍රීවයෙහි බැඳි රැහැනක් ශස්ත්‍රයකින් කපන පුරුෂයකුමෙන්) අර්හත්මාර්ගයෙන් සිඳ දුරු කරන්නේය; **පඤ්ච චුත්තරිභාවයෙ,** (උද්ධම්භාගිය සංයොජනයන් පස්දෙනාගේ ප්‍රහාණය පිණිස) ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් පස්දෙනා අධික කොට වඩන්නේය; **පඤ්චසඞ්ගාතිගො භික්ඛු,** මෙසේ කළ කල්හි රාගසඞ්ගය දෝෂසඞ්ගය මෝහසඞ්ගය මානසඞ්ගය දෘෂ්ටිසඞ්ගය යන සඞ්ගයන් පස්දෙනා ඉක්මුණු මහණ තෙම; **ඔඝතිණ්ණො ඉති වුච්චති,** කාමෞඝාදි සතරමහවතුරෙන් එතරවීයයි කියනුලැබේ.

12. **භික්ඛු,** මහණ; **ඣාය,** ආලම්බනොපනිජ්ඣාන-ලක්ඛණොපනිජ්ඣාන වශයෙන් ද්විවිධ වූ ධ්‍යානය වඩ; **මාච පමාදො,** කායකර්මාදි ත්‍රිවිධසුචරිතයෙහි ප්‍රමාදබවට නො පැමිණ, (ධ්‍යානභාවනායෙහි ද ත්‍රිවිධසුචරිතධර්මයෙහි ද ප්‍රමාදවිහාරිබවට නො පැමිණයයි සේයි) **තෙ චිත්තං,** තාගේ සිත; **කාමගුණෙ,** පස්කම් කොටස්හි; **මා භමස්සු;** නහමක් බමව; **පමත්තො,** ධ්‍යානභාවනාවෙහිද ත්‍රිවිධ වූ සුචරිතයෙහිද ප්‍රමාද වූ යේ, (පඤ්චකාමගුණයෙහි ගිජු වූ යේ); **ලොහගුළං මාගිලි,** නරකයෙහි ඉපද ලොහොගුළු නො ගිල; **ඩය්හමානො,** නරකගින්නෙහි දමින් (පැලෙමින්); **ඉදං දුක්ඛන්ති,** මේ දුකැයි; **මාකන්දි,** නහඬක් හඬ.

13. **අපඤ්ඤස්ස,** ධ්‍යානොත්පාදක වූ ත්‍රිහේතුකසම්ප්‍රයුක්ත වූ ප්‍රඥාව නැත්තාහට; **ඣානං නත්ථි,** ධ්‍යාන නම් නැත; **අඣායතො;** භාවනා

---

1 සතරඅපායට. (මේ විමසියයුතුයි.) 2 දෙව්ලොවට. (විමසියයුතුයි.)

373 14. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො.

374 15. යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං,
ලභතී පීතිපාමොජ්ජං අමතං තං විජානතං.

375 16. තත්‍රායමාදි භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො,
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨි පාතිමොක්ඛෙ ච සංවරො;
මිත්තෙ භජස්සු කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ.

---

නො කරන්නාහට; පඤ්ඤා, ("සමාහිතො යථාභූතං පජානාති" කියනලද ලක්‍ෂණ ඇති) ප්‍රඥ නොම; නත්ථි, නැත; යම්හි, යම් පුද්ගලයක්හු කෙරෙහි; ඣානඤ්ච, ධ්‍යානය ද; පඤ්ඤා ච, ප්‍රඥව ද යන මේ දෙක ඇද්ද; සො, ඒ පුද්ගල තෙම; වෙ, ඒකාන්තයෙන්; නිබ්බාණසන්තිකෙ, නිර්වාණයට සමීප ම සිටියේ ම වේ.

14. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස, ශූන්‍යාගාරයට වන්නා වූ, හෙවත් ජනවිවික්තස්ථානයෙක්හි කර්මස්ථාන මෙනෙහි කෙරෙමින් උන්නා වූ; සන්තචිත්තස්ස, නිවිසින් ඇත්තා වූ; ධම්මං, රූපාරූපධර්මයන්; සම්මා, මනා කොට: විපස්සතො, අනිත්‍යාදිවශයෙන් විශෙෂයෙන් බලන්නා වූ; භික්ඛුනො, මහණුට; අමානුසීරති හොති, (විදර්ශනාවෙහි අභියොගයක් නැති අන්‍ධ පෘථග්ජන වූ ලෞකිකජනයා විසින් ලැබිය නො හැකි වූ) විදර්ශනාසඞ්ඛ්‍යාත වූ අමානුසික වූ ප්‍රීතිය ද අෂ්ටසමාපත්තිසඞ්ඛ්‍යාත දිව්‍යරතිය ද වන්නී සි— උපදනී සි ළේසි.

15. යතො යතො, යම් යම් කලෙක්හි, හෙවත් අටතිස් අරමුණෙන් එක්තරා අරමුණෙක්හි පිරියම්කරණ මහණ පෙරවරු පස්වරු ආදි වූ යම් කිසිකලෙක්හි; ඛන්ධානං, රූපාදිපඤ්චස්කන්ධයන්ගේ; උදයබ්බයං, "අවිජ්ජාසමුදයා රූපසමුදයො" යනාදීන් පස්විසිආකාරයෙකින් උදය ද "අවිජ්ජානිරොධා රූපනිරොධො" යනාදීන් පස්විසිආකාරයෙකින් ව්‍යය ද; සම්මසති, සම්මර්ශනය කෙරේ ද, (=සලකා ද) එකල්හි; පීතිපාමොජ්ජං ලභති, (මෙසේ සමපණස් ආකාරයෙන් ස්කන්ධයන්ගේ උදයව්‍යය සලකන මහණ) යම් ධර්මප්‍රීතියක් යම් ධර්මප්‍රමොද්‍යයක් ලබා ද; තං, ඒ සපත්‍යය වූ (නාමරූපධර්මයන් ප්‍රකට ව වැටහෙන කල්හි උපන්නා වූ) ප්‍රීතිප්‍රමොද්‍යය; විජානතං, නුවණැත්තවුන්ට, අමතං, (අමෘතමහානිර්වාණයට පමුණුවන හෙයින්) අමෘත නම් වේ.

16. ඉධ, මේ බුද්ධශාසනයෙහි; පඤ්ඤස්ස භික්ඛුනො, නුවණැති මහණුට; තත්‍ර, ඒ පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය සම්මර්ශනයෙහි;

376 **17. පටිසන්ථාරවුත්‍යස්ස ආචාරකුසලො සියා,**
**තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සසි.**

377 **18. වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති,**
**එවං රාගඤ්ච දොසඤ්ච විප්පමුඤ්චෙථ භික්ඛවො.**

378 **19. සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො,**
**වන්තලොකාමිසො භික්ඛු උපසන්තොති වුච්චති.**

---

**අයං ආදි** භවති, මේ චතුපාරිශුද්ධිශීලය පූර්වස්ථානයෙහි වේ. (පූර්වකාරණය වේ) ඒ කවරේ ද යත්? ඉන්ද්‍රියගුත්ති; (චක්ෂුරාදි සදොරට හමු වූ රූපාදි සදරමුණෙහි ලෝභ-ද්වේෂ-මෝහ නූපදවා යෝනිසෝ අවජ්ජන් පැවැත්වීම යන) ඉන්ද්‍රියසංවරශීලය ද; සන්තුට්ඨි, චීවරාදි-චතුර්විධ ප්‍රත්‍යයෙහි යථාලාභසන්තොෂය යථාබලසන්තොෂය යථාසාරුප්පසන්තොෂය ද; පාතිමොක්ඛෙ ච සංවරො, ප්‍රාතිමෝක්ෂ-ශීලසඞ්ඛ්‍යාත වූ ප්‍රධානශීලයෙහි පරිපූර්ණකාරී බව ද යන මේයි, (එහෙයින් මේ චතුපාරිශුද්ධිශීලයෙහි පිහිටා) සුද්ධාජීවෙ, (එක්විසි-අනෙසනෙන් දුරු ව සාර වූ ජීවිකා ඇතිබැවින්) පිරිසිදු වූ ආජීව-ඇති; අතන්දිතො, (ජඞ්ඝාබලය නිසා ජීවිකාව කරණහෙයින්) **අකුසීත** වූ; කල්‍යාණෙ මිත්තෙ භජස්සු, දශකථාවස්තුලාභී වූ කල්‍යාණමිත්‍රයන් සේවනය කර.

**17.** පටිසන්ථාරවුත්‍යස්ස, (අනෙවාසිකසද්ධිවිහාරිකයන්ට ද; පැමිණි ආගන්තුකයන්ට ද, ධර්මපටිසන්ථාර-ආමිසපටිසන්ථාර කිරීමෙහි සම්පන්න වූ ප්‍රවෘත්ති ඇතිබැවින්) පරිසන්ථාරශීලී ව සංග්‍රහකරණ සුළු වූයේක්; අස්ස, වන්නේය; ආචාරකුසලො, ශීලය වත්පිළිවෙත්ය යන ආචාරයෙහි දක්ෂ වූයෙක්; සියා, වන්නේය; තතො පාමොජ්ජබහුලො, ඒ පටිසන්ථාරයෙහි පැවැත්මෙන් ද, ආචාරයෙහි දක්ෂවීමෙන් ද උපන් ධර්මප්‍රමොද්‍යයෙන් ප්‍රීතිබහුල වූ යේ;[1] දුක්ඛස්සන්තං කරිස්සසි, සියලු සංසාරදුඃඛය ක්ෂය කරන්නෙහි සි.

18. මද්දවානි, පරව මලාවගියා වූ; පුප්ඵානි, පුෂ්පයන්; වස්සිකා විය පමුඤ්චති, වස්සිකාලතා තොමෝ යම්සේ තුවටුයෙන් මුදා ද, (ඊයේ පිපි මල් අද පරව ගිලන්ගල දුසමන්ලියය ඒ පරමල් තාක් තුවටුයෙන් මුදා යම්සේ බිම හෙළාපියා ද;) එවං, එපරිද්දෙන් ම; භික්ඛවො, මහණෙනි; රාගඤ්ච, රාගය ද; දොසඤ්ච, ද්වේෂය ද; විප්පමුඤ්චෙථ, තොපගේ සන්තානයෙන් මුදා හැරපියව්.

19. සන්තකායො, ප්‍රාණවධාදි ත්‍රිවිධකායදුශ්චරිතයෙන් දුරු වූ

---

1 යෙහි.

379 **20. අත්තනා චොදයත්තානං, පටිමාසෙ අත්තමත්තනා,**
**සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු විහාහිසි.**

380 **21. අත්තා හි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති,**
**තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රංව වාණිජො.**

---

හෙයින් ශාන්ත වූ කායකර්ම ඇති; සන්තවාචො; (මෘෂාවාදාදිචතුර්විධ-වාග්දුශ්චරිතයෙන් දුරු වූ හෙයින්) ශාන්ත වූ වාග්කර්ම ඇති; සන්තවා, (අභිධ්‍යාදිත්‍රිවිධමනොදුශ්චරිතයෙන් දුරු වූ හෙයින්) ශාන්ත වූ මනොකර්ම ඇති; සුසමාහිතො, කායාදිකර්මත්‍රය ම මනාකොට පිහිටි හෙයින් ඉතා සමාහිත වූ; වන්තලොකාමිසො භික්ඛු (චතුර්විධආර්ය්‍යමාර්ගඥානමුඛයෙන්) වමනය කරණලද පඤ්චකාම-ගුණසඞ්ඛ්‍යාත ලොකාමිස ඇති මහණ තෙමේ; උපසන්තොති වුච්චති, සන්තානයෙහි රාගාදීන් සන්හුන් බව හෙතු කොට ගෙණ අතිශයින් ශාන්ත යයි කියනුලැබේ.

20. අත්තනා, තෝ ම; අත්තානං, තට; චොදය, චොදනා කර; (මහණ මෙබඳු නෛර්‍යාණික වූ බුද්ධශාසනයෙහි මහණ වූ තාවිසින් මේ කායදුශ්චරිතය කළසේ නපුරු වේ ද මේ වාග්දුශ්චරිතය කීසේ නපුරු වේ ද මේ මනොදුශ්චරිතය සිතූසේ නපුරු වේදැයි තෝ ම තට චොදනා කර) අත්තං, තා; අත්තනා, තෝම; පටිමාසෙ, විමසා; (කිම රැ දවල්හු මා වත්පිළිවෙත් කරන්නාහට බණ හදාරන්නාහට කම්ටහන්හි යෙදෙන්නාහට ඉක්මෙන් දේ හෝ නො එසේ වූවාහට ඉක්මෙන් දේ හෝයි තෝ ම තා පරීක්ෂා කර); භික්ඛු, මහණ; සො ත්වං, එසේ තෝ; අත්තගුත්තො, තා විසින් ම රක්නාලද්දෙහි; සතිමා, එළඹසිටි සිහිඇතිබැවින් සමෘතිමත්වූයෙහි; සුඛං විහාහිසි, සතරඉරියව්වෙහි ම සුවසෙන් වසන්නෙහි සී.

21. හි, යම් හෙයකින්; අත්තා; පුද්ගල තෙමේ ම; අත්තනො, තමහට; නාථො, පිහිට වේ ද; හි, යම් හෙයකින්; අත්තා, පුද්ගල තෙමේ ම; අත්තනො, තමහට; ගති, පිළිසරණ ද; තස්මා, එහෙයින්, හෙවත් තමා ම තමහට පිහිට වන හෙයින් තමා ම තමහට පිළිසරණ වන හෙයින්; භද්‍රං අස්සං, සින්ධුදේශයෙහි උපන් වර්ණ-ජව-බල-සම්පන්න වූ උත්තම වූ අශ්වාජානීයයෙකු පොෂණය කරන්නා වූ, හෙවත් මෝහු නිසා බොහෝ ලාභ ලබම් යි ඔහු ප්‍රපාතස්ථාන-විෂමස්ථානයෙහි ඇවිද්ද නොදී තුන් වේලෙහි තනවා කවා පොවා රක්ෂා කරණ; වාණිජො ඉව, අස්වෙළෙන්දකු මෙන්;

381 22. පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ,
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.

382 23. යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

භික්ඛුවග්ගො පඤ්චවීසතිමො.

---

383 1. ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ,
සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූසි බ්‍රාහ්මණ.

---

අත්තානං, තමා; සඤ්ඤද විය, කායාදි මාරත්‍රයෙන් අකුසලුන් වැද්ද-නොදී මනා කොට රක්‍ෂා කර.

22. පාමොජ්ජබහුලො, පියවියෙන් ම බුදුන්කෙරෙහි සන්තොෂ බහුල වූ; බුද්ධසාසනෙ, බුදුන්ගේ අනුශාසනයෙහි; පසන්නො, ප්‍රසන්න වූ; භික්ඛු, මහණ තෙම; සඞ්ඛාරූපසමං, සියලු සංස්කාරයන් සන්සිඳුවන්නා වූ; සුඛං, එහෙයින් ම එකාන්ත සුව වූ; සන්තං පදං, අත්‍යන්තශාන්ත වූ නිර්වාණයට; අධිගච්ඡෙ, පැමිණෙන්නේ යි.

23. දහරො, ළදරු වූ, යො භික්ඛු, යම් මහණෙක්; බුද්ධසාසනෙ, බුදුන්ගේ අනුශාසනයෙහි, හෙවත් කමටහන්හි; යුඤ්ජති, යෙදේ ද; සො, ඒ මහණ තෙම; අබ්භා මුත්තො, වලාපටලයෙකින් මිදුනා වූ; චන්දිමා ඉව, පූර්ණචන්ද්‍රයා අවකාශලොකය බබුළුවන්නාක් මෙන්; ඉමං ලොකං, ස්කන්ධාදිසංඛ්‍යාත වූ මේ ලොකය; හවෙ, එකාන්ත-යෙන්; පභාසෙති, ඥාණාලොකයෙන් බබුළුවන්නේ යි.

භික්ඛුවග්ගො පඤ්චවීසතිමො.

---

1. බ්‍රාහ්මණ, බමුණ; පරක්කම්ම, ඥානසම්ප්‍රයුක්ත වූ සම්‍යක්-ප්‍රධානය යි කියන ලද වීර්‍ය්‍යය කොට; සොතං, (අනාදිමත්කාලයෙහි අවිච්ඡින්න ව පැවැත්තා වූ) තෘෂ්ණා නැමැති දියවතුර; ඡින්ද, සිඳ-පිය; කාමෙ පනුද, ඒ තෘෂ්ණා ශ්‍රොතස සිඳිනා පිණිස වස්තුකාම-ක්ලෙශකාමයන් සන්තානයෙන් පහ කර; බ්‍රාහ්මණ, බමුණ; සඞ්ඛා-රානං ඛයං ඤත්වා, පඤ්චස්කන්ධයන්ගේ ක්‍ෂණික නිරොධ-සන්තති නිරොධවශයෙන් ම වන්නා වූ විනාශය විදර්ශනාඥානයෙන් දැන; අකතඤ්ඤූ අසි, (මෙසේ කල්හි තෝ රත්රිදී ආදි කිසිවෙකින් වත්

384 2. යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො,
අථස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති ජානතො.

385 3. යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති,
වීතද්දරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

386 4. ඣායිං විරජමාසීනං කතකිච්චං අනාසවං,
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

---

ශක්‍ර බ්‍රහ්මාදි කිසිකෙනෙකුන් විසින් වත් නො කරණලද හෙයින්) අකත නම් වූ නිර්වාණය ආලම්බන කිරීම් වසයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට දුටුමෙන් අකෘතඥ නම් වන්නේහි සි.

2. බ්‍රාහ්මණො, ක්‍ෂීණාශ්‍රවබ්‍රාහ්මණ තෙම; යදා, යම් කලෙක්හි; ද්වයෙසු ධම්මෙසු, සමථවිදර්ශනාවශයෙන් විවිධ වූ ධර්මයෙහි; පාරගූ හොති, අභිඥාපාරගාදි වශයෙන් පරතෙරට පැමිණියේ වේ ද; අථ, එකල්හි; ජානතො, (දුඃඛ සත්‍යය පරිඥෙයාද්‍යයය, සමුදයසත්‍යය ප්‍රහාතව්‍යය යනාදීන්) චතුරාර්‍ය්‍යසත්‍යයන් සත්‍යඥාන, කෘත්‍යඥානාදි-වශයෙන් මනා කොට දන්නා වූ; අස්ස, ඒ ක්‍ෂීණාශ්‍රවබ්‍රාහ්මණයාගේ; සබ්බෙ සංයොගා, සංසාර චක්‍රයෙහි යොදන්නට සමර්ථ වූ කාම-සංයොගාදි සියලු සංයොගයෝ; අත්ථං ගච්ඡන්ති, ක්‍ෂයට පැමිණෙන්-නාහුයි.

3. යස්ස, යම් ආර්‍ය්‍යශ්‍රාවකයකුහට; පාරං, ආධ්‍යාත්මික වූ චක්‍ෂුරාදි ෂඩායතනය යි කියනලද පාරය ද, හෙවත් එතෙර ද; අපාරං වා, බාහිර වූ රූපාදිෂඩායතනය යි කියනලද අපාරය ද, හෙවත් මෙ-තෙර ද; පාරාපාරං, අජ්ඣත්තිකබාහිරායතන ය යි කියනලද පාරය ද අපාරය ද, හෙවත් එතෙර ද මෙතෙර ද; (1) න විජ්ජති, (මම ය යි වත් මාගේ ය යි වත් ගැන්මක් නැතිහෙයින්) නැද්ද; වීතද්දරං, පහ වූ කෙලශපීඩා ඇති; විසංයුත්තං, සකල ක්ලේශයන් කෙරෙන් විනිර්මුක්ත වූ; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම්; බ්‍රාහ්මණං බ්‍රෑමි, බාහිතපාපයන් ඇති හෙයින් බ්‍රාහ්මණ ය යි කියමි.

4. ඣායිං, ආලම්බනොපනිධ්‍යාන-ලක්‍ෂණොපනිධ්‍යානවශයෙන් ද්විවිධ වූ ධ්‍යානයෙන් ධ්‍යායී වූ, (=සමථවිදර්ශනාභාවනාවෙහි යුක්තා-ප්‍රයුක්ත වූ); විරජං, රාගාදි රජස් නැත්තා වූ; ආසීනං, වනයෙහි හු කලාව හුන්නා වූ, හෙවත් ගැඹුරුවල්හි හුදකලාව වසන්නා වූ; කතකිච්චං, චතුර්විධආර්‍ය්‍යමාර්ගයෙන් කරණලද පරිඥාදිෂොඩශවිධ-කෘත්‍ය ඇති හෙයින් කෘතකෘත්‍ය වූ; අනාසවං, චතුර්විධආශ්‍රවාශී-

---

1 මේ [illegible] විසින් [illegible].

387 5. දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා,
සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහ්මණො;
අථ සබ්බමහොරත්තිං බුද්ධො තපති තෙජසා.

388 6. බාහිතපාපො'ති බ්‍රාහ්මණො සමචරියා සමණො'ති වුච්චති,
පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතො'ති වුච්චති.

---

යත්ථ තිසිතිසි පරිච්ඡෙදත් ප්‍රහීණකරණලද චතුරාශ්‍රවයන් ඇති-හෙයින් අනාශ්‍රව වූ; උත්තමත්ථං අනුප්පත්තං, උත්තමාර්ථ යයි කියනලද අර්හත්ඵලයට පැමිණියා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බාහිත වූ පාපයන් ඇතිහෙයින් බ්‍රාහ්මණය යි කියමි.

5. ආදිච්චො, සූර්ය්‍යා; දිවා තපති, දවල් ම දිලියෙන්නේය, (රෑ නො දිලියෙන්නේය); චන්දිමා, චන්ද්‍රයා; රත්තිං ආභාති, (අභ්‍ර-මහික-ධූම-රජො-රාහු යන පඤ්ච උපක්ලේශයෙන් විනිර්මුක්ත වූ යේ) රාත්‍රියෙහි ම දිලියෙන්නේය, (දවල් නො දිලියෙන්නේය); ඛත්තියො, රජතෙම; සන්නද්ධො තපති, රත්රුවණින් විසිතුරු වූ සර්වාභරණයෙන් සැරසී සිවුරඟසෙනඟින් පිරිවරණලද්දේ ම දිලියෙන්නේය, (=හොබවන්නේය), (අප්‍රසිද්ධවේශයෙන් සිටියේ නො හොබනේය); බ්‍රාහ්මණො, ක්ෂීණාශ්‍රව තෙම; ඣායී තපති, (ගණසඞ්ගනිකාවෙන් වෙන්ව සමාපත්තියට සමවදින්නේම දිලියෙන්නේය (=හොබනේය), (ගණසඞ්ගනිකාවෙන් යුක්ත වූයේ නො හොබනේය); අථ, නැවත; සබ්බං අහොරත්තිං, සියලු දිවාරාත්‍රියෙහි; බුද්ධො, සම්‍යක්සම්බුද්ධ තෙම; තෙජසා, සරණතෙජස-ගුණතෙජස-ඥානතෙජස-පුණ්‍යතෙජස-ධර්මතෙජස-යන පඤ්චවිධතෙජසින්; තපති, දිලියෙන්නේයි.

6. යස්මා, යම්හෙයකින්; බාහිතපාපොති, සන්තානයෙන් බාහ්‍යකරණලද පාපධර්මයන් ඇත්තේනුයි; බ්‍රාහ්මණොති වුච්චති, බ්‍රාහ්මණයයි කියනුලැබේද; සමචරියාය, කායවිෂමාදීන් දුරු ව සියලු අකුසලයන් සන්සිඳුවා වසන හෙයින්; සමණොයි වුච්චති, ශ්‍රමණය යි කියනුලැබේ ද; යස්මා, යම්හෙයකින්; අත්තනො මලං, තමාගේ රාගාදිමල; පබ්බාජයති, තදඞ්ගාදිවශයෙන් පහකෙරේ ද; තස්මා, එහෙයින්; පබ්බජිතොති වුච්චති, ප්‍රව්‍රජිතය යි කියනු ලැබේ.

389 7. න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය නාස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො,
ධී බ්‍රාහ්මණස්ස හන්තාරං තතො ධී යස්ස මුඤ්චති.

390 8. න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො
යදා නිසෙධො මනසො පියෙහි,
යතො යතො හිංසමනො නිවත්තති
තතො තතො සම්මතිමෙව දුක්ඛං.

391 9. යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං,
සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

---

7. බ්‍රාහ්මණෝ, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණ තෙම; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයකු වත් එක්තරා ජාතිබ්‍රාහ්මණයකු වත්; න පහරෙය්‍ය, අතින් පයින් දණ්ඩෙන් සැතින් නො පහරන්නේය; බ්‍රාහ්මණෝ, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණතෙම; අස්ස, ඒ තමා පහළ පුද්ගලයාහට; න මුඤ්චෙථ, කොප නොකරන්නේයි; බ්‍රාහ්මණස්ස හන්තාරං ධී, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයා අතින් පයින් දණ්ඩෙන් සැතින් පහරන්නාහට නින්දා කෙරෙමි, (=ගර්හා කෙරෙමි); යො, යමෙක් තෙම; අස්ස, ඒ තමා පහළනැනැත්තහුට; මුඤ්චති, කොප කෙරේ ද; තතො, ඒ ක්ෂීණාශ්‍රවයා පහළතැනැත්තහුවත්වඩා; තස්ස ධී, ඔහට නින්දා කෙරෙමි, (=ගර්හා කෙරෙමි)

8. එතං, පාණිප්‍රහාරාදීන් පහළ තැනැත්තහුව පෙරළා නො පැහැරීමය, ජාත්‍යාදීන් ගටා බිණුවහුට පෙරළා නො බිණීමය යන මේ; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයාහට; කිඤ්චිසෙය්‍යො න, ස්වල්පමාත්‍ර වූ ශ්‍රෙයසෙක් නො වේ; නොහොත්, යදා, යම්කලෙක්හි; මනසො පියෙහි, ක්‍රොධිපුද්ගලයාගේ මනසට ප්‍රිය වූ ක්‍රොධවිඝාතොත්පාදයෙන්; යො නිසෙධො, යම් වැළැක්මෙක් ඇද්ද, (ක්‍රොධකාරණයෙන් උපදනා වූ ප්‍රතිඝවිඝාතයාගේ යම් වැළැක්මෙක් යම් නිග්‍රහයෙක් ඇද්ද); එතං; මේ ක්‍රොධනිග්‍රහය; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයාහට; අකිඤ්චිසෙය්‍යො න, ස්වල්පමාත්‍ර වූ ශ්‍රෙයසෙක් නො වේ, (මහත් වූ ම ශ්‍රෙයසැයි); යතො යතො, යම් යම් කාරණයෙකින්; හිංසමනො, ක්‍රොධචිත්තය; නිවත්තති, අනාගාමිමාර්ගයෙන් සමුද්ඝාතයට යන්නේත් නවතී ද; තතො තතො, ඒ ඒ කාරණයෙන්; දුක්ඛං, සියලු සංසාරදුඃඛය; සම්මතිමෙව, සන්හිඳෙන්නේ ම වේ.

9. යස්ස, යම් පුද්ගලයක්හට; කායෙන, කයින් සිඩවන්නා වූ ද; වාචාය, වචසින් සිඩවන්නා වූ ද; මනසා, මනසින් සිඩවන්නා වූ ද; දුක්කතං, සාවද්‍යදුඃඛවිපාක වූ අපායගාමි වූ අකුශලකර්මයෙක්

392 **10. යම්හා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං,**
**සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තං'ව බ්‍රාහ්මණො.**

393 **11. න ජටාහි න ගොත්තෙන න ජච්චා හොති බ්‍රාහ්මණො,**
**යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො ච බ්‍රාහ්මණො.**

394 **12. කිං තෙ ජටාහි දුම්මෙධ කිං තෙ අජිනසාටියා,**
**අබ්භන්තරං තෙ ගහනං බාහිරං පරිමජ්ජසි.**

---

නත්ථි, නැද්ද; තීහි ඨානෙහි, මේ තුන්තැනින් හෙවත් මේ තුන් දොරින් වදනා අකුශලයන්ගේ නිවාරණය පිණිස; සංවුතං, පිහිත වූ (=රක්ෂිතගොපිත වූ) දොර ඇති; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

10. යම්හා, (හීන-මධ්‍යමො'ත්තම වූ ස්ථවිර-නවක-මධ්‍යම වූ හෝ) යමක්හු කෙරෙන්; සම්මාසම්බුද්ධදෙසිතං, සම්‍යක්සම්බුද්ධයන් විසින් දෙසනලද්දා වූ; ධම්මං, පර්‍ය්‍යාප්තිධර්මය; විජානෙය්‍ය, යම් පුද්ගලයෙක් දන්නේ වී නම්, හෙවත් මේ පුද්ගලයෙක් සම්‍යක්සම්බුද්ධයන් විසින් දෙසනලද පාළිධර්මයෙන් යටත්පිරිසෙයින් එක ගාථාවකු දු ගාථාර්ධයකු දු යමක්හු කෙරෙන් දන්නේ වී නම්; තං, ඒ ආචාර්‍ය්‍යහු; අග්ගිහුත්තං බ්‍රාහ්මණො ඉව, අග්නිහොත්‍රය පූජාකරණ බමුණකු-මෙන්, හෙවත් ගිනිදෙවියාහට සකස් කොට පරිගරණය කිරීමෙන් බලිකර්ම කිරීම් ආදීන් පූජාකරණ බමුණකු මෙන්; සක්කච්චං, සකස් කොට; නමස්සෙය්‍ය, නමස්කාර කරන්නේ යි, (ආචාර්‍ය්‍යවි-වෙහි ම ඔහු වසනදිගට ද ආදර ඇති ව සකස් කොට වඳනේ යි).

11. ජටාහි, වළදනාලද ජටාවන් කාරණ කොට ගෙණ; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණ නම් නො වෙයි; ගොත්තෙන, කෞශික (1) කාශ්‍යපාදි ප්‍රසිද්ධ ගොත්‍ර කාරණ කොට ගෙණ ද; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණ නම් නො වෙයි; ජච්චා, උත්තම වූ ධානඥාතිකුලය යි කියනලද ජාතිය කාරණ කොට ගෙණ ද; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණ නම් නො වෙයි; වැලි කෙසේ බ්‍රාහ්මණ නම් වේ ද යත්? යම්හි, යම් පුද්ගලයකු කෙරෙහි; සච්චඤ්ච, චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කොට සිටි සත්‍යඥානය ද; ධම්මො ච, නවලොකොත්තරධර්මය ද ඇද්ද; සො සුචී, හෙතෙම සුචි නමුදු වෙයි; සො ච බ්‍රාහ්මණො, හෙතෙම බ්‍රාහ්මණ නමුදු වේ.

12. දුම්මෙධ, නුවණ නැත්ත; තෙ, තට; ජටාහි, බඳනාලද තෙල ජටාවෙන්; කිං, ප්‍රයොජන කිම් ද; තෙ, තට; අජිනසාටියා, හඳනා

---

1 කොණ්ඩිනා,

395 13. පංසුකූලධරං ජන්තුං කිසං ධමනිසන්ථතං,
එකං වනස්මිං ඣායන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

396 14. නචාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං,
භොවාදි නාම සො හොති සචෙ හොති සකිඤ්චනො,
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

---

ලද තෙල අජිනචම්මයෙකපාපිකාවෙන්, හෙවත් නියඇති අඳුන්දිවි-සමින්; කිං, ප්‍රයෝජන කිම් ද; තෙ, තාගේ: අබ්භන්තරං, ඇතුළත; ගහණං, රාගාදි කෙලෙසුන් විසින් ගැවසීගත්තේය; (එනකුදු උවත්) බාහිරං පරිමජ්ජසි, (ඇතුළෙන් සිලුටු නොව පිටතින් සිලුටු වූ ඇත්බෙටි අස්බෙටි ආදියමෙන් ඇතුළෙන් පිරිසිදුනු වූ තෝ ජටා'ජින-වාකචීරාදි තවුස් පිරිකරින්) පිටතම පිරිමදනෙහි, (=පිට තම සිලුටු කරන්නෙහි යි).

13. පංසුකූලධරං, (සුසානසඞ්කාරකූටාදියෙන් හවුලාගත් රෙදි-කඩින් කොටගත්) පවුල්සිවුරු දරන්නා වූ; (1) කිසං, රූක්ෂප්‍රති-පත්තිපිරීමෙන් කෘශ වූ ශරීර ඇති; ධමනිසන්ථතං, ඉපිලපෙනෙන නහරවැලින් ගැවසීගත් ශරීර ඇති; වනස්මිං, ජනවිවිත්ත වූ ගැඹුරු මහවල්හි; එකං, හුදකලාව; ඣායන්තං, භාවනා කරන්නා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණ ය යි කියමි (2).

14. යොනිජං, මවගේ යොනිමාර්ගයෙන් උපන්නා වූ; මත්ති-සම්භවං, බැමිණි මව්කුස උපන්නාහට (එපමණකින්); අහං, මම; බ්‍රාහ්මණං, බ්‍රාහ්මණ ය යි; නචාහං බ්‍රෑමි, නො කියමි; සචෙ, ඉදින්; සකිඤ්චනො හොති, යමෙක් බ්‍රාහ්මණජාති ඇති වත් රාගාදිපලි-බොධසහිත වී නම්, (=රාගාදි කෙලෙස් පලිබොධ ඇත්තේ වී නම්); සො, හෙතෙම; භොවාදී නාම හොති, (ආමන්ත්‍රණාදිකාලයෙහි දුටු-දුටුවන්ට භො භො ය යි කියමින් ඇවිදිනා හෙයින්) භොවාදී නම් වෙයි, (බ්‍රාහ්මණ නම් නො වෙයි, එහෙයින්); අකිඤ්චනං, රාගාදි කිසිපලිබොධයෙක් නැත්තා වූ; අනාදානං, කාමුපාදානාදිචතුරු-පාදානයන් අතුරෙන් කිසි උපාදානයක් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගන්නා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණ ය යි කියමි.

---

1 පසුල්සිවුරු දරන්නාවූ. පොත්හි.
2 මෙහි 'ජන්තුං' යන පෙදෙහි අර්ථය නො පෙනේ.

397 15. සබ්බසංයෝජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති,
සඞ්ගාතිගං විසංයුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

398 16. ඡෙත්වා නද්ධිං (1 වරත්තඤ්ච සන්දාමං සහනුක්කමං,
උක්ඛිත්තපලිඝං බුද්ධං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

399 17. අක්කොසං වධබන්ධඤ්ච අදුට්ඨො යො තිතික්ඛති,
ඛන්තිබලං බලානීකං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

---

15. සබ්බසංයෝජනං ඡෙත්වා, කාමරාගසංයෝජනාදි සියලු දසවිධසංයෝජනයන් ඒ ඒ මාර්ගයට අනුරූප පරිද්දෙන් චතුර්විධ ආර්යමාර්ගයෙන් සමුච්ඡේදය කොට සිටි හෙයින්; යො, යම් ක්ෂීණාශ්‍රව පුද්ගලයෙක්; වෙ, එකාන්තයෙන්; න පරිතස්සති, ජීවිතනිකන්තිරහිත හෙයින් නො බිය ද, (=කිසි සත්ත්ව සංස්කාර කෙනෙකුන් කෙරෙහි භය නො කෙරේ ද); සඞ්ගාතිගං, රාගසඞ්ගාදිසප්තවිධසඞ්ගයන් ඉක්මුනා වූ; විසංයුත්තං, රාගාදිසකලක්ලේශයන් කෙරෙන් වියුක්ත වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවපුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රූමි, බ්‍රාහ්මණය යි කියමි.

16. නද්ධිං, (පරාපකාරය නැවත නැවත සිත්හි ලා වෙළන ස්වභාවයෙන් පවත්නා) ක්‍රොධ නැමැති දලවර ද; වරත්තඤ්ච, (සත්ත්වයන් සංසාරයෙහි බඳනා ස්වභාව වූ) තෘෂ්ණා නැමැති වරපට ද; සහනුක්කමං, (කාරණලාභයක් ඇතිකල්හි සත්ත්වසන්තානයෙහි නැවත නැවත පවත්නා හෙයින් අනුක්‍රම නම් වූ) කාමරාගාදිඅනුශයයන් සත්දෙන හා සහිත වූ; සන්දාමං (2), මාෂ්ටිදෘෂ්ටි නැමැති මහද් දම ද; ඡෙත්වා, ඒ ඒ මාර්ගයෙන් සමුච්ඡේදය කොට සිටියා වූ; උක්ඛිත්තපළිඝං, අභිනව ගෘහයුත් නැමැති හස්තයෙන් උදුරා හරණලද අවිද්‍යා නැමැති හිදිබාව ඇති; බුද්ධං, චතුරාර්යසත්‍යයන් තත්වූ පරිද්දෙන් දත්තා වූ: තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රූමි, බ්‍රාහ්මණය යි කියමි.

17. අක්කොසං, ජාත්‍යාදියෙන් ගටා බණන්නා වූ දශවිධආක්‍රොශය ද; වධබන්ධඤ්ච, පාණිප්‍රහාරාදි-හස්තපාදච්ඡේදාදි වධය ද අන්දු-බන්ධන-රජ්ජුබන්ධනාදිබන්ධනය ද යන මේ සියල්ල; යො, යම් පුද්ගලයෙක්; අදුට්ඨො, ද්වේෂයෙන් දූෂිත නොවූයේ, හෙවත් නො කිපියේ; තිතික්ඛති, ඉවසා ද; ඛන්තිබලං, ක්ෂාන්තිය බලකොට ඇති; බලානීකං,

---

1 නන්ධිං. 2 සන්දානං.

400 **18. අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං,**
**දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.**

401 **19. වාරි පොක්ඛරපත්තෙ'ව ආරග්ගෙරි'ව සාසපො,**
**යො න ලිම්පති (1) කාමෙසු තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.**

402 **20. යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො,**
**පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.**

---

නැවත නැවත උපදනාවූ ක්ෂාන්තිබලය ඇණිකොට ඇති, නොහොත්; ඛන්තිබලං බලානීකං, ක්ෂාන්තිබලය ම බල කොටඇති; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රූමි, බ්‍රාහ්මණය යි කියමි.

18. අක්කොධනං, ක්‍රොධ නැත්තා වූ, (=ආක්‍රොශ කළවුන් කෙරෙහි නොකිපෙන්නා වූ); වතවන්තං, ධූතාඞ්ගව්‍රතයෙන් සමන්විත වූ; සීලවන්තං, චතුපාරිසුද්ධිසීලයෙන් සිල්වත් වූ; අනුස්සුතං, තෘෂ්ණා-ස්නෙහයෙන් තෙත් නො වන්නා වූ; දන්තං, චක්ෂුරාදිෂඩින්ද්‍රිය දමනයෙන් දැමුනා වූ; අන්තිමසාරීරං, භවපරියන්තයෙහි සිටිහෙයින් අන්තිමශරීර ඇති; තං, ඒ ක්ෂීණාශ්‍රවපුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රූමි, බ්‍රාහ්මණය යි කියමි.

19. පොක්ඛරපත්තෙ වාරි ඉව, පියුම්පතෙහි නො ඇලෙන දිය-බිඳු මෙන් ද; ආරග්ගෙ සාසපොරිව, හිඳිකටුඅග නො රඳන අබ-ඇට මෙන් ද; යො, යම් පුද්ගලයෙක්; කාමෙසු, වස්තුකාමක්ලෙශ-කාම දෙක්හි; න ලිම්පති, නො ඇලේ ද; තං, ඒ ක්ෂීණාශ්‍රව-පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රූමි, බ්‍රාහ්මණය යි කියමි.

20. යො; යම් පුද්ගලයෙක්; ඉධෙව, ප්‍රත්‍යක්ෂ වූ මෙම ආත්මභාව-යෙහි; අත්තනො, තමාගේ; දුක්ඛස්ස, ස්කන්ධදුඃඛයාගේ; ඛයං, විනාශය; පජානාති, දනීද; (මේ ජාතියෙහිම මාගේ ස්කන්ධදුඃඛය නිරුද්ධ වන්නේය යි දනී ද;) පන්නභාරං, බහා තබනලද ස්කන්ධභාර ඇති; විසංයුත්තං, සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රූමි, බ්‍රාහ්මණය යි කියමි.

---

1 න ලිප්පති.

403 **21. ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං,**
**උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

404 **22. අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං,**
**අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

405 **23. නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච,**
**යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

406 **24. අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං,**
**සාදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.**

---

21. ගම්භීරපඤ්ඤං, ගැඹුරුවූ ස්කන්ධායතනාදියෙහි පැවැත්තා වූ ප්‍රඥාවෙන් සමන්විත වූ; මෙධාවිං, ධර්මෞජඃප්‍රඥාවය යි කියනලද විදර්ශනඥානයෙන් මෙධාවී වූ; මග්ගාමග්ගස්ස කොවිදං, (මේ දුගතියට මගය මේ සුගතියට මගය මේ නිවණට මගය යි මෙසේ) මාර්ගාමාර්ගදෙක්හි දක්‍ෂ වූ; උත්තමත්ථං අනුප්පත්තං, රහත්ඵලය යි කියනලද උත්තමාර්ථයට පැමිණියා වූ; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බෲමි, බ්‍රාහ්මණය යි කියමි.

22. ගහට්ඨෙහි, ගිහිමිනිසුන් හා ද; අනාගාරෙහි ච, ප්‍රව්‍රජිතයන් හා ද යන; උභයං, දෙපක්‍ෂයෙහි ඇත්තවුන් හා; අසංසට්ඨං, (දර්ශනසංසර්ගය ශ්‍රවණසංසර්ගය සමුල්ලාපසංසර්ගය පරිභොගසංසර්ගය කායසංසර්ගය යන) පඤ්චවිධසංසර්ගය නැත්තාවූ; අනොකසාරිං, ආලයසංචාරයක් නැත්තා වූ, හෙවත් තෘෂ්ණා නැමැති ගිහිහැසිරීමක් නැත්තාවූ; අප්පිච්ඡං, ප්‍රත්‍යයගෘධයක් නැතිහෙයින් චතුර්විධප්‍රත්‍යයෙහි ඉච්ඡාරහිත වූ; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බෲමි, බ්‍රාහ්මණය යි කියමි.

23. තසෙසු, තෘෂ්ණාසන්ත්‍රාසයෙන් සහිත වූ ද; ථාවරෙසු ච, තෘෂ්ණාසන්ත්‍රාසරහිත හෙයින් නිහීයවූ ද; භූතෙසු, සියලු සතුන් විෂයෙහි; දණ්ඩං, කායදණ්ඩය; නිධාය, බහා තබා, හෙවත් දණ්ඩනය දුරු කොට; යො, යම් පුද්ගලයෙක්; න හන්ති, කිසිසතක්හු තමාමත් නො මරා ද; න ඝාතෙති, අනුන් ලවාත් නො මරවා ද; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බෲමි, බ්‍රාහ්මණය යි කියමි.

24. විරුද්ධෙසු, ආඝාතවශයෙන් සතුරන් කෙරෙහි විරුද්ධ වූ ලෞකික මහාජනයා අතුරෙහි; අවිරුද්ධං, ආඝාතයක් නැතිහෙයින් අවිරුද්ධවූ; අත්තදණ්ඩෙසු, පරහිංසායෙන් නො වැළකිහෙයින් පරහිංසා පිණිස ගත්තාලද දඬු ඇති ලෞකිකමහාජනයා අතුරෙහි;

407 **25.** යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො,
සාසපොරිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

408 **26.** අකක්කසං විඤ්ඤාපනිං ගිරං සච්චං උදීරයෙ,
යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

409 **27.** යො'ධ දීඝං වා රස්සං වා අණුං ථූලං සුභාසුභං,
ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

---

නිබ්බුතං, නිවී සිත් ඇති; සාදානෙසු, පංචස්කන්ධයන් මමය මාගේය යි ගත්තා වූ ලෞකිකමහාජනයා අතුරෙහි; අනාදානං, පඤ්චස්කන්ධයන් මමය මාගේය යි ගැන්මක් නැත්තා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

25. යස්ස, යම් පුද්ගලයකු විසින්; රාගො ච, (කාමරාග-රූපරාග-අරූපරාග වශයෙන්) ත්‍රිවිධ වූ රාගය ද; දොසො ච, (මේ සත්ත්‍ව නාශිත්ව යි යනාදීන් යම්කිසි අරමුණෙක්හි යම්කිසි ආකාරයෙකින් ගැටීමෙන් උපදනා) ද්වෙෂය ද; මානො, ("සෙය්‍යොහමස්මි" යනාදීන් උන්නතිවශයෙන් පවත්නා වූ) නවවිධ මානය ද; මක්ඛො ච, අනුන් විසින් කරණලද උපකාර මැකීම් ලකුණු කොට ඇති මක්ඛය ද; ආරග්ගා, ඉඳිකටුඅග නො රඳා එයින් ගිලිහෙන්නා වූ; සාසපොරිව, අබ ඇටක් මෙන්; පාතිතො, හෙළනලද ද, (=ඒ ඒ මාර්ගයෙන් පහකරණලද ද); තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

26. යාය, යම් වාචාවක් කාරණකොට ගෙණ; කඤ්චි, කිසි පුද්ගලයකු; නාභිසජෙ, නුසුපපවා ද, (=කිසිවකුගේ සිත කොපයෙහි ලග්න නො කරවා ද) එබඳු වූ; අකක්කසං, කර්කශ නො වූ-මට සිලුටු වූ; විඤ්ඤාපනිං, මෙලොව පරලොව වැඩ හඟවන්නා වූ; සච්චං ගිරං, සැබෑතෙපුල්; උදීරයේ, යමෙක් කියන්නේ වේ ද; තං, ඒ පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

27. යො, යම් පුද්ගලයෙක්; ඉධ, මේ සත්ත්වලොකයෙහි; දීඝං වා රස්සං වා, වස්ත්‍රාභරණාදීන්ගේ වශයෙන් දික් වූ හෝ ලුහුඬු වූ හෝ; අණුං ථූලං, මණිමුක්තාදීන්ගේ වශයෙන් අනුවූ හෝ ස්ථූල වූ හෝ; සුභාසුභං, මාහැඟි නො මාහැඟි වස්තූන්ගේ වශයෙන් යහපත් වූ හෝ නපුරු වූ හෝ; අදින්නං, පරසන්තක වස්තුවක්; නාදියති, සොරසිතින් නොගණී ද; තං, ඒ පුද්ගලයා; අහං මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

410 28. ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච,
නිරාසයං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

411 29. යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී,
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

412 30. යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා,
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

413 31. චන්දං'ව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං,
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

---

28. යස්ස, යම් පුද්ගලයක්හට; අස්මිං ලොකෙ, මෙ ලොව ද; පරම්හි ච, පරලොව ද; ආසා න විජ්ජන්ති, ආසාවෙක් නැද්ද; (මනුෂ්‍ය ලොකසම්පත්තියෙහි වත් දිව්‍යලොකසම්පත්තියෙහි වත් ආසා නැද්ද; නිරාසයං, තෘෂ්ණාරහිත වූ; විසංයුත්තං, සියලු කෙලෙසුන් කෙරෙන් මුක්ත වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි; බ්‍රාහ්මණය සි කියමි.

29. යස්ස, යම් පුද්ගලයක්හට; ආලයා න විජ්ජන්ති, මෙලෝ පරලෝ රූපාදීන් විසය කොට පවත්නා වූ තෘෂ්ණාවෙක් නැද්ද; අඤ්ඤාය, බුද්ධාදිවස්තූන් අවිපරීත වූ පරිද්දෙන් දැන, හෙවත් යථාභූතවශයෙන් දත්හෙයින්; අකථංකථී, කථංකථරහිත ද, (=බුද්ධාදි අටතැන්හි විචිකිත්සාව නැත්තේ ද); අමතොගධං, අමෘතය යි කියනලද නිර්වාණයට බැස; අනුප්පත්තං, ඒ නිර්වාණයට පැමිණියා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය සි කියමි.

30. ඉධ, මේ සත්වලොකයෙහි; යො, යම් පුද්ගලයෙක්; පුඤ්ඤඤ්ච, කුසලය ද; පාපඤ්ච, අකුසලය ද යන මේ; උභො, දෙකම; උපච්චගා, පසුකොට සිටියේද, හෙවත් කෙලශසහායවෙකල්‍යයෙන් විද්‍යමාන වූ ද කුසලයන් විපාකදීමට අසමර්ථහෙයින් කුසලයන් ද, අභීතමාර්ගයෙන් සකලකෙලශයන් ප්‍රහීණකළහෙයින් අකුසලයන් ද යන මේ උභයපක්ෂය ම නසාපී ද; සඞ්ගං උපච්චගා, රාගසඞ්ගාදි සප්තවිධසඞ්ගය ඉක්මී ද; අසොකං, ශොකරහිතවූ; විරජං, රාගාදිරජස් නැත්තා වූ; සුද්ධං, රාගාදිඋපක්ලෙශවිගමනයෙන් පරිසුද්ධ වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය සි කියමි.

31. චන්දං ඉව, (අභ්‍ර-මහික-ධූම-රජො-රාහු යන පඤ්චවිධ උපක්ලෙශයෙන් විනිර්මුක්ත වූ) පූර්ණචන්ද්‍රයා මෙන්; විමලං, නිර්මල වූ; සුද්ධං, රාගාදි කෙලෙස්මල විගමනයෙන් පරිසුද්ධ වූ; විප්පසන්නං, (ගැඹුරු වූ මහවිලක් මෙන්) විශෙෂයෙන්ම ප්‍රසන්න වූ; අනාවිලං,

414 **32. යො ඉමං පලිපථං දුග්ගං සංසාරං මොහමච්චගා,**
**තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී;**
**අනුපාදාය නිබ්බුතො තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.**

415 **33. යොධ කාමෙ පහත්වාන අනාගාරො පරිබ්බජෙ,**
**කාමභවපරික්ඛීණං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.**

416 **34. යොධ තණ්හං පහත්වාන අනාගාරො පරිබ්බජෙ,**
**තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.**

---

ක්ලෙශකාලුෂ්‍ය නැතිහෙයින් නොකැලඹුනු සිත්ඇති; නන්දිභව-පරික්ඛීණං, භවයෙහි නන්දනය කරණ හෙයින් නන්දිභවය යි කියන ලද භවතෘෂ්ණාව ක්ෂය කළා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

32. යො, යම් මහණෙක්; ඉමං පලිපථං, මේ රාගාදික්ලෙස් නැමැති කලල්මඩ සහිත මාර්ගයද; දුග්ගං, මේ කෙලෙස් නැමති දුර්ගය ද; සංසාරං, සංසාරවෘත්තය ද; මොහං, චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කල නො දෙන මොහය ද; අච්චගා, ඉක්මී ද; තිණ්ණො, කාමෞඝාදි සතරම්හවතුරෙන් එතරවී ද; පාරගතො, නිර්වාණය යි කියනලද පාරයට පැමිණියේ වේ ද; ඣායී, ආලම්බනොපනිධ්‍යාන-ලක්ෂණොපනිධ්‍යානවශයෙන් ධ්‍යායී ද, හෙවත්, සමථවිදර්ශනා භාවනාවෙහි යුක්තප්‍රයුක්ත ද; අනෙජො, එජාසඞ්ඛ්‍යාත තෘෂ්ණා රහිත ද; අකථංකථී, බුද්ධාදි අටතන්හි උපදනා සංසයක් නැති හෙයින් කථංකථාරහිත ද, හෙවත් බුද්ධාදී අටතන්හි උපදනාසංසය ලක්ෂණ වූ විචිකිත්සාව නැත්තේ වේ ද; අනුපාදාය නිබ්බුතො, කාමු-පාදනාදීන් නැති හෙයින් කිසි ක්ලෙශයෙකුදු තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් මමය මාගේය යි නොගෙණ ක්ලෙශපරිනිර්වාණයෙන් නිවිනීද; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

33. ඉධ, මේ සත්‍වලොකයෙහි; යො, යම් පුද්ගලයෙක්; කාමෙ පහත්වාන, වස්තුකාමක්ලෙශකාමයන් පහ කොට; අනාගාරො පරිබ්බජෙ, ගෙය හැර මහණ වේ ද; කාමභවපරික්ඛීණං, වස්තුකාම-ක්ලෙශකාමයන් ද කාමභවරූපභවඅරූපභවයන් ද ක්ෂය කළා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

34. ඉධ, මේ සත්‍වලොකයෙහි; යො, යම් පුද්ගලයෙක්, තණ්හං පහත්වාන, ෂඩ්ද්වාරික වූ රූපතෘෂ්ණාදි තෘෂ්ණා දුරු කොට; අනාගාරො, ගෙය නැති ව; පරිබ්බජෙ, පැවිදි වේ ද; තණ්හාභව-පරික්ඛීණං, තෘෂ්ණාව ද භවය ද ක්ෂය කළා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

417 35. හිත්වා මානුසකං යෝගං දිබ්බං යෝගං උපච්චගා,
සබ්බයෝගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

418 36. හිත්වා රතිඤ්ච අරතිඤ්ච සීතිභූතං නිරූපධිං,
සබ්බලෝකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

419 37. චුතිං යෝ වේදි සත්තානං උපපත්තිඤ්ච සබ්බසෝ,
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

420 38. යස්ස ගතිං න ජානන්ති දේවා ගන්ධබ්බමානුසා,
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

---

35. (ඉධ, මේ සත්වලෝකයෙහි:) යෝ, යමෙක්; මානුසකං යෝගං, මනුෂ්‍යලෝකයෙහි ආයුෂය ද, මානුසක වූ පඤ්චකාමය ද; හිත්වා, හැර; (=එහි නිකන්ති පහ කිරීමවසයෙන් හැර); දිබ්බං යෝගං උපච්චගා, දිව්‍ය වූ ආයුසය ද දිව්‍ය වූ පඤ්චකාමගුණය ද ඉක්මුණේ වේ ද; සබ්බයෝගවිසංයුත්තං, කාමයෝගාදි සියල යෝගයන් කෙරෙන් වෙන් වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

36. රතිඤ්ච, පඤ්චකාමගුණයෙහි ඇලීම ද; අරතිඤ්ච, අධිකුසලයෙහි ද අරණ්‍යවාසයෙහි ද උපදනා උකටලිය ද; හිත්වා, දුරු කොට; සීතිභූතං, නිවිසිත් ඇති; නිරූපධිං, ස්කන්ධොපධි ආදි වූ සතර උපධීන් නැත්තා වූ; සබ්බලෝකාභිභුං, සීලාදිගුණයෙන් සකලලෝකයා මැඩපවත්නා වූ; වීරං, චතුර්විධ සම්‍යක්ප්‍රධානය හි කියනලද වීර්‍ය්‍යයෙන් යුක්ත වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

37. යෝ, යම් මහණෙක්; සත්තානං චුතිං ච, චුතවන සත්ත්වයන්ගේ චුතිආසන්නය ද; උපපත්තිඤ්ච, උත්පත්තිආසන්නය ද; සබ්බසෝ, සර්වප්‍රකාරයෙන්; වේදී, ප්‍රකටකොට දනී ද; (චුතිචිත්තය ද ප්‍රතිසන්ධිචිත්තය ද දිව්‍යැසින් දක්නට නොපිළිවන් හෙයින් චුතිආසන්නය ද ප්‍රතිසන්ධිආසන්නය ද හෙණ චුති-උත්පත්තිදෙක වදාරණලදී); අසත්තං, කිසිභවයෙක්හි අලග්න වූ; සුගතං, අන්තවය පරිවර්ජනය කොට මධ්‍යමප්‍රතිපත්තියෙන් සුන්දර වූ නිර්වාණපුරයට ගිය හෙයින් සුගත නම් වූ; බුද්ධං, චතුරාර්‍ය්‍යසත්‍යයන් අවබෝධ කළ හෙයින් බුද්ධ නම් වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

38. යස්ස, යම් ක්ෂීණාශ්‍රවයක්හුගේ; ගතිං, උත්පත්තිගතිය, නොහොත් නිෂ්ඨාව; දේවා, ශක්‍රාදී දෙවියෝ ද; ගන්ධබ්බා, තිම්බරු-නාරදාදි ගන්ධර්වයෝ ද; මානුසා, ක්ෂත්‍රිය-බ්‍රාහ්මණාදි මනුෂ්‍යයෝ ද; න ජානන්ති, නොදනිද්ද; ඛීණාසවං, ක්ෂීණ වූ චතුරාශ්‍රවයන් ඇති; අරහන්තං, ක්ලෙශයන් කෙරෙන් දුරු වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

421 39. යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං,
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

422 40. උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

423 41. පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි;
සබ්බවොසිතවොසානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

බ්‍රාහ්මණවග්ගො ඡබ්බීසතිමො.

---

39. යස්ස, යම් පුද්ගලයකුහට; පුරෙ ච, අතීතභවයෙහි ද, නිරුද්ධ වූ රූපාදි පඤ්චස්කන්ධයන් කෙරෙහි ද; පච්ඡා ච, අනාගතභවයෙහි ද, එන සුලු වූ රූපාදි පඤ්චස්කන්ධයන් කෙරෙහි ද; මජ්ඣෙ ච, වර්තමානභව පැමිණි වූ රූපාදී පඤ්චස්කන්ධයන් කෙරෙහි ද; කිඤ්චනං නත්ථි, තෘෂ්ණා ග්‍රහණය යි කියනලද කිසි පලිබෝධයෙක් නැද්ද; අකිඤ්චනං, රාගාදි කිඤ්චනයක් නැත්තා වූ; අනාදානං, තෘෂ්ණාදෘෂ්ටිවානගාහයක් නැත්තා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණය යි කියමි.

40 උසභං, භය සන්ත්‍රාසරහිත බැවින් වෘෂභාජානේයයෙකු බඳු වූ; (නිර්භයකාරණයෙන් වෘෂභරාජ වූ); පවරං, උත්තමකාරණයෙන් ප්‍රවර වූ; වීරං, වීර්‍ය්‍යසම්පන්න බැවින් වීර වූ; මහෙසිං, මහත් වූ ශීලස්කන්ධාදිපඤ්චවිධධර්මස්කන්ධයන් එසනය කළ හෙයින් මහර්ෂි වූ; විජිතාවිනං, ක්ලේශමාරය ස්කන්ධමාරය මෘත්‍යුමාරය යන මේ තුන් මරුන් දිනූ හෙයින් දිනනලද සතුරන් ඇති; අනෙජං, කාම-භව-විභවසංඛ්‍යාත ත්‍රිවිධතෘෂ්ණාරහිත වූ; නහාතකං, අෂ්ටමාර්ගාඞ්ග-ශලිලයෙන් සේදනලද කෙලෙස්මල ඇති බැවින් නැහැවා වූ; බුද්ධං, චතුරාර්‍ය්‍යසත්‍යයන් දත්තා වූ: තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි. බ්‍රාහ්මණය යි කියමි.

41. යො මුනි, යම් මහණෙක්; පුබ්බෙනිවාසං වෙදී, පෙර විසූ කඳපිළිවෙළ පහළ කොට දනී ද; සග්ගාපායඤ්ච පස්සති, සවිසිදෑරුම් වූ ස්වර්ගය ද නරකාදි සතර අපාය ද දිවැසින් දකී ද; අථො, නැවත; ජාතික්ඛයං පත්තො, ජාතික්ෂය යි කියනලද අර්හත්ඵලයට පැමිණියේ ද; අභිඤ්ඤාවොසිතො, විශිෂ්ටඥානයෙන් දතයුතු වූ අභිඥෙය්‍යාදි ධර්මයන් විශේෂයෙන් දැන නිෂ්ඨාවට පැමිණියේ ද; සබ්බවොසිතවොසානං, සකලක්ලේශයන්ගේ අවසානය යි කියනලද අර්හත්ඵලඥානසංඛ්‍යාත බ්‍රහ්මචර්‍ය්‍ය වැස නිම වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවමහණහු; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බාහිත පාපධර්මයන් ඇති හෙයින් බ්‍රාහ්මණය යි කියමි.

බ්‍රාහ්මණවග්ගො ඡබ්බීසතිමො.

---

සමාප්තායි.

# උද්දානං.

1. යමකොප්පමාදෙ චිත්තා පුප්ඵා බාලො ච පණ්ඩිතො,
අරහන්තා සහස්සා ච පාපා දණ්ඩා දසෙති ච. (1)

2. ජරා අත්තා ච ලොකො ච බුද්ධො සුඛපියාහි ච,
කොධො මලො ච ධම්මට්ඨො මග්ගවග්ගාහි වීසති.

3. පකිණ්ණා නිරයා නාගො තණ්හා භික්ඛු ච බ්‍රාහ්මණො,
එත්ථ ඡබ්බීසතී වග්ගා දෙසිතාදිච්චබන්ධුනා,

4. යමකෙ වීසතී ගාථා අප්පමාදම්හි ද්වාදස,
එකාදස චිත්තවග්ගෙ පුප්ඵවග්ගම්හි සොළස.

5. බාලෙ සත්තරස ගාථා පණ්ඩිතම්හි චතුද්දස,
අරහන්තෙ දස ගාථා සහස්සෙ හොන්ති සොළස.

6. තෙරස පාපවග්ගම්හි දණ්ඩම්හි දසසත්ත ච,
එකාදස ජරාවග්ගෙ අත්තවග්ගම්හි ද්වාදස.

7. ද්වාදස ලොකවග්ගම්හි බුද්ධවග්ගම්හි සොළස,
සුඛෙ ච පියවග්ගෙ ච ගාථායො හොන්ති ද්වාදස.

8. චුද්දස කොධවග්ගම්හි මලවග්ගෙකවීසති,
සත්තරස ච ධම්මට්ඨෙ මග්ගවග්ගම්හි සොළස.

9. පකිණ්ණෙ සොළස ගාථා නිරයෙ නාගෙ චතුද්දස,
ඡාවීස තණ්හාවග්ගම්හි තෙවීස භික්ඛුවග්ගිකා.

10. චත්තාළීස ච ගාථායො බ්‍රාහ්මණෙ වග්ගමුත්තමෙ,
ගාථාසතානි චත්තාරි තෙවීස ච පුනාපරෙ;
ධම්මපදෙ නිපාතම්හි දෙසිතාදිච්චබන්ධුනා'ති.

ධම්මපදං නිට්ඨිතං.

---

සිද්ධිරත්ථු.

---

1 යමකං පමදං චිත්තං පුප්ඵං බාලෙන පණ්ඩිතා
අරහන්තං සහස්සෙන පාපදණ්ඩෙන තෙදස-(ඉච්චෙවමාදි
සබ්බසු පොත්ථකාසු.)

# ධම්මපදපූරාණසන්නයේ
# ග්‍රන්ථිපදවිවරණය.

(විද්‍යෝදය පිරිවෙණේ උපාචාර්‍ය්‍ය ආභිධාර්මික වාගීශ්වරාචාර්‍ය්‍ය
කුකුල්නාපේ දෙවරක්ඛිත ස්ථවිරයන් වහන්සේ
විසින් සම්පාදිතයි.)

## නමෝ බුද්ධාය.

**වර්ගය. ගාථාව.**

1 -- 1.

අභිධ්‍යාදෞර්මනස්‍යාදි=අභිධ්‍යාය, (=විෂමලෝභය හෙවත් අනුන් අයත්දේ තමාට වේවයි සිතීම හෝ තමන්අයත් දෙයකෙරෙහි දැඩිආසාව); දෞර්මනස්‍ය(=නොසතුට හෙවත් සිතේ දුක) යන දෙක ආදිකොට ඇති.

අරූප ධර්මයෝ=රූප නොවන ධර්මයෝ.

ආගන්තුක=අලුතුවෙන් පැමිණි; පසුව හිතට පැමිණි.

ආපායිකවූ=අපායෙහිවූ.

එකනිරෝධ=එකවිටනැතිවෙන.

එකවාස්තුක= එකම වාසස්ථාන ඇති.

එකාලම්බන=එකම අරමුණක් ඇති.

එකෝත්පාද=එක්ව උපදනා.

කාමාවචරාදි භේදයෙන්=කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර යන භේදයෙන්.

කායිකවූ=කයෙහිවූ.

චාතුර්භූමිකවූ=කාම,රූප,අරූප, ලෝකෝත්තර යන සතර භූමියෙහිවූ.

චෛතසිකයෝ=සිත්හි උපදනා ධර්මයෝ.

නිස්සත්ත්ව නිර්ජීවාර්ථයෙන්= සත්ත්වනොවන; ජීව (=ප්‍රාණ) නොවන තේරුමෙන්.

පූර්වඞ්ගම=පෙරටුව යන්නෙකු.

වේදනාදිස්කන්ධත්‍රය සංඛ්‍යාත= වේදනා, සඤ්ඤා, සඞ්ඛාර යන ස්කන්ධ තුණයයි කියනලද.

ව්‍යාපාද=අන්‍යයෝ වැනසෙත්වා යන නපුරු චේතනාව.

සඞ්ගෘහීත=ඇතුලත්ව ගැණෙන.

සම්බද්ධ=යුක්ත.

සහජාතාධිපති වශයෙන්= සහජාතප්‍රත්‍යය,අධිපති ප්‍රත්‍යය යන ප්‍රත්‍යයන් දෙදෙනාගේ වශයෙන්.

1 -- 2.

අනභිධ්‍යාදිගුණ යෝගයෙන්= අනභිධ්‍යා,අව්‍යාපාද, සම්මාදිට්ඨි යන ගුණයන් හා යෙදීමෙන්.

ප්‍රසන්නවූ=පැහැදුනාවූ.

ශරීර ප්‍රතිබද්ධ=ශරීරය පිළිබඳ.

1 — 3.

උපභොග=සමීපයෙහි තබාගෙණ ප්‍රයොජන ගතයුතුවූ වස්ත්‍රාභරණාදිය.

කුළුදෙස්=බොරු සාක්ෂ්‍ය.

ජාත්‍යාදියෙන් ඝට්ටා= නීච කුල ඇත්තෙක යනාදි වසයෙන් පෙළා.

පරිභොග වස්තු= හාත්පස්හි කොට ප්‍රයොජන ගතයුතුවූ කෙත්වත් ගෙරිසරක් ආදිවස්තු.

විසින්=වශයෙන්.

සැතින්= ශස්ත්‍රයෙන්; ආයුධයෙන්.

1 — 4.

අමනස්කාර= මෙනෙහි නොකිරීම.

කර්මප්‍රත්‍යවෙක්ෂා= පූර්ව කර්මය නුවණ මෙහෙයා බැලීම.

නිරින්ධන වහ්නියක්= දර නැති ගින්නක්.

1 — 5.

අනත්ථං මෙ අචරි=(අසවලා)මට අවැඩක් කෙළේය.

ආඝාත වස්තූන්=ක්‍රොධය ඉපදීමට හෙතු කාරණයන්.

මූකුණු=සොටූ.

ක්ෂාන්ති=ඉවසීම.

දෙවැ=සෝද.

යොනිශොමනස්කාරයෙන්= නුවණින් මෙනෙහි කිරීමෙන්.

1 — 6.

කලහ=කෝලාහලය.

කාමවිතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසාවිතර්ක වශික වැ=රූපශබ්දාදි වස්තු කාමයන්ගැණ කල්පනාව, අන්‍යයෝ නැසෙත්වා යනාදීන් පවත්නා කල්පනාව,අනුන්ට හිංසාකිරීමේ කල්පනාව යන මොවුන්ට යටත්ව.

ලොභාදි=ලොභයආදි.

මිථ්‍යාග්‍රහණය=වරදවා ගැණීම.

යත්න=උත්සාහ.

විග්‍රහ=විරුද්ධග්‍රාහය,එකිනෙකාට විරුද්ධවීම.

සම්‍යක් ප්‍රතිපත්තිය= මනා පිළිපැදීම.

1 — 7.

අස්ථාන නියොජනය= නුසුදුසු කාරුණෙහි යෙදවීම.

අනෙස්නෙන්= අනෙසනයෙන්, වැරදි සෙවීමෙන්.

ඉෂ්ටාලම්බනයෙහි= මනාප අරමුණෙහි.

කප්පියා කප්පිය භාවය= කැප නොකැප බව.

කුලදූෂණය=සැදැහැති කුලයන් කිලිටි කිරීම.

කුලන්=කුලයන්.

නිමිත්තානුව්‍යඤ්ජන ග්‍රහණය= තන ආදි ස්ත්‍රී නිමිති හෝ දැළිරැවුල් ආදි පුරුෂ නිමිති සිතින් ගැණීම හා අනුව්‍යඤ්ජනයයිකියනලද අත් පා ආදියෙහි සටහන් සුභවශයෙන් සිතින් ගැණීම.

චර්‍ය්‍යා=හැසිරීම.

පිරියෙස්නෙහි= පර්‍ය්‍යෙෂණයෙහි, සෙවීමෙහි.

ප්‍රචණ්ඩ=ඉතා සැඬ.

මාත්‍රඥනොවූ= පමණනොදත් නොවූ.

සඟන්නට=සඞ්ග්‍රහ කරන්නට.

සතර ඉරියව්වෙහි=යාම, සිටීම, ඉඳීම, නිදීම යන පැවතුම් සතරෙහි

සම්වෘති කවාටයෙන්=සිහිනැමැති කවුළුවෙන්.

1 — 8.

අලළන්නට=කළඹන්නට.

ඉෂ්ටාලම්බනස්ස මාංසොගයක්=මනාප අරමුණු මුණගැහීමක්.
උද්ධුමාතක=ඉදිමුනු මළකුණ
ඝනසෙල පබ්බතයක්=පස්නුමුසු ගල් පර්වතයක්.
වණ්ණසණ්ඨාන දිසොකාස පරිච්ඡෙදවශයෙන්= වර්ණය, සටහනය, හටගත් දිසාය, පැතිරී තිබෙන අවකාශය,යන මොවුන්ගේ වසයෙන්.
සන්තානයෙහි=සිතෙහි.

1 — 9.

නිෂ්කෂාය= (රාගාදි කෙලෙස්) කසට රහිත.
පරමාර්ථ සත්‍යපාක්ෂිකවූ=සකන්ධ-ධාතු- ආයතනාදි වශයෙන් පවත්නා පරමාර්ථ සත්‍යයාගේ පක්ෂයෙහිවූ.

1 — 10.

ආයතීමාගීඥන මුඛයෙන්= සෝවාන් ආදී මාර්ගඥන නැමැති දොරටුවෙන්.
චතුර්විධ=සිවු වැදෑරුම්.

1 — 11.

චීවරාදි චතුර්විධ ප්‍රත්‍යය=චීවර, පිණ්ඩපාත, සෙනාසන, ග්ලාන ප්‍රත්‍යය (=ගිලන්පස) යන සිවු පසය.
තදුපනිශ්‍රයවූ=(උපනිශ්‍රයප්‍රත්‍යය වශයෙන්) ඊට හේතුවූ.
මිච්ඡාසඤ්ඤ= පාපක්‍රියාවන්හි උපාය සිතීම් වසයෙන් හෝ පව් කොට මවිසින් යහපතක් කරණලදැයි සලකා බැලීම් ආකාරයෙන් උපන් මොහය.
මිච්ඡාසංකප්ප=කාමසංකප්පාදිවූ වැරදිකල්පනා.
මිච්ඡාවිමුත්ති=කෙලශයන්ගෙන් නොමිදුනහුගේ මිදුනෙමි යන සංඥව.

1 — 12.

දසවත්ථුක සම්‍යග්දෘෂ්ටිය= මේ වර්ගයෙහි 11 වෙනි ගයේ සත්තයබලනු. (1) දුන්දෙයෙහිවිපාක ඇත, (2) යාගවසයෙන් පිදූ දෙයෙහි විපාක ඇත, (3) සත්කාර වශයෙන් පිළියෙලකොට දුන්දෙයෙහි හෝ ආගන්තුක දාන යෙහි විපාකඇත,(4 ;කුශලාකුශලකර්මයන්ගේ විපාක ඇත, (5)මෙලොව ඇත, (6) පරලොව ඇත, (7) මවුට කළ සත්කාරයෙහි විපාක ඇත, (8) පියාට කළ සත්කාරයෙහි විපාකඇත, (9) ඔපපාතික (ගර්භශය්‍යාවක් නැති සොළසැවිරිදි පමණවූ-ආත්මභාව යන්ගේ පහළවීම ඇති චුතව උපදනා) සත්ත්වයෝ ඇත, (10) මෙලොව පරලොව දත් මනාව පිළිපන් මහණබමුණෝ ඇත යන දශයද දශවිධසම්‍යග් දෘෂ්ටිනම්.

1 — 13

තෘණකුටි=තණසෙවිලිකළ කුඩාඹගවල්.
විරල=තුනී.

1 — 14.

විෂයකොට=අ ර මු ණු කො ට; ගොචර කොට.

1 — 15.

කර්මානුස්මරණ වශයෙන්=කර්මය සිහිකිරීම් වසයෙන්.

1 — 16.

පුණ්‍යකර්ම විශුද්ධිය=පින්කම්වල පිරිසිදු බව.

1 — 17.

අනිෂ්ට විපාකසන්තාපයෙන්=නපුරු විපාකයෙන් තැවීමෙන්.

කර්මසන්තාප-විපාක සන්තාපයෙන්= (පාප)කර්මය නිසා තැවීමෙන් හා (අනිෂ්ට) විපාකය නිසා තැවීමෙන්.

1 — 18.

අපරිමිත=අප්‍රමාණ.

කර්මනන්දනයෙන්=(පුණ්‍ය)කර්මය නිසා සතුටුවීමෙන්.

විපාකනන්දනයෙන්=(ඉෂ්ට)විපාකය නිසා සතුටුවීමෙන්.

සප්තකාමස්වර්ගයෙහි= සදෙව්ලොව හා මිනිස්ලොව යන ස්වර්ග සතෙහි.

1 — 19.

උද්දෙස පරිප්‍රශ්නාදි වසයෙන්= උදෙසීම් (=ඉගෙණීම්) පිළිවිසීම් (=ප්‍රශනකිරීම්) ආදි වසයෙන්.

උපනිශ්‍රිතක කථා= සමීපයට පැමිණියවුන්ට දෙසන කථා.

භුක්තානුමෝදනා=වළඳ අවසන්හි වදාරණ අනුමෙවෙනි බණ.

යුක්තප්‍රයුක්තව= යෙදී වෙසෙසින් යෙදී.

1 — 20.

අනුධර්මයෙහි=අනුරූප (යොග්‍ය වූ) ධර්මයෙහි.

අශෛක්ෂ ධර්මස්කන්ධ= රහතුන්ගේ ශීලාදී පඤ්චවිධධර්ම සමූහය.

අෂ්ටොත්තර ශත ප්‍රභෙදවූ=එක්සිය අටක් ප්‍රභෙද ඇති.

ආධ්‍යාත්මික=තමා පිළිබඳ.

ආලම්බනවූ=අරමුණුවූ.

කුත්සිතාජීවයෙන්= නින්දිතවූ යන තේරුමෙන්.

ක්ලෙශ මාරණය= කෙලෙස් නැසීම.

චතුෂ්පාරිශුද්ධි ශීල=ප්‍රාතිමොක්ෂ සංවරශීලය, ඉන්ද්‍රිය සංවරශීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය යන සිවු පිරිසිදු සිල්.

ධාත්වායතන=චක්ඛුධාතු ආදිවූ අටළොස් ධාතු හා චක්ඛායතනාදිවූ දොළොස් ආයතන.

නිර්වාණාර්ථින්=නිවන් කැමැත්තවුන්.

පරිච්ඡෙද්‍යය= පිරිසිඳ දත යුතුය.

ප්‍රහාතව්‍යය=ප්‍රහීණ කටයුතුය.

බාහ්‍ය=පිටත්හිවූ.

භාවිතව්‍යය=වැඩිය යුතුය.

මාර්ගණය=සෙවීම.

සමතික්‍රමණය=ඉක්මවීම.

ස්කන්ධ=රූපාදි රාශිය.

සාක්ෂාත් කර්තව්‍යය= ප්‍රත්‍යක්ෂ කටයුතුය.

ශාන්ති ලක්ෂණවූ= සංසිඳීම ලක්ෂණකොට ඇති.

2 — 1

අපරිච්ඡින්නායු= පිරිසිඳීමක් (=කෙළවරක්) නැත.

අපරිමුක්ත=නොමිදුනු.

ජාතයහට=උපන්නාහට.

ජීවිතෙන්ද්‍රිය=රූප ධර්මයන් හා අරූප ධර්මයන් ජීවත්කිරීමෙහි අධිපති බව කරණ ධර්මය.

නිර්විශෙෂ=වෙනසක් නැති.

ප්‍රමත්තයා=ප්‍රමාදවූවහු.

සන්තතිවිච්ඡෙදසඞ්ඛ්‍යාත= ජීවිතෙන්ද්‍රියපරම්පරාවසිඳීමයයි කියනලද.

ස්මෘති අවිප්‍රවාසය= සිහියෙන් නොවෙන්ව විසීම.

2 — 2.

නවලොකොත්තර ධර්මය=සතර මග, සතරපල, නිවනයන ලොකොත්තර ධර්ම නවය.

බොධිපාක්ෂික ධර්ම= නිවන් අවබොධකරණ පුද්ගලයාගේ පක්ෂයෙහිවූ සතිපට්ඨාන 4ය, සම්මප්පධාන 4 ය, ඉද්ධිපාද 4 ය, ඉන්ද්‍රිය 5 ය, බල 5 ය, බොජ්ඣඞ්ග 7 ය, මාර්ගාඞ්ග 8 ය යන ධර්ම.

2 — 3.

අත්‍යන්තශාන්තවූ= ඉතාම සංසිඳුනාවූ.
ධ්‍රැවවූ=ස්ථිරවූ.
ප්‍රසනය=ස්පර්ශකිරීම.

2 — 4.

පරිවාර=පිරිවර.
සම්මාන=බුහුමන් කිරීම.

2 — 5.

අගාධ= පතුළ නොපෙණෙන ගැඹුර.
අපාර=පරතෙර නැති.
අවජන්= ආවර්ජනය (මෙනෙහි) කිරීම.

2 — 6.

ත්‍රිවිද්‍යා= පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්‍ෂුර්ඥානය, ආශ්‍රවක්‍ෂයකරඥානය යනවිද්‍යාතුණ.
සිවුපිළි සිඹියාවට= අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන ප්‍රතිසම්භිදා සතරට.
ෂඩභිඥවට= ඉද්ධිවිධ, දිබ්බසොත,පරචිත්තවිජානන,පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු,ආසවක්ඛය යන විශිෂ්ට ඥාන සය.

2 — 7.

තෘෂ්ණා සංස්තවයෙහි=තණ්හාව හා එකතුවීමෙහි.
නහමක් යෙදෙන්නේයැ=නොයෙදෙන්නේය.

2 — 8.

අනුබද්ධවූ=නුදුරණ ලද; නුගුළු වන ලද.
අභිඥචිත්තසම්ප්‍රයුක්තවූ=අභිඥ සිත හා යෙදුනාවූ.
අසමුච්ඡින්නවූ=නුසුන්වූ; නොසිඳින ලද්දාවූ.

ශොකශල්‍ය=සොකනැමැතිඋල්.

2 — 9.

ස්මෘතිජාගර්‍ය්‍යාභාවයෙන්= සිහිය නොනිදා (=පිබිද) සිටීමක් නැති බැවින්.
ස්මෘතිවෛපුල්‍යයට= සිහිය මහත් බවට.

2 — 11.

උඩම්භාගිය වසයෙන්= උඩයයි කියනලද රූපාරූප ලොකයන් භජනය කරණ ධර්මයන්ගේ වශයෙන්.
ඔරම්භාගියවසයෙන්=ඔර(=යට) යයි කියනලද කාමලොක භජනය කරණ ධර්මයන්ගේ වශයෙන්.
නරකොත්පත්ති ආදියට= නිරයෙහි ඉපදීම් ආදියට.
පුනරුත්පත්තියට= නැවත ඉපදීමට.

2 — 12.

අනුපාදා පරිනිර්වාණයට=ස්කන්ධයන්ගේ පරිනිර්වාණයට;අනුපාදිශෙෂ පරිනිර්වාණයට.
ක්ලෙශපරිනිර්වාණයට=කෙලෙස් නිවීමට.
විදර්ශනා= අනිත්‍යාදි ත්‍රිලක්‍ෂණ භාවනාව.

3 — 1.

අනවස්ථිතවූ= එක් අරමුණක නොසිටින්නාවූ.
අවිද්‍යාස්කන්ධ=අවිද්‍යා රැශිය
ඖදාරිකක්ලෙශයන්=දළ(=දූඩි) කෙලෙස්.
වලිතව=වකුටුබව.
ධනුර්ධරතෙම=දුනු දරන්නා;දුනුවායා.

භූමිවස්ථාලම්බන ක්‍රියාදි වශයෙන්= කාමාවචරාදි භූමි වශයෙන්ද, වාසස්ථාන වශයෙන්ද, රූපාදි අරමුණු වශයෙන්ද, ක්‍රියා (=සිතින් කරණ වැඩ) වශයෙන්ද යන මේ ආදිවශයෙන්.

වාලවෙධයට=ලොමයක් විදිමට.

සත්ප්‍රාප්තවූ= සැපවූ; හිතවූ; පථ්‍යවූ.

සතාමශීතය=සලකා බැලීම.

සපන්දනාදි=වසැඩලවීම් ආදි.

3 — 2.

අභාවිතවූ=නොවැඩූනාවූ.

එකත්‍රාලම්බනයෙහි=එකම අරමුණෙහි.

ධුරනික්ෂෙප= කටයුතුත බහා තැබීම (අත්හැරීම.)

නානාලම්බනයෙහි= නොයෙක් අරමුණෙහි.

පරිභ්‍රමණය කිරීම්= කරකැවීම්.

මාරායතන=මරුට අයත්.

3 — 3.

දුර්විනීතවූ=නොහික්මුනාවූ.

නිපොපි කිරීම්= නිශ්චල කිරීම.

3 — 4.

අනයව්‍යසනයට= නොවැඩීමට හා විනාසයට.

චිත්තවශිකව=සිතට යටත්ව.

3 — 5.

වර්‍ණසංසථානයෙක්= පාටක් හා සටහනක්.

සතර මහා භූතයන්= පඨවී, ආපො, තෙජෝ, වායො යන මහාභූත සතර.

හුයක්=නූලක්.

3 — 6.

අචලප්‍රසාදයෙහි= නොසෙල්වෙන පැහැදීමෙහි.

ආජීවකව=නිගණ්ඨනාථපුත්‍ර ශ්‍රාවකයෙක්ව.

දවසෙයි=දහසියා.

නිගණ්ඨව= අපි කෙලෙස් ගැට නැත්තෝවමුයි පවසන තීර්ථකයෙක්ව.

මට්ටතනලයා=තට්ටයා, හිසෙහි කෙස්නැති තැනැත්තා.

සෙවකව=අචෙලක (=නගනපිරිවැජිතවූසෙක්)ව.

3 — 7.

අනාලය=ආලය(=ගෙයක්)නැති.

අපුනරාවර්තනය= නැවත හැරී නොඊම.

කායග්ලානාදි වශයෙන්= කයේගිලන්බැව් ආදි වසයෙන්.

ජාගර=නොනිදන.

ශ්‍රද්ධාදි පඤ්චවිධ=ශ්‍රද්ධා,වීර්‍ය,සති, සමාධි,පඤ්ඤය නපස්වැදෑරුම්වූ.

3 — 8.

අබල=බලනැති.

අයොධ්‍යවූ= පහර නො දිය හැකිවූ.

ආර්‍යමාර්ගමයවූ= ආ ර්‍ය මා ර්ග යෙන්ම උපන්නාවූ.

ආවාසසත්ප්‍රාය= සැපවූ ආවාස.

ආශ්වාද=රස විඳ ගැණීම.

කුලාල= කුඹල්.

කෙලශයන් තාක්= ඇතිතාක් කෙලෙසුන්.

තත්තනමාර්ගයෙන්=ඒ ඒ මගින්.

තව්කාලි=තාවත්කාලික (=එතකල්පවත්නා දෙයක්.)

ධර්මශ්‍රව ණ ස ත් ප්‍රා ය= හි ත වූ බණක් ඇසීම.

නොතර=අස්ථිර, ස්ථිරනොවන.

පසමිතුරන්=සතුරන්.

පවුරු=ප්‍රාකාර.

පදනම=අත්තිවාරම, කය්යෝරුව, අනුප්‍රාකාරය.

පුද්ගල සත්ප්‍රාය=හිතවූ පුද්ගලයන්.

ප්‍රතිබා (ත) ධනය= වැළැක්වීම.
භොජන සත් ප්‍රාය= සැපවූ බොජුන්.
වධ්‍යවූ=නැසිය යුතුවූ.
විදර්ශනාමයවූ=විදර්ශනා භාවනා වෙන් උපන්නාවූ.
සමවැද=මනාකොට පැමිණ.
සමාපත්තියට=ධ්‍යානයට.
සංස්කාරයන්=හෙතුප්‍රත්‍යය බල යෙන් ඇතිවන ධර්මයන්.

3 — 9.

පූතිශුෂිරකාෂ්ඨයක්= කුණුවූ සිදුරු ඇති දරලීයක්.

3 — 10.

ජීවිතහරණය= දිවි පැ හැ ර ගැණීම.
සර්වස්වහරණය= සියලු ධනය පැහැර ගැණීම.

3 — 11.

කැලම=කොහෙත්ම.
නං=නංගී, බාල සහෝදරී.
බූන්= වැඩිමහල් සහෝදරී, භගිනී.
බෑ=වැඩිමල් සහෝදරයා.
මල්= මල්ලී, බාල සහෝදරයා

4 — 1.

දනන්නේද=දිනන්නේද.
ප්‍රතිවෙධ=අවබොධ.
යථාස්වභාව=ඇතිසැටිය.

4 — 2.

අධිශිල= වැඩි (උසස්) සීලය, උතුම් සීලය. එනම් ප්‍රාතිමොක්ෂ සංවර සීලය හෝ මාර්ග ඵල සම්ප්‍රයුක්ත ශීලයයි. පඤ්චාඞ්ග- දසාඞ්ග සීලයන්ට වැඩිවූද උතුම්වූද සීලය හෙයින් මෙය අධිශීල නම්.

අධිචිත්ත= වැඩිසිත, උසස්සිත. එනම් විපස්සනා පාදක අෂ්ට සමාපත්තිචිත්තය හෝ මාර්ග ඵල චිත්තයයි. මේ චිත්තයෝ සියලු ලෞකික චිත්තයන්ට වැඩිවූද උතුම්වූද සිත්හෙයින් අධිචිත්ත නම් වෙත්.
අධි ප්‍රඥ=උසස් ප්‍රඥව, උත්තම ප්‍රඥව. එනම් ත්‍රිලක්ෂණාකාරය පිරිසිඳින්නාවූ විදර්ශනා ඥනය හෝ මාර්ග ඵල ප්‍රඥවයි. දුන්දෙ යෙහි විපාක ඇතැයි යනාදීන් පවත්නා කර්මස්වකප්‍රඥවට හා සියලු ලෞකික ප්‍රඥවන්ටත් අධිකහෙයින් හා උත්තම හෙ යින් මොතොමෝ අධිප්‍රඥනම්.
අව්‍යාපාරනය= (ඒ ඒ ප්‍රත්‍යය යෙන් ඇතිවන ධර්මයන් විෂ යෙහි නොපවත්නා බවයයි කිය නලද) ව්‍යාපාරයක් (ක්‍රියාවක්) නැතිකුමය.
එවංධම්මතානය=ඒඒ හෙතුන්ට සුදුසු සුදුසු පරිද්දෙන් විපාක යන් පහළවීමේ ක්‍රමය.
එකත්වනය= එක්ලෙසකින්ම පැවැත්වීමේ ක්‍රමය හෙවත් හෙතු ඵල ක්‍රමය.

> හෙතුඵලසම්බන්ධෙන
> සන්තතානුපච්ඡෙදතො,
> පවත්තො එකත්තනයො
> කච්චෙන පකාසිතො.

එකත්වනය නානාත්වනයාදීනය වශයෙන්=එකත්වනය, නානාත්ව නය, අව්‍යාපාරනය, එවං ධම්ම තානය යන මේ ආදී ක්‍රමවශ යෙන්.

නානාතීනය= නොයෙක් ක්‍රම වලින් පැවැත්මේ ක්‍රමය හෙවත් නොයෙක් ප්‍රත්‍යයන්නිසා නොයෙක් ධර්මයන් පැවැත්මේ ක්‍රමය.

සකාසක පච්චයෙහි
නානා ධම්මානු පජ්ජනං,
සොච නානත්තනයොති
වෙදිතබ්බො විභාවිනා.

පුෂ්පාරාමයට=මල්උයනට.

සමාස ව්‍යාස සාකල්‍යාදී වශයෙන්= සංක්ෂෙපය, විස්තරය, සකලභාවය යන මේ ආදී වසයෙන්.

සප්තවිධ=සත්වැදෑරුම්.

4 — 3

අනවත්තිය=කල් නොපවත්නා.

ආයතීමාගීශස්ත්‍රයෙන්= ආයතීමාගී නැමති ආයුධයෙන්.

කම්වට්ය=කර්මවෘත්තය.

කෙලෙස් වට්ය= කෙලශ වෘත්තය.

තාවත්කාලික=එතකල්වූ.

පඤ්චකාමගුණයන්=රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන පස් කම් ගුණයන්.

මෘත්‍යුමාරයාහට=මරණ නැමති මාරයාට.

විවට්ය=විපාක වෘත්තය.

4 — 4.

අසම්ප්‍රාප්ත=නොපැමිණි.

ගෙධ වශයෙන්=ගිජුවීම් (=ආසා කිරීම්) වශයෙන්.

4 — 5.

අතෘප්තාවූවහු=තෘප්තියට නොපැමිණියහු.

පයෙෂණයෙන්=සෙවීමෙන්.

ප්‍රතිලාභයෙන්=ලැබීමෙන්.

4 — 6.

අනගායමී= ගිහිගෙට අයත් නොවූ.

අසෙඛවූ=මතුහික්මීමක් නැත්තාවූ, රහත්වූ.

කෙසුරකට=රෙණකට.

භික්=භික්ෂාව (=ආහාරය.)

මල්මුවරද=මල්පැනි.

සෙඛවූ= ත්‍රිවිධශික්ෂාවෙහි හික්මෙන්නාවූ, රහත්නොවූ.

4 — 7.

අපපස්සානය= (තෙරුවන්කෙරෙහි) පැහැදීම් නැත්තෙක.

අසස්ධය=ශ්‍රද්ධා නැත්තෙක.

අසෝ=අසවල්.

කායදඩ්ඩි බහුලව=කයේ (ශරීරයේ) දැඩිකම බොහෝ කොට ඇත්තෙක්ව.

නිදුරාමව= නින්දෙහි ඇලුනෙක්ව.

භස්සාරාමව=කථාකිරීමෙහි ඇලුනෙක්ව.

මර්මච්ඡේදකාවූ=මර්මස්ථාන සිඳින්නාවූ. යම්තැනක් තැළූ පෙළූකල්හි සත්වයා මැරෙයිනම් එය මර්මනම්. එනම්:– ශිරා, ස්නායු, සන්ධි, මාංස, අස්ථි යනමොවුන් එක්වූතැනයි. මේ තැන්වල ප්‍රාණය විශෙෂාකාරයෙන් පවත්නාහෙයින් ඒතැන් "මර්ම" යයි කියනුලැබෙත්. ශරීරයෙහි ඒ "මර්ම"ස්ථාන 107 කි.

ලාබත්= සලාකබත්, නම් ඈදී මෙන් බෙදන බත්.

විසස්ටඨකායචිත්තව= සිහියෙන් තොරවූ කය-සිත දෙක ඇත්තෙක්ව, කය-සිතදෙක නොරැක.

සඞ්ගණිකාරාමව= සමූහයා හා එක්ව හිඳීමෙහි ඇලුනෙක්ව.

4 — 8

ත්‍යාගගන්ධය=ත්‍යාග ( =කම්පල අදහාදීම ) නැමති සුවඳ.
ප්‍රතිපත්තිගන්ධය=ප්‍රතිපත්ති ( =මනාපිළිපැදීම ) නමැති සුවඳ.
ශ්‍රැතගන්ධය=ත්‍රිපිටකධර්මය අසා දැන ඇතිබව නැමති සුවඳ.

4 — 9

සත්කෘත්‍යශ්‍රවණ-ධාරණ-ප්‍රතිපත්ති වශයෙන් } =සකස් කොට ඇසීමය, දැරීමය, පිළිපැදීමය යන මොවුන්ගේ වශයෙන්

4 — 10

එකතෝ වණ්ටික උභතෝ වණ්ටිකාදි වශයෙන් } =එක අතට නැටි ඇති, දෙනට නැටිඇති යනාදි වශයෙන්

4 — 1'

ඉතිරියක්හු=වැඩියක්හු.

4 — 14

තදඞ්ගවිමුක්ත්‍යාදි පඤ්චවිධ විමුක්තීන්ගේ=තදඞ්ගවිමුක්තිය ආදි කොට ඇති පස්වැදෑරුම්වූ විමුක්තීන්ගේ.
පස්වැදෑරුම්වූ විමුක්ති නම්-(1)තදඞ්ග විමුක්තිය (2) විෂ්කම්භණ විමුක්තිය, (3) සමුච්ඡේද විමුක්තිය, (4) ප්‍රතිප්‍රශ්‍රබ්ධි විමුක්තිය, (5) නිස්සරණවිමුක්තිය යන මොහුයි. එහි (1) තදඞ්ග විමුක්ති නම් අනිච්චානුපස්සනාදි සත්වැදෑරුම් අනුපස්සනාවෝයි. ඔහු තමතමන්ට විරුද්ධවූ අඞ්ග (කරුණු) වශයෙන් හරණලද නිත්‍යසංඥාදියෙන් විමුක්ත(=මිදුනු) හෙයින් තදඞ්ග විමුක්ති නම් වෙත්.
(2 විෂ්කම්භණ විමුක්ති නම් අෂ්ටසමාපත්තීහුයි. තමතමන් විසින් විෂ්කම්භිත (=යටපත්කළ) නීවරණාදියෙන් විමුක්ත හෙයින් අෂ්ටසමාපත්තිහු විෂ්කම්භණ විමුක්ති නම් වෙත්
(3 සමුච්ඡේද විමුක්ති නම් ස්‍රෝතාපත්තිමාර්ගාදි චතුර්විධ ආර්ය්‍යමාර්ගයෝයි. තමතමන් විසින් සමුච්ඡින්න (=මුල්සිඳි) කෙලෙසුන්ගෙන් විමුක්ත හෙයින් ආර්ය්‍යමාර්ගයෝ සමුච්ඡේද විමුක්ති නම්වෙත්
-(4) පටිප්පස්සද්ධි විමුත්ති නම් ශ්‍රෝතාපත්ති ඵලාදි චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵලයෝයි. මාර්ගානුභාවයෙන් කෙලෙසුන් පටිප්පස්සම්භනය (=සිඳීම) කළපසු උපන් හෙයින් ඵලයෝ පටිප්පස්සද්ධි විමුත්ති නම් වෙත්.
-(5) නිස්සරණ විමුත්ති නම් නිර්වාණයයි සියලු කෙලෙසුන්ගෙන් විමුක්ත හෙයින් නිර්වාණය නිස්සරණ විමුත්ති නම්වේ †

4 — 16

මහමගෙක්හි=මහාමාර්ගයෙක්හි.

† නිර්වාණය සියලු කෙලෙසුන්ගෙන්ම මිදුනක් බැව් මෙයින්ද පෙණේ. එබැවින් කෙලෙස් ඉතිරිවතිබියදී සොවාන්මගේ පටන් නිවණ ලැබේයයි මැනක සිට ඔවුනොවුන් කියන තමුන් එය විතණ්ඩ (මිථ්‍යා) වාදයක් බැව්ද කෙලශලේශයක්වත් තිබෙනතුරු නිවණ නොලැබෙන බැව්ද තේරුම් ගතයුතුයි.

4 — 16

මුවරද=මකරන්ද, මල්පැනි.
පුහුදුන්=පෘථග්ජන-මාර්ගඵලනො ලැබූ තැනැත්තා.

5 — 1

ධර්‍මතාවශයෙන්=ස්වභාවවශයෙන්

5 — 3

රූප-යෞවන-බල-පරාක්‍රමසම්පන්නවූ=රූව, තරුණබව, බලය, බලවත්වීර්‍ය්‍යය යන මෙයින් යුක්තවූ.

5 — 4

පඩිරූපාසනය-එලඹීම=ලඟට පැමිණීම.
බහුශ්‍රුතයෙක්=බොහෝ ආගම ධර්‍මයන් ඇසූ තැනැත්තෙක්.

5 — 5

අනවද්‍යය=නිවැරදිය.
අසෙවිතව්‍යය=සෙවනය නොකට යුතුය.
ආචාරය=සුදුසු හැසිරීමය.
ගොචරය=හැසිරියයුතුතැන්ය.
පර්‍ය්‍යාප්ති ධර්‍මය=ත්‍රිපිටකධර්‍මය.
පසක්කටයුතුය=ප්‍රත්‍යක්‍ෂකට යුතුය.
පිළිවිද්දයුතුය=ප්‍රතිවෙධ කට යුතුය, තේරුම්ගතයුතුය, අවබොධ කටයුතුය.
විහාරය=හැසිරියයුතුතැන්ය.
සාවද්‍යය=වරදසහිතය.
සෙවිතව්‍යය=සෙවනය කටයුතුය

5 — 6

උද්ග්‍රහණ-පරිපෘච්ඡාදිය=ඉගෙණ ගැණීම-උගත්දෙය පිළිබඳ නැවත නැවත විචාරීම් ආදිය, පෙළ ඉගෙණීම, අර්‍ථ පිළිවිසීම් ආදිය
සම්මස්ථානානුයොගයෙන්=භාවනා කර්‍මයට යොග්‍යවූ පඨවිකසිණාදී කර්‍මස්ථානයන්හි යෙදීමෙන් හෙවත් පඨවි කසිණාදි කර්‍මස්ථාන භාවනා කිරීමෙන්.
චාරවිහාරාදී ප්‍රතිපත්ති ධර්‍මය=හැසිරීමය, වාසයකිරීමය, යනාදීවශයෙන් පිළිපැදියයුතු ධර්‍මවූ-පාංශුකූලිකාඞ්ගය, තෙචීවරිකාඞ්ගය යනාදි තෙරලස් ධුතාඞ්ගාදි ප්‍රතිපත්තිධර්‍මය.
විඥතාධිෂ්ඨිතවූ=විඥානයෙන් යුක්තවූ.

5 — 7

කර්‍කශවූ විපාක=රළුවූ (නපුරුවූ) විපාක.

5 — 8

අනිෂ්ටවිපාකය=අයහපත්විපාකය
අපායොත්පත්තිසාධකවූ=අපායෙහි ඉපදීම සිදුකරන්නාවූ.
පශ්චාත්තාපයෙන්=පසුතැවිල්ලෙන්.

5 — 9

ආයතිභවයෙහිදූ=මතුජාතියෙහිදූ
ඉෂ්ටවිපාකය=යහපත්විපාකය.
ප්‍රීති සෞමනස්‍යයෙන්=ප්‍රීතියෙන් හා සතුටුසිතින්.
සෞමනස්‍ය වෙගයෙන්=සොම්නස් බලයෙන්, සතුටුසිත්හුගේ වෙගයෙන්.

5 — 10

අපරාපර්‍ය්‍යායවෙද්‍යවූ=කවද නමුත් ඉසර අවකාශ ලැබුනවිටකදී විපාකදෙන කර්‍මයක්ව.
උපපද්‍යවෙද්‍යවූ=දෙවෙනි ආත්ම

භාවයෙහි විපාකදෙන කර්මයක්ව.

කායික චෛතසික දුඃඛයට=කය පිළිබඳවූද සිතපිළිබඳවූද දුකට.

දුශ්චරිත සම්බන්ධීව=දුශ්චරිතයන් ගෙන් යුක්තව.

දෘෂ්ටධර්මවෙදනීව=ඉහාත්මභාවයෙ හි විපාකදෙන කර්මයක්ව.

5 — 11

අචේලක ව්‍රතයට=වස්ත්‍රයෙහිත් ආශාවක් නැතැයි කියා රෙදි ඇඳීමක් නොමැතිව හැසිරෙණ නිගණ්ඨයන්ගේ ව්‍රතයට.

කෂ්ටව්‍රත සමාදානය=දුක් දෙන ව්‍රත සමාදන්වීම.

කලාව=කොටස, භාගය.

කුකුස්කොට=පසුතැවිලිකොට.

කොහොන්=කුහක.

ත්ණායතනයෙහි=තීණිතම දූලී බිඩිඇතිවන තන්හි.

පරිඥාතධර්මයන්=අවබෝධකළ චතුස්සත්‍ය ධර්මයන්.

වාතභක්ෂණයකොට=වාතය අනුභවකොට.

ශීල පරිපූරණය=ශීලය මනාකොට සම්පූර්ණකිරීම.

5 — 12

ඇඹිලක් . නොපහරණතෙක්=ඇඹිල් (මුහුන්) නොදමනතාක්.

5 — 14

අනාගාමී=කාමරාග ව්‍යාපාද යන සංයෝජනවය නිරවශෙෂ වශයෙන් ප්‍රහාණය කළ හෙයින් ප්‍රතිසන්ධි වශයෙන් කාමභවයෙහි නූපදනා අනාගාමී පුද්ගලයා.

ඉච්ඡාචාරයෙහි=තමන් කැමතිසේ හැසිරීමෙහි.

වෙහෙර පසන=විහාරයේ එක් පැත්තක.

සකෘදාගාමී=කාමරාග ව්‍යාපාද යන සංයෝජනවය තුනීබාවට පමුණුවකලද හෙයින් ප්‍රතිසන්ධිවශයෙන් එක්වරක් මනුෂ්‍යලෝකයට එන සකෘදාගාමී පුද්ගලයා.

සෝපද්‍රව=උපද්‍රව සහිතවූ

සෝවාන්=සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයෝජනවශයෙන් තුනක්කොට දක්වකලද දිට්ඨි, විචිකිච්ඡා යන අකුසල් දෙක (මුල්සිඳ) නැති කොට අෂ්ටාඞ්ගමාර්ගසඞ්ඛ්‍යාත ධර්මස්‍රොතසට පැමිණි ස්‍රොතාපන්න පුද්ගලයා.

5 — 15

අවතුරසියක්= (අව + උතුරු + සියක්) අවක් අධික සියයක්. 106,

වපෙළාදයෙහි-චන්ද්‍රයා උදාවන කල්හි, සඳපායන කල්හි

විතර්කය=කල්පනාව.

5 — 16

අනඝව=අඝයෙක් නොවී.

අමායාවීව=වඤ්චාකාරයෙක් නොවී.

අශඨව=කෛරාටිකයෙක් නොවී.

උපධිවිවේකය= (=ස්කන්ධොපධි, ක්ලේශොපධි, අභිසංස්කාරොපධි, පඤ්චකාමොපධි යන සතර උපධීන්ගෙන් වෙන්වූ හෙයින් උපධිවිවේක නම්වූ) නිර්වාණය.

ගණසඞ්ගණිකායෙන් = සමූහයා කෙරෙහි ඇලී වාසය කිරීමෙන්.

නිර්වාණප්‍රාප්තවූද=නිවණට පමුණුවන්නාවූද.

ලාභොත්පාදකවූද=ලාභ උපදවන්නාවූද

සංස්කාර සඞ්ඛ්‍යාතයෙන්=සංස්කාරයන් කෙරෙහි ඇලීම්වීමෙන්.

6 — 1

නිගනිමි=නිග්‍රහකරමි.

කරණාවමි=තිම්බලාගැනීම කරවමි

නිශ්‍රය ප්‍රණාමිතය=නිසඳුවත් කිරීම. (මෙය භික්ෂූන්ට ආචාර්ය්‍ය උපාධ්‍යායාදීන්විසින්කරණ දඬුවමකි.)

නොසරුප්=අයගපත්-නුසුදුසු.

රන්ධ්‍රගවෙෂීනොනාව=සිදුරුසොයන්නෙක් නොව.

6 — 2

අනුත්පන්නවස්තුවෙහි=නූපන් කරුණෙහි.

ජීවිකාර්ථිව=ජීවිකාවම ප්‍රයෝජනකොට ඇත්තෙක්ව.

6 — 3

අකත්තිව්‍යයෙහි=නොකටයුත්තෙහි.

6 — 4

නාමකායයෙන්=වේදනා, සඤ්ඤා, සංස්කාර, විඥානයයි කියනලද නාම කායයෙන්.

නිරුපක්ලෙශවූ=කාමවිතර්කාදි උපක්ලෙශ රහිතවූ-ආගන්තුකව පැමිණෙන කෙලෙස් නැති.

පරිශුද්ධ-ප්‍රහාන-සච්ඡිකිරියා-භාවනා වශයෙන් }=පිරිසිදුනීමය, ප්‍රහාණය කිරීමය, පසක්කිරීමය, වැඩීමය යන මොවුන්ගේ වශයෙන්.

6 — 5

නිම්වලලු=කරත්තරෝදය වටේ යොදන වලලු-යකඩ පට්ටම්

වෙහෙලි=නියර, බැමි.

6 — 6

අනුරෝධ=අනුකූලබව-ඇල්ම.

උන්නතාවනතියක්=උස්පහත් කමක්.

පටලයක්=වැස්මක්.

පාංශුපතිත=පස් පතිත-පස්කඩ.

මිශ්‍රපතිත=ගල් පස් මිශ්‍ර පතිත.

රන්ධ්‍රයක්=සිදුරක්.

විරෝධයක්=නො ඇල්මක්.

6 — 7

අනාකුලවූ=නොපැටලුනාවූ.

වලිතවූ=සොලවනලද්දවූ.

මස්කැස්බත්=මසුන් හා කැස්බත්.

6 — 8

උච්චවූද=උස්වූද.

නන්දිරාගය=ආසාව, ඇලීම.

නීචවූද=පහත්වූද.

වහල්සරකට=මෙහෙකරුවන්ට හා ගවයන්ට.

ස්කන්ධධාත්වායතනාදී=රූපස්කන්ධාදී පඤ්චස්කන්ධ,චක්ඛුධාතු ආදී අටළොස්ධාතු, චක්ඛායතනාදී ෂඩායතන යනමේ ආදීවූ.

6 — 9

සමාධිය=සම්පූර්ණතාව.

6 — 10

සක්කායතීරයවම=ආත්මදෘෂ්ටිනැමති නොවටම.

6 — 12

අභිරමණය=සිත් ඇලවීම.

නිරාලයයයි=ආලය නැතැයි.

6 — 13

කාමච්ඡන්දාදී පඤ්චනීවරණයන් කෙරෙන්=මාර්ග-ඵල-නිර්වාණයන් ආවරණයකරණහෙයින්නීවරණ

නම්වූ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පඤ්චවිධ ධර්මයන්ගේ පළිබෝධ=පීඩා.

6 — 14

චතුරුපාදානයන්=කාමූපාදාන, දිට්ඨුපාදාන, අවිජ්ජුපාදාන, සීලබ්බතුපාදාන යන උපාදාන (දෘඪග්‍රහණ) සතර.

චරිමචිත්තනිරෝධයෙන්=අන්තිම චිත්තයාගේ නිරුද්ධවීමෙන්.

කාරණහෙයින්=හේතුවසයෙන්.

කෙලශවෘත්තය=කෙලෙස්වට.

ග්‍රහණය=ගැණීම.

නයහෙයින්=ක්‍රමවශයෙන්.

නිරුපාදානවූ=තෙල්, පගන් වැටි ආදි උපකරණ රහිතවූ.

සප්තබොධ්‍යඞ්ග ධර්මයන්=සතිසම්බොජ්ඣඞ්ගය, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය, විරිය සම්බොජ්ඣඞ්ගය, පීතිසම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය යන සප්ත බොධ්‍යඞ්ග ධර්මයන්.

7 — 1

අභිධ්‍යාකාය ග්‍රන්ථාදී=අභිධ්‍යා, ව්‍යාපාද, සීලබ්බතපරාමාස, ඉදංසච්චාභිනිවෙස යන මොවුහු නාමකායින් රූපකාය හෝ වර්තමාන කායින් අනාගත කාය හෝ වෙලත් නුයි කායග්‍රන්ථනම්වෙත්;එනම්— අභිධ්‍යාකායග්‍රන්ථ, ව්‍යාපාද කායග්‍රන්ථ, සීලබ්බතපරාමාස කායග්‍රන්ථ, ඉදංසච්චාභිනිවෙශ කායග්‍රන්ථයන මොහුයි.

වට්ටමූලකවූ=සංසාරවෘත්තයට මූලකාරණවූ.

7 — 2

අභිරතියෙක්=ඇලීමක්.

අලග්නව ම=නොඇලී ම.

ආවර්ජන=බැලීම.

උඨාන=නැඟිටීම.

ගණෙහිවත්=සමූහයා කෙරෙහිවත්-ගණයා කෙරෙහිවත්.

ගොචරසම්පන්නවූ=ගොදුරු ඇති.

නිරපෙක්ෂව=බලාපොරොත්තු නැතිව.

සමාපජ්ජන=සමාපත්තීන්ට සම වැදීම.

හංස-පිලව-කාරණ්ඩව-බක-බලාකාදි පක්ෂීන් } =හංස-මහවෙල්-කිරල්-සුදුකොක්-කනකොක් ආදී පක්ෂීන්.

7 — 3

කබලිඞ්කාරාහාරයෙහි=පිඩුකොට වළඳන අහරෙහි.

ඡන්දරාගප්‍රහාණය=ආසාදුරුකිරීම.

ඛජ්ජ-භොජ්ජ-ලෙය්‍ය-පෙය්‍ය-සඛාද්‍යාන=කඩා කෑයුතු දෙය-බුදියයුතුදෙය-ලෙවියයුතුදෙය-පානය කටයුතු දෙයයි කියනලද.

7 — 4

පයින් ඇක්ම=පයින් පාගා.

පැහැර=ස්පර්ශකොට.

ලෙන්=ලයෙන්.

7 — 5

අවලෝකධර්ම=6. ර්. ගාථාවේ සන්නය බලනු.

චතුරාශ්‍රවයන්ගේ=කාමාශ්‍රව, භවාශ්‍රව, දෘෂ්ට්‍යාශ්‍රව, අවිද්‍යාශ්‍රව යන ආශ්‍රවයන් සතරදෙනාගේ.

නිපොපිබවට=නිශ්චලබවට.

ප්‍රගීත මත්ඇති=ප්‍රණීතවූ මාතය ඇති.

සඉඳුවෙරී=ඉන්ද්‍රියයන් සංදෙන.

7 — 8

අකම්ප්‍ය=කම්පා නොවන.
අනුනය ප්‍රතිඝරහිතව=ප්‍රේමයක් හා ද්වේෂයක් නැතිව.
අසත්කාර=නෑගැව, නොසැලකීම.
ඊෂිකාස්තම්භයක්=කණුවක්.
ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන්=චුතවීම් උපදීම් වශයෙන්.
නික්ෂේපයෙහිද=බහාලනකල්හිද
ධූතාඞ්ගව්‍රත=පාංශුකූලිකාඞ්ගය, තෙචීවරිකාඞ්ගය ආදී තෙළෙස් ධූතාඞ්ගව්‍රත.
මූත්‍රපුරීෂාදීන්ගේ=මූත්‍ර-මල ආදීන්ගේ.
සංසරණයක්=හැසිරීමක්.

7 — 8

ප්‍රතිසන්ධ්‍යවකාශ=ප්‍රතිසන්ධියදීමට සෑහෙන හෙතු.
වෘත්තසන්ධියද=භවයෙන්භවයගැළපෙන සන්ධියද, සසරද.
සංස්කාර සන්ධියද=සංස්කාර විඥාන දෙදෙනා අතරවූ සන්ධියද.

7 — 10

නිර්මලශුචිශීතලසලිලසම්පන්නවූ=මල ( කිලිටි) රහිත පිරිසිදු ශීතල ජලයෙන් යුක්තවූ.
බට=බැස්සාවූ.
පුල්පියුමට=පිපිනෙළුම්මලට.
සුපුෂ්පිත තරුවනසණ්ඩමණ්ඩිතවූ=මනාව පිපී මල්ඇති වෘක්ෂයන්ගෙන් යුක්ත වනලැහැබින් හෙබියාවූ.
පුල්ලෝ=ස්වභාව ඇත්තෝ.

8 — 1

අනවීපදයෙන්=(යගපත්වූ) අවියක් නැති පදවලින්
පඤ්චස්කන්ධ ද්වාදසායතනාදිවූ=රූප, වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය හා චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය; රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන දොළොස් ආයතනයන් ආදිවූ.
පුර=නගර.

8 — 4

අධ්‍යාත්මිකවූ=තමන් පිළිබඳවූ.
සංග්‍රාමයෝධයෙක්=යුඩභටයෙක්
සම්මර්දනය=මෙළෙනගිකිරීම

8 — 5

ධනහරණයෙන්=ධනය පැහැර ගැනීමෙන්.
බලාභිභවනයෙන්=බල මැඩ පැවැත්වීමෙන්.
සංයතවූ=හික්මුනාවූ.

8 — 6

කායවාක්සංයම=කය-වචනය යන දෙදෙනාගේ හික්මීම.
තිම්බරු නාරදාදිගන්ධර්වයෙක්=තිම්බරුය, නාරදය යනආදි ගන්ධර්වයෙක්.

8 — 7

බත්කෙනෙස්සක්=බත්හැන්දක්.
හබුසරලුවක්=හැඳහැන්දක්.

8 — 8

කඩපොල්ලක්=රෙදිහැල්ලක්.
ක්ෂීරපායාස-ඝෘත-මධු-ශර්කරාදි සිඤ්චනයෙන්=කිරිබත්, ගිතෙල් මී, සකුරු ආදිය ඉසීමෙන්.
නිෂ්ප්‍රපඤ්චපරිහරණය=ප්‍රමාද

රහිතව කර්මස්ථානපරිහරණය මෙහෙවත් භාවනා කිරීම.

යෝගද්‍රව්‍ය= යෝගකිරීමට වුවමනා දේ.

සිදුගතු=අඩ.

පුත්සාල්=කැඩුණුහාල්, හුණුහාල් යයි ව්‍යවහාරයෙහි එනහාල්.

8 — 9

එකවාරෙන=එකවරක.

කායවඞ්කාදි රහිතත්තභාවෙන්=කාය දුශ්චරිතාදිය නැතිහෙයින්.

ඛුද්‍ද=කුඩා.

8 — 11

ආලම්බනූපනිජ්ඣාන ලක්ඛණූපනිජ්ඣානයෙන් } අෂ්ට සමාපත්ති සංඛ්‍යාත ආලම්බනොපනිධ්‍යානයෙන් හා විදර්ශනා-මාර්ග-ඵල සංඛ්‍යාත ලක්ෂණොපනිධ්‍යානයෙන් (පඨවිකසිණාදි කසිණයන් උපනිධ්‍යානය(=මෙනෙසින් සිතාගැන්ම) කරණහෙයින් අෂ්ටසමාපත්තීහු ආලම්බනොපනිධ්‍යාන නම්වෙත්. අනිත්‍යාදී ත්‍රිලක්ෂණයන් උපනිධ්‍යානය කරණහෙයින් විදර්ශනාවද, විදර්ශනාවෙන් පැමිණි කිස සිදුකරණහෙයින් මාර්ගයද, තථ්‍යලක්ෂණය හා නිරොධසත්‍යය උපනිධ්‍යානය කරණහෙයින් ඵලයද, ලක්ෂණොපනිධ්‍යාන නම් වෙත්.)

උපචාරසමාධිඅර්පණාසමාධියෙන්=බුද්ධානුස්මෘති ආදි අනුස්මෘති සයය, මරණානුස්මෘතිය, උපශමානුස්මෘතිය, ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව, පෘථිවිධාතු ආදි චතුර්ධාතුව්‍යවස්ථානය යන දසවිධ කර්මස්ථානයන් භාවනා කිරීමෙන් ලැබගත් නා එකාග්‍රතාවය (සිතේ එකඟබවය ; ඉතිරිකර්මස්ථානයන් ත්‍ර භාවනාකිරීමෙන් ලැබගත් නා අර්පණාසමාධිත්ව පූර්වභාගයෙහි උපදනා එකාග්‍රතාවය යන මේ විවිධ එකාග්‍රතාවෝයයි කියනලද උපචාර සමාධියෙන් හා උපචාරසමාධිනමැති දසකර්මස්ථානයන් හැර ඉතිරි තිස් කර්මස්ථානයන් භාවනාකිරීමේදී උපදනා ගෝත්‍රභූ සංඛ්‍යාත පරිකර්ම සිතට අනතුරුව උපදනාඑකාග්‍රතාවයයි කියනලද අර්පණා සමාධියෙන්.

සීලසම්පදනයක්=සිල් සම්පත්තිමත්.

සමථවිදර්ශනා ප්‍රඥා=සමථ භාවනාවෙන් හා විදර්ශනා භාවනාවෙන් වැඩුනු ප්‍රඥාව.

මාර්ගඵල ප්‍රඥා=මාර්ගසිත්හි හා ඵල සිත්හි යෙදුන ප්‍රඥාචෛතසිකය.

8 — 13

වත් පිළිවෙත්=එක වරක් පමණක් කටයුතු සිරිත් හා නැවත නැවත කටයුතු සිරිත්, ලොකු කුඩා වත්.

හැදෑරීම පිරිවීමෙහි=හැදෑරීමෙහි හා හැදෑරුදේ පාඩම්කිරීමෙහි.

8 — 16

පස්විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන්ගේ උදය=(1) අවිද්‍යානුගේ හටගැන්ම කාරණකොටගෙණ රූපයාගේ හටගැන්මවේ, (2) තෘෂ්ණාහුගේ හටගැන්ම කාරණකොටගෙණ-(3)භවගාමී කර්මයන්

ගේ හටගැන්ම කරණකොටගෙණ-(4) ආහාරයාගේ හටගැන්ම කරණකොටගෙණ රූපයාගේ හටගැන්මවේ,

(5) අවිද්‍යාහුගේ හටගැන්ම කරණකොටගෙණ වේදනාහුගේ හටගැන්මවේ, (6) තෘෂ්ණාහුගේ හටගැන්ම කරණකොටගෙණ– 7)භවගාමී කර්මයාගේ හටගැන්ම කරණකොටගෙණ–(8, ස්පර්ශයාගේ හටගැන්ම කරණකොටගෙණ වේදනාහුගේ හටගැන්මවේ,

(9) අවිද්‍යාහුගේ හටගැන්ම කරණකොටගෙණ සංඥාහුගේ හටගැන්මවේ. (10) තෘෂ්ණාහුගේ හටගැන්ම කරණකොටගෙණ-(11) භවගාමී කර්මයාගේ හටගැන්ම කරණකොටගෙණ-(12) ස්පර්ශයාගේ හටගැන්ම කරණකොටගෙණ සංඥාහුගේහටගැන්මවේ,

(13) අවිද්‍යාහුගේ හටගැන්ම කරණකොටගෙණ සංස්කාරයන්ගේ හටගැන්මවේ. (14) තෘෂ්ණාහුගේ හටගැන්ම කරණකොටගෙණ-(15) භවගාමී කර්මයාගේ හටගැන්ම කරණකොටගෙණ-(16) ස්පර්ශයාගේ හටගැන්ම කරණකොටගෙණ සංස්කාරයන්ගේහටගැන්මවේ,

(17)අවිද්‍යාහුගේ හටගැන්ම කරණකොටගෙණවිඥාන(විඤ්ඤාණ)යාගේ හටගැන්මවේ, (18) තෘෂ්ණාහුගේ හටගැන්ම කරණකොටගෙණ- (19) භවගාමීකර්මීයාගේ හටගැන්ම කරණකොටගෙණ-(20)නාමරූපයන්ගේ හටගැන්ම කරණකොටගෙණ විඥානයාගේ හටගැන්ම වේයයි මෙසේ ප්‍රත්‍යයපරමර්ශතවශයෙන්ද;

(ප්‍රත්‍යය පරමර්ශතය නොකොට හටගැණීම් ලක්ෂණය වෙනස්වීම් ලක්ෂණය යන ලක්ෂණ මාත්‍රවශයෙන් (21) හුදෙක් රූපස්කන්ධයාගේ සමුදය(හටගැණීම) දැකීමය, (22) එසේම වේදනාස්කන්ධයාගේ (23) සංඥාස්කන්ධයාගේ (24) සංස්කාරස්කන්ධයාගේ (25) විඥානස්කන්ධයාගේ සමුදය යන පස්විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන් හටගැණීම.

පස්විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන්ගේ ව්‍යය=මෙකී අවිද්‍යාදි ප්‍රත්‍යයන්ගේ අභාවයෙන් රූපාදි ස්කන්ධයන්ගේ ව්‍යය (නිරෝධය) වේයයි ප්‍රත්‍යය පරමර්ශතවශයෙන් 20 ආකාරයකින්ද, ලක්ෂණ පරමර්ශතවශයෙන් පස්ආකාරයකින්දයි 25 ආකාරයෙන් වන පඤ්චස්කන්ධයන්ගේ ව්‍යය හෙවත් නිරෝධය.

9 — 1

තුන්දුසිරිත්=කාය වචනය සිත යනද්වාරත්‍රයපිළිබඳදුශ්චරිතයන්.

එනම්-ප්‍රාණඝාත,අදත්තාදාන,කාමෙසුමිච්ඡාචාර යන කයින් සිඳුවන තුනද, මුසාවාද, පිසුනාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාප යන වචනයෙන් සිඳුවනසතරද; අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිඨි යන සිතින්සිඳුවනතුණද යනදසයයි.

තෙරවත්=තෙරවරුන්ට කටයුතු වත්.

ලැසිගෙන=පමා වෙවී, පසුබැස බැස.

9 — 2

අසත්සමවා යෙකින්=අසත්පුරුෂයන් හා එක්වීමකින්.

සාලඟුරු=ගිනිගෙන දිලිසෙන අඟුරු.

9 — 4

අපරාපරියවේදනීය= සසරෙහි කිසියම් ආත්මභාවයකදී අවකාශ ලත් විටක විපාකදෙන කර්මයක්ව. උපපජ්ජවේදනීය=දෙවන ආත්මභාවයෙහි විපාකදෙන කර්මයක්ව. දිට්ඨධම්ම වේදනීය=මේ අත් බැව්හි විපාකදෙන කර්මයක්ව.

9 — 6

අබවස=අභ්‍යවකාශයෙහි (කිසිවකින් ආවරණයක් නැතිතන්හි.)
අවඥා=හෙළාදකීම, අනාදරය.
ඝටචාටි ආදි=කල සැලි ආදී.

9 — 8

සාදීනවයහ=දොෂ සහිතයහ.
සොපද්‍රවයහ=උපද්‍රව සහිතයහ, (විපත් සහිතයහ.)
හලාහල විෂයක්=නාග විෂයක්, දරුණු විෂ වර්ගයක්.

9 — 9

ජංගම=චංචල, ඇවිදින.
ස්ථාවර=නිශ්චල.

9 — 11

උපලක්ෂිතව=යුක්තව.

10 — 1

බති=බියපත්වෙති.
බිම්ද=බියපත් වෙම්ද.
හඩගමාත්‍රයක්=බිදීම් පමණක්.
සත්කාය දෘෂ්ටිය=ස්වකීය කය පිළිබඳව ආත්ම වශයෙන් විසි අයුරකින් වරදවා දැක්ම.

10 — 2

උදන් අනන හෙයින්=ප්‍රීති වාක්‍ය පහළකරණ හෙයින්.
ආජනෙය=උත්තම.

10 — 3

ගැත්තකොට-දාසකොට.

10 — 5

තරණොත්තර තරණකීම=තමහට තිණු පරෙස් බස්වලට වැඩියක් පරෙස් බස් කිණීම.
කාය දණ්ඩාදි=කයට ලැබියයුතු දඬුවම් ආදිවූ.
ප්‍රතිදණ්ඩයෝ=වෙනුවට ලැබෙන දඬුවම්.

10 — 6

යුගග්‍රාහය=ඒ ඒ කරුණු වලින් තමන් උතුමන් සමානකොට සැලකීම.

10 — 7

සන්තති විච්ඡේදය=ජීවිතේන්ද්‍රිය පරම්පරාහුගේ සිදීම.

10 — 9

මෛත්‍රීපරවූ=මෛත්‍රියෙන් යුක්තවූ.

10 — 10

අපිහානි=ධන විනාශය.
කාණ=එක ඇසක් නැත්තෙක්, (කණෙක්)
කිලාස=එනම් කුෂ්ටය.
කුණිවෙක්වූ අත් පා ඇඟිලි ඇත්තෙක්.
ඛඤ්ජ=කොරවූවෙක්.

ගණ්ඩ=ගඩු, (=ගෙඩි).
පිත්තොන්මාදයට=පිත කිපීමෙන් වන උමතු ගතියට.
පිළකපපී=පිළු.
යක්ෂොන්මාදයට=යක්ෂයන් කෙරෙහි හසින් හෝ ඔවුන්ගේ ආවේශයෙන් ඇතිවන උමතුගතියට.
මහොදර=ඉදිමීම හා උදර රොගය.
ශොෂ=ක්ෂය රොගය.
ශ්වාසාතිසාර=ඇදුම හා අතිසාරය.

10 — 11

අභ්‍යාඛ්‍යානය=බොරුදෙස් තැගීම, අභූත දොෂාරොපණය.
අසොතැන=අසවල් තැන.
උමත් බුත්තෙත්=උමන්බිත්දේ.
කප් ඇට=කපු ඇට.
ධනවොලො ගැන්මෙන්=වස්තුව කොල්ල කෑමෙන්.

10 — 12

ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදයෙන් = ජීවිතෙන්ද්‍රියය නැසීමෙන්.
ගෙහගිනි=ගෙත ගිනි.
ලැවු ගිනි=කැලෑ වලින් උපදින ගිනි.

10 — 13

අජව්‍රත=එළුවින් සේ පැවැත්ම.
ආගන්තුක=අමුත්තු.
ගෝව්‍රත=ගෙරින් සේ පැවැත්ම.
දන්තමල ධාරණය=දත්වල කුණු තබාගෙණ සිටීම.
පුබ්බන්තාපරන්තාදි = පුබ්බන්ත-අපරන්ත ආදිවූ.
වෙර=ශරීරය.
රජස්=ධූලි.

10 — 14

කාය විෂමාදියෙන්=කාය දුශ්චරිතාදියෙන්.
කායසමාධිසංයමයෙහි=කය කුශලයෙහිම පිහිටුවා හැන්මෙහි හා හික්මවා ගැන්මෙහි.
බාහිතවූ=නසන ලදාවූ, බැහැර කරණ ලදාවූ.
සන්තානයෙන්=සිතින්.
ශමිතවූ=සන්සිඳුවන ලදාවූ.

10 — 15

ඥානවෘද්ධ=නුවණින් වැඩිහිටියාවූ.
බහුශ්‍රැත=බොහෝ ඇසූපිරූතැන් ඇත්තාවූ, පණ්ඩිතවූ.
වයොවෘද්ධ=වයසින් වැඩිහිටියාවූ.
කැමිටිය=කසය.
සුශික්ෂිතවූ=මොනවට හික්මවන ලදාවූ.

10 — 16

උද්වෙග බහුල වවු=කලකිරීම බොහෝකොට ඇත්තෝ වවු.
ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යාවන්ගේද=පෙර විසූ කඳපිළිවෙළදන්නා නුවණය, සත්ත්වයන්ගේ ච්‍යුති උත්පත්ති දන්නා නුවණය, ආශ්‍රවක්ෂයකර ඥානය නොහොත් අර්හත් මාර්ගඥානය, යන මේ ත්‍රිවිද්‍යාවන්ගේද; විදර්ශනාඥානය, මනොමය ඍද්ධිය, ඍද්ධිවිධඥානය, දිව්‍යශ්‍රොත්‍රය, පරචිත්තවිජානන ඥානය, පූර්වෙනිවාසානුස්මෘතිඥානය, දිවඇස, ආශ්‍රවක්ෂයකරඥානය යන මේ අෂ්ට විද්‍යාවන්ගේද.

පසළොස් චරණ ධර්මයන්හේද=සීල සංවරය, ඉන්ද්‍රිය සංවරය, භෝජනයෙහිපමණදැනීමය, නිදිවර්ජිත කිරීමෙහි යෙදීමය; සද්ධා, හිරි, ඔත්තප්ප, බාහුසච්ච, විරිය, සති, පඤ්ඤා යන මොහුය; සතර රූපාවචරධ්‍යානයෝය යන පසළොස් චරණ ධර්මයන්හේද.

11 — 1

එකොළොස් ගින්නෙන්=රාග, ද්වේෂ, මෝහ, ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන එකොළොස් ගින්නෙන්.

දුක්ඛාදි අටතන්හි=දුක්ඛ, දුක්ඛසමුදය, දුක්ඛනිරෝධ, දුක්ඛනිරෝධගාමිනී පටිපදා, පුබ්බන්ත, අපරන්ත, පුබ්බන්තාපරන්ත, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නධම්ම යන අටතන්හි.

11 — 2

කලෙබරය=ශරීරය.

නවස්‍රාවණමුඛ=අසූචි වැගිරෙන හෙයින් වණ නම්වූ මුඛය, නාස් පුඩු දෙකය, දෑස්ය, දෙකන්ය, මලමාර්ගය, මූත්‍රමාර්ගය යන නවය.

මෘත=මල, මැරුණ.

ව්‍රණ ස්වභාවවූ=වණයක ස්වභාව ඇති.

11 — 3

කැදල්ල=කුඩුව.

දුදුරුව=දිරා.

11 — 4

කොබෝවන් පැහැඇත්තාවූ=සුදු පැහැ ඇත්තාවූ.

11 — 5

උන්නති ලක්ෂණවූ=උසස්බව ලක්ෂණකොට ඇති.

නවවිධ මානය=යම්කිසි ශ්‍රේෂ්ඨයෙක් ගැණසිතා ඒ ශ්‍රේෂ්ඨයා හට වඩා මම ශ්‍රේෂ්ඨවෙමියි සැලකීම, ශ්‍රේෂ්ඨයාහට සමාන වෙමියි සැලකීම, ශ්‍රේෂ්ඨයාහට හීන වෙමියි සැලකීම; සමාන තැනැත්තෙක් ගැණ සිතා ඒ සමාන තැනැත්තාට වඩා මම උසස්මියි සැලකීම, සමාන තැනැත්තාට සමාන වෙමියි සැලකීම, සමාන තැනැත්තාට හීනවෙමියි සැලකීම; හීන තැනැත්තෙක් ගැණසිතා ඒ හීනයාටවඩා මම උසස්මියි සැලකීම, හීනයාහට සමානවෙමියි සැලකීම, හීනයාහට හීනවෙමියි සැලකීම යන මේ නවාකාරමානය

ස්කන්ධපරිපාක ලක්ෂණවූ=ස්කන්ධයන්ගේ මේරීම ස්වභාවකොට ඇත්තාවූ.

ස්කන්ධ භේද ලක්ෂණවූ=ස්කන්ධයන්ගේ බිඳීම ස්වභාවකොට ඇත්තාවූ.

11 — 6

ඛාණ්ඩිත්‍යාදියට=දත් වැටීම් බැවි ආදියට.

මිහිකිරීමෙන්=මේරීමෙන්.

11 — 7

අල්පශ්‍රැතවූ=අපණ්ඩිතවූ, නූගත්තාවූ.

එක් දෙපණ්ණාසයක්=පණ්ණාස එකක් දෙකක්.

එක් දෙවගක්=වර්ගයක් දෙකක්.

නුමුහුකුරු=නොමේරු.
වලහැරපු=කැලේට ඇරපු.

11 — 8

අභිනීහාරය=ප්‍රාර්ථනාව.
තෘෂ්ණාවඩ්ඪකිහු=තෘෂ්ණා නමැති වඩුවා.
බොධිඥානාධිගමය=සම්‍යක් සම්බොධිඥානය ලැබීම, චතුස්සත්‍යාවබොධය.

11 — 9

ආලම්බනකරණ වසයෙන්=අරමුණු කිරීම් වශයෙන්.
කැණිමඬල= සතරපලගෙයක මහපරාල සතරේ මුදුන් කොන් සවිකරණ කර්ණිකාව.

11 — 10

කෘෂි-වණික්කර්මාන්තාදියෙන්=ගොවිකම්-වෙළඳාම් ආදී කර්මාන්ත වලින්.
පත්වගුල=පියාපත් වැටුන.

11 — 11

වලහුනු=කැලේ වැටුනු.
සර=ඊය.

12 — 1

ගබ්ගෙට=ගෙයි ඇතුල් කාමරයට.
පණිවා=ප්‍රාණඝාතය.
සුපිහිතවූ=මනාකොට වසන ලද්දවූ.

12 — 2

අපිස් බැව් ආදී=අල්පෙච්ඡ (ඉතාම ටිකදෙයක් කැමතිවන) බව ආදිවූ, ආදි ශබ්දයෙන් සන්තුට්ඨිතා, සල්ලෙඛතා, පවිවෙකතා, වීරියාරම්භ, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණදස්සන යන මොහු ගැනෙත්.
අරිවස්පිළිවෙත්=ආර්‍ය්‍ය වංශ ප්‍රතිපදා.-අල්පෙච්ඡ බව, ලද දෙයින් සතුටුවන බව, කෙලෙස් තුනී කරණ බව, සමථ විදර්ශනා භාවනාවෙහි නියුක්ත බව යන මොහු සතර ආර්‍ය්‍යවංශ ප්‍රතිපදාවෝයි.

12 — 3

පස් නීවරණයන්=කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන-මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පඤ්ච නීවරණයන්.

12 — 4

පරම දුලීහවූ=ඉතා දුකසේ ලැබිය යුතුවූ.

12 — 5

පාණමයවූ=ගල් මුවාවූ, ගලින්ම නිපන්නාවූ.
පහණ මිණිය=මැණික්ගල.
විදුර=දියමන්තිය.
පාෂාණමයවූ=ගල්මුවාවූ, ගලින්ම ඇතිවූ.
විසිදුරු කොට=විශෙෂයෙන් සිදුකොට.

12 — 6

ගරුකාපත්තියට=තෙළෙස් සංඝාදිසෙසාපත්තීන්ට.

12 — 7

පැදුම් දෙසට=නැගෙණහිර දිසාවට.
පැළ දෙසට=බස්නාහිර දිසාවට.

12 — 10

අර්හත්ඵලාධිගමයයි=අර්හත් ඵලයට පැමිණීමයයි.
ආභිසමාචාරිකවත්=කුඩා-ඉතා කුඩාවත්. මෙහි 'අභිසමාචාර' යනු උතුම්වූ හැසිරීමයි. ඒ උතුම්වූ හැසිරීම කුඩා-ඉතා කුඩා සික්ෂාපදපවා රැකීමෙන් කටයුතුවේ. ඒ අභිසමාචාරයම ආභිසමාචාරිකනම්.

චෛතිය පටිසඞ්ඛරණාදී=චෛත්‍ය අළුත්වැඩියාකිරීම් ආදිවූ.
සංඝකෘත්‍යයද=කටයුතුද.

13 — 1

ශාශ්වතොච්ඡෙද දෘෂ්ටියද=පඤ්ච ස්කන්ධ සංඛ්‍යාත ලෝකය හෙවත් සත්ත්වයා නිත්‍යය ධ්‍රැවය හෙවත් හැමකල්හිම පවතීයයි ගන්නා ශාශ්වත දෘෂ්ටිය හා ගස්වලකොළ වැටුනුවිට ඒ කොළ නැවත නොවැඩෙන්නාක් මෙන් සත්ත්වයා මැරුණුපසු නැවත පිළිසිඳගැන්මක් නැතැයි ගන්නා උච්ඡෙදදෘෂ්ටියද.

13 — 2

එක්විසි අනෙස්නෙන් = දුශ්ශීල ශ්‍රමණයන් සිවුපසය සෙවීම පිණිස කරණ සාවද්‍යක්‍රියා එක්විස් සෙන්. එනම්:—(1) (කුල සඞ්ග්‍රහ පිණිස)ගිහීන්ට හුණ දඬු ආදි දඬු දීමය, (2) තල්පත් තලපත් ආදි පත් දීමය,(3)මල්දීමය, (4)ඵලදීමය, (5) දැහැටිදීමය, (6)මුවදෝනා පැන් දීමය, (7) නාන පැන්දීමය, (8) නගන සුණු (=නානවිට ඇග ගල්වන කුඩුවර්ග) දීමය, (9) මැටි දීමය, (10) දසයෙකු මෙන් පහත් ගති පෙන්වමින් ගිහීන් සතුටු කිරීම (පිණිස කථාකිරීම් ආදිවූ ලාමක පැවැත්මයයි කියන ලද චාටු කම්‍යතාවය, (11) අනුන් සතුටු කරණ පිණිස සැබෑ මද කොට බොරු බොහෝකොට කීමයයි කියනලද මුග්ගසූප්‍යතාවය, (මුග්ගසූප්‍යතාව නම් මුං ඇට ව්‍යඤ්ජනය වැනි බවයි. මුංඇට ව්‍යඤ්ජනය පිසනකල්හි බොහෝ මුන්පැසියතුදු ඇට කීපයක් පමණක් නොපැසී තිබෙයි. එමෙන් සැබෑ බොරු දෙකින්, දිවිපවත්වන්නහු කෙරෙහි බොරු බොහෝවෙයි. සැබෑ මදවෙයි.) (12) අනුන් දරුවන් වැඩීමයයි කියන ලද පාරිභට්ටකතාවය,(13) ගිහීන්ගේ හසුන් ගෙණ යාම ඊමයයි කියනලද ජඞ්ඝපෙසනියය, (14) වෙදකමය, (15) දූතකමය, (16) කෙත්වත් අරම්ආදියට මෙහෙවර යාමයයි කියනු ලබන පහෙණගමනය,(17) තමා ලදමනා පසය ගිහීන්ටදී උන් දෙන දෙයක් ගැන්මයයි කියනුලබන පතිපිණ්ඩ දනය,(18)අත්ලස් ආදිය දීමයයි කියනු ලබන අනුප්පදනය, (19) ගෙබිම් ලිංබිම් ආදිය සොයා පාන වාස්තු විද්‍යාවය, (20) නක්ෂත්‍ර විද්‍යාවය,(21) අඟපසඟ ලකුණු දක්නා අඞ්ග විද්‍යාවය යන මොහුයි.
සපදානචාරියායෙන්=ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසිරීමෙන්.

13 — 3

භික්ෂාචය්‍යාධර්මය=පිඬුසිඟීම්ධර්මය.
වෙසිය ගොචරාදී අගොචරයෙහි=වෙශ්‍යාස්ත්‍රීන් වසන තැන් ආදී වූ නොඑළඹිය යුතු තන්හි, වෙශ්‍යාවන් වසන තැන්ය, මළ සැමියන්–බැහැර ගිය සැමියන් ඇති ස්ත්‍රීන් වසන තැන්ය, පති කුලය කට නොගොස් සිය ගෙයිදි වැඩිමැහැලිවූ කුමාරිකාවන් වසන තැන්ය, පණ්ඩක—නපුංසකයන් වසන තැන්ය, බ්‍රහම චය්‍යීයට අනතරාය සිදුවියහැකිවූ මෙහෙ

ණීත් වසන තැන්ය, රූ සොඳුන් වසන පුර සල්ය, රාජ-රාජ මහාමාත්‍ය- තීර්ථක- තීර්ථක ශ්‍රාවක යන මොවුහුය (මොවුන් හා නුසුදුසු සංසර්ගය,) තුනුරුවන් කෙරෙහි ඇදහිලි නැත්තාවූ අශ්‍රද්ධාවත් කුලයෝය යන මොහු භික්ෂූන් විසින් නොඑළඹිය යුතු අගොචර නම් වෙත්.

13 — 4

ස්කන්ධායතන ධාතු සඞ්ඛ්‍යාත ලොකය=රූපාදි පඤ්චස්කන්ධ, චක්ඛායතනාදි ද්වාදසායතන, චක්ඛු ධාතු ආදි අටළොස් ධාතුයයි කියන ලද ලොකය හෙවත් සත්ත්වයා.

13 — 5

රාගසඞ්ගාදි කිසි සඞ්ගයෙක්= රාගසඞ්ග, දොසසඞ්ග, මානසඞ්ග, දිට්ඨිසඞ්ග, විචිකිච්ඡාසඞ්ග, භවරාගසඞ්ග, අවිජ්ජාසඞ්ග යන සප්තවිධ සඞ්ගයන් අතුරෙන් කිසි සඞ්ගයෙක්.

13 — 7

අභිනාමාගී චිත්ත සම්ප්‍රයුක්ත චෙතනා=අභිනාමාගී සිතේ යෙදුනාවූ චෙතනා චෛතසිකය.

13 — 8

සුෂ්ඨු අග්‍ර හෙයින්=අතිශයින් අග්‍ර හෙයින්.

13 — 9

කර්මවිපාකජ ඍද්ධියෙන්=කර්ම විපාකයෙන් ඇතිවූ ඍද්ධියෙන්.

කෘතාධිකාර ප්‍රාඥයෝ=මස්තක ප්‍රාප්ත ප්‍රාර්ථනා ඇති නුවණැති පුද්ගලයෝ.

ඡන්දර්ධිපාදාදි චතුර්විධ ඍද්ධිපාද භාවනා ඇති=ඡන්දිද්ධිපාදය, විරියිද්ධිපාදය, චිත්තිද්ධිපාදය, විමංසිද්ධිපාදය යන මේ චතුර්විධ ඍද්ධිපාද භාවනා ඇති.

13 — 10

වාක් සත්‍ය ධර්මය=සත්‍යවූ වචන කීමයයි කියනලද ධර්මය.

13 — 12

ආධිපත්‍යය=අධිපති බව.

වෛමානික ප්‍රෙතයන්=කලක් දිව සැපද කලක් ප්‍රෙත දුක්ද විඳින්නාවූ චාතුර්මහාරාජිකදෙවලොකයට අයත් ප්‍රෙතයන්.

14 — 1

අනන්තාලම්බනවූ=අනන්ත අරමුණු ඇත්තාවූ.

රාගාදික්ලෙශජාතය=රාගාදි කෙලෙස් සමූහය.

14 — 2

ආසක්ත=ඇලීම.

රාග පදදින්=රාගාදි කාරණයන්.

වලඳනා=වැලඳගන්නා.

විසක්ත=වෙසෙසින් ඇලීම.

ගිවන=මහනහෙවත්මැකීමකරණ.

14 — 3

ආවජ්ජන- සමාපජ්ජන - අධිට්ඨාන-වුට්ඨාන-පච්චවෙක්ඛණ වශයෙන්= ආවජ්ජනවසී - සමාපජ්ජනවසී-අධිට්ඨානවසී-වුට්ඨානවසී -පච්චවෙක්ඛණ වසී යන පඤ්ච වසීන්ගේ වශයෙන්.(පඤ්චවසීහු නම් උපදවාගත් ධ්‍යානය තමන්ට කැමති පරිද්දෙන් පරිහරණය කරන්ට පුරුදුකර ගන්නා ආකාර පසයි. ඉන් ආවජ්ජන වසිනම් ධ්‍යානාඞ්ගයන් ආවර්ජනා

කිරීමෙ (=සිතා බැලීමේ) සාමර්ථ්‍යයයි. යම් කලෙක්හි වනාහි ප්‍රථම ධ්‍යානයෙන් නැගිට පළමුකොට විතර්කය ආවර්ජනා කරන්නාවූ යොගාවචරයාහට භවඞ්ගය සිඳගෙණ උපන්නාවූ ආවර්ජනයට අනතුරුව විතර්කය අරමුණුකොට ඇත්තාවූම ජවන් සතරක් හෝ පසක් දුවත්ද, ඊට පසු භවඞ්ග දෙකක්ද, ඊට පසු විචාරය අරමුණුකොට ඇති ආවර්ජනයද පෙරකී ක්‍රමයෙන්ම ජවන්ද යි මෙසේ ධ්‍යානාඞ්ග පස කෙරෙහිම නිරතුරුව සිත යවන්ට හැකිවේද, එකල්හි ඔහුට ආවජ්ජනවසී තොමෝ සිද්ධවූවාවෙයි. අතර භවඞ්ග භවඞ්ගවලත දෙක පමණක් ලැබෙන්නාවූ මේ මස්තකප්‍රාප්ත වසීතොමෝ භාග්‍යවතුන් වහන්සේට යමකප්‍රාතිහාර්‍ය්‍ය කාලයෙහි ලැබෙයි. ආයුෂ්මත් ධර්මසේනාපති ශාරිපුත්‍ර ස්ථවිරාදිවූ අන්‍යයන්ටද ඇතැම්විට ලැබෙයි. එහෙත් එය ශාස්තෲන්වහන්සේට මෙන් බොහෝවේලාවක් නොපවතියි. සවල්ප වේලාවක් පමණක් පවතියි. එහෙයින්ම එය ශ්‍රාවකයන්ට අසාධාරණයයිද කියතලදී. මීට වඩා ශීඝ්‍රතරවූ ආවජ්ජනවසී නොතෙක්නම් නැත.

නන්දොපනන්ද නාගරාජ දමනයෙහිදී ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙන් වහා ධ්‍යානයට සමවැදීමේ සමර්ථ බව **සමාපජ්ජනවසී** නම්. මෙහි ධ්‍යානයට සමවැදීමේ කැමැත්තට අනතුරුව භවඞ්ග දෙකක් උපන් කල්හි භවඞ්ග පෙළ සිඳගෙණ උපන් ආවර්ජනයට අනතුරුව ධ්‍යානයට සමවැදීම වහා සමවැදීමේ සමර්ථ බවයි. මස්තකප්‍රාප්තවූ මේ සමාපජ්ජනවසී තොමෝ භාග්‍යවතුන් වහන්සේට ධර්මදේශනා කරණ වේලාවල ලැබෙයි. මීට වඩා ශීඝ්‍රතරවූ සමාපජ්ජනවසී නොතෙක්ද නැත.

අසුරක් ගසන පමණ වේලාවක් හෝ අසුරු දහයක් ගසන පමණ වේලාවක් හෝ ධ්‍යානය තබාගන්ට සමර්ථ බව **අධිෂ්ඨානවසී** නමි.

එසේම අසුරක් ගසන පමණවූ හෝ අසුරු දහයක් ගසන පමණවූ හෝ සවල්ප වේලාවක් ධ්‍යානයට සමවැද සිට ඉන් නැගිටින්ට සමර්ථබව **වුට්ඨානවසී** නමි.

ධ්‍යානයන් ප්‍රත්‍යවේක්ෂා කරණ (=සලකා බලන) කල්හි ආවජ්ජන පච්චවෙක්ඛණ වීථීන් දෙදෙනා අතර භවඞ්ග ගණන අඩුකර ගැනීමේ හා පච්චවෙක්ඛන වීථිවල ජවන ගණන අඩුකර ගැනීමේද සමර්ථබව **පච්චවෙක්ඛණවසී** නමි.

ආලම්බනූපනිධ්‍යාන= අෂ්ටසමාපත්තීහු. (පඨවි කසිණාදි අරමුණක් නිමිතිකොට භාවනා කිරීමෙන් ලැබියයුතු හෙයින් අෂ්ට සමාපත්තීහු ආලම්බනොපනිධ්‍යාන නම් වෙත්).

ක්ලෙශව්‍යුපශමණය=ක්ලෙශයන් සංසිඳවීම.

පච්චවෙක්ඛන=නුවණින්සලකා කිරීම.

සුගත ප්‍රඥප්තයෝද=මනාකොට දෙසූහාහුද.

ලක්ඛණූපනිජ්ඣාන=විදර්ශනා—මාර්ග-ඵල.(අනිත්‍යාදි ලක්ෂණයන් අරමුණු කරණ හෙයින් විදර්ශනාව ලක්ෂණූපනිධ්‍යාන නමි. ඒ විදර්ශනාවෙන් කළ කෘත්‍යය මාර්ගයෙන් සමෘද්ධවන හෙයින් මාර්ගය ලක්ෂණූපනිධ්‍යාන නමි. නිරොධ සත්‍යය හා තත්ලක්ෂණය උපනිධ්‍යානය කරණ හෙයින් ඵලය ලක්ෂණූපනිධ්‍යාන නමි.

සමාපජ්ජන=සමවැදීම,පැමිණීම,

14 — 4

මහා ව්‍යායාමයෙන්=මහත් උත්සාහයෙන්.

14 — 6

පරූපකාර=අනුන්ගෙන් ලැබෙන හිරිහැර.

පරූපවාද=අන්‍යයන් විසින් කරණු ලබන නින්දා.

පාණිප්‍රහාරාදියෙන්=අතින් ගැසීම් ආදියෙන්.

14 — 7

අහර පිරියෙස්නෙහි=ආහාර සෙවීමෙහි.

ප්‍රාන්තශයනාසනයෙහි=වනසෙනසුන්හි.

සතතයෙන්=නිතොරව.

14 — 8

අත පොලාපු කල්හි=අත් පොලසන් දුන්කල්හි.

හිණිමසක්=උකුලක්.

14 — 9

අභිරමන්තෙන්ති=ඇලෙන්නෙන්ති.

ක්‍ෂයානතයෙහි=ගෙවී අවසන් වීමේ කෙළවරෙහි.

14 — 12

නෛර්‍යාණික=ඉතා උතුම්, නිවණට පමුණුවන, සියලු දුක් ඉක්මීමට කාරණ (හෙතු)වූ.

මාර්ගාගත සරණගමණ වශයෙන්=සෝවාන් මාර්ගයේදී සිදුවෙන සරණගමන වශයෙන්.

ස්වාඛ්‍යාතාදිගුණොපෙත=මොනවට වදාරණලදබව ආදිවූ ගුණයන්ගෙන් යුක්තවූ.

14 — 14

සබ්බදුඃඛ නිශ්ශරණයට= සියලු දුක් නැතිකිරීමට.

14 — 16

ධුතාඞ්ග පරිහරණය=ධුතාඞ්ගයන් ආරක්ෂාකිරීම.

14 — 17

තෘෂ්ණාප්‍රපඤ්චය=108 ක් ප්‍රභෙද ඇති තෘෂ්ණාව.

දෘෂ්ටි ප්‍රපඤ්චය=දෙසැට දෘෂ්ටිය.

මාන ප්‍රපඤ්චය=නවවිධ මානය. (සත්ත්වයන් මත්වීම් ආකාරයට පමාවීම් ආකාරයට පමුණුවන හෙයින් මොවුහු ප්‍රපඤ්චනම් වෙත්.)

14 — 18

ධරියමානකල්හි= ජීවත්ව වැඩ ඉන්නාකල්හි.

15 — 1

පඤ්චවිධදුශ්චරිතවෛරයෙන්=පස්පවින්.

15 — 2

ක්ලේශව්‍යාධීයෙන්=ක්ලේශ නමැති ව්‍යාධීන්.

15 — 3

නිරුත්සාහවූ=උත්සාහ රහිතවූ.

පලිබෝධයක්=උපද්‍රවයක්, පීඩාවක්.

15 — 6

අනීවරණ අවස්ථාවක්=(ව්‍යාපාද) නීවරණ නොවන අවස්ථාවක්.

ගිහිසිළක්=ගිහි දලුවක්.

15 — 7

ජිඝච්ඡාව=අනුභව කරණු කැමැත්ත, (බඩගින්න.)

15 — 9

පරිජානනාදීන්=පිරිසිඳ දැනීම ආදීන්.

රූපදරථාදීන්=රූපපීඩාදීන්.

15 — 12

ආගමාධිගමසම්පන්නවූ=ත්‍රිපිටක ධර්මය දැනීමෙන් ද මාර්ගඵල ලාභයෙන් යුක්තවූ.

ධුරවහනසීලයා=ධුර උසුලන සුලු තැනැත්තා.

ධෘතිසම්පන්නවූ=ධෛර්‍යයෙන් යුක්තවූ.

ව්‍රතසම්පන්නයා=ව්‍රතයන්ගෙන් යුක්තවූ තැනැත්තා.

16 — 1

අධිශීලාදිශික්ෂාත්‍රයසංඛ්‍යාත=අධිශීලශික්ෂා, අධිචිත්තශික්ෂා, අධිප්‍රඥාශික්ෂා යන ශික්ෂා තුනයැයි කියනලද.

විප්‍රතිපත්තිය=විරුද්ධ ප්‍රතිපත්තිය.

වේසියගෝචරාදිෂඩ්විධඅගෝචර=1 වේශ්‍යාවන් වසන තැන්ය, (2) වැන්දඹුවන් වසන තැන්ය, (3) පතිකුලයට නොගොස් ගෙයි සිඳ වැඩී මැහැලිවූ කුමාරිකාවන් වසන තැන්ය, (4) නපුංසකයන් වසන තැන්ය, (5) භික්ෂුණීන් වසන තැන්ය, (6) පානාගාරය (සුරාසාලා=තැබෑරුම් ආදිය) යන මේ නොඑළඹියයුතු තැන් සය.

16 — 2

තෘෂ්ණාසංස්තවවශයෙන්=තෘෂ්ණාවගේ පරිචය (=පුරුද්ද) වශයෙන්.

වියෝග වශයෙන්=වෙන්වීම් වශයෙන්.

16 — 3

චතුර්විධකායග්‍රන්ථයෝ= අභිධ්‍යා ව්‍යාපාද, සීලබ්බතපරාමාස, (=අජසීල, ගෝසීලාදියෙන් ශුද්ධිය වෙයියන මිථ්‍යාව දැඩිකොට ගැන්ම) ඉදංසච්චාභිනිවේස =සෙසු දෘෂ්ටීන් ප්‍රතික්ෂේපකොට ලෝකය 'ශාශ්වතයි, සත්‍යයමේය ඇතී, අනික් සියල්ලම හිස්ය'යි දැඩිකොට වරදවා සැලකීම) යන කායග්‍රන්ථ සතර ව්‍යුත්පත්ති වශයෙන් නාමකායය ග්‍රන්ථනය කරණහෙයින්=සසරෙහි ගැටගැසීම කරණහෙයින්=මොහු කාය ග්‍රන්ථ නම්වෙත්.

16 — 9

ත්‍රිවිධ ශික්ෂා පූරණය=අධිශීලශික්ෂා, අධිචිත්තශික්ෂා, අධිප්‍රඥාශික්ෂා යන ත්‍රිශික්ෂාවන් පිරීම.

පරිඥාපහාණාදි සොළොස් ආකාරයෙන්-එක් එක් සත්‍යයක් පිළිබඳ (1) පරිඥා (2) පහාණ, (3) සච්ඡිකිරියා, (4) භාවනා යන සතර සතර ආකාරයෙන්වූ සොළොස් ආකාරයෙන්.

16 — 10

කත්තුකම්‍යතා වශයෙන්=කරණු කැමති බැව් වශයෙන්.

ප්‍රතිසන්ධිශ්‍රොතස්= ප්‍රතිසන්ධි නැමති සැඩපහර.

මෞනෙයය ප්‍රතිපදාවෙන්=මුනිභාවය කරන්නාවූ ප්‍රතිපදාවෙන්. එනම්:- කාය මෞනෙයය, වචී මෞනෙයය, මනොමෞනෙයය, යන මොහුය්. මෙහි ත්‍රිවිධකාය දුශ්චරිතප්‍රහාණය, ත්‍රිවිධකාය සුචරිතය පිරීම, "අත්‍ථි ඉමස්මිං කායෙ කෙසා" යන මේ ආදික්‍රමයෙන් කායාරම්මණයෙහි පැවති ඥානය, සමුදයාදීන් විසින්වූ කාය පරිඥාව හෙවත් කාය පිරිසිඳ දැනීම, කායපරිඥා සහගත විදර්ශනාමාර්ගය, කායතෙරෙහිවූ ඡන්දරාගයාගේ ප්‍රහාණය, කාය සංස්කාර නිරොධයෙන් පැමිණියයුතුවූ චතුර්ථධ්‍යානය යන මොහු කායමෞනෙයය නම්.

චතුර්විධ වාග්දුශ්චරිතයාගේ ප්‍රහාණය, චතුර්විධ වාග්සුචරිතය පිරීම, වාගාලම්බණයෙහිවූ ඥානය, සමුදයාදීන් විසින් වාචාහුගේ පිරිසිඳ දැනීම, වාචාපරිඥා සහගත මාර්ගය, වාචාවතෙරෙහිවූ ඡන්දරාගයාගේ ප්‍රහාණය, වාක්සංස්කාරනිරොධයෙන් පැමිණියයුතුවූ ද්විතීයධ්‍යානය යන මොහු වචීමෞනෙයය නම්.

ත්‍රිවිධමනොදුශ්චරිතයාගේ ප්‍රහාණය, ත්‍රිවිධමනොසුචරිතය පිරීම, මනාරම්මණයෙහි හෙවත් ලෞකික සිත් අසුළුව අරබයා පැවතිඥානය, සමුදයාදීන් විසින් මනස පිරිසිඳ දැනීම, මනොපරිඥාසහගත විදර්ශනාමාර්ගය, මන තෙරෙහිවූ ඡන්දරාගය ප්‍රහීණකිරීම, චිත්තසංස්කාරනිරොධයෙන් පැමිණියයුතුවූ සඥාවෙදයිත නිරොධ සමාපත්තිය යන මොහු මනොමෞනෙයය නම්.

17 — 6

යොගාවචරයන්ට=භාවනා කිරීමෙහි නියුක්තවූවන්ට.

17 — 7

කළාපරියන්තයෙක් = කළාවේ කෙළවරක්.

කරකරයා=කරකරගා.

බණතසුල්ලහට= ව්‍යාකරණ සවභාව ඇත්තාහට.

මාල්ලමක්=තල්පතක්.

17 — 9

අච්ඡිද්‍රවූ-සිදුරු (=වැරදි) නැත්තාවූ.

ජීවිතවෘත්ති=දිවිපැවැත්ම.

ප්‍රාඥයෝ=නුවණැත්තෝ, ප්‍රඥා ඇත්තෝ.

17 — 10

ජාම්බුනදකනකපුඤ්ජයකට=දඹරන්රන් පිඩකට.

17 — 11

දුශ්චරිතප්‍රවෙශය = දුශ්චරිතයන්ට ඇතුලත්වීම.

පිහිතවූ=ආවරණය කරණලදවූ.

18 — 1

විලික්ඛව=විගලී.

18 — 2

අඞ්ගණ=කෙලෙස්.

18 — 5

කෘත්‍රිමදෙෂය=(නැවත නැවත නැලීම ආදිවූ ක්‍රියා නිසා) අමුතු වෙන් ඇතිවූ දෙෂය.

18 — 7

අලෙසිවන=නැතිවන.

18 — 10

කායපාගබ්භියාදීන්=කය පිළිබඳවූ බුහුටි (=නිර්භය) බැව් ආදියෙන් හෙවත් කය පිළිබඳ 'දඹබරකම' ආදියෙන්.

18 — 11

කායපුගල්භ=කය පිළිබඳවූ බුහුටි (=නිර්භය) බව හෙවත් කය පිළිබඳ 'දඹබර' කම.

18 — 12

අභිහඤ්ජන=අනුන්ගේ ප්‍රයොජන නැතිකරණ හෙවත් අලාභ උපදවන.

ථෙය්‍යාවහාරාදි පස්විසි අවහාරයෙන්=විනයෙහි අදත්තාදාන පාරාජිකශික්‍ෂාපදයෙහි එන ථෙය්‍ය අවහාරය ආදිකොට ඇති අවහාර (=අදත්තාදාන පරිජය සිදුවන ක්‍රම) විසිපසෙහන්.

පියොවෙකින්=ප්‍රයොගයකින්.

සාහත්ථිකාදියපියෝ= සාහත්ථික, ආණත්තික. නිස්සග්ගිය, ථාවර, විජ්ජාමය, ඉද්ධිමය යන ප්‍රාණඝාත කිරීමේ ප්‍රයොග සය. එහි සාහත්ථිකපයොගය නම් තමන් විසින්ම සතෙක් මැරීමදී තමන්ගේ අත්පා ආදියෙන් හෝ දඬු මුගුරු ආදියකින් හෝ ගැසීමයි. ආණත්තිකපයොගය නම් මෙසේ විද හෝ මෙසේ පහරා හෝ මරවයි අනුන්ට අණවීමයි. නිස්සග්ගියපයොගය නම් දුර සිටි සතෙකු මැරීම පිණිස ඊ-සත්-කල් ආදිය දමාගැසීමයි. ථාවරපපයොගය නම් බොරුවලවල් කැණීම්, හබක් ආදිය කිරීම්, බෙහෙත් යෙදීම් ආදියයි. විජ්ජාමය පයොගය නම් යන්ත්‍ර මන්ත්‍ර හදි හූනියම් කිරීම ආදියයි. ඉද්ධිමය පයොගය නම් නාග-සුපර්ණ-යක්‍ෂාදීන්ට කම් විපාකයෙන් ලැබීතිබෙන සෘද්ධියයි.

18 — 14

පඤ්චදෞශ්ශීල්‍ය කර්මයෙහි=ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, සුරාපාන, යන පස්වැදෑරුම් අකුසලකර්මයෙහි.

18 — 16

මදභිදයක්=සවල්පදෙයක්.

18 — 18

අනුමාත්‍රවූ=ස්වල්පවූ, කුඩාවූ.

18 — 19

උදගතසුලුවූ=අවඥා (=අවමන්) කරණ සුලුවූ.

රන්ධ්‍රගවෙසී=සිදුරු සොයනසුලුවූ.

18 — 20

තෘෂ්ණා-මාන-දෘෂ්ටි-ප්‍රපඤ්චයෙහි=තෘෂ්ණාප්‍රපඤ්ච-මානප්‍රපඤ්ච-දෘෂ්ටිප්‍රපඤ්චයෙහි. මෙහි

තෘෂ්ණා, මාන, දෘෂ්ටිය යන මොහුම සත්ත්වයන් මත්කිරීම-පමාවීම. බවට පමුණුවන හෙයින් ප්‍රපඤ්ච නම් වෙත්.

18 — 21

ඉඤ්ජිතයෙක්=චලනයක්, කම්පනයෙක්.

19 — 3

අත්තුක්කංසන=තමන් උසස්කොට සැලකීම.

පරවම්භන=අනුන් පහත්කොට සැලකීම

ඛෙමිංවේද=ඉවසන්නෝ වේද.

19 — 4

ප්‍රවේණිපාලක=පරම්පරාව ආරක්ෂාකරණ.

19 — 15

තුච්ඡජිණ්ණයයි= ගුණධර්මයන්ගෙන් හිස්ව ජරාවට පැමිණියේයයි. ජරව=පැසී.

19 — 7

කාකස්සර=කපුටන්ගේ හඬවැනි හඬ.

ගද්ගදස්සර=බලවත් සතුට-බලවත් කාංගාටුව යන මොවුන් නිසා නිසිලෙස සඵාතරගත නොහැකිවූ විට "ගද්ගද"යි ඇතිවන හඬ, ගොතහඬ.

ගම්භීරතාදිවසයෙන්= ගැඹුරු බැව් ආදි වශයෙන්.

භින්නස්සර=අතරතුර කැඩිකැඩී උපදින හඬ.

පඤ්චවිධමාත්සර්යයන්= ආවාස මාත්සර්යය, කුලමාත්සර්යය, ලාභමාත්සර්යය, ධර්මමාත්සර්යය, වර්ණමාත්සර්යය, යන පස්වැදෑරුම මසුරුකම්ය. එහි ආවාස මාත්සර්යය නම් ආවාසයන් කෙරෙහිවූ මසුරුකමයි. සියලු ආරාමය හෝ එක් පිරිවෙණක්- එක් ගබඩාවක්-රාත්‍රිස්ථාන- දිවාස්ථානාදියක් හෝ මෙහි ආවාස යන්නෙන් ගැණේ. ආවාසමාත්සර්යය ඇති භික්ෂුතෙම අන්කිසි භික්ෂුවක්හුගේ එහි පැමිණීම නොකැමතිවෙයි, පැමිණියද වහා නික්මයාම පතයි.

උපස්ථායකකුලය කෙරෙහි හෝ ඥාතිකුලය කෙරෙහි හෝ වූ මසුරුකම කුලමාත්සර්යයයි. කුලමාත්සර්යය ඇති භික්ෂුතෙම ඒ කුලයන්ට අනික් භික්ෂුවක්හුගේ පැමිණීම නොකැමතිවෙයි.

සිවුපසය කෙරෙහිවූ මසුරුකම ලාභමාත්සර්යයයි, ලාභමාත්සර්යය ඇති භික්ෂුතෙම සිල්වත්වූත් අන්‍යයන්ට ලාභ ඉපදීම නුරුස්සන්නේමයි.

පර්‍ය්‍යාප්තිධර්මය - ප්‍රතිපත්තිධර්මය යන ධර්මයන් කෙරෙහිවූ මාත්සර්යය ධර්මමාත්සර්යයයි. ධර්මමාත්සර්යය ඇති භික්ෂුතෙම තමන් දත් ධර්මය අනුන්ට කියාදෙනු නොකැමතිවෙයි.

ශරීරවර්ණය කෙරෙහි හා, ගුණවර්ණය කෙරෙහිත් වූ මාත්සර්යය වර්ණමාත්සර්යයයි. වර්ණමාත්සර්යය ඇති භික්ෂුතෙම අන්‍යයන්ගේ ශරීරවර්ණය වර්ණනාකරණු අසනු නොරිසිවෙයි. අන්‍යයන්ගේ ගුණවර්ණනයද අසනු නොරිසිවෙයි.

හිතස්සර=අන්තරතුර බිඳිබිඳී නගින හඬ

19 — 12

මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයෙන්=අෂ්ටාංගිකමාර්ගයෙන්.

19 — 16

අවිතර්කඅවිචාරසමාධිය= විතර්ක රහිත විචාර රහිත සමාධිය එනම් අභිධර්මපර්‍ය්‍යායයෙන් තෘතීයධ්‍යානය.

අවිතර්ක විචාරමාත්‍ර සමාධිය=විතර්කය රහිත විචාරය පමණක් ඇති සමාධිය. එනම් අභිධර්ම ක්‍රමයෙන් ද්විතීයධ්‍යානය

සවිතර්කසවිචාරසමාධිය= විතර්ක විචාර සහිතවූ සමාධිය එනම් අභිධර්ම පර්‍ය්‍යායයෙන් ප්‍රථමධ්‍යානය.

19 — 17

ගූථය=අශුචිය.

නාමකායයෙන්=වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන නාමකායයෙන්.

20 — 1

අවිතථ= (මිරිගුසෙයින් විසංවාදන නොවන හෙයින්) සත්‍යවූ සැබවත් ඇතිසැටිවූ.

අෂ්ටමිථ්‍යාමාර්ගයෙන්= මිථ්‍යාදෘෂ්ටි, මිථ්‍යාසංකල්ප, මිථ්‍යාවාචා, මිථ්‍යාකර්මාන්ත, මිථ්‍යාආජීව, මිථ්‍යාවායාම, මිථ්‍යාසති, මිථ්‍යාසමාධි යන මිථ්‍යාමාර්ග අටෙන්.

කෘත්‍යසාධක=කටයුතු සිඬකරණ.

ජංඝමාර්ග= රථ යා නොහැකි හෙයින් ගමන් කිරීමට පමණක් පොහොනා මාර්ග.

භූත= (සුවර්ණ නොවූවක් සුවර්ණ යයි දක්වන්නාවූ මායාකාරයන්ගේ ක්‍රියාවමෙන් විපරීත නොවන බැවින්) අවිපරීතවූ.

දුඃඛපරිඥාදී=දුක පිරිසිඳ දැනගැනීම් ආදිවූ

ද්වාෂෂ්ටිදෘෂ්ටිගතමාර්ගාදී=දෙසැට මිථ්‍යාදෘෂ්ටිසංඛ්‍යාත මාර්ග ආදිවූ.

ප්‍රත්‍යයසමුත්පන්නවූද= ප්‍රත්‍යයෙන් හටගත්තාවූද.

ශකටමාර්ග=රථ ගමනය කරණ මාර්ග.

20 — 3

ශල්‍යයන්=උල්.

20 — 5

ව්‍යුත්ථානගාමිනී විදර්ශනා වශයෙන්=මුදුන් පැමිණි විදර්ශනාභාවනාහුගේ වශයෙන්. මෙහි ව්‍යුත්ථාන නම් මාර්ගයයි. මාර්ගය කරා යන හෙයින්–මාර්ගය හා බැඳෙන හෙයින් මේ විදර්ශනා තොමෝ ව්‍යුත්ථානගාමිනී (=උට්ඨානගාමිනී) නමි.

ශිඛාප්‍රාප්තවූ=මුදුන් පැමිණියාවූ.

20 — 6

උදයෙන්=උත්පත්තියෙන් හා විනාශයෙන්, ඇත්වීමෙන් හා නැතිවීමෙන්.

20 — 7

නිර්වේදය=කලකිරීම.

40 — 8

ආලස්‍යයෙන්=අලසබැවින්.

20 — 9

එසනය කලාවූ=සෙවීම කලාවූ.

ශීලස්කන්ධාදි පඤ්චවිධ ධර්මස්කන්ධයන්=ශීලස්කන්ධ, සමාධිස්කන්ධ

ප්‍රඥාස්කන්ධ, විමුක්තිස්කන්ධ, විමුක්තිඥානදර්ශනස්කන්ධ යන පඤ්චවිධ ධර්මස්කන්ධයන්.

අටතිස් අරමුණෙහි= දශකසිණ (10) දශ අසුභ (10+10=20) දශ අනුස්සති (20+10=30) සතරබ්‍රහ්මවිහාර (30+4=34) සතර අරූපධ්‍යාන (34+4=38) චතුධාතුවවත්ථාන (38+1=39) ආහාරෙ පටිකූලසඤ්ඤ (39+1=40) යන සමසතලිස් කමටහන් අතුරෙන් ආලෝක-ආකාසකසිනවය හැර ඉතිරි අටතිස් අරමුණෙහි.

උක්තප්‍රකාර=කියනලද පරිදි.

යෝනිසෝමනසිකාරයෙහි= නුවණින් මෙනෙහි කිරීමෙහි.

භාවනාමනසිකාරයෙන්=භාවනාවශයෙන් මෙනෙහි කිරීමෙන්.

20 — 11

පියවිවනයෙන්=ප්‍රකෘතිවනයෙන් හෙවත් නියම වනාන්තරවලින් ප්‍රවෘත්තිවිපාකදායකවූ= ප්‍රවෘත්ති විපාක ගෙණදෙන්නාවූ (කර්මවිපාකයෝ වූකලි, ප්‍රතිසන්ධිවිපාක-ප්‍රවෘත්තිවිපාකයයි දෙවැදෑරුම් වෙත්. එහි ප්‍රතිසන්ධිවිපාකයෝ නම් යම්තැනෙක්හි උත්පත්තිය ගෙණදෙන විපාකයෝයි. ප්‍රවෘත්තිවිපාකයෝ නම් එසේ උත්පත්තිය ගෙණදුන් පසු අමුතුවෙන් පැමිණ ප්‍රතිසන්ධිවිපාකය පවත්නාකාලයෙහි දෙන විපාකයෝයි. දුප්පත්කුලවල ඉපිද පොහොසත්වීම්, පොහොසත්කුලවල ඉපිද දුප්පත්වීම් ආදිය සිදුවන්නේ මේ ප්‍රවෘත්ති විපාකයෙනි)

භවොත්පත්තිසාධකවූ=සසර ඉපදීම සිදුකරගන්නාවූ.

20 — 12

තෘණාලවයක්= ස්වල්පමාත්‍රවූත් තෘණාවක්.

20 — 13

ශාන්තය=සංසිඳුනේය.

ශාස්වතය=සැමකල්හි එකසේ පවත්නේය.

21 — 3

මාතතල=මාත නැමැති තල. (තල නම් බටගස්ය. බටවල ඇතුලත හිස් කුහරයක් මුත් හරයක් නැත්තේය. මාතයද එසේ හිස්වූවක් හෙයින් බටයට උපමා කරණු ලැබේ.)

භාවනාරාමතාය=භාවනාවෙහි ඇලුනුබවය.

ශීලස්කන්ධගොපනය=සිල් (රැස) රැකීම.

හුවනලද=ඔසවනලද.

21 — 4

කායගතාසතිභාවනා තොමෝ=කායගතාසති භාවනා තොමෝ.

චතුසම්පජඤ්ඤ= සාත්ථකසම්පජඤ්ඤ, සප්පායසම්පජඤ්ඤ, ගොචර සම්පජඤ්ඤ, අසම්මොහසම්පජඤ්ඤ යන සම්පජඤ්ඤ සතර. මෙහි සාත්ථක සම්පජඤ්ඤය නම් යාම් ඊම් ආදිවූ යමක් කරන්ට අදහස්වූ විට අදහස්වූ වහාම නොකොට එය කිරීමෙන් අර්ථයක් (වැඩක්) ඇද්ද නැද්ද යනු විමසා දැනගැනීමයි. මේ සාත්ථකසම්පජඤ්ඤය ඇති තැනැත්

ත් එසේ විමසා දැන අර්ථයක් ඇතොත් ඒ අදහස්වූ දෙය කරයි, නැතොත් නොකරයි.

සප්පායසම්පජඤ්ඤය නම් සත්ප්‍රාය — අසත්ප්‍රායයන් (=යෝග්‍යායෝග්‍යකම්) විමසා දැනගැණීමයි. උදාහරණයක් නම් පුරුෂයන්ට මාගමුන්ගේ අශුභය අසත්ප්‍රායයි, මාගමුන්ට පුරුෂයන්ගේ අශුභය අසත්ප්‍රායයි. අශුභභාවනාහි යෙදෙන තැනැත්තේ මෙසේ අශුභයන්ගේ යෝග්‍යායෝග්‍ය කම් දතයුතුය.

භාවනානුයෝගීහු විසින් ගත් කම්සථාන සඞ්ඛ්‍යාත ගෝචරය භික්ෂාචාර වේලාවන්හිත් අත් නොහැරම හැසිරීම ගෝචර සම්පජඤ්ඤයයි.

යාම් ඊම ආදියෙහි නොමුලාවීම අසම්මෝහසම්පජඤ්ඤයයි. එනම් ගමනාගමනාදියෙහිදී 'මමයෙමි, අසවලා, යෙයි' යනාදීන් නොමුලාව 'ධාතන්ගේම යාමයි, ධාතූන්ගේම සිටීමයි' යනාදීන් ඇතිසැටිය තේරුම් ගැණීමයි.

පරිෂ්කාර මණ්ඩනාදී= පරිෂ්කාරයන් ලක්‍ෂණකරගැන්ම ආදිවූ.

21 — 5

බාහිතපාපිවූ= නසනලද පව් ඇත්තාවූ.

21 — 6

විචිකිච්ඡානීවරණය=බුඩාදි අට තන්හි සැක කිරීම් වසයෙන් පවත්නා එනම් නීවරණය.

21 — 10

අජ්ඣත්තනීලකසිණරූපධ්‍යානාදී=තමා පිළිබඳ කෙසාදිවූ නීලාවර්ණයන් කසිණකොටගෙණ භාවනාකිරීමෙන් පහලවන රූපාවචරධ්‍යාන

චතුධාතුවවත්ථාන= පඨවීධාතු ආදිවූ ධාතුන්තර ඒ ඒ ධාතුන්ගේ ස්වභාව වශයෙන් හා ලක්‍ෂණ වශයෙන් සනිටුහන් කරගැන්ම.

වත්තිංසාකාරවසයෙන්=“අත්ථි ඉමස්මිං කායෙ කෙසා” යනාදීන් ශරීරයේ දෙතිස්කුණුකොටසුත් පිළිබඳ භාවනාහුගේවශයෙන්.

නවසීවථිකා=උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලොහිතක, පුලවක යන සීවථිකා නවය.

21 — 13

අද්ධමග්ගට=දීර්ඝමාර්ගයට.

21 — 15

අයම්විතර=දිග හා පළල.

ඝනාන්ධකාරරාත්‍රියෙහි=මහත්අන්ධකාරය ඇති රාත්‍රියෙහි

චතුරඞ්ග සමන්විත=කලුවර පක්‍ෂයෙහිවූ තුදුස්වක් දිනය, එකඝන වන ලැහැබ, මෙඝපටලයෙන් යුත් අහස, අඩිරාත්‍රිය යන අඞ්ග සතරින් යුක්තවූ.

21 — 16

මහග්ඝ=මහාර්ඝවූ, බොහෝ වටිනාවූ,

යගන්හි=ශයනයන්හි.

28 — 1

අභ්‍යාඛ්‍යානය= නොකීනොකළ දෙය කීහයි කලහයිදොස්නැගීම

22 — 6

කාරකණයෙක්=රළුවූ කාණුවගී යක්.

22 — 7

උපෝසථපණ්ඩයකම්=සඞ්ඝයාවිසින් භික්ෂූන්ටගන්නේස් යකෝ නහනම් කිරීම කරණ එනම් සඞ්ඝකාර්මය.

22 — 10

අෂ්ටදුෂ්ටක්ෂණයෙන්=නරකය තිරිසන්යොනිය, ප්‍රෙතඅපාය යන අපායතුනද, අරූපල, අසංඥතල යන බ්‍රහ්මලොකදෙකද, බුද්ධාගම නැති ප්‍රත්‍යන්තයද, පඤ්චඉන්ද්‍රිය යන්ගේ විකලබවද, දරුණු ආජ්‍යා දෘෂ්ටියද යන දුෂ්ටවූ අවසථා අටින්.

තරකිරීමෙන්=ශක්තිමත් කිරීමෙන්.

විනිර්මුක්තවූ=මිදුනාවූ.

22 — 11

භික්ෂාභාජනයෙහි=අහර සිඟිම උණ්ස ගෙණයන භාජනයෙහි.

රජස්=මල (ධූලි ආදිය)

වගුල් විතාන=වැටුමෝනම.

23 — 5

තිව්‍රවූ=තියුණුවූ (ඉවසියනොහැක් කා ...)

පරික්ෂෙප කරණලද්දේ= වටකර ණලද්දේ.

මාතෘවියොගයෙන් = මවගෙන් වෙන්වීමෙන්.

23 — 6

අලංසාටක=බොහෝකොට කාමන්ව හැඟිව රෙදි ඇඳගතනොහැකිව 'අලංසාටකං'(රෙද්ද ඕනෑ නැතැ)යි කියන බමුණා.

ආහරහත්ථක=බොහෝකොට කානැගිඳු ගතනොහැකි "ආහරහත්ථං" (=අතදෙව)යි කියන බමුණා.

කාකමාසක=කවුඩන් විසින් කටට කොට ද ඇ ගතහැකිවනසේ බුබමාරය දක්වා අහරබුදිනා බමුණා.

ජඨරාග්නියෙහි=බඩගින්නෙහි.

තත්‍රවට්ටක=බොහෝකොට කා නැගිසිටිනු නොහැකිව එහිම පෙරළෙන බමුණා.

දඹුහඩ=දංකුඩ

මලවුන්දිය=නැලිවලන්සේද ජලය,

නියුඩු=කුඩුයගිත සහලේ කැඳ

භුත්තවම්තක= බොහෝකොට කා මුඛයෙහි නොදැරියහැකිව එතැනම වමනය කරණ බමුණා.

23 — 11

කණපරිහරණයෙහි=සමූහයා පාලනය කිරීමෙහි.

23 — 12

විවරකරණ=ඉවුරුකිරීම (මැහීම් උඩුපෙවීම් ආදිය).

පාත්‍රපචනාදි=පාත්‍රපිස්සීම් ආදිවූ.

23 — 14

මාර්ගයෙන් සමුච්ඡින්න=අභිනාමාගීයෙන් මොනවට ළුළුසුන් සළ

24 — 1

මාලුවාලියය=මාලුවා නම් වැල.

සමාතිවිප්‍රවාස=සිඟිමුලාබව.

24 — 2

ආසන්න=ඇලුනු

විසන්න=මනාකොට ඇලුනු.

සහාටන=සුවඳගොට, සැවැන් දරා.

24 — 3

ගිලිහෙන්නාවූ=වැටෙන්නාවූ

පොකුරුපතක්න්=පොලුම් පත්‍රයකින්

24 — 4

සුවඳකොටමුලින්=සැවැන්දරා මුල් වලින්.

24 — 5

කාම්භවධාදි=පණුවන්විදීම්ආදිවූ.

මූෂිකාදිවිෂයක්=මී ආදීන්ගේ විෂයක්.

24 — 6

තෘෂ්ණාශ්‍රාතසින්=තෘෂ්ණා නැමති සැඩපහරින්

ශ්‍රවන්ට=වැගිරෙමින්.

විපන්නාවූ=විපත්ව පැමිණියාවූ.

24 — 7

හිවන අඬියෙන් = මැනෙන (බැඳෙන අඬියෙන්.

පියවිලියයක් = ප්‍රකෘති ලතාවක්, (වැලක්.)

24 — 9

කුණ්ඩලාභරණයෙහි = කණාභරණයෙහි.

ත්‍රාසය=බිය, චකිතය.

24 — 12

සංරක්තව=විශෙසයින් ඇලී.

24 — 13

ථලපථ=ගොඩබිම්හිවූ මාර්‍ග.

ජලපථ=ජලයෙහිවූ මාර්‍ග.

24 — 14

නිරාලයව=ආලයරහිතව.

24 — 16

ප්‍රවෘත්තවූ=පැවැත්තාවූ.

24 — 17

නිකන්තියව=තණ්හා.

24 — 18

රාගාදිසන්ත්‍රාසයක්= රාගාදි බියක්, රාගාදිචකිතයක්.

රාගාද්‍යඞ්ගන= රාගාදිකෙලෙස්.

24 — 19

අක්ෂර සමුදාය = නිරුක්තිනයින් අක්ෂරයන්ගේ එක්වීම හෝ සම්බන්ධවීම.

සිවුපිළිසිඹියාවර්=අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන, යන පිළිසිඹියා සතර.

25 — 8

ස්මෘතිප්‍රස්ථානාදි= සතිපට්ඨානාදි.

25 — 6

රූක්ෂවූ=කටුකවූ.

25 — 7

ජඞ්ඝාබලතිසා=කෙණ්ඩාදෙකෙහි උත්සාහයෙන්.

25 — 10

ඇලවාලා=වසාලා.

25 — 17

අභියොගයක් = නැවත නැවත යෙදීමක්.

ආමිස පරිස්කාර= ආහාරපානාදි ආමිසයෙන් කරණ පිළිසඳර.

ධර්මපරිස්කාර= දහම්කථාවකින් කරණ පිළිසඳර.

ධර්මප්‍රමොද්‍යයෙන්ද=ධර්මය කරණකොටගෙණ උපන් සන්තොෂයෙන්ද.

25 — 18

ධූවවූයෙන්=නැවීමෙන්.

25 — 21

ප්‍රපාතස්ථාන=පව්තපලලම්, පව්තාදියෙහි බෑවුම්.

26 — 1

විෂමස්ථාන = වලගොඩලි ඇතිතැන්.

අනාදිමත්=ආදියක් නැති.

අවිච්ඡින්නව=නොසිඳී.

ක්ෂණික නිරොධ=ඇසිල්ලක්පාසා වන නිරොධය.

සන්තති නිරොධ=පරම්පරාව සිඳීමෙන් වන නිරොධය.

26 — 3

චක්ෂුරාදිෂඩායතනය=චක්ෂු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා, කාය, මනස යන ආයතන සය.

රූපාදිෂඩායතන = රූප, ශබ්ද,

ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන ආයතන සය

26 — 5

අභ්‍ර=වලා.

ධූම=දුම්.

මහිකා=පිනි.

රජෝ=ධූලි.

26 — 8

සමුද්ඝාතනයට=මුලුපුන්කොට නැතිකිරීමට.

26 — 12

අජිනචම්මය සාටිකාවෙන් = අඳුන් දිවිසමින් කරණලද සලුවෙන්.

ජටාජිනචාකචීරාදි = කේශජටාව, අජිනචම්මය, වැහැරි සිවුරය යනාදී ආදිවූ.

26 — 13

පවුල් සිවුරු=පාංශුකූල චීවර.

26 — 15

ජීවිතනිකන්ති = ජීවත්වීමෙහි ආසාව.

26 — 16

ද්වාෂෂ්ටිදෘෂ්ටි = දෙසැට මිථ්‍යාදෘෂ්ටි. එනම්:- සස්සතවාද 4, එකච්ච සස්සතවාද 4 (4+4=8), අන්තානන්තිකවාද 4 (8+4=12), අමරාවික්ඛෙපිකවාද 4 (12+4=16), අධිච්චසමුප්පන්නවාද 2 (16+2=18), සඤ්ඤීවාද 16 (18+16=34,) අසඤ්ඤීවාද 8 (34+8=42), නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද 8 (42+8=50), උච්ඡේදවාද 7 (50+7=57), දිට්ඨධම්මනිබ්බානවාද 5 (57+5=62) යන මොහුයි.

අවිද්‍යානැමැති හිදිබාව = අවිද්‍යා නැමති දොරපොල්ල, පලිඝය, අගුල..

26 — 17

අනුබන්ධන=හිරගෙහි දැමීම.

රජ්ජුබන්ධනාදී=රැහැණින්බැඳීම ආදිවූ.

26 — 22

සමුල්ලාපසංසග්ග=කථාකිරීමෙන් උපදනා රාගය.

2 — 23

සභයවූ=භය සහිතවූ.

2 — 31

සංකිලේශක ධර්ම = ලෝභාදි කෙලෙස්නැමති කිලිටිබව

විගමනයෙන්=පහව යාමෙන්

6 — 32

ඕජසඞ්ඛ්‍යාත= සිත කම්පා කරණ හෙයින්) ඕජයයි කියනලද.

26 — 37

අලග්නවූ=නොඇලුනාවූ.

පරිවර්ජනය=දුරලීම.

26 — 40


භයසන්ත්‍රාස = භය සා තැතිගැන්ම.

මහාජානීයයෙකු = උත්තම මහණයෙකු.

නි මි.

—

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු